# ආඛ්‍යාන narrations

open access, refereed journal
ISSN 2478-0642
Volume 02 | Issue 01 | January – June 2017



Center for indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka
www.sab.ac.lk

ආඛ්‍යාන narrations

ආඛ්‍යාන narrations
open access, refereed journal

ISSN 2478-0642
Volume 02 | Issue 01 | January – June 2017

Sabaragamuwa University of Sri Lanka

Attribution-NonCommercial-ShareAlike
CC BY-NC-SA
Legal Code: https://creativecommons.org/licenses/by-nc-nd/4.0/legalcode

## Editorial Board

**Sarath Ananda - Chief Editor**
BA Hons, M.Phil, PhD
**Manoj Ariyarathne**
BA Hons, MA, PhD
**Hiniduma Sunil Senevi**
BA Hons, MA, PhD
**E. P. N. Udaya Kumara**
BSc (sp), Msc, PhD
**Prabath Galagamage**
BA Hons, M.A, M.Phil, PhD (reading)

## Reviewers

**Prof. Kalinga Tudor Silva**
**Prof. H.M.D.R Herath**
**Prof. Premakumara De Silva**
**Dr. Sumudu Premachandra**

Submit your academic papers to sarath_a@yahoo.com or gprabath@gmail.com

**Center for indigenous Knowledge and Community Studies**
**Sabaragamuwa University of Sri Lanka**

**Cover Page**

Artist: Dr. Manoranjana Herath
Title: Face

# Contents


ශ්‍රී ලංකාවේ දේශපාලනය සහ නාථ දෙවියන් .......... 4

කන්ද උඩරට රාජධානි සමයේ ශ්‍රී ලාංකේය හමුදාවේ අවි ආයුධ හා පාරම්පරික යුධ දැනුම .......... 12

උඩුදුම්බර සංස්කෘතික භූදර්ශන තුළින් හෙළිවන කෘෂි සමාජය සහ වර්තමාන අර්බුදය .......... 35

ක්‍රි.ව. 8-10 සියවස් අතර කාලයේ අනුරාධපුරය සහ බැග්ඩෑඩය අතර වාණිජ සහ සංස්කෘතික සබඳතා .......... 58

ජීව විද්‍යාත්මක ලිංගිකත්වයේ සමාජ නිර්මිතය .......... 73

දෘෂ්‍ය පරිසරය තුළ ස්ථාපිත කුල මහේශාක්‍යත්වයේ ආඛ්‍යාන .......... 83

ආඛ්‍යානnarrations
**Volume 02 | Issue 01 | January – June 2017 | Article 01**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# ශ්‍රී ලංකාවේ දේශපාලනය සහ නාථ දෙවියන්

අජිත් තල්වත්ත[1]
B.A.(special), M.A.(PDN) , M.phil, Ph.D. (KLN)
ajiththalwatte@gmail.com

## සංක්ෂිප්තය

ලාංකේය බෞද්ධ ජන සමාජයෙහි නාථ දෙවියන් සඳහා හිමි වන්නේ සුවිශේෂි ස්ථානයකි. බුදු දහමට අනුව, නිර්වාණය මගින් සසර ගමන කෙළවර කොට අවසාන විමුක්තිය ලැබීම ස්වෝත්සාහයෙන් කළ යුත්තක් බැවින් දෙවියන් සරණ යෑම ධෛර්යවත් නොකැරේ. එනමුත් නාථ දෙවියන් සම්බන්ධ ක්‍රියා පිළිවෙත් සම්මිශ්‍ර වී ඇත. බෞද්ධ සංකල්පය හා දේව සංකල්පය එකිනෙකට බද්ධ වීම පොළොන්නරු යුගයෙන් පසු ඍජු වශයෙන් සිදු වූ බව පෙනේ. මෙරට ඉතිහාසයේ නාථ දෙවියන් වඩාත්, වැදගත් වන්නේ බෝධිසත්ව තත්ත්වයේ සිට ක්‍රමික ව දේවත්වයට පත්වීම නිසාය. මෙකී සන්දර්භය පදනම්කොට ගොඩ නැගෙන මෙම ආඛ්‍යානයේ මූලික පරමාර්ථය වන්නේ මෙරට සමාජය තුළ නාථ දෙවියන්ට හිමි ඓතිහාසික පසුබිම ගවේෂණය කිරීම හා දාහතර වන සියවසෙන් පසු නාථ දේව සංකල්පය ප්‍රචලිත වූ ආකාරයත් එය ලාංකේය දේශපාලන සන්දර්භය තුළ හිමි භූමිකාව විග්‍රහ කිරීමත්ය.

**ප්‍රමුඛ පද:** නාථ දෙවියන්, ඓතිහාසික විකාශනය, ලාංකේය දේශපාලනය

බෞද්ධ ජන සමාජයෙහි නිබඳ ව ගෞරවාදරයට ලක්වන දෙවියෙකු ලෙස නාථ දෙවියන් සැලකිය හැකිය. බුදු දහමට අනුව, නිර්වාණය මගින් සසර ගමන කෙළවර කොට අවසාන විමුක්තිය ලැබීම අනුදක්නා බැවින්, දෙවියන් සරණ යෑම ධෛර්යවත් නොකැරේ. එනමුත් කාලානුරූප ව සිදු වූ වෙනස්වීම් හා බෞද්ධ චර්යාවන් තුළ දෙවියන් සම්බන්ධ ක්‍රියා පිළිවෙත් සම්මිශ්‍ර වී ඇත. බෞද්ධ සංකල්පය හා දේව සංකල්පය එකිනෙකට බද්ධ වීම පොළොන්නරු යුගයෙන් පසු ඍජු වශයෙන් සිදුවිය. එලෙස මුසු වී ජනතා ගෞරවාදරයට පත් දෙවි කෙනකු ලෙස නාථ දෙවියන් සැලකිය හැකිය **(ධර්මදාස සහ තුන්දෙණිය, 1994:76).** මෙරට ඉතිහාසයේ නාථ දෙවියන් වඩාත්, වැදගත්

[1] Senior Lecturer, Faculty of Social Sciences and Humanities. Rajarata University of Sri lanka

වන්නේ බෝධිසත්ව තත්ත්වයේ සිට ක්‍රමික ව දේවත්වයට පත්වීම නිසාය. ඒ අනුව, මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ මෙරට දේශපාලනය තුළ නාථ දෙවියන්ට හිමිවූ ඓතිහාසික ස්ථානය ගවේෂණය කිරීම ය. මේ යටතේ පළමුව, දාහතර වන සියවසෙන් පසු නාථ දේව සංකල්පය ප්‍රමුඛවීමත්, දෙවනුව නාථ දේව සංකල්පයට ලාංකේය දේශපාලන සන්දර්භය තුළ හිමි ස්ථානය විග්‍රහ කිරීමටත් නියමිතය.

මහායාන බෞද්ධයන් අතර අවලෝකිතේශ්වර බෝධිසත්ව විශ්වාසය ඇති වන්නේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව, එනම් හතර වන සියවසේ දී පමණ ය. මහායානික සංකල්ප ඔස්සේ ඉදිරියට ආ අවලෝකිතේශ්වර බෝධිසත්වයන් බෞද්ධ ජනතාවගේ පුද පූජාවන්ට භාජනය වන්නේ හත් වන හෝ අට වන සියවස්වල දී ය. මෙම අවධියේ ආසියාවේ සෑම ප්‍රදේශයක ම වාගේ මෙම බෝධිසත්වයෝ පුද සත්කාරයට බඳුන් වූහ. ශ්‍රී විජය, කාම්බෝජය, සියමය, බුරුමය වැනි අග්නිදිග ආසියානු රටවල අවලෝකිතේශ්වර පුද පූජාදිය රාජත්වය තහවුරු කිරීම පිණිස වැදගත් කොට සලකන ලදී. ලක්දිව ද මෙම පසුබිම නිර්මාණය වූ බව පෙනේ **(සාසනරතන,1952:86).** ලක්දිව ථෙරවාදී සම්ප්‍රදාය කෙරේ මහායානය බලපෑ අයුරු අනුරාධපාරයේ බුදුසමය පිරික්සන විට පැහැදිලි ව ම පෙනෙන්නක **(වික්‍රමගමගේ,2006:58)**. ඇතැම් රජවරු ඍජුව ම මහායාන සංකල්පයන්ට පක්ෂපාතී වූ අතර අවසනයේ ථෙරවාදය ම ජය ගත්තත් සමාජයේ පැතිරි පැවති මහායාන අදහස් ථෙරවාදී සම්ප්‍රදාය තුළට ද ඇතුළු විය. අප මෙහි දී විශේෂයෙන් ම අවධානයට ලක් කළ යුත්තේ මහායානිකයන් අතර වැදගත් ම බෝධිසත්වයන් ලෙස සැලකෙන අවලෝකිතේශ්වර කෙරේ විශේෂ භක්ති ප්‍රණාමයක් මධ්‍යකාලීන ලංකාවේ පැවතිණ. මෙම බෝධිසත්වයන් රූගත කිරීමේ දී කිරීටයෙහි ධ්‍යානි බුද්ධ රූපයක් යොදනු ලැබේ. අට වන සහ නම වන සියවස් කාලය තුළ මෙරට ඉදි වූ අවලෝකිතේශ්වර ප්‍රතිමා රාශියක් ඇත **(ලගමුව,1997:54).**එම ප්‍රතිමා ඇසුරෙන් පැහැදිලි වන්නේ අනුරාධපුරයේ අවසාන භාගයේ අවලෝකිතේශ්වර වන්දනය කොතරම් ජනප්‍රිය පැවතියා ද යන්නයි. තවද මහායානික සංකල්ප මෙන් ම පොළොන්නරු අවධියේ මෙරට ව්‍යාප්ත වූ හින්දු බලපෑම ද මෙරට දේව පද්ධතිය කෙරේ අනුගත වීමත් දක්නට ලැබුණි.

මුල දී අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ලෙස පුද පූජා ලැබූ මෙම දෙවියන් පසුකාලීනව බෝධිත්ව තත්ත්වයෙන් මිදී දේවත්වය ආරෝපණය කරගන්නා ආකාරය දක්නට ලැබේ **(පරණවිතාන,1965:189 ).** එලෙස නාථ දෙවියන් බවට පත්වීමට උප්පත්තිය කෙබඳු ලෙසින් සිදු වුවාද යන්න හඳුනාගැනීම ඉතා වැදගත් වේ. පොළොන්නරු යුගයෙන් පසුව එනම් 14 වන සියවස සිංහල ඉතිහාසයේ දේශපාලන හා ආර්ථිකයේ පසුගාමී යුගයකි **(හේරත්,2003:2004).** පුලස්තිපුරය දහතුන් වන සියවස අග භාගයේ දී අතහැර දමා ආරක්ෂා උපායක් වශයෙන් නිරිතදිගට සංක්‍රමණය වීම ඇරඹුණි. නමුත් අනුරාධපුර යුගයේ සිට ම ජනප්‍රිය ව පැවති මහායාන බෝධිසත්ව සංකල්පය 14 වන සියවස වන තෙක් ම සිංහල සමාජ, දේශපාලන ව්‍යුහයක් තුළට සුවිශේෂී වූ බව නොපෙනේ. මෙම බෝධිසත්වයන් දේශීය බවට පත්වීම සිදුව ඇත්තේ ගම්පොළ යුගයේ දී වන අතර එතැන් සිට අවලෝකිතේශ්වර ස්වීයත්වය හා අනන්‍යතාව ද සැකසීමට භාජනය විය **(හෝල්ට්,1994:137).**

පොළොන්නරු යුගයෙන් පසු මෙරට ඇති වු දේශපාලන සහ සාමාජික අස්ථාවරත්වය හේතු කොට ගෙන දේව ඇඳහීම කෙරෙහි ජනතාව වඩාත් නැඹුරු වූ බව පෙනේ. තවද ශ්‍රී ලාංකේය දේශපාලන බලය සුන්බුන් වීමට අමතර ව සිදු වූ තවත් සුවිශේෂි දෙයක් වන්නේ සෑම ස්තරයකට ම බලපාන අයුරින් පෙර නොපැවති තරම් සංස්කෘතික අනුකලනයක් ඇති වීමයි. මේ සමඟ ම හින්දු හා මහායානික සංකල්ප රාශියක් සම්මිශ්‍රණය වීම සිදු විය. එසේ ම මහායාන අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ශ්‍රී ලාංකීය දෙවි කෙනෙකු වශයෙන් සලකා නාථ දෙවියන් බවට පරිවර්තනය වීමත් සිදු වේ. 15 වන සියවස වන විට නාථ දෙවිඳුන් ඇඳහීම ශ්‍රී ලංකාවේ ඉතා සුලභ දෙයක් වී ඇත **(චන්ද්‍රසිරි,1996:164).**සමස්තයක් වශයෙන් බැලිමේ දී ගම්පොළ යුගය දේශපාලන වශයෙන් යම් අවස්ථාවරත්වයක් නිරූපණය කළත් සංස්කෘතික වෙනස්වීම් හා හැඩගැසීම් බෙහෙවින් සිදු වූ යුගයක් වශයෙන් හඳුනාගත හැකිය. ගම්පොළ යුගයේ දී බෝධිසත්ව වන්දනය බෙහෙවින් ජනප්‍රිය ව පැවති බවක් දක්නට ලැබේ. මෙය එකවර ඇති වූවක් නොව ක්‍රමික ව විකාශනය වූවකි. දඹදෙණි යුගයේ දෙවන පැරකුම් රජුට බුදු බව ප්‍රාර්ථනා කරවීමට දේවපතිරාජ අගමැතිවරයාගේ ආරාධනාවෙන් බුද්ධ පුත්‍ර හිමයෝ **පූජාවලිය** රචනා කළහ **(පූජාවලිය,1986:698)**. තවද මෙම රජතුමාගේ සහෝදරයා වූ විජයබාහු, බෝසත් විජයබාහු ලෙස හඳුන්වා තිබේ.

බෝධිසත්ව වන්දනය හා බුද්ධත්වය ප්‍රාර්ථනා කිරීම ගම්පොළ යුගයේ ශිලා ලේඛනවල සහ සාහිත්‍ය මූලාශ්‍රවල ද දක්නට ලැබේ. මෙම යුගයේ විහාරස්ථානවල දේව රූප සමඟ ම බෝධිසත්ව රූප ද කරවා ඇත. **ජාතක පොතේ** ඇති කථා ගම්පොළ යුගයේ විහාරවල සිතුවම් කරන ලදී (E.Z. Vol. IV,1948:90-110 ). ගඩලාදෙණි ලිපියේ නාථ සහ මෛත්‍රී දෙදෙනා ගැන දැක්වේ. නාථ යනු මෙම දෙවියන්ගේ දකුණු ඉන්දියානු නාමය බවට මහාචාර්ය මංගල ඉලංගසිංහ විසින් පෙන්වා දෙනු ලැබේ **(ඉලංගසිංහ, 2005:270-280).** මෙම බෝධිසත්වවරුන් පොදුවේ දෙවියන් අතර දක්වා ඇතත් බෝධිසත්වවරුන් ලෙස ඔවුන්ට හිමි වූ ස්ථානය මෙම අවධියේ වෙනත් මූලාශ්‍රවල ද දැකගත හැකිය. ලංකාතිලක සිංහල ලිපියේ මෛත්‍රී බෝධිසත්ව නමින් ද නාථ ලෝකේශ්වර නාථ නමින් ද හඳුන්වා ඇත. මින් අවබෝධ වන්නේ සෙසු දෙවියන්ට වඩා නාථ දෙවිඳුන්ට විශේෂත්වයක් මෙම යුගයේ දී හිමි වූ බවයි.

නියම්ගම්පාය ලිපියට අනුව එම විහාරයේ උඩු වියනේ මෛත්‍රී බෝසතුන්ගේ රුව සිතුවමට නැගූ බව පෙනේ. සෙංකඩගල දෙවියන් විසින් අලකේශ්වර සහ දේවමන්ත්‍රීශ්වර දෙදෙනාට සිහිනෙන් පෙනී සිට සතුරන් පරාජය කිරීම පිණිස ජය කාරණා දක්වන ලද බවට සගම ලිපිය සාක්ෂි දරයි (E.Z. Vol. IV,1948:296-311 ). නාථ බෝධිසත්වයකුට වඩා ලංකාරක්ෂක දෙවියකු ලෙස ක්‍රියාත්මක වූ බව පෙනේ. නාථ දෙවියන් සම්බන්ධයෙන් ආචාර්ය ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට් දක්වන අදහස ඉතා වැදගත් වේ. "නාථ සහ මෙරට රාජත්වය අතර සුවිශේෂි සබඳතාවන් පැවති බවත්, මෙරට පාලකයන් බෝධිසත්ව යානය අනුගමනය කළ බවත්, ඒ අනුව බෝධිසත්ව, දේව, රජ යන සංකල්පයක් පැවති බවත්, ඒ නිසා නාථ සිංහල රාජ්‍යයේ ආරක්ෂකයා **(හෝල්ට්,1994:153)** බවත් පවසයි. එසේ ම, අම්පිටිය ලිපියේ (E.Z. Vol. IV,1948:271-273) දැක්වෙන "සෙංකඩගල දෙවියන්" යනු ද මෙම නාථ දෙවියන් ම බව ඔහුගේ අදහසයි. මේ වන විට නාථ කෘත්‍යමය වශයෙන් දෙවියෙකු බවට පත් වී සිටි බව ද, සත්වයන් සසරින් එතර කිරීමේ බෝධිසත්ව ගුණය වෙනුවට

බැතිමතුන් ආරක්ෂා කරන ලෞකික කාර්යයන් ඉටු කළ දෙවියකු බවට පත් වූ බව ද හෝල්ට් වැඩිදුරටත් පෙන්වා දේ.

**තිරස සංදේශයේ (තිසර සංදේශය, 1936ඃ කවි. 130-131)**ද නාථ දෙවියන් "නතිඳු" නමින් ද එතුමන්ගේ දේවිය තාරා බිසව නමින් ද හඳුන්වයි. එහි දී දොරවක තිබූ නාථ දේවාලයත් නාථ දෙවිඳුන් හා තාරා බිසවත් නමදින ලෙස තිසරාට විධාන කර තිබේ. ආචාර්ය ජෝන් හෝල්ට් පවසන්නේ බුදුමැදුර තුළ නාථ දේව ප්‍රතිමාවක් පැවති බවකි **(හෝල්ට්,1994ඃ152)**. මෙසේ නාථ බෝධිසත්වරයකු ලෙස සලකන නිසා එසේ තබන්නට ඇත. බුදු බව ප්‍රාර්ථනා කිරීම ද මෙකල බහුල ව සිදු වූ බව ඉහත තොරතුරු මගින් අනාවරණය වේ. ඊට අමතර ව මහායාන සංකල්පය කෙරෙහි විශේෂ නැඹුරුවක් පැවති බව පෙනේ. **සද්ධර්මලංකාරයේ** බාහිර සිදාසියේ දී ව්‍යාඝ්‍ර ජාතක කථාව ඇත (**සද්ධර්මාලංකාරය, 1953ඃ ගාථා 16**). මෙම කථා හුදෙක් ස්වර්ණ ප්‍රභාස, අවදාන කල්පලතා වැනි මහායාන ග්‍රන්ථවල ද ආර්යශූරපාදයන්ගේ ජාතක මාලාවේ ද දක්නට ලැබේ. කෙසේ නමුත් ඉහත තොරතුරු තුළින් පැහැදිලි වන්නේ ගම්පොළ යුගයේ පැවතියේ ථෙරවාදී ආගමික පසුබිමක් නොව මහායාන හා හින්දු දේව විශ්වාස සම්මිශ්‍රණය වූ ආගමික පසුබමක් බවයි.

ගම්පොළ යුගයේ දී නාථ දේව වන්දනය ජනප්‍රිය වී වැදගත්කමින් වැඩිවන අයුරු පෙනේ. එසේ වීමට කුමන හේතු ඉවහල් වූවා ද යන්න පිරික්සිය යුතුය. දිගුකාලීන වශයෙන් දේශපාලන ක්ෂේත්‍රයේ ස්ථාවරත්වයක් නොමැති වූ විට සිදුවන විපරිවර්තනයන අතිමහත් ය. ගම්පොළ යුගයේ දී මෙම තත්ත්වය වඩාත් හොඳින් නිරූපණය වන අතර ඇතැම් විට විදේශීය රාජ්‍යයන් සමඟ ද සබඳතා වැඩිකර ගැනීමට උත්සහ ගනී. විශේෂයෙන් ම ධර්මකීර්තී මාහිමියන් සහ සේනා ලංකාධිකාරයන් දකුණු ඉන්දියාවේ ආගමික කටයුතුවල නිරත වීමත්, ඒ සම්බන්ධතා මත දකුණු ඉන්දියානු ශිල්පීන් මෙරට විහාර කර්මාන්ත සඳහා ගෙන්වා ගැනීමත්, මේ සම්බන්ධතාවලට ප්‍රකට නිදසුන්ය. දේව විශ්වාසය හා හින්දු ආගමික බලපෑම් මෙරට සංස්කෘතියට සහ බුදුදහමට තර්ජනාත්මක තත්ත්වයකට පත් නොවී, සහජීවන තත්ත්වය නිතර පැවති බවත් ආගමික සම්මිශ්‍රණයක් ඇති කිරීමට දායක වූ බවත් පෙනේ.

අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ද මෛත්‍රී බෝධිසත්වයන් ද සිංහල බෞද්ධ සමාජ හා දේශපාලනමය සංකල්ප පද්ධතියට අන්තර්ගහනයට ලක්වීම දහතුන් වන හා දාහතර වන සියවස් අතර කාලය තුළ සිදුවූ බවඉහතින් පැහැදිලි වේ. දෙවන පැරකුම් රාජ්‍ය සමයේ දී දුර්භික්ෂයක් ඇති වූ විට එය දුරු කරගැනීම රජු පුද පූජා පවත්වා තිබේ. ***මහාවංසයට*** අනුව.............තුනුරුවන්, චෛත්‍යය, බෝධිය, මහර්ධි ඇති නාථ, මෛත්‍රිය **(මහාවංසය,1996ඃපරි.87)**........යනාදීන්ට අවශ්‍ය වූ ගරු බහුමන් දක්වා ඇත. මෙම දෙවියන්ට ද පුද පූජා පැවැක් වූ බවට සඳහන් වීමෙන් මෙම දෙවියන් දේශපාලන වශයෙන් වැදගත් වූවා ද යන්න පැහැදිලි වේ.

විශේෂයෙන් ගම්පොළ අවධිය වන විට ලංකාවේ විහාරාරාම තුළට දේශීය දේවාල ඉදිවීමත් විහාරස්ථාන අභ්‍යන්තරයේ දේවා ප්‍රතිමා ඉදිවීමත් සිදුවිය. ලංකාවේ බෞද්ධ සංකල්පය හා සම්බන්ධ දේව සංකල්පයේ විස්තාරණය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී එහි වැදගත් සන්ධිස්ථානක්

වශයෙන් ගම්පොළ යුගය සැලකිය හැකිය. එම අවධියේ විසූ හතර වන බුවනෙකබාහු රජු (ක්‍රි.ව. 1344 - 1351) පිහිටවූ ලංකාතිලක සෙල් ලිපියේ බුදුරජාණන් වහන්සේ ළඟට වැදගත් කොට සැලකී ඇත්තේ මෛත්‍රී බෝධිසත්වයන් හා ලෝකේශ්වර නාථ වහන්සේ ය ( Paranavitana,1968:65). එම ලිපියේ ම සතරවරම් දෙවියන් පිළිබඳ ව ද සඳහන් වේ. මෙම රජුගේ ගඩලාදෙණිය ශිලා ලිපියෙහි ඉහත සඳහන් බෝධිසත්වයන් දෙදෙනා දෙවියන් ලෙස හඳුන්වා ඇත (Mudiyanse,1976:137). බෞද්ධ විහාරස්ථානයක් තුළ පිහිටවූ මෙම ලිපියේ දෙවියන් පිළිබඳ ව සඳහන් කර තිබීමෙන් ගම්පොළ අවධිය වන විට දේව විශ්වාසය ලාංකීය බෞද්ධ සමාජය තුළට කොතෙක් අනුගත වී ද යන්න පැහැදිලිය. හත් වන සියවසේ පමණ සිට ලක්දිව බෞද්ධයන් විසින් ගෞරවාදරයට පාත්‍ර කරමින් සිටි අවලෝකිතේශ්වර බෝධිසත්වයන් 14 වන සියවස වන විට ලෝකේශ්වර නාථ හෝ නාථ යන නමින් දේවත්වයට පත්ව සිටි අයුරු පෙනේ.

නාථ දෙවියන් පිළිබඳ ව විශේෂ අධ්‍යයනයක නිරත වූ ආචාර්ය ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට් අවලෝකිතේශ්වර නාථයන් සිංහල රාජ්‍යත්වය හා සම්බන්ධ වීම දඹදෙණි රාජධානි සමයේ සිට ම දක්නට ලැබෙන බව පවසයි **(හෝල්ට්,1994:94)**. නාථ දෙවියන් පිළිබඳ **මහාවංසයේ** ප්‍රථම වරට සඳහන් වන්නේ දෙවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ වර්ෂාව අපේක්ෂාවෙන් පූජාව පැවැත්වීම හා සම්බන්ධ සිද්ධියකි. රජතුමා නාථ දෙවියන් වැදගත් කොට සැලකීමෙන් පැහැදිලි වන්නේ සිංහල බෞද්ධ සමාජයේ පැවති විශේෂ ප්‍රවණතාවකි. චන්ද්‍රබානුගේ ආක්‍රමණය හා සම්බන්ධ තොරතුරු දැක්වීමේ දී ආචාර්ය හෝල්ට් පවසන අදහස ඉතා වැදගත් වේ. මෙම ආක්‍රමණය තුළින් තාමුලිප්තයේ ප්‍රචලිත බුද්ධරාජ සංකල්පය මෙරටට පැමිණි බවත් ඊට ප්‍රතිවිරුද්ධ මතයක් වූ නාථ දේව වන්දනය ව්‍යාප්ත කිරීමට දෙවන පරාක්‍රමබාහු ක්‍රියා කරන බවකි **(එම,96)**. ආචාර්ය ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට් තවදුරටත් පෙන්වා දෙන්නේ නාථ දෙවියන් සිංහල රජ කෙනෙකු විසින් විශේෂ පුද පූජාවන්ට භාජන කිරීම ප්‍රථම වරට සිදුවන්නේ දෙවන පැරකුම්බා යුගයේ දී බවයි. තවද අග්නිදිග ආසියාවේ ප්‍රචලිත ව පැවති දේව රාජ සංකල්පය රැගෙන චන්ද්‍රබාහු සිංහල රාජ්‍යය ආක්‍රමණය කළ මේ අවස්ථාවේ දී නාථ දෙවියන් සිංහල රාජ්‍යත්වය හා සම්බන්ධ වීම යථෝක්ත විදේශීය රාජ්‍ය සංකල්පයන්ට ප්‍රතිචාරයක් වන්නට ඇත **(එම,98)**.

අම්පිටිය ශිලා ලේඛනයේ සෙංකඩගල දෙවියන්ගේ ඇතා ගන්නා දවස ගැන ඇති තොරතුරු ද සගම ලිපියේ සෙංකඩගල නාථ සාමීන් ගැන ඇති සඳහන තුළින් ද පැහැදිලි වන්නේ මෙම යුගයේ පාලකයා සහ නාථ දෙවියන් අතර පැවති විශේෂ සම්බන්ධතාවයි. කෝට්ටේ යුගයේ රචිත **ගිරා සංදේශය** මඟින් නාථ දෙවියන් හා සිංහල රාජත්වය අතර පැවති සබඳතාව මනා ව පැහැදිලි වේ. මෙම සංදේශයේ මූලික පර්මාර්ථය වන්නේ තොටගමුවේ රාහුල හිමියන් ලවා හය වෙනි පරාක්‍රමබාහු රජු ඇතුළු පිරිසේ ආරක්ෂාව දෙවියන් ලවා සිදු කර ගැනීමයි. දිවයින අවසන් වරට එක්සේසත් කළ හය වෙනි පරාක්‍රමබාහුගේ ආරක්ෂාව මෙම අවධියේ ඉතා වැදගත් විය. එබැවින් සංදේශකරු මෙවැනි ආයාචනයක් කරන්නට ඇත. තවද රහල් හිමියන් ද නාථ වන්දනයෙහි උග්‍ර බැතිමතෙකි. එවකට පැවති උගත් සමාජය තුළ වඩා ඉදිරියෙන් සිටි භික්ෂුවක් ලෙස රහල් හිමියන්ට විශේෂ ස්ථානයක් තිබුණි. සිංහල බෞද්ධ සමාජය තුළ බුදුන්ට හා සමාන ව නාථ දෙවියන්ට සැලකීම මෙමගින් වඩාත් තහවුරු වේ. පැපිලියානේ සුනේත්‍රා දේවී පිරිවෙනෙහි ඇති ශිලා ලිපිය

මගින් "නාථ හා මෛත්‍රිය දෙතැනට" යනුවෙන් සඳහන් කර ඇත **(ජයතිලක,1955:41).** කෝට්ටේ අවධියෙන් පසු මහනුවර යුගයට සිංහල රාජධානි ගමන් කිරීමෙන් පසු නාථ හා මෛත්‍රී බෝධිසත්වයන් එකට බද්ධ වී එක් දෙවි කෙනෙකු බවට පත්ව ඇත. මෙය සිදු වන්නේ සිංහල රාජත්වය තුළ සිදු වූ ස්වභාවික වර්ධනයක් ලෙස ය.

කෝට්ටේ රාජධානියේ අවසාන භාගයේ බලයට පත් හය වන බුවනෙකබාහු හෙවත් සපුමල් කුමරු රාජ්‍ය අවධියේ නාථ දේව වන්දනය සම්බන්ධයෙන් ඉතා වැදගත් කාල පරිච්ඡේදයක් වේ. දේශපාලනය තුළ නාථ දෙවිඳුන්ට කොතෙක් වැදගත් පසුබිමක් හිමිවූවා ද යන්න සමකාලීන සිද්ධීන් පරීක්ෂා කරීමේන් පැහැදිලි කර ගත හැකිය. මෙරට පිහිටි නාථ දේවාල අතර මාතලේ හුනාපවුරේ නාථ දේවොල ද හය වෙනි බුවනෙකබාහු හා සම්බන්ධ ව පවතින බව කිව හැකිය. මෙම ප්‍රදේශයේ පවතින ජනප්‍රවාද පරීක්ෂා කිරිමේ දී පැහැදිලි වන්නේ සපුමල් කුමරු යාපනය ජයග්‍රහණය කිරීමට ගිය ගමනේ දී මෙම ස්ථානයේ නාගසක සිටි හුනෙකු හඬනු අසා හෙතෙම සතුටට පත්ව ඇති බවය. එය සුබ ලකුණක් සේ සිතා ජයග්‍රහණයෙන් පසු පෙරළා පැමිණ මෙම දේවාලය ගොඩනගා තිබේ. ආචාර්ය ජෝන් කිලිෆර්ඩ් හෝල්ට් පවසන්නේ දොරවක පිහිටි නාථ දේවාලය ද බුවනෙකබාහු විසින් පිහිටුවන ලද එකක් බවයි. යාපනය ප්‍රදේශයේ බලය අත්පත් කර දීමට සපුමල් කුමරු කළ මෙහෙවරත් සිංහල බෞද්ධ පරිසරය තුළ ඔහුගේ කාර්යභාරයත් වැදගත් විය. තම යුද ක්‍රියාදාමය මල්පල ගන්වා ගැනීමට නාථ දෙවිඳුන් පිහිටවූවා යැයි සිතන්නට ඇත. එහ දී ඔහු දෙවියන් උදෙසා ගරු සැලකිලි දක්වා අවශ්‍ය අනුග්‍රහය ලබාදීමට යොමුවුණ බව කිව හැකිය. කෙසේ නමුත් මෙම සිදුවීම තුළින් දේශපාලනය හා නාථ දෙවි අතර සබඳතාව වඩාත් පැහැදිලි වේ.

ක්‍රි. ව. 1505 පෘතුගීසි ආගමනයත් සමඟ මෙරට ඉතිහාසයේ නව කාල පරිච්ඡේදයක් උදා වේ. ප්‍රධාන රාජධානිය ලෙස පැවති කෝට්ටේ රාජධානියේ දේශපාලන කටයුතුවලට ක්‍රමික ව සම්බන්ධ වූ පෘතුගීසීන්ට නොබෝ කලකින් තමන්ට පක්ෂපාතී අයෙකු පාලනයට පත්කර ගැනීමට හැකි විය **(අබේසිංහ, 1968:138).** දොන් ජුවන් ධර්මපාල හා පළමු වන රාජසිංහ යන පාලකයන් දෙදෙන බුදු දහම සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්තිය නිසා සිංහල බෞද්ධ බලය මහනුවර රාජධානිය වටා ඒකරාශි විය. පළමු වන විමලධර්මසූරිය තුළින් ගොඩනැංවෙන නව රජ පෙළපත මඟින් සිංහල බෞද්ධ සම්ප්‍රදාය යළිත් ආරක්ෂා වීමට පටන් ගත්තේය. මුල් වකවානුවේ උඩරට ප්‍රදේශයේ නාථ දෙවියන් සහ රජු අතර සම්බන්ධය පිළිබඳ තොරතුරු හමු වන්නේ අල්ප වශයෙනි. එනමුත් පසු භාගයේ උඩරට රජුන් ඇමතීම"දෙවියෝ බුදුවන්ඩ රාසින් දෙවියෝ" යනාදී ලෙස ව්‍යවහාර කිරීමෙන් පැහැදිලි වන්නේ මහනුවර අවධියේ රජවරුන් බෝධිසත්ව විලාසයෙන් පෙනී සිටි බවකි **(ධර්මදාස සහ තුන්දෙණිය, 1994:87).**

මහනුවර රාජධානි සමයේ සිට නැවත නාථ දෙවියන්ගේ වැදගත්කම ගොඩනැගෙන බව පෙනේ. මේ සඳහා අවශ්‍ය ප්‍රවේශය ගොඩ නැගෙන්නේ නාථ දෙවියන් සහ පිටයේ දෙවියන් අතර ගැටීම තුළිනි. උඩරට ප්‍රදේශයේ බලය පිහිටුවාගෙන සිටි නාථ දෙවියන් පිටියේ දෙවියන්ගේ බලය හමුවේ යුද්ධයෙන් පැරදී පස්ගම දක්වා පසු බැස තිබේ. එසේ පසුබැම සිදු කර ඇත්තේ ද සතුන්ට වන හානිය දැක එය වලකාලීම සඳහා ය. මෙම ගැටුම පිළිබඳ ව ආචාරය හෝල්ට්ගේ විග්‍රහය ඉතා

වැදගත් වේ. මෙම ගැටුම මඟින් සමකාලීන සමාජමය හා දේශපාලන සිද්ධීන් සංකේතවත් කරන බව පවසයි. දඹදෙනි, ගම්පොළ හා කෝට්ටේ යන අවධීන්හි සිංහල සමාජයේ දේශපාලන කටයුතු කෙරේ දැඩි ලෙස බල පෑ නාථ දෙවිඳුන් ක්‍රමයෙන් බෝධිසත්ව භාවයට පත්වීමත් සමඟ ඔහුගේ ලෞකික  කාර්යයන් ක්‍රමයෙන් අඩු වේ. තවද බාහිර දෙවි කෙනෙකු ලෙස පිටියේ දෙවියන් උඩරට ප්‍රදේශයේ බලය පිහිටවා ගැනීම සංකේතවත් කරන්නේ නරේන්ද්‍රසිංහ රජුගෙන් අවසන් වන සිංහල රජ පෙළපතට පසු නායක්කාර්වරුන්ගේ බලය ස්ථාපිත වීම සංකේතවත් කරන බවකි.

මහනුවර අවධිය වන විට රාජපදප්‍රාප්ත වීම හා සම්බන්ධ වැදගත් චාරිත්‍ර ගණනාවක් පැවතිණ. ඒ තුළ වඩා සුවිශේෂ වූයේ රජුට නමක් තේරීම හා මඟුල් කඩුව තේරීමේ චාරිත්‍රයයි. මෙම වැදගත් චාරිත්‍රය නාථ දේවාලය හා දේවාල භූමියේ බටහිර දෙසින් ගොඩනංවන ලද චෛත්‍යය අසළ ඉදිකරන ලද දර්ශනීය කවාකාර මණ්ඩපය තුළ සිදු කළ බව පෙනේ. රජුට සුදුසු නමක් තෝරා ගැනීමේ මංගල උත්සවය පැවැත්වූයේ මේ නාථ දේවාලයේ දී ය**(ධර්මදාස,2005:95)**. රාජකීය නක්ෂත්‍රාචාර්යවරුන් විසින් ලබාදුන් නම් කිහිපයක් තෝරා රන් පත්වල ලියා රිදී තැටියක තබා නාථ දේව ප්‍රතිමාව ඉදිරිපිට තබනු ලැබේ. අභිනවයෙන්  රජකමට පත්වූ රජු නියමිත සුබ දිනයේ දී සේනාව සමඟ විෂ්ණු දේවාලයට ගොස් දෙවියන් පුදා නාථ දේවාලයට පැමිණ දේව පූජා පවත්වා ඇත. නාථ දෙවියන් ඉදිරියේ තැබූ රන්පත් පරීක්ෂා කොට තමන්ට අභිමත නාමයක් තෝරාගෙන පළමු ව ප්‍රධාන අදිකාරම්වරයාට කියන්නේ ය.**(ධර්මදාස සහ තුන්දෙණිය, 1994:79)**. පසුව ඔහු සැමට ඇසෙන පරිදි "රජතුමන් සඳහා දෙවියන් තෝරා ගෙන ඇති නම මෙයයි." යනුවෙන් ප්‍රකාශ කරයි**(පරණවිතාන,1965:193)**. අනතුරු ව එකී නාමයට සහිත රන්පත රජුගේ නළලේ බැඳීමෙන් පසුව රන් අසිපත ලබාගැනීමේ චාරිත්‍රය සිදු කෙරේ. දේවාලයේ ප්‍රධාන කපුමහතා විසින් සකසා ගෙනෙන සඳුන් කල්කය මත අත තවරා රජතුමා අසිපත අල්ලනු ලැබේ. මේ චාරිත්‍රය විෂ්ණු දේවාලයේ දී මෙන්ම නාථ දේවාලයේ දී සිදු කරන්නේ ය (Davy,1821:64) .මහනුවර යුගයේ පැරණි සම්ප්‍රදායන් පිළිපදින බැවිනුත්, ලංකාවේ  සෑම රජ කෙනෙකු ම බෝධිසත්ව කෙනෙක් ය යන්න දහ වෙනි සියවසේ අභයගිරි වාසී භික්ෂූන් විශ්වාස කළ බැවිනුත්, පසු කාලයේ ලංකාවේ රජවරුන්ට " බෝධිසත්වාකාර" යන උපපද නාමය යෙදූ බැවිනුත්, රජ්ජුරුවන් සිය රාජ නාමය හා මඟුල් කඩුව අවලෝකිතේශ්වර බෝධිසත්වයන් අතින් තැබීම ද පුරාණ  සිරිතක් වූවා විය හැකිය.

තවද උඩරට පාලකයන් රාජ්‍යත්වයට පත්වීමට පෙර නමක් තෝරාගැනීමේ දී හා ඔටුනු පැළඳීම සිදු කර ඇත්තේ මහනුවර නාථ දේවාලය ඉදිරිපිට ය. විදේශීය රජ පෙළපතක් පාලනය කළත් බෝසත් බව්න් යුතු නාථ දෙවිඳුන් කෙරෙහි විශාල බලයක් පැවති බව පෙනේ. එම බලය තුළින් සංකේතවත් වන්නට ඇත්තේ සිංහල බෞද්ධ පසුබිම විය හැකිය. නමුත් වර්තමානය තුළ දේශපාලනය හා නාථ දෙවියන් අතර ඉතා සමීප සම්බන්ධතාවක් පවතින ආකාරයක් දක්නට නැති බව පෙනේ. තම දේශපාලන අරමුණු සපුරා ගැනීම පිණිස කතරගම, මුන්නේශ්වරම් හෝ දකුණු ඉන්දියානු කෝවිල් වෙත දේශපාලන නායකත්වය ඒකරාශී වූවත් නාථ දෙවියන්ගේ ආශිර්වාදය සලසා ගැනීමට නො එන තරම් ය.  එහෙත් ඉහත සාකච්ඡා කළ කරුණු තුළ දාහතර වන සියවසෙන් පසු දේශපාලනයේ තීරණාත්මක සාධකයක් වූයේ නාථ දෙවියන් බව පැහැදිලි වේ.

## ආශ්‍රිත මූලාශ්‍ර

**තිසර සංදේශය**, දීපනී, සංස්. කුමාරතුංග මුනිදාස, සූරිය මුද්‍රණ, කොළඹ, 1936.

**පූජාවලිය**, සංස්. කිරිඇල්ලේ ඤාණවිමල, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1971.

**මහාවංසය,** සංස්. හික්කඩුවේ සුමංගල හා බටුවන්තුඩාවේ, එස්. ගොඩගේ සහ සමාගම, කොළඹ, 1996.

**සද්ධර්මාලංකාරය**, සංස්. කළුතර සෝමානන්ද, රත්නාලංකාර ප්‍රකාශකයෝ, කොළඹ, 1953.

අබේසිංහ, ටිකිරි, **පරංගි කෝට්ටේ**, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස්, කොළඹ, 1968.

ඉංලගසිංහ, මංගල, **මධ්‍යකාලීන ලංකාවේ ආගම**, එස්.ගොඩගේ සහ සමාගම, කොළඹ,2005.

ජයතිලක, ඩී. බී. **කතිකාවත් සඟරා**, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය. 1955.

ධර්මදාස, කේ.එන්.ඕ. සහ තුන්දෙණිය එච්.එම්.එස්. **සිංහල දේව පුරාණය**, මුද්‍රණ නිතිගත සංස්ථාව, පාදුක්ක, 1994.

ධර්මදාස. කේ.එන්. ඕ. "ලක්දිව බුදුසමයෙහි බෝධිසත්ව සහ දේව සංකල්පය", **සංස්කෘත ලිපි සංග්‍රහය,**
නිශ්ශංක පෙරේරා සහ තවත් අය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ, 2005.

පරණවිතාන, සෙනරත් "ලක්දිව මහායානවාදය," **පුරාණ යුගය,**තිසර ප්‍රකාශකයෝ,කොළඹ, 1967.

ලගමුව, ඒ, **ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා ලක්ෂණ ,**මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ , 1997.

වික්‍රමගමගේ, චන්ද්‍ර, **ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා කලාව,** එස්. ගොඩගේ හා සමාගම, කොළඹ, 2006.

හේරත්, යමුනා, **ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා හා රූකම්**, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, කොළඹ, 2003.

හෝල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, **මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය**, පරි. පී.බී. මීගස්කුඹුර, ප්‍රදීප ප්‍රකාශන, කොළඹ. 1994.

Davy, John, **An Account of the Interior of Ceylon and Inhabitomts**, London, 1821.

**Epigraphia Zeylanika**, ed. Senerath Paranavithana, Oxford University Press, London, 1948.

Paranavitana, S. "Lankatilaka Inscription", **University of Ceylon Review**, Vol. XVIII, P.S.1947.

Mudiyanse, N. **Mahayana Monuments in Ceylon**, Gunasiri, Colombo, 1976.

ආඛ්‍යානnarrations
**Volume 02 | Issue 01 | January – June 2017 | Article 02**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

---

# කන්ද උඩරට රාජධානි සමයේ ශ්‍රී ලාංකේය හමුදාවේ අවි ආයුධ හා පාරම්පරික යුධ දැනුම

තුෂාර විතාරණ[2]
B.A, M.Phil (reading)
thusharawith@gmail.com

**සංක්ෂිප්තය**

යුද තාක්ෂණය අතින් අතිශය දියුණු බටහිර ජාතීන්ගේ ආක්‍රමණ හමුවේ කන්ද උඩරට රාජධානිය යටත් නොවීමටත්, සතුරාට දරුණු ප්‍රහාර එල්ල කරමින් පරාජය කිරීමටත් සමත් වූ බවට ඓතිහාසික සාධක සාක්ෂි දරයි. බටහිර පැවති නිරන්තර යුද්ධ තත්වයන් ඔස්සේ දියුණු කරන ලද යුද තාක්ෂණය ශ්‍රී ලංකාවේ දී අවලංගු වුව ද ශ්‍රී ලාංකේය භූමියට සහ ස්වකීය තත්වයන්ට ගැලපෙන ආකාරයට නිර්මාණය කර ගන්නා ලද සරළ අවි ආයුධ වෙතින් වැඩි යුද වාසියක් අත්පත්කර දීමට සමත් විය. කන්ද උඩරට ආක්‍රමණයට පැමිණි බටහිර ජාතීන්ට දරුණු ප්‍රහාරයන් එල්ල කිරීමට සමත් වූ ශ්‍රී ලාංකේය හමුදා සතු වූ අවි ආයුධ සම්බන්ධ පාරම්පරික ඥානය සහ ප්‍රායෝගික යුද ඥානය මේ තුළින් විමසා බැලීමට උත්සාහ දරා තිබේ.

**ප්‍රමුඛ පදː** කන්ද උඩරට රාජධානි, අවි ආයුධ, බටහිර ආක්‍රමණ, පාරම්පරික යුද ඥානය

## හැඳින්වීම

කන්ද උඩරට රාජධානි සමය වශයෙන් සැලකෙන්නේ ක්‍රි.ව 1592 දී පෘතුගීසී සෙන්පතියෙකු වශයෙන් පැමිණි දොන් ජෝන් නොහොත් කොනප්පු බණ්ඩාර විසින් උඩරට රාජධානිය අත්පත් කරගෙන පළමු වැනි විමලධර්මසූරිය නමින් රජවූ අවස්ථාවේ සිට ක්‍රි.ව 1815 දී ශ්‍රී ලංකාව ඉංග්‍රීසීන්ට පාවා දෙන තෙක් කාලවකවානුව යි (Dewaraja, 1988, p. 5). ඒ අනුව 16 වැනි සියවසේ අග භාගයෙන් පසු ශ්‍රී ලංකාවේ ප්‍රධානත ම පාලන අධිකාරිය බවට පත්වූයේ කන්ද උඩරට රාජධානියයි (දේවරාජා, 1997, පි. 1). කන්ද උඩරට රාජධානිය යන්න පැහැදිලි පාලන ව්‍යුහයක් සහිත නිලබල රටාවක් ඔස්සේ පාලන කටයුතු පවත්වා ගත් අංගසම්පූර්ණ රාජධානියක ලක්ෂණ සහිත වූවකි (පීරිස්,

---

[2] Lecturer, Sri Lanka Military Academy, Diyatalawa

2001, පි. 23; ඩොයිලි, 2005, පි. 31). ක්‍රි.ව 1505 දී ශ්‍රී ලංකාවට පැමිණි පෘතුගීසීන් ද,(පවෙල්, 2009, පි. 21), ක්‍රි.ව 1658 දී පෘතුගීසීන් යුදමය වශයෙන් පරාජය කරමින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් අත්පත් කරගත් ලන්දේසීන් ද, (De Silva, 2005, p. 38), ක්‍රි; ව; 1796 දී ලන්දේසීන්ගෙන් සාමකාමී ව බලය හුවමාරු කරගත් ඉංග්‍රීසීන් ද, (Perera, 1947, p. 11), විවිධ අවස්ථාවන් හී දී කන්ද උඩරට රාජ්‍යය ආක්‍රමණය කිරීමට උත්සහ කරන ලදි. තත්කාලය වන විට යුද තාක්ෂණය අතින් අතිශය දියුණු මට්ටමකට පත්ව සිටි පෙරකී බටහිර ජාතීන් ත්‍රිත්වය හමුවේ සාපේක්ෂ ව අඩු යුද තාක්ෂණික දියුණුවක් ලබා සිටි කන්ද උඩරට හමුදාව යුදමය වශයෙන් පරාජය නොවී තම ස්වාධීනත්වය පවත්වා ගැනීමට සමත් විය. (Wickremesekera, 2004, p. 16).

යුද හමුදාවක ශක්තිය මැනබැලීම සඳහා යොදා ගත හැකි සංකල්පයක් වන සටන් බලය (Fighting Power) සංරචකයන් ත්‍රිත්වයකින් සමන්විත වන අතර ඉන් භෞතික සංරචකයන් නියෝජනය කරන වැදගත් සාධකයක් වන්නේ අවි ආයුධ යන්නයි (Ministry of Defence, 2002, p. 27). කන්ද උඩරට රාජධානි සමයේ ඇති වූ සටන් වල දී සාපේකෂ ව වැඩි යුද තාක්ෂණික දියුණුවක් ලබා සිටි බටහිර ජාතීන් (Newark, 2009, pp. 277-308). පරාජය කරනු වස් කන්ද උඩරට හමුදාවන් විසින් භාවිත කරන ලද අවි ආයුධ පිළිබඳ අධ්‍යනය කිරීම වැදගත් වන්නේ ඒ හා බැඳී පැවතුණු අවි ආයුධ පිළිබඳ පාරම්පරික ඥානය සහ ඔවුන් සතු වූ සරළ මට්ටමේ පැවති අවි ආයුධ උපක්‍රමික ව භාවිතය පිළිබඳ ව පැවති පාරම්පරික ප්‍රායෝගික යුද ඥානය හඳුනා ගැනීම උදෙසා ය.

බටහිර හමුදාවන් හී අවි ආයුධ දියුණු වන්නේ ඔවුන්ගේ විවෘත භූමියෙහි පැවති සටන් වල දී වැඩි වාසි අත්පත් කරගැනීම අරමුණ සහිතව ය. එහි දී සතුරා වෙත දැඩි හානියක් අත්පත් කරවිය හැකි ආකාරයට ප්‍රමාණයෙන් සහ බරින් වැඩි ආයුධ නිර්මාණය සිදුවිය. විශාල කාලතුවක්කු (Weir, 2006, p. 67), නයිට්වරුන් විසින් භාවිත කරන ලද මීටර් 3 ක් පමණ දිගු හෙල්ලය (Chandler, 1974, pp. 97-101), ට්‍රෙබූච් නම් සුවිශාල ගල් විදින උපකරණය (Newark, 2009, pp. 114-115), ආදිය ඒ සඳහා කදිම උදාහරණ් වෙති. බටහිර ජාතීන් විසින් මෙතරම් දියුණු අවි පිළිබඳ යුද ඥානයකින් යුක්ත වුව ද ඒ වන විටත් කඩුව, දුන්න, හෙල්ල, සිරිය සහ සැහැල්ලු සණයට අදාළ තුවක්කු වර්ග භාවිත කළ කන්ද උඩරට හමුදාව යුද්ධයන් හී වැඩි වාසි අත්පත් කරගන්නා ලදි. එබැවින් කන්ද උඩරට හමුදාව සහ බටහිර ආක්‍රමණික ජාතීන් අතර ඇති වූ සටන් යන්න සාමාන්‍ය යුද්ධ විශ්ලේශනයේ දී භාවිත වන අවි බලය හෝ අනෙකුත් සංරචකයන්ට සීමා කොට විග්‍රහ කරගත හැකි ප්‍රපංචයක් නොවන බව පෙනී යයි. එබැවින් තමන් සතුවන කුමන හෝ ආකාරයේ අවි ආයුධයන් තම භූමිය, දේශගුණය සහ යුද්ධයෙහි ප්‍රායෝගික තත්වයන් සමග මනාව ගලපා ගැනීමේ හැකියාව යන්න යුද හමුදාවකට වැඩි වාසි අත්පත් කරදෙන සාධකයක් බව පැහැදිලි ය.

## විශ්ලේෂණය

කන්ද උඩරට සෙබළුන් විසින් දෙතිස් ආයුධයන් භාවිත කළ බව තෙන්නකෝන් විමලානන්ද උඩරට මහ කැරැල්ල කෘතියේ දක්වා ඇතත් (විමලානන්ද, 1962, පි. 422) ඒ සියල්ල සාක්ෂි සහිත ව ඔප්පු කිරීමේ ගැටළුවක් පවතී. කන්ද උඩරට සෙබළා විසින් භාවිත කරන ලද අවි ආයුධයන් ඓතිහාසික යුගයේ සිට භාවිත කරන ලද මධ්‍යතන යුගයේ දී දියුණු වූ අවි ආයුධ සහ බටහිර

ආක්‍රමණික ජාතීන් සමග සටන් පැවති කාලය තුළ දී නිෂ්පාදනය කොට දියුණු කරන ලද අවි ආයුධ ආදී වශයෙන් මූලික ව දෙආකාරයකින් යුක්ත වන අතර ඒවා භාවිත කළ ආකාරය අනුව පහත පරිදි සරල බෙදීමකට ලක් කළ හැකිය.

1. සමීපයේ සිට පහර දීම සඳහා භාවිත කරන අවි ආයුධ

2. දුර සිට පහර දීම සඳහා භාවිත කරන අවි ආයුධ (ගමගේ, 1997, පි. 51).

මේ අතුරෙන් සමීපයේ සිට පහර දීම සඳහා භාවිත කරන අවි ආයුධ සාපේක්ෂ ව ප්‍රාථමික සණයෙහි ලා සැලකෙන අතර දුර සිටින සතුරෙකුට පහර දීම සඳහා භාවිත කරන අවි ආයුධ ද්විතීයික සණයෙහි ලා ගත හැකිය. මේ අනුව කන්ද උඩරට සෙබළා විසින් යුද අවස්ථාවන් හී දී යොදා ගන්නා ලද අවි ආයුධ වර්ගයන් පහත පරිදි විස්තර කළ හැකිය.

යුද්ධයේ සංකේතය වශයෙන් සැලකෙන කඩුවයන්න මුහුණට මුහුණලා සිදුවන සටන් වලදී භාවිත කළ ප්‍රධානත ම ආයුධය විය (කුලතුංග, 1988, පි. 137). කඩුව සහ අනෙකුත් අවි ආයුධ නිර්මාණය කිරීමට ලෝපස් උණු කොට අවශ්‍ය ලෝහ ලබා ගැනීමේ තාක්ෂණය ශ්‍රී ලංකාවේ ජනයා සතුව තිබී ඇත (ගමගේ, 1997, පි. 52). කන්ද උඩරට රාජධානි සමය වන විට ශ්‍රී ලංකාවේ සෙබළා විසින් භාවිත කරන ලද කඩු වර්ග කිහිපයක් පිළිබඳ ව ම තොරතුරු ලැබේ. ඒවායේ හැඩය අනුව පහත පරිදි වෙන්කර දැක්විය හැකිය.



1 රූපය

දෙපැත්ත කැපෙන කඩුව

(*The Sinhala Sword*, n.d).



2 රූපය

කස්ථාන කඩුව

(*The Sinhala Sword*, n.d).



3 රූපය

කස්ථාන කඩුවක සිංහ හිස

(*The Sinhala Sword*, n.d).



4 රූපය

ඉළුක්කොළය නම් කඩුව

(*The Sinhala Sword*, n.d).



5 රූපය

වක් කඩුව

(*The Sinhala Sword*, n.d).



6 රූපය

වධක කඩුව

(*The Sinhala Sword*, n.d).

ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ සිට ම බහුතර වශයෙන් භාවිත කරන ලද්දේ ඉහත දැක්වෙන දෙපැත්ත කැපෙන ආකාරයේ කඩුවයි. එය සමීප සටන් වලදී වැඩි ඵලදායීතාවයක් සහිත අවියක් වන අතර විනාශකාරීත්වය අතින් ද ඉදිරියෙන් සිටී. කස්ථාන කඩු අලංකාර කැටයම් සහ සැරසිලි වලින් යුක්ත වන බැවින් ඒවා ප්‍රභූන් විසින් භාවිත කරනට ඇති බවට අනුමාන කළ හැකිය (Wickremesekera, 2004, P. 113). ඉළුක්කොළය නම් කඩුව ඇඟිලි සඳහා ආවරණයන් රහිත වූ අග සිහින් වූ තලයකින් යුක්ත කඩුවක් වූ අතර එය සැහැල්ලු කඩුවක් වේ (ගමගේ, 1997, පි. 54). වක්කඩු සටනක දී සතුරා වෙත වැරෙන් පහරදීම සඳහා සුදුසු අවියක් වන අතර සතුරු ප්‍රහාරයන්ගෙන් ආරක්ෂා වී සතුරු පහරෙහි දිශානතිය වෙනස් කිරීම සඳහා උපක්‍රමික ව වැදගත් වන්නේ ය. කඩුවල හැඩය අනුව මීට අමතර ව දික්කඩු, ලුහුඬු කඩු, දිලෙන කඩු, ලෙලෙන කඩු ආදී වශයෙන් විවිධ නම් වලින් හඳුන්වන ලද කඩු පැවති අතර කඩුවෙහි වටිනාකම දක්වනු පිණිස ප්‍රභූන් විසින් යොදාගන්නා ලද කඩු රන් කඩු, රිදී කඩු, මිණි කඩු, සත්රුවන් කඩු ආදී නම් වලින් ද හඳුන්වා ඇත (කුලතුංග, 1988, පි. 138-139). තව ද ඉන්දීය බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ භාවිතයට පැමිණි කඩු වර්ග ඒවා මුල් වරට නිෂ්පාදිත දේශය අනුව ම හඳුන්වන ලද බව දැකගත හැකිය. ඒ අනුව ගුජ්ජර කඩු, පඬි කඩු, වඩිග කඩු, ජින කඩු, මලය කඩු, මදුර කඩු, තෙලිඟු කඩු, වංග කඩු, අයෝධ්‍ය කඩු ආදී ව්‍යවහාරික වචන ද භාවිත වී තිබේ (*The Sinhala Sword*, n.d).

කඩු නිෂ්පාදනය සඳහා භාවිත කරන ලද තාක්ෂණය ජ්‍යොතිශ විද්‍යාව සමග බද්ධ වූවක් බැවින් එය භාවිත කරන පුද්ගලයාට අනුව විශේෂිත වන්නේ ය (විමලානන්ද, 1962, පි. 422). භාවිත කරන්නා අනුව සණ පිහිටුවා, යෝනි පිහිටුවා, නිෂ්පාදනය කරන කඩුව අදාල පුද්ගලයාගේ වියතෙහි සහ ඇඟිලි වල දිග අනුව අනන්‍ය වන ආකාරයට නිෂ්පාදනය කරනු ලබයි. එසේ ම කඩුවක් පණ පෙවීම ද විශේෂිත කාර්යයක් වන අතර රජුගේ කඩුව ගිතෙලෙහි ද, රණ ශූරයාගේ කඩුව රුධිරයෙහි ද, සාමාන්‍ය කඩුව කිරි වලද බහා පණ පෙවීම සිදු කරනු ලබයි (ජයතිස්ස, 2011).

මේ අනුව බැලීමේ දී පෙනී යන්නේ කඩුව යන්න යුද්ධයේ දී භාවිත කළ මූලික ම අවියක් වූ බවත්, එය ශ්‍රී ලංකාවට ම අනන්‍ය බොහෝ අංගයන්ගෙන් සමන්විත වූ බවත් ය. එසේ ම කඩු සම්බන්ධයෙන් මෙතරම් තාක්ෂණයක් ඔවුන් සතු වීමෙන් පැහැදිලි වන්නේ ඒ පිළිබඳ ව හසල දැනුමෙන් සහ අත්දැකීම් වලින් කන්ද උඩරට සෙබළා සන්නද්ධ ව සිටි බවයි. කන්ද උඩරට ප්‍රදේශයේ භූගෝලීය සාධක සැලකීමේ දී එය කඳුකර භූමියෙන් යුක්ත වූ ඝණ කැලෑ වලින් සමන්විත වූ පර්වත සහ බාධක වලින් ගහණ ප්‍රදේශයක් විය (නොක්ස්, 1997, පි. 177). එබැවින් බටහිර දී මෙන් විවෘත භූමියක දී සතුරා හමුනොවී උපක්‍රමික ව සැඟවී සිට සිදු කරන සටන් මෙම ප්‍රදේශයේ දී බහුල ව භාවිත වූ බව දක්නට ලැබේ. ඒ සඳහා කඩුව වැනි ආයුධයක ප්‍රයෝජනය සාපේක්ෂ ව වැඩි වන්නේ රැකසිට සිදු කරන පහරදීමක දී තමන්ට ආසන්නයේ සිටින සතුරෙකු සමග සටන් වැදීමට සිදුවන බැවිනි.


කන්ද උඩරට සෙබළා විසින් යුද භූමියේ දී භාවිත කළ තවත් වැදගත් අවියක් වන්නේ දුන්න සහ ඊතලය යි. එවක පුහුණු කරන ලද අෂ්ටාදස විද්‍යාවන්ගෙන් ප්‍රමුඛ විද්‍යාවක් වූ ධනු ශිල්පය දේශීය රජවරුන්, ප්‍රභූන් සහ සාමාන්‍ය වැසියා යන සියලු දෙනා විවිධ පරිද්දෙන් හදාරණ ලදි

(කිරිඇල්ලේ ඥාණවිමල, 1960, පි. 30). දේශීය සෙබළා විසින් භාවිත කරන ලද දුනු වර්ග මූලික වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.


1. මහදුන්න හෙවත් උසදුන්න

2. මිටිදුන්න (ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය, 2014, පි. 42).

මූලික වශයෙන් මෙම දුනු වර්ග ද්විත්වය භාවිත වුව ද දඹදෙණි අස්නෙහි දුනු වර්ග 21 ක් පිළිබඳ ව සඳහන් කරයි. කෙසේ වුව ද මහදුන්න හෙවත් උසදුන්න දිගු දුර විදීමටත් මිටිදුන්න කෙටි දුර විදීමටත් භාවිත කරන ලදි. මිටිදුන්න යන්න කුඩා ප්‍රමාණයේ දුන්නක් වූ අතර එය සාමාන්‍ය මහදුන්න භාවිත කරන ආකාරයටත්, තවත් මිටි දුනු වර්ගයක් වූ හරස් දුන්න හරස් අතට භාවිත කිරීමටත්, ගල්දුන්න යන්න ගල් හෝ පිළිස්සූ මැටි ගුලි විදීමටත් භාවිත කරන ලද බැවින් එය ආකාර කිහිපයකින් යුක්ත වූ බව පෙනේ (හේරත්, 1998,පි. 262;කුලතුංග, 1988, පි. 130). මේ අනුව පැහැදිලි වන්නේ දේශීය සෙබළා විසින් භාවිත කරන ලද මහදුන්න බටහිර යුද භූමිය තුළ භාවිත වූ දිගු දුන්නට බොහෝ දුරට සමාන වූ බව සහ දේශීය මිටිදුන්න සහ හරස් දුන්න ආදිය බටහිර කෙටි දුන්නට තරමක් දුරට සමාන වූ බවයි (Elmy, n.d). මහදුන්න සහ මිටි දුන්න පහත රූප සටහන් වලින් දැක්වේ



7 රූපය
මහදුන්න සහ ඊතල
(Elmy, n.d).



8 රූපය
මිටිදුන්න භාවිත කිරීම
(Elmy, n.d).

දුන්න සමග භාවිත වන අනෙක් උපාංගය වන්නේ ඊතලය යි. දේශීය ව භාවිත කරන ලද ඊතලයෙහි ඊ හිස හී දණ්ඩෙහි පළල නොඉක්මවූ බැවින් එය වැඩි කාවැදීමේ ශක්තියකින් යුක්ත වූ බව පැහැදිලිය. එසේ ම දේශීය සෙබළුන් විසින් භාවිත කරන ලද සමහර ඊතල සතුරා වෙත කාවැදීමෙන් පසු ව හී දණ්ඩ ගැලවී වැටෙන ලෙස සකස් කළ ඒවා විය (ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය, 2014, පි. 43). විෂයෙදූ ඊතල පිළිබඳ දේශීය ඉතිහාසයේ සඳහන් වෙතත් ඒ දේශීය සෙබළා විසින් භාවිත කරන ලද ඒවා පිළිබඳ ව නොවේ. දේශීය සෙබළා විසින් ලී හිස්, යකඩ හිස් සහ ඇටකටු යොදා ඊතල සෑදුව ද ඒවා විෂයොදා භාවිත කළ බවට සාක්ෂි නොමැත (කුලතුංග, 1988, පි. 126-127).

දුනු නිෂ්පාදනය පිළිබඳ මනා දැනුමක් තත්කාලීන දේශීය ජනයා සතු වූ අතර දුන්නෙහි වරපට සඳහා නුග පට්ට, නියඟ, ගෝන බඩවැල්, අරළු පට්ට ආදිය යොදා ගන්නා ලදි (විමලානන්ද, 1962, පි. 130). දුන්නෙහි ලීය සඳහා සහ ඊතල සඳහා යොදා ගන්නා ලද අමුද්‍රව්‍ය අතර කොබ්බෑ, ගැටවරා, කරඬු, වේවැල්, කුකුරුමහන්, කැතිදෙමට, උල්කැන්ද, මහකෙකෙල වැනි ලී වර්ග ප්‍රමුඛ විය (හේරත්, 1998, පි. 262). මෙසේ දේශීය අමුද්‍රව්‍ය භාවිත කොට නිපදවන ලද දුන්න ද කඩුව මෙන් ම එය භාවිත කරන පුද්ගලයාගේ දේහ ශක්තිය අනුව සකස්වන්නකි (ගමගේ, 1997, පි. 59). දුන්නෙහි දිග එය භාවිත කරන්නාගේ අත්රියනෙන් රියන් තුනක් වූ අතර දිග අඩු කළ ද වියතකට වඩා දිග අඩු නොකළ යුතු විය. වැඩි කාර්යක්ෂමතාවයක් සඳහා ඊතල වල ප්‍රමාණය දුන්නෙහි දිගෙන් අඩක් වන පරිදි නිමැවුණි(කුලතුංග, 1988, පි. 134).මේ ආකාරයට එකල පැවති දුනු නිෂ්පාදන දැනුම පෘථුල එකක් වූ බව පැහැදිලි ය.


ශබ්දවේදී ක්‍රමය අනුව පුහුණුව ලද දුනු ශිල්පයෙහි සමතුන් දේශීය හමුදාවෙහි සිටි බැවින් සතුරාගේ ශබ්දය අනුව ඉලක්ක ගෙන පහරදීමේ හැකියාව ඔවුන් සතු විය (හේරත්, 2014, පි. 57-58).තව ද, සඳ එළියෙහි ඉලක්කය ගෙන විදීමේ හැකියාව ඇති දුනුවායන් එකල චන්ද්‍රාලෝක ධනුර්ධර යන නාමයෙන් හඳුන්වා ඇත (කුලතුංග, 1988, පි. 126). එසේ ම දේශීය ජනයා විසින් දඩයම් කටයුතු සඳහා ද බහුල වශයෙන් යොදා ගන්නා ලද අවිය වූයේ දුන්නයි. වැදි ජනතාව විසින් තම පුද්ගලික අවි වශයෙන් නිතර ම පාහේ භාවිත කරන්නට පුරුදුව සිටි අවියක් වූයේ දුන්නයි (Elmy, n.d).මේ සාධයන් අනුව පැහැදිලි වන්නේ දුනුවායන් කන්ද උඩරට හමුදාවේ මූලික යුද කාර්යයක නියැලුණු බව සහ දේශීය සෙබළා සතු ව දුනු ශිල්පය පිළිබඳ මනා දැනුමක් පැවති බවයි.

දුන්න භාවිතය කන්ද උඩරට ප්‍රදේශයේ දී සටන් සඳහා කොතෙක් දුරට වාසිසහගත තත්වයක් ජනිත කරේද යන්න එවකට බටහිර ජාතිකයින් විසින් භාවිත කරන ලද දුන්නට සාපේක්ෂ අවිය සමග ගෙන විශ්ලේශනය කළ යුතු කරුණකි. මෙහි දී සමකාලීන ව බටහිර සෙබළුන් විසින් භාවිත කරන ලද සාපේක්ෂ අවිය හඳුනා ගැනීමේ ගැටළුවක් පැණනගියි. මන්ද යත්, සමකාලීන ව බටහිර සෙබලුන් විසින් හරස් දුන්න භාවිත කළ ද ඔවුන් විසින් වැඩි වාසි ලබා ගැනීම සඳහා තරමක් දුරින් සිටින සතුරෙකුට එරෙහි ව භාවිත කරන ලද ප්‍රධාන අවිය වූයේ තුවක්කුවයි (Weir, 2006, pp. 71-78).නමුත් එය කන්ද උඩරට සෙබළාගේ දුන්න සමග ගෙන විග්‍රහ කිරීම ගැටළු සහගත වන්නේ කන්ද උඩරට සෙබළා විසින් ද තුවක්කු භාවිත කරන ලද බැවිනි. මධ්‍යතන යුගයේ අවසානය වන විට බටහිර යුද භූමියේ වෙඩි බෙහෙත් භාවිත කරන අවි භාවිතය දියුණු වීමත් සමග දුන්න භාවිතය අඩු වෙමින් ඒ වෙනුවට තුවක්කු භාවිතයට ගත් බවක් දැකගත හැකිය. නමුත් දේශීය සෙබළා දේශීය භූමියේ යුද වාසිය තකා තුවක්කු පැවතිය ද දුන්න භාවිතය තව දුරටත් දියුණු කරන ලදි. එබැවින් බටහිර සෙබළා විසින් තරමක් දුරින් සිටින සතුරෙකුට එරෙහිව භාවිත කළ මන්දගාමී තුවක්කුවට සාපේක්ෂ ව කන්ද උඩරට සෙබළා විසින් කාර්යක්ෂම ව භාවිත කළ හැකි දුන්න යොදා ගැනීම දේශීය යුද ඥානය සම්බන්ධ තවත් වැදගත් සාක්ෂියක් සපයයි.



9 රූපය

යුද භූමියේ දී කෙටි දුන්න භාවිතා කරන සෙබළා සහ එයට ඊතල පුරවන සෙබළා.
(brainly, n.d)





10 රූපය

බටහිර සෙබළුන්ගේ මැච්ලොක්, වීල්ලොක් සහ ෆ්ලින්ට්ලොක් අවි
(*A brief history of anthropology*, n.d)

කන්ද උඩරට සෙබළා විසින් භාවිත කරන ලද මීළඟ වැදගත් අවිය වූයේ හෙල්ලය යි. යකඩින් තැනූ උල් තලයක් සහිත මෙම ආයුධය දිගු ලී මිටක සවි කරන ලද්දකි. එක් පුද්ගලයෙක් විසින් දෙඅතම යොදා ගනිමින් භාවිත කරන මෙම අවිය සතුරා සමග මුහුණට මුහුණලා සිදුවන සටනක දී තරමක පරතරයක් පවත්වා ගනිමින් සතුරාට හානි පැමිණවීමට මෙන් ම සතුරු හමුදාවන් වෙත විසිකර හානි පැමිණවීමට ද යොදා ගනු ලබයි (De Silva, 1971, p. 81).

ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ සිට ම යුද අවස්ථාවන් හී දී මෙම අවිය යොදා ගන්නා ලද අතර එය චූලවංශයේ දී සත්ති යනුවෙනුත් අටුවාවල අඩියටි යනුවෙනුත් හඳුන්වා දී ඇත(කුලතුංග, 1988, පි. 134).යුද්ධ අවස්ථාවන්ට අමතර ව ද්වාර ආරක්ෂකයින් සහ මුරකරුවන් විසින් ද බහුල ව භාවිත කළ මෙම ආයුධය විවිධාකාරයේ හැඩයන්ගෙන් යුත් යකඩ තල භාවිත කරමින් විනාශකාරීත්වය වැඩි දියුණු කරන ලද්දකි(හේරත්, 2014, පි. 60).සාමාන්‍ය හෙල්ලය ත්‍රිකෝණාකාර තලයකින් යුක්ත වූ බැවින් එහි තුඩ දක්වා කොටස ක්‍රමයෙන් සිහින් වීමේ දී තියුණු මුවහතක් නිර්මාණය වීම නිරන්තරයෙන් දක්නට ලැබුණි (ගමගේ, 1997, පි. 62-63). මීට අමතර ව තුඩ ත්‍රිශූලාකාර හැඩයකින් ද, තරංගාකාර හැඩයකින් ද යුක්ත හෙල්ලයන් කන්ද උඩරට සෙබළා විසින් භාවිත කරන ලදි(හේරත්, 2014, පි. 60).මෙම විවිධ හැඩයන්ගෙන් යුත් හෙල්ල මගින් සතුරා වෙත පහරක් එල්ල කිරීමේ දී එමගින් සතුරාගේ ශරීරයේ ස්ථානයක් කැපීමකට ලක්වීමත්, හෙල්ලයක් ඍජුව ම සතුරාගේ ශරීරයට කිඳා බැස්සහොත් එය යළි පිටතට ඇදීමේ දී සතුරාගේ අභ්‍යන්තර ඉන්ද්‍රීන්වලට දැඩි හානි සිදුවීමත් හේතුවෙන් එය වැඩි හානි ගෙන දෙන අවියක් ලෙස සැලකේ(ගමගේ, 1997, පි. 63). විවිධ හැඩයන්ගෙන් යුත් හෙල්ල තල කිහිපයක් පහත රූප සටහනේ දක්වේ.



11 රූපය
විවිධ හැඩයන්ගෙන් යුත් හෙල්ලයන් (*The Sinhalese Army during the Portuguese, Dutch and the British*, n.d).

විෂ පෙවූ හෙල්ල පිළිබඳ ව ශ්‍රී ලංකා ඉතිහාසයෙන් සාක්ෂි හමුනොවුන ද බුරුමයේ දී විෂ පෙවූ හෙල්ල භාවිත කළ බවට ඉතිහාසයේ සඳහන් වේ. එසේ ම ජාවක සෙබළුන් විසින් විෂ පෙවූ හී තල විදීමේ දී දේශීය සෙබලුන් තියුණු තුඩ ඇති හෙල්ල යොමවා ඒවා කැබලි වලට කඩා දැමූ බවට ද ඉතිහාස සටහන් හී දක්වා තිබේ(කුලතුංග, 1988, පි. 136).ඒ අනුව පෙනී යන්නේ දේශීය සෙබළා විසින් විෂ පොවන ලද හෙල්ල භාවිත නොකළ අතර විෂ යෙදූ අවි වලට එරෙහිව සතුරා සමග පරතරය පවත්වා ගනිමින් සටන් කිරීම සඳහා හෙල්ල මනා යුද අවියක් ලෙස යොදා ගත් බවයි. තව ද කන්ද උඩරට සෙබළා විසින් යොදා ගන්නා ලද කෙටි හෙල්ලයක් පිළිබඳ ව ද මහනුවර යුගයේ සටන් වලදී සාක්ෂි හමුවේ. එය කැලෑ වල දී පහසුවෙන් හැසිරවිය හැකි ලෙස සකසා තිබූ බව සඳහන් වේ (ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය, 2014, පි. 42). මේ අනුව පැහැදිලි වන්නේ කන්ද උඩරට සෙබළා තමන්ගේ අවශ්‍යතාවය අනුව හෙල්ල නිමවා ගන්නා ලද බවයි.

බටහිර සෙබළාගේ හෙල්ල පිළිබඳ දැනුම ද පුළුල් මට්ටමක පැවති බව ඔප්පු කරන වැදගත් ම සාධකයක් වන්නේ හෝමර්ගේ ඉලියඩ් කෘතිය පරිදි දිගු හෙල්ල අතින් ගත් සෙබළුන් ක්‍රි.පූ 359-336 කාලයේ දී බටහිර යුද භූමියේ සිටියේය යන්නයි (Mark, 2012).පසුකාලීන ව එය කොතෙක් දියුණු වූයේ ද යත් හෙල්ල අතින් ගත් අශ්වාරෝහක සෙබළුන් සරඹානුකූල ව සටන් සඳහා මෙහෙයවන ලදි (Newark, 2009, pp. 176-179). මීට අමතර ව නයිට්වරුන් විසින් මීටර් 3 ක් පමණ දිගු හෙල්ල භාවිත කරන ලද අතර අශ්වාරෝහකයින් පළවා හැරීමේ උපක්‍රමයක් වශයෙන් යොදාගන්නා ලද දිගු හෙල්ල සහ පළිහ භාවිත වූ ආරක්ෂක ක්‍රමවේදයක් ද බටහිර හමුදාවන් විසින් උපයෝගී කරගන්නා ලදි(*Repel Cavelry*, 2008). නමුත් කන්ද උඩරට සෙබළා විසින් භාවිත කරන ලද්දේ ඔහුට ම ආවේණික වූ කෙටි හෙල්ලයකි(ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය, 2014, පි. 42). එය බටහිර සෙබළාගේ දිගු හෙල්ලයට සාපේක්ෂ ව කඳුකර භූමිය තුළ සහ කැලෑ සහිත ප්‍රදේශයන් හී පහසුවෙන් ගෙනයා හැකි මෙන් ම සතුරාට එරෙහි ව පහසුවෙන් හැසිරවිය හැකි ආයුධයක් වූයේ ය.

ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ සඳහන් වන තවත් ආයුධයක් වන්නේ සිරිය යි. සිරිය යන්නට කිරිච්චිය, ජුරිකාව, අසිපුත්තික වැනි වචන ද විවිධ අවස්ථාවල දී භාවිත වී තිබේ(කුලතුංග, 1988, පි. 136).සිරිය යනු කිනිස්සක් ආකාරයට නිපදවන ලද තරමින් කුඩා වූ කඩුවක් වැනි අවියකි(De Silva, 1971, p. 81).මෙය රාජකීයන් විසින් භාවිත කළ අවියක් බවට වැඩි සාක්ෂි පවතින අතර පළමු වැනි විජයබාහු නමින් රජ වූ කීර්ති කුමාරයාට උත්සවාකාරයෙන් ජුරිකාව පැළඳූ බවත්, සටනින් පැරදුණු සීගිරි කාශ්‍යප රජු තම ජුරිකාවෙන් ගෙල සිඳගත් බවත් දැක්වීමෙන් මෙය රාජකීය අවියක් ව පැවති බව තවදුරටත් තහවුරු වෙයි (කුලතුංග, 1988, පි. 136-137).

සිරිය රාජකීය බව දැක්වීම සඳහා අලංකාර ව නිපදවන ලද ආයුධයක් විය. එහි මිට බොහෝ විට කැටයම් වලින් හැඩදමා තිබෙන අතර දැවයෙන්, ගෝන අඟෙන්, හරක් අඟෙන් සහ ඇත් දළෙන් ද නිමවා තිබේ (ජයතිස්ස, 2011).සිරිය තලය අනුව විවිධ ආකාරයන්ගෙන් යුක්ත වේ. ඒවා කිහිපයක් පහත පරිදි වෙයි.

1. තරංගාකාර තලය සහිත සිරිය.

2. තුන් හුලස් තලය සහිත සිරිය.

3. තුඩ කරා ක්‍රමයෙන් සිහින් වී යන කැපෙන මුව සහිත තලය ඇති සිරිය.

4. මුදුන කපා දමූවාක් වැනි තුඩකින් යුතු සෘජු මුව සහිත තලය ඇති සිරිය.

5. අන්‍ය ලෝහ ඔබ්බවා කරන ලද සැරහුම් පටි මිටෙන් යුතු සිරිය(ගමගේ, 1997, පි. 65).

සිරිය රාජකීයන් විසින් භාවිත කළ ආයුධයක් වශයෙන් පැවතිය ද උසස් නිලධාරීන් විසින් ද තම තත්වය පෙන්වන ආකාරයට කැටයම් කරන ලද සිරියක් භාවිත කළ බවට සාක්ෂි හමුවේ(හේරත්, 2014, පි. 60-61).රාජකීයන් විසින් සහ ඉහළ නිලධාරීන් විසින් තම ප්‍රධාන ආයුධයට අමතර ව සිරිය භාවිත කළ බැවින් එය පුද්ගලික ආරක්ෂාව වෙනුවෙන් භාවිත කළ කුඩා ආයුධයක් බව අනුමාන කළ හැකිය(ජයතිස්ස, 2011).මීට අමතර ව රටේ සාමාන්‍ය ජනයා විසින් ද කුඩා පිහියක් භාවිතයට හුරුව සිටි නමුත් එය සිරිය භාවිත කරන අරමුණු වලින් හෝ සිරිය වැනි ආකාරයට කැටයම් වලින් හෝ යුක්ත නොවීය. එසේ වුව ද, මහාපරාක්‍රමබාහු රජ දවස ජුරිකා සන්නද්ධ දහස් ගණනකින් යුත් හමුදා බලඇණික් තිබූ බවට ඉතිහාසයේ සඳහන් වීමෙන් මෙම අවිය යුද අවස්ථාවන් සඳහා ද යොදා ගත් බවට ඉතිහාසයෙන් සාක්ෂි සපයා ගත හැකි ය(කුලතුංග, 1988, පි. 137).සිරියක දළ රූපයක් සහ එය භාවිතයට අල්ලා ගන්නා ආකාරය පහත පරිදි වේ.



12 රූපය

සිරිය

කඩුව, දුනු ඊතල, හෙල්ල සහ සිරිය යන සුලභ ආයුධ හතර හැරුණු විට යුද භූමියෙ තුළ භාවිත කරන ලද වෙනත් අවි ආයුධ බොහොමයක් තිබේ. ඒ අතුර සතුරා වෙත දුර සිට පහර දීමට භාවිත කළ පාරාවළල්ල සහ චක්‍රායුධය විශේෂත්වයක් ගනී. ලෝහයෙන් නිර්මාණය කරන ලද මෙම ආයුධ ද්විත්වය ම වක්‍රාකාර හැඩයකින් යුක්ත වන අතර සතුරා වෙත විසිකිරීමට හැකි වන පරිදි මෙවායේ මධ්‍යයේ රවුම් සිදුරක් ඇත (ගමගේ, 1997, පි. 63). පරිධිය තියුණු මුවහත් තලයක් ආකාරයට නිමවා ඇති බැවින් සතුරා වෙතට ක්ෂණයෙන් විසි කිරීම මගින් හානි පැමිණවිය හැකි ආයුධ ලෙස මේවා භාවිත කර තිබේ. මෙම ආයුධ ද්විත්වයම එක සමාන වන අතර පාරාවළල්ලෙහි පරිධිය දැති සහිත ආකාරයට නිමවා ඇති නමුත් චක්‍රායුධයෙහි පරිධිය දැති නොතබා තියුණු මුවහතක් පමණක් පිහිටන සේ නිමවා තිබේ (විමලානන්ද, 1962, පි. 434). උඩරට නර්ථන ශිල්පයෙහි එන පන්තේරු නර්ථනයේ යෙදෙන ශිල්පීන් විසින් භාවිත කරන පන්තේරුව මෙම හැඩයට බොහෝ දුරට සමාන කමක් දක්වයි. යුද අවස්ථාවන් හී දී යොදාගත් උපකරණයන් නර්ථන අංග ආදියෙන් ජනගත වී තිබීමක් මෙහි දී දැකගත හැකි බව පෙනේ. පන්තේරු නර්ථන ශිල්පියෙකුගේ ඇඳුම් ආයිත්තම් සහ පන්තේරුව පහත රූප සටහනෙහි දක්වේ



13 රූපය

පන්තේරු නර්ථන ශිල්පියා(*Kandyan Dancer*, n.d).

පාරාවළල්ල සහ චක්‍රායුධය වැනි ආයුධ පහසුවෙන් ගෙනයා හැකි ආයුධ වීමත්, සැඟවී පහරදීමක දී මනා උපයෝගීතාවයක් ලබාගත හැකි ආයුධ වීමත් හේතුවෙන් ඒවා කන්ද උඩරට සෙබළාගේ ප්‍රහාරාත්මකබව වැඩිදියුණු කළ ආයුධ වශයෙන් සැලකිය හැකිය. මීට සමාන ආයුධයන් භාවිතයක් බටහිර සෙබලුන් කෙරෙන් දෘෂ්‍යමාන නොවන්නේ ඔවුන්ගේ යුද අත්දැකීම් මත එවැනි ආයුධයන් දියුණු වීමට ඉඩකඩ නොතිබූ බැවින් විය හැකිය. එබැවින් මෙවැනි අතිරේක ආයුධයන් කන්ද උඩරට සෙබළාගේ ප්‍රහාරාත්මක ශක්තිය විවිධාංගීකරණයකට ලක්කරන ලද අතර එය ඔහු වෙත පැවති අමතර යුද වාසියක් වශයෙන් හඳුන්වාදිය හැකිය.

සතුරු පාර්ශවය වෙත ගොස් ප්‍රහාර එල්ල කිරීමේ දී කන්ද උඩරට සෙබළා විසින් භාවිත කළ තවත් ආයුධයක් වූයේ මුගුර යි. ගදාව, බලතඩි යන නම් වලින් ද හැඳින්වූ මෙය ලීයෙන් නිමවන ලද ආයුධයක් විය. භාවිත කරන්නා විසින් ග්‍රහණය කරගන්නා කොටස පහසුව තකා සිහින් ව නිමවූත්, ක්‍රමයෙන් පහළට යත් ම විශාල වන ආකාරයට නිමවූත් මුගුර අගින් විශාල වූ බැවින් සතුරා වෙත

පහර දීමේ දී මරණීය හානි පැමිණවිය හැකි ආයුධයක් විය(හේරත්, 2014, පි. 61).මෙය තරමක් විශාල වූ සහ බරෙන් වැඩි වූ ආයුධයක් බැවින් එකල යුද භූමිය වෙත ගිය සිංහල සෙබළුන් ශක්තිසම්පන්න පිරිසක් වූ බවට ද මෙය කදිම සාක්ෂියකි. මෙම මුගුර ක්‍රමයෙන් වැඩි දියුණු කර ගැනීමෙන් සතුරා වෙතට විසිකර පහර දීමට හැකි ආයුධයක් නිපදවා ගන්නා ලදි. එය නමින් චන්ද්‍රවංකය නොහොත් බූමරංගය යැයි නම් කෙරිණ (ගමගේ, 1997, පි. 69). මෙය සතුරා වෙතට එල්ල කිරීමෙන් සතුරාට මරණීය හානි පැමිණවීමේ හැකියාව පැවතියා මෙන් ම පහර වැදීමෙන් පසු මෙම ආයුධය නැවත ප්‍රහාරකයා අතට පැමිණීම සුවිශේෂී ලක්ෂණයක් විය (විමලානන්ද, 1962, පි. 422).

එබැවින් මෙම ආයුධය කන්ද උඩරට ප්‍රදේශයේ පහසුවෙන් ගෙනයාහැකි මෙන් ම නැවත නැවත භාවිත කිරීමට හැකි ආකාරයට නිපදනවා ගන්නා ලද ආයුධයක් බව පෙනී යයි. බටහිර හමුදාවන් කෙරෙන් මෙවැනි සරල තාක්ෂණයක් ප්‍රදර්ශනය නොවන අතර ඔවුන් විසින් බටහිර භූමියේ දී දියුණු කරන ලද අවි ආයුධ බොහොමයක් කන්ද උඩරට දී අවලංගු තත්වයකට පත්වූවා මිස අවි ආයුධ අතින් විවිධාංගීකරණයක් පවත්වා ගැනීමට ඔවුන් අසමත් වූ බව දක්නට ලැබේ.



14 රූපය

බූමරංගය නොහොත් චන්ද්‍රවංකය

කන්ද උඩරට සෙබළාගේ ආයුධ අතර පැවති තවත් ආයුධ වර්ගයක් වූයේ රණ පොරව යි. මේවා තලය අනුව විවිධ ආකාරයන්ගෙන් යුක්ත වන අතර සාමාන්‍ය පොරවක හැඩයට නිමවන ලද නමුත් යුද භූමිය තුළ කාර්යක්ෂම ව භාවිත කළ හැකි පරිද්දෙන් මේවා දියුණු කර තිබේ. මෙම රණ පොරවෙහි තලය අඩසඳ ආකාරයට, ඍජුකෝණාස්‍රාකාරයට හෝ ත්‍රිකෝණාකාරයට නිපදවන ලද අතර අවශ්‍ය අවස්ථාවකදී සතුරා වෙතට දමා ගැසීමේ හැකියාව ද මෙම ආයුධ භාවිත කරන්නාට ලැබුණි. අත් පොරව, කෙටේරිය, කොණ්ඩ කෙටේරිය වැනි ආයුධ ද රණ පොරොවෙහි ලක්ෂණයන්ගෙන් යුක්ත වූ වෙනත් ආයුධ විය(ගමගේ, 1997, පි. 69).

ගල් පටිය නම් ආයුධය මගින් තරමක් විශාල ගල් කැට වැඩි වේගයකින් සතුරා වෙත එල්ල කර හානි පැමිණ විය හැකි විය. එම ආයුධය දෙපසට ලණු දෙකකින් යුක්ත වූ අතර මැද කොටස ගල් කැටයක් රැඳවිය හැකි ආකාරයට පට්ටා හෝ කෙඳි වලින් වියන ලද තට්ටුවකින් සමන්විත වේ. එම කොටසෙහි ගල් කැටය රඳවා ලණු වලින් අල්ලා වට කිහිපයක් කැරකවීමෙන් ශක්තිය නිපදනවා ගෙන ඉලක්කය ගෙන සතුරා වෙතට එල්ල කිරීමක් මෙහිදී සිදු වෙයි (හේරත්, 2014, පි. 61-62).මෙවැනි උපකරණයකින් ගල් කැටයක් ඉලක්කයකට එල්ල කිරීම යනු ඒ සඳහා ම වූ ප්‍රාගුණ්‍යයකින් හෙබි අයෙකුට විනා අනෙකෙකුට කළ හැක්කක් නොවන බව පැහැදිලි ව පෙනේ.

මෙම ආයුධය භාවිතය පහසු වීමත්, අඩු බරකින් සහ උපාංගයන්ගෙන් යුත් උපකරණයක් වීමත්, ගල් කැට ඕනෑම තැනකින් සපයා ගැනීමට පහසු වීමත්, සැඟවී සිට පහර දීමක දී කිසිඳු හඬක් නොනැඟීමත්, ප්‍රහාරකයා හසු නොවන පරිද්දෙන් සූක්ෂම ව ප්‍රහාර එල්ල කිරීමට හැකිවීමත් යන කරුණු නිසා කන්ද උඩරැටියන් විසින් කැලෑ තුළ සිදු කරන ලද සටන් වලදී මනාව යොදා ගන්නා ලද උපකරණයක් වේ(ගමගේ, 1997, පි. 61).

මෙවැනි ආයුධයන් කන්ද උඩරට සෙබළාගේ ප්‍රායෝගික යුද ඥානය මනාව විදහා දක්වන අතර ප්‍රහාරය සිදුකිරීමට අවශ්‍ය වන ගල් ඕනෑම ස්ථානයකින් ක්ෂණයෙන් සපයා ගැනීමේ හැකියාව පවතින බැවින් ඒවා ඔසවාගෙන යෑමක් අවශ්‍ය වන්නේ නැත. එසේ ම ඒ සඳහා භාවිත වන උපකරණය ද සැහැල්ලු උපකරණයක් වන බැවින් රැගෙන යෑමේ පහසුව ද පවතී. කන්ද උඩරට භූමියේ දී තමන්ට වාසි ලබාගත හැකි ආකාරයේ ආයුධයන් නිර්මාණය වෙනුවෙන් කන්ද උඩරට සෙබළා දක්වන ලද සමර්ථකම මේවායින් මනාව පිළිඹිබු වේ.

මේ අනුව බැලීමේ දී කන්ද උඩරට සෙබළා විසින් භාවිත කරන ලද සාම්ප්‍රදායික අවි ආයුධ අතර කඩුව, දුනු ඊතල, හෙල්ල, සිරිය, පාරාවළල්ල, චක්‍රායුධය, මුගුර, චන්ද්‍රවංකය, රණ පොරව හා ගල් පටිය වැනි බොහොමයක් අවි ආයුධ පැවති බව පෙනේ. ඓතිහාසික යුගයේ සිට ක්‍රමයෙන් දියුණු වෙමින් පැමිණි මෙම අවි ආයුධ භාවිත කිරීමේ කලාවන් පාරම්පරික උරුමය මත මනාව හැදෑරූ දක්ෂ සෙබළුන් කන්ද උඩරට හමුදාවෙහි සිටි අතර යුද අවස්ථාවන් හී දී එම ආයුධයන් උපක්‍රමික ව සහ කාර්යක්ෂම ව භාවිත කරන ලදි. මේ අනුව කන්ද උඩරට හමුදාව විවිධාකාර වූ සාම්ප්‍රදායික අවි ආයුධ විශේෂ ප්‍රාගුණ්‍යයකින් යුක්ත ව හැසිරවීමට සමත් පිරිසක් වූ බව නිගමනය කළ හැකිය.

ඉහත කී අවි ආයුධ සමගින් යුද ආරක්ෂක මෙවලම වශයෙන් බහුල වශයෙන් යොදා ගන්නා ලද්දේ පලිහ යි(හේරත්, 2014, පි.68).පලිහ යුද ආරක්ෂක මෙවලමක් වශයෙන් යොදා ගත් බව මන්දාරම් පුවතෙහි එන කවි වල ද පැහැදිලි ව දක්වා තිබේ (ලබුගම ලංකානන්ද, 1998, පි. 109). ඇම්බැක්කේ දේවාලයේ කැටයම් අතර පලිහක් අතින් ගත් කඩු හරඹයෙහි යෙදෙන සෙබළෙකුගේ රූපයක් තිබීමෙන් ද, රිදී විහාරයේ කඩු හරඹකරුවන්ගේ චිත්‍රයෙහි පලිහ දරමින් සිටින සෙබළුන්ගේ රූපවලින් ද, මහනුවර කෞතුකාගාරයේ දක්නට ලැබෙන පලිස් වලින් ද පැහැදිලි වන්නේ පලිහ යන්න කන්ද උඩරට සෙබළා විසින් බහුල ව භාවිත කළ යුද ආරක්ෂක මෙවලම වන බවයි (ගමගේ, 1997, පි. 70).කඩුව සහ පලිහ දරමින් සටන් කරන දේශීය සෙබළෙකුගේ ස්වරූපය දැක්වෙන ඇම්බැක්කේ දේවාලයේ ඇති ලී කැටයමක් පහත රූපයෙන් දැක්වේ.



15 රූපය

ඇම්බැක්කේ දේවාලයේ ලී කැටයමක්

රිදීයෙන් නිමවන ලද පලිස් (හේරත්, 2014, පි. 68)උත්සව අවස්ථාවන්ට සහ ප්‍රභූන්ගේ තත්වය නඩත්තු කිරීම වෙනුවෙන් භාවිත වූ බව අනුමාන කළ හැකි අතර දැවයෙන්, පදම් කරන ලද සත්ව හම් වලින් සහ මෘදු ලෝහයෙන් නිමවූ පලිස් (ගමගේ, 1997, පි. 71)යුද අවස්ථාවන්ට යොදා ගත් බව අනුමාන කළ හැකිය. කෙසේ වුව ද පලිහ මගින් ද්වන්ධ සටන් වල දී ප්‍රතිපාර්ශවයෙන් එල්ල වන කඩුව, හෙල්ල වැනි ආයුධ වලින් විය හැකි අනතුරු වලක්වාලීම බලාපොරොත්තු වූ බව පැහැදිලි ය. කන්ද උඩරට සෙබළුන් විසින් භාවිත කරන ලද සැහැල්ලු සහ ප්‍රමාණයෙන් විශාල නොවූ පලිහ දුර සිට එල්ල වල කෙටි හෙල්ල හෝ ඊතල ප්‍රහාර වලින් මුළුමනින් ම ආරක්ෂාවීමේ අරමුණින් භාවිත කළ බවක් දැකගත නොහැකි වීම ද විශේෂත්වයකි. බොහෝ විට කැලෑ ආශ්‍රිත සැඟවී සිට පහර දීම් ක්‍රමවේදය අනුගමනය කළ බැවින් සහ විවෘත භූමියක මෙන් ඊතල හෝ හෙල්ල විදීම් වලින් ආරක්ෂාවීමේ අවශ්‍යතාවයක් නොවූ බැවින් විශාල පලිස් ඔසවාගෙන යෑම එලරහිත වූ බව නිගමනය කළ හැකිය.

මීට අමතර ව යුද ආරක්ෂක මෙවලම් වශයෙන් යොදා ගන්නා ලද පැළඳුම් කිහිපයක් පිළිබඳ ව ද විවිධ ස්ථානයන් හී සටහන් දැකගත හැකි වුව ද කන්ද උඩරට සෙබළා සන්නාහයෙන් සැරසී විවෘත යුද භූමියක සටන් වැදීම බොහෝ විට සිදු නොකළ බැවින් සන්නාහ ඇඳුම් හෝ යුද ආරක්ෂක මෙවලම් ඔසවාගෙන යෑම අනවශ්‍ය කාරණාවක් ලෙස සැලකූ බව පෙනේ. කීරොස් මෙම තත්වය වෙනත් කෝණයකින් විස්තර කරයි. ඔහු සඳහන් කරන්නේ යුද්ධයේ දී යුද ආරක්ෂක සන්නාහ භාවිත කිරීමක් කන්ද උඩරට සෙබළා විසින් සිදු නොකරන්නේ එය භය හා දුර්වලබව පිළිබඳ සලකුණක් යැයි ඔවුන් විසින් සැලකූ බැවින් බවයි (විමලානන්ද, 1962, පි. 439). කෙසේ වුව ද බුළුලෙනගල රජමහ විහාරය, ඇම්බැක්කේ දේවාලය, හඟුරන්කෙත රජමහ විහාරය, කුණ්ඩසාලේ ශ්‍රී නරේන්ද්‍රසිංහ රජමහ විහාරය වැනි ස්ථානයන් හී ඇති කැටයම් සහ චිත්‍ර වලට අනුව දේශීය සෙබලුන් විසින් ලෝහ වළලු, උරමාල, හිස් ආවරණ, බඳ පටි වැනි සන්නාහයෙන් කරන ලද ආරක්ෂක මෙවලම් භාවිත කළ බවට සාක්ෂි ලැබේ (ගමගේ, 1997, පි. 70-71;හේරත්, 2014, පි. 66-69).කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස (ක්‍රි.ව 1747-1782) ඉදිකරන ලද කුණ්ඩසාලේ ශ්‍රී නරේන්ද්‍රසිංහ රජමහ විහාරයේ ද්වාර ආරක්ෂක පිළිම පහත රූපයෙන් දැක්වේ.



16 රූපය
කුණ්ඩසාලේ ශ්‍රී නරේන්ද්‍රසිංහ රජමහා
විහාරයේ ද්වාර ආරක්ෂකයින්

මෙම යුද ආරක්ෂක සන්නාහ පිළිබඳ තවත් වැදගත් සාක්ෂියක් වන්නේ උඩරට නර්ථන ශිල්පීන් විසින් පළඳින වෙස් ඇඳුම් කට්ටලයේ කොටස් ය. ක්‍රි.පූ 504 - 474 දක්වා වූ පණ්ඩුවාසදේව රජ දවස රජුට වැළඳුණ දිවි දෝශය දුරු කිරීමට පවත්වන ලද හැටපස් මංගල්‍යයේ දී ද, ක්‍රි.ව 1402 - 1467 දක්වා වූ 6 වැනි පරාක්‍රමබාහු රජුට සිදු කරන ලද කොහොඹායක් කංකාරියේ දී ද උඩරට නර්ථන ශිල්පියාගේ වෙස් ඇඳුම් කට්ටලය භාවිත කරන ලදි (අභයරත්න, 2009).මේ අනුව පෙනී යන්නේ එය කන්ද උඩරට රාජ්‍යයේ ආරම්භයට පෙර සිට භාවිත වූ බවයි. යුද ආරක්ෂක සන්නාහ අතින් බැලීමේ දී එය කොතෙක් දුරට අදාළ ද යන්න පහත රූප සටහනින් පැහැදිලි කර ගත හැකිය.



17 රූපය

උඩරට වෙස් නර්ථන ශිල්යාගේ ඇඳුම් ආයිත්තම්(*Kandyan Dancer*, n.d).

කෙසේ වුවද සමස්තයක් ලෙස බැලීමේ දී යුද ආරක්ෂක සන්නාහ සහ ආරක්ෂක මෙවලම් කන්ද උඩරට සෙබළාගේ ක්‍රියාකාරීත්වය සමග කොතෙක් දුරට ප්‍රායෝගික ව භාවිත කළ හැකි ද යන්න විමර්ෂණය කිරීම වැදගත් වේ. කන්ද උඩරට සෙබළා බොහෝ දුරට කැලෑ ආශ්‍රිත ව සැඟවී සිට පහර දීම මූලික ම යුද ක්‍රමවේදය වශයෙන් භාවිත කළ බැවින් සහ කඳු, දුර්ග, කැලෑ වැනි ස්වාභාවික ව දුෂ්කර පරිසරයක සටන් වැදීමට සිදු වීම හේතුවෙන් ඔහුට නිතැතින් ම ආරක්ෂාවක්

සැලසී තිබූ බව පැහැදිලි වේ. එබැවින් ඔහුගේ අවශ්‍යතාවය වූයේ ක්ෂණිකව ගමන් කිරීමේ හැකියාව පවත්වා ගැනීම සහ සතුරා වෙත විශ්මය දනවන ආකාරයේ ප්‍රහාරයන් එල්ල කිරීමයි. මෙහි දී ඔහු බොහෝ විට ප්‍රහාරාත්මක තත්වයක සිට පළමු ප්‍රහාරය ඔහු විසින් එල්ල කරන ලද බැවින් ප්‍රතිප්‍රහාරයකින් වැලකීමේ සූදානමක් ද ඔහු සතු වූ බව පෙනේ. එබැවින් කන්ද උඩරට සෙබලාගේ සටන් ක්‍රමය අනුව ම ආරක්ෂක මෙවලම් වල අවශ්‍යතාවය අවම මට්ටමක තිබූ බව පෙනේ. අනෙක් අතට තම සැහැල්ලු බව පවත්වා ගැනීමට අසීරු වන සන්නාහ ඇඳුම් සහ උපකරණයන් ඔහුට අමතර වෙහෙසක් ජනිත කරන ලද බැවින් ද, සන්නාහ ඇඳුම් ඇඟලාගෙන කැලෑ සහිත ප්‍රදේශයන් හී ක්ෂණික ගමන් හැකියාව පවත්වා ගැනීමේ අපහසුව ඇති බව බැවින් ද කන්ද උඩරට සෙබළා සන්නාහ ඇඳුම් ආයිත්තම් සහ උපකරණ භාවිතය අවම මට්ටමක පවත්වා ගන්නා ලද බව අනුමාන කළ හැකිය. නමුත් සන්නාහ ඇඳුම් සහ යුද ආරක්ෂක උපකරණයන් පිළිබඳ සාක්ෂි හමුවීමත් කලා ශිල්ප ඔස්සේ ඒවා ජනගත වී තිබීමත් හේතුවෙන් එවැනි තාක්ෂණයක් ශ්‍රී ලංකාවේ තිබූ බව බැහැර කරලිය නොහැකි වන්නේ ය.

නමුත් බටහිර සෙබළා සම්බන්ධයෙන් බැලීමේ දී තත්වය මීට හාත්පස වෙනස් වන්නේ ය. බටහිර සෙබළා විසින් බටහිර විවෘත යුද භූමිය අරඹයා නිර්මාණය කරන ලද ආරක්ෂක මෙවලම් රාශියකි. ඒ අතුරෙන් සන්නාහ ආවරණයන්ට සුවිශේෂී ස්ථානයක් ලැබෙන අතර සන්නාහ තහඩුවෙන් නිමවන ලද හිස්වැසුම් සහ බඳ ආවරණයන් ඒ අතුරෙන් මූලිකත්වයක් ගනී(Medieval warfare Armour and shields, n.d). සන්නාහ තහඩුවෙන් සහ දම්වැල් ආකාරයට සකසා කය ආවරණයන් නිර්මාණය කර තිබූ ආකාරය පහත රූප සටහන් වලින් පැහැදිලි වේ.




18 රූපය

හිස් ආවරණයක්.



19 රූපය

දම්වැලින් නිමවූ කය ආවරණයක්.



20 රූපය

සන්නාහ අත් ආවරණයන්.



21 රූපය

මුළුමනින් ම සන්නාහයෙන් ආවරණය වූ නයිට්වරයෙකුගේ ඇඳුම.

මෙය සන්නාහ ආවරණයන් වශයෙන් සැලකු කල ඉතා දියුණු තත්වයක් වුව ද කන්ද උඩරට ප්‍රදේශයේ සටන් සඳහා භාවිත කිරීමේ හැකියාව අතින් බැලීමේ දී බටහිර ජාතීන්ගේ බර අවි මෙන් ම අවලංගු තත්වයකට පත්වන බව පෙනී යයි. සන්නාහ ආවරණයන්ගේ ලක්ෂණය වන්නේ ඒවායේ අධික බර සහිත බවයි. එබැවින් කන්ද උඩරටට ආවේණික කඳු සහිත භූමිය තරණය කරනු වස්

මෙවැනි බර සන්නාහ ආවරණයන් යොදා ගැනීමෙන් හමුදාවෙහි ගමනාගමන වේගය බිඳ වැටී ඉන්ලැබෙන ආරක්ෂාවට වඩා වැඩි අවදානමකට හමුදාවක් පත්වීමේ ඉඩකඩක් පවතී. එබැවින් ආරක්ෂක මෙවලම් දියුණු කිරීම සම්බන්ධයෙන් කන්ද උඩරට සෙබළා සාපේක්ෂව අඩු දියුණුවක් පෙන්වූව ද එය ප්‍රායෝගික යුද ඥානය අතින් බැලීමේ දී වැඩි දියුණුවක් යැයි පැහැදිලි ව පෙනේ.

කන්ද උඩරට සෙබළා විසින් භාවිත කරන ලද ප්‍රධානත ම අවියක් වන්නේ තුවක්කුව යි. තුවක්කුව යන්න දේශීය සෙබළා විසින් භාවිත කිරීම ආරම්භ වන්නේ පෘතුගීසී ආගමනයෙන් පසු කාලයේ දී ය (ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය, 2014, පි. 39). පෘතුගීසීන් කොළඹින් ගොඩබැසීමෙන් පසු ඒ බව කෝට්ටේ රජු වෙත සැලකර සිටි පණිවිඩකරුවන් විසින් කාලතුවක්කු නම් වෙඩිලි ශබ්දය යුගන්ධර පර්වත හෙණ හඬටත් වඩා වැඩි බවත්, ඒවායේ උණ්ඩ ගව් ගණන් දුර ගොසින් විශාල හානි සිදු කරන බවටත් දන්වා සිටින ලදි (සුරවීර, 1997, පි. 214).මෙම හඳුන්වාදීමට අනුව පැහැදිලි වන්නේ ඒ වන විටත් කාලතුවක්කුව යන අවිය ශ්‍රී ලංකාවේ ජනයා විසින් දැකනොතිබූවක් වන බවයි. එබැවින් ඒ වන විටත් කාලතුවක්කු භාවිතයක් ශ්‍රී ලංකාවේ සිදු නොවූ බව විග්‍රහ කරගත හැකි වුවත් දේශීය නිෂ්පාදනයක් ලෙස සැලකෙන බොන්ඩික්කුල නම් තුවක්කුවර්ගය සඳහා යොදන ලද නම අරාබි භාෂාවෙන් බිඳී ආ වචනයක් වන නිසාත් (ගමගේ, 1997, පි. 71), පෘතුගීසීන්ගේ පැමිණීමට පෙරාතුව අරාබීන් ශ්‍රී ලංකාවේ වෙළඳ කටයුතු සඳහා සම්බන්ධ වූ නිසාත්, පෘතුගීසීන් මගින් තුවක්කු තාක්ෂණය ලද බව ප්‍රශ්ණ සහගත තත්වයකට පත්වේ. අනෙක් අතට තුවක්කු යන වචනය පෘතුගීසී සම්භවයක් සහිත වචනයක් නොවන බවත් එය තුපක් යන තුර්කි වචනයෙන් බිඳී ආ වචනයක් වන බවටත් මතයක් තිබේ (අබේසිංහ, 2006, පි. 104). කෙසේ වුව ද දේශීය සෙබළා විසින් තුවක්කු භාවිතය පිළිබඳ ව සාක්ෂි හමුවන්නේ පෘතුගීසීන්ගේ ආගමනයෙන් පසු කාලයේ දී ය.

කන්ද උඩරට හමුදාව සම්බන්ධයෙන් බැලීමේ දී තුවක්කු වර්ග 4 ක් පිළිබඳ ව විස්තර සපයා ගත හැකිය. ඒවා නම්,

1. කාලතුවක්කුව - ප්‍රමාණයෙන් විශාල කාලතුවක්කු (De Silva, 1971, p. 80).

2. කොඩිතුවක්කුව සහ බොන්ඩික්කුල තුවක්කු - ප්‍රමාණයෙන් කුඩා සැහැල්ලු කාලතුවක්කු (ජයතිස්ස, ගුණපාල, 2011).


3. ගල්තුවක්කු - බටහිර මැච්ලොක් තුවක්කුවේ හැඩයට සමාන දේශීයව නිපදවූ අවියකි (ගමගේ, 1997, පි. 67-68).

4. අත්තුවක්කුව - බටහිර පිස්තෝලය අනුකරණය කොට නිපදවූ අවියකි (Wickremesekera, 2004, P. 95).

උඩරැටියන් විසින් තුවක්කු නිෂ්පාදනය සහ භාවිතය සිදු කරන ලද්දේ පෘතුගීසීන්ගේ පැමිණීමෙන් පසුව වුව ද ඔවුන් විසින් කෙටි කාලයක් තුළ එය මනාව දියුණු කරගන්නා ලද බව ඉතිහාස වාර්තා වලින් පැහැදිලි වේ. ද සා මෙනිසස් විසින් සඳහන් කරන්නේ සිංහලයින් අවි පරිහරණය පිළිබඳ ව ප්‍රමාණවත් දැනුමක් සහිත ජනකොටසක් වූ බවයි (ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය, 2014, පි. 40). රිබේරු දක්වන්නේ උඩරැටියන්ගේ ගිනිඅවි ඉතා ප්‍රබල මට්ටමක පැවති බවයි. එසේ ම ඔවුන් විසින් එල්ල කරන ලද ප්‍රහාර කෙතරම් බලවත් වූයේ ද යත් ඒවායින් නොමැරී

බේරීම පවා ඉතා අපහසු වූ බව ඔහු පවසයි (Rebeiro, 1999, p. 263). මේ අනුව පැහැදිලි වන්නේ කෙටි කාලයක් තුළ කන්ද උඩරට හමුදාව විසින් තුවක්කු නිෂ්පාදන තාක්ෂණය දියුණු කර ගන්නා ලද බව සහ එය යුද භූමිය තුළ කාර්යක්ෂම ව භාවිත කිරීමේ කලාව ප්‍රගුණ කරන ලද බවයි.


කන්ද උඩරැටියන් විසින් භාවිත කළ කාලතුවක්කුව බර අවි සණයෙහි ලා සැලකිය හැක්කකි. මේවා පෘතුගීසීන්ගේ කාලතුවක්කු අනුකරණය කරමින් නිෂ්පාදනය කරනට ඇති බව අනුමාන කළ හැකිය. බර අවි කන්ද උඩරට ප්‍රදේශයෙහි ප්‍රවාහණය ගැටළුකාරී වූ බැවින් මෙම ආයුධ යොදා ගන්නා ලද්දේ කන්ද උඩරට වෙත පැවති ප්‍රවේශ මාර්ගයන් හී ආරක්ෂාව සැලසීම වෙනුවෙනි. මේවා එම ප්‍රවේශ මාර්ගයන් හී ස්ථානගත කොට ආරක්ෂාව සලසා ගත් බව සඳහන් ය (හේරත්, 2014, පි. 65-66). දේශීය සෙබළුන් විසින් භාවිත කළ කාලතුවක්කුවක හැඩය පහත රූපයෙන් දැක්වේ.



22 රූපය

කාලතුවක්කුව(*The Sinhalese Army during the Portuguese, Dutch and the British*, n.d).

කන්ද උඩරට ප්‍රදේශයේ දී කාලතුවක්කු භාවිතය සම්බන්ධයෙන් ප්‍රායෝගික ගැටළුවක් පැන නගින්නේ එහි පවතින භූගෝලීය තත්වය හේතුවෙනි. නමුත් උඩරට හමුදාව විසින් ඊට ගැලපෙන ආකාරයට නිෂ්පාදනය කරගන්නා ලද සැහැල්ලු කාලතුවක්කුව වූ කොඩිතුවක්කුව එකී භූගෝලීය බාධකය ජය ගැනීමට තරම් උපක්‍රමික නිෂ්පාදනයක් විය. එය යකඩින් හෝ පිත්තලෙන් නිර්මාණය කරන ලද කඳකින් සහ එය සවිකළ දැවමය මිටකින් යුක්ත වූ අතර ලෝහමය පාදයන් දෙකකින් ද යුක්ත විය(විමලානන්ද, 1962, පි. 439). උඩරට සෙබළා විසින් භාවිත කරන ලද බොන්ඩික්කුල තුවක්කුව බිම රැඳවිය හැකි පාදයන් සහිත ව නිර්මාණය වූවක් බව සඳහන් වන බැවින් එහි හැඩය ද බොහෝ දුරට කොඩිතුවක්කුවට සමාන වන බව පෙනේ(ගමගේ, 1997, පි. 53;හේරත්, 2014, පි. 64).කන්ද උඩරට හමුදාවෙහි භාවිත කළ කොඩිතුවක්කුවක හැඩය පහත පරිදි වේ



23 රූපය

කොඩිතුවක්කුව(*The Sinhalese Army during the Portuguese, Dutch and the British*, n.d).

රිබේරු දක්වන්නේ මෙය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විට බිම රඳවූ අවිය අසල දෙපා විහිදුවා හිඳගන්නා සෙබළා අවියෙහි පාද දෙක දෙපතුල් වලින් සිරකරගෙන එය ක්‍රියාත්මක කළ බවයි (Rebeiro, 1999, p. 53). මෙම අවියෙහි වූ විශේෂත්වය නම් අවශ්‍ය පරිදි කොටස් කර හෝ නොකර තනි පුද්ගලයෙකු විසින් මෙය රැගෙන යෑමේ හැකියාවයි(හේරත්, 2014, පි. 65).එබැවින් කන්ද උඩරැටියන්ට අනන්‍ය වූ සතුරා වෙත පහර දී ක්ෂණයෙන් පළා යෑමේ යුද උපක්‍රමයන්ට මෙය මනාව ගැලපුණි. ඔවුහු සතුරු හමුදාව වෙත විශාල හානියක් කොට කොඩිතුවක්කු කරේ තබාගෙන පළා ගියහ(මාෂල්, 2004, පි. 175).

මේ අනුව පෙනී යන්නේ කන්ද උඩරට සෙබළා විසින් බර කාලතුවක්කු සහ සැහැල්ලු කාලතුවක්කු වන දෙවර්ගය ම භාවිත කරන ලද බවයි. නමුත් බර කාලතුවක්කු තම රාජධානියේ ආරක්ෂාව සලසා ගනු වස් ස්ථිර ව ස්ථාපිත කොට පවත්වා ගන්නා ලද අතර ම එහා මෙහා ගෙනයමින් භාවිත කිරීම පහසු වන ආකාරයට සැහැල්ලු කාලතුවක්කු නිර්මාණය කර ගැනීමට ඔවුහු උපක්‍රමික වූහ. බටහිර ජාතීන් විසින් භාවිත කරන ලද බර කාලතුවක්කු කන්ද උඩරටට ප්‍රවාහණය අසීරු කටයුත්තක් වූ බැවින් එය කන්ද උඩරට දී අවලංගු බලයක් බවට පත්වුව ද ඔවුන්ගේ ආභාෂය ලද දේශීය කාලතුවක්කු ව කන්ද උඩරට භූමියට අනුගත කොට නිර්මාණය කරගැනීමට තරම් දේශීය ප්‍රායෝගික යුද ඥානයක් සංවර්ධනය වී තිබූ බව දක්නට ලැබේ.

දේශීය සෙබළා විසින් භාවිත කරන ලද ගල්තුවක්කුව බටහිර දී නිෂ්පාදනය වූ මැච්ලොක් තුවක්කුවේ හැඩයට සමාන වූ අතර එය භාවිතය ද තනිපුද්ගලයෙකු විසින් අත් හී සහ උරෙහි ආධාරයෙන් සිදු කරන ලද්දක් විය. වෙඩි තැබීමෙන් සිදුවන ප්‍රතික්‍රියාව අවම වන ලෙස සහ උරහිසෙහි සිරකර ඉලක්කය ගැනීමට පහසුවන ලෙස මෙම අවිය අවසානයේ පළල් රැඳවුමක් නිර්මාණය කිරීමට උඩරැටියන් සූක්ෂම විය (ගමගේ, 1997, පි. 68;Wickremesekera, 2004, pp. 107-110). දඹුළු විහාරයේ බිතු සිතුවම් හී ඇති ගල්තුවක්කුවක හැඩයට සමාන අවියක් භාවිත කරන අවස්ථාවක් පහත දැක්වේ.



24 රූපය

ගල්තුවක්කුව භාවිත කිරීම(ගමගේ, 1997, පි. 60)

කන්ද උඩරට සෙබළාගේ තුවක්කු නිෂ්පාදනයෙහි සංවර්ධිත ම අවධිය වශයෙන් දැක්විය හැක්කේ අත්තුවක්කු නොහොත් බටහිර භාවිත වූ පිස්තෝල ආකාරයේ අවිය නිෂ්පාදනය යි. මෙය සැඟවී සිට පහර දීමට මෙන් ම කැලෑබද ප්‍රදේශයන් හී භාවිතයට පහසු අවියක් වූවාසේම එය ප්‍රමාණයෙන් කුඩා සහ සැහැල්ලු අවියක් වූ බැවින් රැගෙන යෑම ද පහසු විය (Wickremesekera, 2004, pp. 95-100).

මේ ආකාරයට නිෂ්පාදනය කර භාවිත කරන ලද තුවක්කු වර්ගයන් කන්ද උඩරට හමුදාවෙහි ප්‍රහාරක බලය වැඩිදියුණු කළ සාධකයක් වුව ද තුවක්කු මත යැපීම අවම මට්ටමක පවත්වා ගැනීම කන්ද උඩරට හමුදාවේ විශේෂ ලක්ෂණයක් වශයෙන් දැකිය හැකිවිය. කෙසේ වුව ද බටහිර දී වර්ෂ ගණනාවක් තිස්සේ දියුණු කරන ලද ගිනි අවි දේශීය හමුදාව විසින් භාවිතයට ගෙන කෙටි කාලයක් තුළ සීඝ්‍ර දියුණුවක් ලද බව පැහැදිලි ය. එසේ ම මෙම අවි භාවිත කළ හමුදාවන් වෙන වෙනම රෙජිමේන්තු හෝ දෙපාර්තමේන්තු වශයෙන් බෙදා ඒවාට ප්‍රධානීන් පත් කිරීම ද සිදු කරන ලදි. ඒ අනුව වෙඩික්කාර ලේකම්, වඩනතුවක්කුකාර ලේකම්, කොඩිතුවක්කු ලේකම්, බොණඩික්කුල ලේකම් වශයෙන් තනතුරු කිහිපයක් ද ඇති කළ බව සඳහන් වේ(ඩේවි, 1966, පි. 158). මේ අනුව පෙනී යන්නේ කෙටි කාලයක් තුළ සංවර්ධනය වූවක් වුව ද තුවක්කු භාවිතය කන්ද උඩරට හමුදාව තුළ දී ක්‍රමවත් ව සහ සංවිධානාත්මක ආකාරයට හැඩගැසී තිබූ බවයි.

බටහිර හමුදාවන් හී තුවක්කු භාවිතය සන්සන්දනාත්මක ව විශාල දියුණුවක් ලබා තිබූ නමුදු ඒවා මුල්කාලයේ දී බාහිරින් ගිනි අවුලවන බරින් වැඩි ප්‍රවාහණය අපහසු ආකාරයේ ගිනි අවි විය (Newark, 2009, pp. 122). සමකාලීන ව බටහිර දියුණු කරන ලද මැච්ලොක්, වීල්ලොක් සහ ෆ්ලින්ට්ලොක් අවි ප්‍රවාහණය පහසු වුව ද ඒවා ද මන්දගාමී ප්‍රහාරක වේගයක් සහිත අවි වූ බැවින් (Chase, 2003, p. 32) සාපේක්ෂ ව කන්ද උඩරට කැලෑ ප්‍රදේශයන් හී දී වැඩි වාසියක් අත්පත් කරගැනීමට ඔවුන්ට හැකියාවක් නොවූ බව පැහැදිලි වෙයි.

## නිගමන

කන්ද උඩරට හමුදාවෙහි ප්‍රායෝගික යුද ඥානය ඔස්සේ දියුණු කරන ලද අවි ආයුධ බටහිර හමුදාවන් හී දියුණු යැයි පිළිගැනීමට ලක්වූ අවි ආයුධ සමග සන්සන්දනය කළ කල්හී පැහැදිලි වන කරුණ වන්නේ කන්ද උඩරට කැලෑ සහිත භූමියේ දී වැඩි වාසි අත්පත් කරගැනීම උදෙසා යෝග්‍ය අවි ආයුධ ඔවුන් විසින් භාවිත කරන ලද බවයි. ඒ අතුරෙන් පහසුවෙන් ප්‍රවාහණය කළ හැකි

සැහැල්ලු අවි ආයුධ යන්න ප්‍රමුඛත්වයෙහි ලා සලකන ලද බැවින් කඩුව, දුන්න, හෙල්ලය කන්ද උඩරට සෙබළාගේ පුද්ගලික ආයුධයන් අතර මූලිකත්වයක් ගන්නා ලදි.

පහසුවෙන් සකසාගත හැකි ආයුධ සහ පහසුවෙන් අමුද්‍රව්‍ය සපයාගත හැකි ආයුධයන් භාවිතය ද කන්ද උඩරට සෙබළාගේ පාරම්පරික යුද ඥානය ප්‍රදර්ශනය කරන තවත් වැදගත් සාධකයක් වේ. මුගුර, භුමරංගය, ගල්පටිය වැනි ආයුධයන් දැවයෙන් නිර්මාණය කරගන්නා ලද බැවින් සහ ගල්පටිය වැනි ආයුධයන් භාවිතයට අවශ්‍ය අමුද්‍රව්‍ය වන ගල් පහසුවෙන් සපයාගත හැකි බැවින් ඒවා සැපයුම් වෙනුවෙන් අමතර වෙහෙසක් දැරිය යුතු ආයුධයන් නොවිණි.

කන්ද උඩරට භූමියේ කැලෑ සහිත බිම් හී සිදුවන සටන් වලදී යෝග්‍යතම සටන් ක්‍රමය වන සැඟවී සිට පහරදීමේ ක්‍රමවේදයේ දී සතුරු පාර්ශවයට විවිධාකාර තත්වයන්වලදී හානි පැමිණවිය හැකි විවිධාංගීකරණයකින් යුතු අවි ආයුධ භාවිත කිරීමට තරම් කන්ද උඩරට සෙබළා උපක්‍රමික ඥානයකින් යුක්ත විය. කඩුව, සිරිය, වැනි මුහුණට මුහුණලා සටන් වලදී භාවිත කරන ආයුධ වලින් ද දුනු ඊතල, ගල්පටිය, වැනි දුර සිටින සතුරෙකුට ප්‍රහාර එල්ල කරන ආයුධ වලින් ද සමීපයේ සිටින සතුරෙකු වෙත හානි පැමිණිවිය හැකි පාරාවළල්ල, චක්‍රායුධය, චන්ද්‍රවංකය වැනි ආයුධ වලින් ද මුගුර, හෙල්ල, රණ පොරව වැනි මුහුණට මුහුණලා සටන් වලදී සහ සමීපයේ සිටින සතුරෙකුට එරෙහිව භාවිත කළ හැකි ආයුධ වලින් ද සන්නද්ධ වූ කන්ද උඩරට සෙබළා පුළුල් පරාසයක විහිදුනු ආයුධ භාවිතයේ වාසිය ලද බව පැහැදිලි ය.

තුවක්කු භාවිතය සම්බන්ධයෙන් වූ ඥානය ඔස්සේ කෙටි කාලයක් තුළ සීඝ්‍ර දියුණුවක් ලැබූ කන්ද උඩරට සෙබළා තම භූමියට සහ සටන් ක්‍රමයට අනුකූල වන පරිද්දෙන් සැහැල්ලු අවි නිශ්පාදනයට යොමුවූ අතර තුවක්කු මත යැපීම සටන් හී අවශ්‍යතාවය අනුව සුදුසු මට්ටමකින් පවත්වා ගැනීමට ද උපක්‍රමික විය. එසේ ම සෑම ආකාරයක ම තුවක්කු සහ කාලතුවක්කු ද නිශ්පාදනය තුළින් සතුරු හමුදාවන් හා සටන් කිරීමේ දී විය හැකි අවාසි සහගත තත්වයන් අවම කරගැනීමට යොමුවූවා සේ ම ඒ මත යැපීම අවම මට්ටමක පවත්වා ගැනීම හේතුවෙන් සැපයුම් අඩාල වීමෙන් විය හැකි හානි සහ සැඟවී සිට පහරදීමේ දී අවශ්‍ය වන වේගය පවත්වා ගැනීමේ ගැටළු වලින් ද උපක්‍රමික ව නිදහස් විය. වෙඩි බෙහෙත් යොදාගත් තුවක්කු මත යැපීම අවම කර ගැනීම සඳහා ප්‍රමාණවත් පුළුල් පරාසයක විහිදුණු විකල්ප ආයුධ සහිත වූ යුද ශක්තියක් ඔහු සතු විය. එබවින් සමස්තයක් වශයෙන් බැලීමේ දී කන්ද උඩරට සෙබළාගේ පාරම්පරික යුද ඥානය අති විශිෂ්ට මට්ටමක පැවති බව බිඳලිය නොහැකි තර්කයක් බැව් පැහැදිලි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

<u>**ග්‍රන්ථ - ඉංග්‍රීසි**</u>

Chandler, D. (1974). *The art of warfare on land*. London. Hamlyn.

Chase, K W. (2003). *Firearms, A Global History to 1700*. Cambridge. Cambridge University Press.

De Silva,A V. (2005).*The Dutch in Ceylon.* (ලංකාවේ ලන්දේසීන් පරිː සුජීව දිසානායක). Colombo. Suriya Publishers.

Dewaraja, L S. (Ed.). (1988). *The Kandyan Kingdom of Sri Lanka 1707-1782*. 2nd Ed. Deepani Printers. Nugegoda.

Ministry of Defense. (2002). *The Application of Force: An Introduction to Army Doctrine and the Conduct of Military Operations*.The Stationary Office, London.

Newark, T. (ed). (2009). *The Worldwide History of Warfare*. United Kingdom. Thomas & Hudson.

Perera, G S. (1947).*A history of Ceylon for schools. I, The Portuguese and Dutch period,. 1505-1796*. Colombo. Lake House Publishers.

Rebeiro, J. (1999). *The Historic Tragedy of the Island of Ceilao*. (P.E Peiris, Trans.). New Delhi. Asian Educational Services.

Weir,W. (2006). *50 Weapons that changed warfare*. London. Bounty books.

Wickremesekera, C. (2004). *Kandy at War: Indigenous Military Resistance to European Expansion in Sri Lanka*. Colombo. Vijitha Yapa Publishers.

**<u>ග්‍රන්ථ - සිංහල</u>**

අබේසිංහ, ටී. (2006). *පෘතුගීසින් හා ලංකාව (1597-1658).* පන්නිපිටිය. ස්ටැෆර්ඩ් ලේක් ප්‍රකාශන.

කිරිඇල්ලේ ඤාණවිමල. (සංස්.). (1960). *දඹදෙණි අස්න.* කොළඹ. ඇම්,ඩී ගුණසේන සහ සමාගම.

කුලතුංග, ටී.ජී. (1988). *මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ ආරක්ෂක සංවිධාන.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ගමගේ, ජී, එස්. (1997). *මහනුවර යුගයේ රාජ්‍ය ආරක්ෂක ක්‍රමෝපාය.* කොළඹ 10. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ඩේවි, ජේ. (1966). *සිංහලේ ආණ්ඩු ක්‍රමය.* (පරි. එච්, එම් සෝමරත්න). කොළඹ. ඇම්, ඩී ගුණසේන සහ සමාගම.

ඩොයිලි, ජෝන්.(2005).*සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඬු සටහන්.* (පරිඃ ඇහැලේපොළ එච්.ඇම් සෝමරත්න). බොරලැස්ගමුව. විසිදුනු ප්‍රකාශන.

නොක්ස්, ආර්. (1997 ). *එදා හෙළදිව.* (පරිඃ ඩේවිඩ් කරුණාරත්න). කොළඹ. ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

දේවරාජා, ලෝනා ශ්‍රීමතී. (1997).*උඩරට රාජධානිය 1600-1782.*(පරිඃ කුසුම් දිසානායක). නුගේගොඩ. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

පවෙල්, ජේ. (2009). *කන්ද උඩරට සටන්.* (පරිඃ ප්‍රේමචන්ද්‍ර අල්විස්). කොළඹ. සූරිය ප්‍රකාශකයෝ.

පීරිස්, රැල්ෆ්.(2001).*සිංහල සමාජ සංවිධානය මහනුවර යුගය.* (පරිඃ කේ.ඒ.ඩී පෙරේරා).බොරලැස්ගමුව. විසිදුනු ප්‍රකාශකයා.

මාෂල්, එච්. (2004). *සිංහලේ.* (පරි. එච්, ඒ, සෝමරත්න). බොරලැස්ගමුව. විසිදුනු ප්‍රකාශන.

ලබුගම ලංකානන්ද. (සංස්.). (1998). *මන්දාරම් පුර පුවත*. කොළඹ. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

විමලානන්ද, ටී. (1962). *උඩරට මහ කැරල්ල*. කොළඹ. ඇම්,ඩී ගුණසේන සහ සමාගම.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය. (2014). *රන්දෙණිවෙල සටන - ක්‍රි.ව 1630.* දියතලාව. ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය.

සුරවීර, ඒ වී. (සංස්.). (1997). *රාජාවලිය.* කොළඹ. ලේක්හවුස්.

හේරත්, අයි එම් එම්. (2014). *කන්ද උඩරට ගරිල්ලා උපක්‍රම.* බේලින් සහ සමාගම. මහනුවර.

හේරත්, එච්, ඒ, ඩී, ආර්. (1998). *මධ්‍යම පළාතේ යුද්ධ අවි ආයුධ පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ෂණයක්.* මහනුවර. මධ්‍යම පළාත් සභාව.

**<u>ශාස්ත්‍රීය සඟරා ලිපි- ඉංග්‍රීසි</u>**

De Silva,M S C. (1971). *The Sinhalese Army during the Portuguese, Dutch and British periods, 1505 – 1815*. Spolia Zeylanica. Vol 3. No 1. pp 81.

**<u>මාර්ගගත - ඉංග්‍රීසි</u>**

*A brief history of anthropology*. (n.d). Retrieved fromhttp://slideplayer.com/slide/5158334/

Elmy, D. (n.d). *The End of an Archery Tradition-Sri Lanka Archery*. Retrieved fromhttp://www.atarn.org/india/sri_lanka.htm.

*Kandyan Dancer*. (n.d). Retrieved from http://www.freeimages.com/premium/kandyan-dancer-kandy-sri-lanka-414894

Mark.J J, (18 January 2012), *The Greek Phalanx*, Retrieved from, http://www.ancient.eu/article/110/

Medieval warfare Armour and shields. (n.d). *Armour*,Retrieved from http://www.medievalwarfare.info/armour.htm

*Opisz*. (n.d). Retrieved fromhttps://brainly.pl/zadanie/4705706

*Repel Cavelry*. (04 June 2008).Retrieved from http://www.roman-empire.net/army/repel-cavalry.html

*The Sinhala Sword*. (n.d). Retrieved from https://sirimunasiha.wordpress.com/about/military-history-of-sri-lanka/the-sinhala-kastana-sword/

*The Sinhalese Army during the Portuguese, Dutch and the British*. (n.d). Retrieved from https://sirimunasiha.wordpress.com/about/military-history-of-sri-lanka/the-sinhala-army-during-the-portuguese-dutch-and/

**මාර්ගගත - සිංහල**


අභයරත්න, ජී, වී. (2009 ඔක්තෝබර් 07.). උඩරට නැටුමේ වෙස් තට්ටුව නව නිර්මාණයකි. *දිවයින*. උපුටා ගැනීම http://www.divaina.com/2009/10/07/feature04.html

ජයතිස්ස, ජී. (2011, සැප්තැම්බර් 19). *රට සහ රජු රැකි රණ අවි*. උපුටා ගැනීම http://www.divaina.com/2011/09/19/mano01.html

ආඛ්‍යාන narrations
Volume 02 | Issue 01 | January – June 2017 | Article 03

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

---

# උඩුදුම්බර සංස්කෘතික භූදර්ශන තුළින් හෙළිවන කෘෂි සමාජය සහ වර්තමාන අර්බුදය

අරුණ රාජපක්ෂ[3]
BA (Cey), PG Diploma (Netherlands ), MA (India )
tsaru2003@yahoo.com

සංක්ෂිප්තය

මෙම අධ්‍යයනය මධ්‍යම පළාතේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගංගොඩ හා මැදිවක ග්‍රාමයන් සංස්කෘතික හා භෞමික භූදර්ශන පදනම් කර ගත්තකි. මූලික වශයෙන් වී වගාවල එළවලු වගාව මෙන් ම හේන් ගොවිතැන මත යැපෙන ප්‍රජාවක් සහිත මෙම භෞමික ක්ෂේත්‍රය තුළ සංස්කෘතික භූ දර්ශන හා මුසු වූ සාම්ප්‍රදායික ජීවන රාටාවන්ගේ ශේෂයන් ද සුරක්ෂාවී ඇති බැවින් පුරාවිද්‍යාත්මක හා මානවවංශවිද්‍යාත්මක මෙන් ම නිර්මිත පරිසර අධ්‍යයනයක් සඳහාතෝරා ගැණින.

නව සමාජ ක්‍රමය තුළ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා සමස්ත භූදර්ශනයේ ශීඝ්‍ර පරිවර්තන සිදුවෙමින් පවතින අතර, මෙම සංවේදී කලාපය තුළ සංස්කෘතික භූ දර්ශන මෙන් ම ඒ හා බැදුණු සංස්කෘතික ලක්ෂණ වාර්තාකරණයක් සිදු කිරීම මෙම අධ්‍යයනයෙහි මූලික අභිලාශය විණ. ගංගොඩ හා මැදිවක ග්‍රාම කේන්ද්‍ර ගත කොට තදාශ්‍රිත කලාපයේ සිදුකරන ලද භූ දර්ශන අධ්‍යයනය තුළින් තත් ප්‍රදේශයට ආවේණික නෛසර්ගික ගති ලක්ෂණ කිහිපයක් විග්‍රහ කෙරෙන අතරල ප්‍රදේශයේ සංස්කෘතික භූදර්ශනයේ පදනම සැකසී ඇත්තේ ස්වාභාවික භූදර්ශනයට අනුරූපව කෘෂිකාර්මික කටයුතු සඳහා මුල්තැන දෙන ග්‍රාමීය සමාජයක් ආශ්‍රයෙනි. සංස්කෘතික භූදර්ශනයේ වැඩි අවකාශයක් කෘෂිකාර්මික භූදර්ශන වන හෙල්මළු කුඹුරු සහ හේන් වලින් මෙන් ම වන සම්පත් පරිහරණය හා සම්බන්ධවන භූදර්ශන නියෝජනය කරයි. තත් භූදර්ශන හා එකාබද්ධ වූ ජනාවාස රටාවේ අංගද ඊට ම අවේණික ගති

---

[3] Senior Lecturer, Department of Archaeology, University of Peradeniya

ලක්ෂණ ප්‍රකට කරයි. මෙම භෞතික ස්පර්ශනීය සංස්කෘතික භූදර්ශනය හා අවියොජනීය ලෙස බද්ධ වූ එහි ගතිකත්වය හා ජීවමාන බව ප්‍රකට කරනසුළු දැවැන්ත නෂ්පර්ශිත සංස්කෘතියක් ද උරුමකරගෙන සිටියි. මෙම ස්පර්ශිත හා නෂ්පර්ශිත සංස්කෘතික භූදර්ශන වර්තමානයේ වුවද උරුමයේ ප්‍රාදේශීය අනන්‍යතා ප්‍රකට කරන සුළු ය. එසේ ම ඒවා සංකේතාත්මක නියෝජනය කරණු ලබන්නේ තත් ග්‍රාමයන්හි ඉපිද වැඩී ජීවත් වූ මිනිසුන්ගේ අධ්‍යාපත්මික ප්‍රතිරූපයයි. එම ප්‍රජාවගේ ජීවන රටාවන්හී සිදුවන විවිධ වෙනස්කම්වලට සමගාමීව සංස්කෘතික භූ දර්ශන ද අනවරත පරිනාමයකට ලක්වෙමින් පවතියි.

**ප්‍රමුඛ පදඃ** උඩුදුම්බර සංස්කෘතික භූදර්ශන, සමාජ විපරිනාමය, වර්තමාන අර්බුදය

**හැඳින්වීම**


මානවයාගේ හැසිරීම විග්‍රහ කිරීම සඳහා සමාජීය විද්‍යාවන් තුළ අවියෝජනීය ලෙස බද්ධ වූ සංකල්ප චතුස්තයක් වන පුද්ගලයා, සමාජය, සංස්කෘතිය සහ පරිසරය භාවිත කෙරේ. මානවයාගේ ක්‍රියාකාරකම්වල ස්වරූපය පදනම් වූ සංස්කෘතික පරිසරය කිසියම් භූමි භාගයක පරිසරාත්මක සාධක මත තීරණය වේ. පරිසර පද්ධතියේ අන්තර් ක්‍රියාවන්ගෙන් වියුක්ත කොට නැතහොත් හුදකලා කොට මානව සමාජය තේරුම් ගත නොහේ.සංස්කෘතිකමය දෘෂ්ටිකෝණයෙන් ගත් කල මානවයා විසින් කිසියම් භූමි භාගයක සිදු කරනු ලබන කුඩු මහත් කටයුතු සංස්කෘතික භූ දර්ශනය තුළ දැකගත හැකි ය. ඒවා ආර්ථික, සාමාජිය හෝ සංකේතාත්මක ක්‍රියාකාරකම් වේ. උක්ත ක්‍රියාකාරකම් හරහා මානවයා භූ දර්ශනය හැඩ ගස්වයි. එය තුළින් ඔවුන්ගේම සංස්කෘතිය නිර්මාණය කරයි. කිසියම් භූමි කලාපයක සමස්ථ භූ දර්ශනය එහි අංගයන් වෙන වෙනම ගෙන තේරුම් ගත නොහේ. බහු විෂයාත්මක ප්‍රවේශයක් තුළ සමාජ මානව විද්‍යාව, සංස්කෘතික පරිසර විද්‍යාව, භූ දර්ශන පරිසර විද්‍යාව සහ සංස්කෘතික භූ දර්ශනයඅධ්‍යයන ප්‍රවේශය තුළින් මේ සබඳතාවය ගැඹුරින් සලකා බලයි. සංස්කෘතික භූ දර්ශන ග්‍රාමීය භූ දර්ශන (Rural Landscapes) ලෙස ද හැඳින් වේ. ග්‍රාමීය භූ දර්ශන නිර්වචනය කරනු ලබන්නේ කාලයාගේ ඇවෑමෙන් මානවයා සහ පරිසරය අතර අන්තර් සබඳතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වන ඒවාටම ආවේණික වූ ගති ලක්ෂණ සහිත ප්‍රදේශ වශයෙනි.

උක්තසංකල්පීය ප්‍රවේශයන්ට අනුව අධ්‍යයනයට ලක් කෙරෙන ගංගොඩ හා මැදිවක ග්‍රාමයන් මධ්‍යම පළාතේ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි උඩුදුම්බර නගරයේ සිට කි. මී. 04ක් පමණ ඈතින් පිහිටා තිබේ. මේ ගම්මාන වටා විසිර පවතින පල්ලෙවෙල, ගොඩකුඹුර, පල්ලෙපිටවල, උඩපිටවල හා මඩුගල්ල ආදී ගම් කිහිපයක් ද වන අතර ඒවා එකිනෙක අතර අන්තර් සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබේ. මූලික වශයෙන් වී වගාව හා එළවළු වගාව මත යැපෙන ජනතාවක් සහිත තත්ත් ක්ෂේත්‍රය පුරාවිද්‍යාව හා මානවවංශවිද්‍යාව මිශ්‍ර වූ අධ්‍යයනයක් සඳහා යෝග්‍ය යැ යි වටහා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම අධ්‍යයනය ආරම්භ විය. ඒ සඳහා බලපෑ ප්‍රධාන හේතුවක් නම් මහනුවර වැනි නගරබද ප්‍රදේශයකට සාපේක්ෂව සැලකිය යුතු තරම් දුෂ්කර පරිසරයක් තුළ සම්ප්‍රදායික ජීවන රටාවන්හි ශේෂ තවදුරටත් පවත්වාගෙන යමින් කෘෂිකාර්මික කටයුතුවල නිරත

පිරිසක් ඒ තුළ වාසය කිරීමයි. අවධානයට ලක් වූ දෙවැනි කරුණ නූතන සංවර්ධන ක්‍රියාදාම හමුවේ වර්තමාන පරම්පරා හා ඔවුන්ගේ ආකල්ප මුල් පරම්පරාවලට වඩා වෙනස් ලක්ෂණ පෙන්නුම් කරමින් නව සමාජ ක්‍රමය සමග හැඩගැසීමට උත්සහ දැරීම හේතු කොටගෙන සුලු වශයෙන් හෝ ආරක්ෂා වී පවතින සම්ප්‍රදායික ජීවන ශෛලීන්හි සීඝ්‍ර පරිවර්තන සිදු වෙමින් පැවතීමයි. මේ දෙකරුණ සලකන විට මැදිවක හා ගංගොඩ ප්‍රදේශය ඇතුළත් ක්ෂේත්‍රය අතීතය හා වර්තමානය අතර දෝලනයක පවත්නා සංවේදී කලාපයක් සේ හඳුනා ගනු ලැබිණි. එබැවින් ආරක්ෂිතව පවතින සම්ප්‍රදායික ජීවන ශෛලීන් මුලුමනින් ම වෙනස්ව යාමට පෙර උපරිම වාර්තාකරණයකට ලක් කිරීමත් ප්‍රධාන අරමුණු අතර වෙයි. මැදිවක හා ගංගොඩ ප්‍රදේශය ආශ්‍රිත පෞරාණික කෘෂිකර්මාන්තය පිළිබඳ කරුණු සම්පිණ්ඩනය කිරීමත්, ඒවා වර්තමානය වන විට යම් විචලනයන්ට ලක්ව ඇති ආකාරය පරීක්ෂා කර බැලීමත් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ.

ගංගොඩ - මැදිවක ඇතුළු මෙහි අධ්‍යයනයට ලක් කෙරෙන ආංශුක කලාපයේ භූ දර්ශනය සැකසී ඇත්තේ ස්වාභාවික භූ දර්ශනයට අනුරූපව කෘෂිකාර්මික කටයුතු සඳහා මුල් තැනදෙන ග්‍රාමීය සමාජයක් ආශ්‍රයෙනි. කඳුකර භූ රූපණ ලක්ෂණ සහිත ප්‍රදේශයක හෙල්මළු කුඹුරු ඇතුළු කෘෂිකාර්මික බිම් පද්ධතිය හා ගොවීන්ගේ ජනාවාස ස්ථාන ගතවීම මෙහි සංස්කෘතික භූ දර්ශනයේ සුවිශේෂී අනන්‍යතාවය ලෙස සැලකිය හැකි ය.මැදිවක, පල්ලෙවෙල, ගොඩකුඹුර හා ගංගොඩ යන ගම්මාන හුන්නස්ගිරිය, මැදිවක පතන, උග්ගොල්ල, කන්දෙකුඹුර, කොඩිබැන්ද ඉන්න, කොස්කන්ද හා යක්ගිරිගල යන කඳු පන්තීන්ගෙන් වට වූ පටු තැනි, මං හා දළ බෑවුම් සහිත භූ දර්ශනයක් තුළ පිහිටා තිබේ. එහි හරස්කඩක් කෙරෙහි අවධානය යොමු කළ හොත් උඩරට ගමක සාමාන්‍ය පිහිටීමට වඩා වෙනස් බවක් දැකගත නොහැකි බව පෙනී යනු ඇත. භූමියේ බෑවුම් සහගත පහත්ම ප්‍රදේශය කුඹුරු උදෙසා වෙන් වී තිබේ. ඊට ඉහළින් පිහිටා ඇති දිගට විහිදී යන පටු උස් ගොඩැල්ලක් වැනි භූමිය වැසියන්ගේ නිවාස දරා සිටින නේවාසික ක්ෂේත්‍රය වෙයි. නිවාස ආශ්‍රිතව ඒ අවට බිම් කොටස ගෙවතු භෝග වැවීමට වෙන්ව ඇති බැවින් පොදුවේ 'ගෙවතු' ලෙස හැඳින්වීමට යෝග්‍ය ය. ක්‍රමයෙන් ඉහළට උස්ව විහිදෙන කඳුකර භූමිය වසර කිහිපයකට වරක් එළි කරන ලදුව ධාන්‍ය, එළවළු හෝ අලවර්ග වැවීමට සුදුසු මහහේන් බවට පත් කරන ලදි. වගාකටයුතුවලින් පසු මෙම භූමි ප්‍රදේශය තණ කැවීමට හෝ ඉන්ධන, ඉදිකිරීම් හෝ වැටවල් සඳහා අවශ්‍ය දැව ආදිය සපයා ගැනීමට භාවිත කළ හැකි විය. හේන්වලට ඉහළින් කඳුකරයේ ඉහළ සීමාවන් සටහන් කරන ඝන වනාන්තර නැතහොත් මූකලාන් පැතිර පැවතියේ ය. එබැවින් මේ භූ දර්ශනය කව හතරකින් යුතු වෘත්තයකට ගොනු කළ විට ඇතුළත කවයේ සිට පිළිවෙලින් කුඹුරු, ගෙවතු, හේන හා වනාන්තර ලෙස බෙදා දැක්වීමට පුළුවන (Meyer 1996:184). එහෙත් මේ සාමාන්‍ය චිත්‍රය සෑම විටම එයාකාරයෙන් ම පිළිගැනීම සැබෑ තත්ත්වය යම් තරමකින් විකෘති කිරීමකි. හේන් ව්‍යාප්තව පිහිටි උස් භූමි ආශ්‍රිතව ද කුඹුරු පිහිටා ඇති අවස්ථා දක්නට හැකි බැවිනි. භූමියේ ස්වභාවික පිහිටීම කෙරෙහි සැලකිලිමත් වෙමින් බෑවුමේ ස්වරූපය හා වතුර බැස්ම පදනම් කොටගෙන ඒවා සකසා ගැනෙන අතර, 'පොළොව ගැන ඉව' හැරුණු විට සමෝච්ඡ රේඛා මත තීරණය කෙරෙන හෙල්මළු සැකසීමේ විද්‍යාත්මක ක්‍රමවේදයක් වර්තමානයේ පවා මේ ගැමියෝ නොදනිති. හෙල්මළු භූ දර්ශනය ක්‍රමානුකූල නිමාවක් සමග බැඳුණු සෞන්දර්යාත්මක ආකර්ෂණයක් එය නරඹන්නාගේ සිතෙහි ඇති කරවයි. යටත්විජිත කාලයේ දී උඩරට සංචරණයේ නියුතු වූ විදේශිකයන් ඒ දර්ශනයෙන් වශීකෘත

වූයේ එබැවිනි. අධ්‍යයන ක්ෂේත්‍රයේ විස්තෘත කලාපයට අයත් කෙවුල්ගම, පල්ලෙ පිටවල, උඩ පිටවල වැනි ගම්මාන ද මේ භූ දර්ශනය සමග හැඳී පවතී.




**රූප සටහන 1 :ගංගොඩ මැදිවක ඇතුළු තදශ්‍රිත ගම්මානවල සංස්කෘතික භූ දර්ශනයේ සැකැස්ම**




**ඡායාරූපය 1 : උඩුදුම්බර ප්‍රදේශයේ සංස්කෘතික භූ දර්ශනයේ සුවිශේෂී අංග - කිරිපට්ටිය**

ගංගොඩ හා මැදිවක ආශ්‍රිත වී වගාවේ පෞරාණිකත්වය එහි භූ දර්ශනයේ පෞරාණිකත්වය ද වන්නේ ය. ජනශ්‍රැතික සාධක මගින් ක්‍රිස්තු පූර්ව දෙවැනි සියවස තරම් ඈත කාලයක් යෝජනා කෙරෙන නමුදු ඒවායේ විශ්වසනීය බව කෙනෙකුට ප්‍රශ්න කළ හැකි වනු ඇත. තෙල්දෙණියට නුදුරු බඹරගල ක්‍රිස්තු පූර්ව අවධියට අයත් අභිලේඛන සාධක සහිත ක්ෂේත්‍රයක් බැවින් තදාශ්‍රිත කලාපයේ ජනාවාසකරණය හා මේ ජනශ්‍රැති කාල අවකාශීය වශයෙන් සමාන වෙයි. කෙසේ වෙතත් වඩා විශ්වසනීයව කිව හැක්කේ යටත්පිරිසෙයින් දොළොස්වන සියවස වන විට මේ කලාපය වී වගාව සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමක පැවති බව ය. මීට ඉහත ද පෙන්වා දෙන ලද පරිදි

දහතුන්වන සියවසට අයත් කෙවුල්ගම ටැම් ලිපිය 'මැදිවක' පිහිටි වැලිමඩ ලියද්දක් ගැන පවසමින් ප්‍රථම වරට අධ්‍යයන ක්ෂේත්‍රයේ වී වගාව සම්බන්ධ වඩා පෞරාණික ඍජු සාධක සපයයි (Epigraphia Zeylanica Vol. III, 230-235).

වර්තමානයේ මෙම ප්‍රදේශයේ වාසය කරන වයස්ගත පුද්ගලයන් පවා සිය වගාභූමිවල පෞරාණිකත්වයේ ආරම්භයක් ගැන කීමට නොදනිති. 'අලුත අස්වද්දපු කුඹුරු පිළිබඳ මතකයක් නොවීම' ඒවායේ පෞරාණිකත්වය කීමට භාවිත කරන එක් පැහැදිලි කිරීමක් විය. දෙවැනි පැහැදිලි කිරීම නම් ඒවා 'රජ කාලයේ සිට' පැවතෙන බව කීම ය. ඇතැමුන්ට අනුව මේ කුඹුරු පැවතෙන්නේ 'රාජසිංහ රජ්ජුරුවන්ගේ කාලයේ සිට' ය. 'අවුරුදු සිය ගානක් ඇති' යනු ගැමි කාලනිර්ණයේ තවත් ස්වරූපයකි. මෙම ප්‍රකාශ මගින් වගාභූමි සම්බන්ධ වැදගත් කරුණු කිහිපයක් ගම්‍ය කරවනු ලැබේ. මූලිකව, ඒවායේ පෞරාණිකත්වයට අදාළ වඩා විශ්වසනීය මුල් සාධක පිළිබඳ ගැමියෝ නොදනිති. දෙවැන්න නම් ඉකුත් වසර සියයකට වැඩි කාලයක දී අලුතින් කුඹුරු නිර්මාණයක් සිදුව නැති බව හා එවැන්නක් පිළිබඳ ශ්‍රැති දැනුමක් හෝ නොතිබීම ය. එය 'පරම්පරාගත කුඹුරු' සංකල්පයට මුල් වී තිබේ. සිය වගාභූමි රාජකීයයන් හා සම්බන්ධ කිරීමට පවතින උනන්දුව සැලකිය යුතු තෙවැනි කරුණයි. මේ රාජකීයයන් යනු ජනශ්‍රැති බහුතරයකින් හෙළි වන පරිදි උඩරට රාජධානියේ පාලනය ගෙන ගිය දකුණු ඉන්දීය නායක්කර් වංශිකයන් ය. සිංහල රජෙකු හා සම්බන්ධ ජනශ්‍රැති බෙහෙවින් ම දුර්ලභ වන අතර, එවැන්නෙකුට දැක්විය හැක්කේ (දෙවැනි?) රාජසිංහ පමණකි.

මීළඟට ගැමියන්ගේ අනුමාන පුරාවිද්‍යාත්මක සාධක මත පරීක්ෂා කර බලමු. දහනව වන සියවසේ දෙවැනි භාගයේ දී බදුල්ල දිස්ත්‍රික් විනිසුරුවරයා වූ ඒ. සී. ලෝරි මධ්‍යම පළාතේ පරිපාලන දත්ත සම්බන්ධයෙන් දැක් වූ උනන්දුව නිසා එවැනි සාධක කිහිපයක් මුද්‍රිත තත්ත්වයෙන් ආරක්ෂිතව පවතී. එහි දක්වා ඇති පරිදි මැදිවක, ගංගොඩ, කනහන්පිටිය හා මඩුගල්ල ආශ්‍රිත වගා ඉඩම් මිලදී ගැනීම, පැවරීම හෝ පූජා කිරීම්වලට අදාළ කාල අවකාශීය දත්ත පහත පරිදි පෙළ ගැස්වීමට පුළුවන.

| විසින් | වෙත | ශක වර්ෂ | (+) | ක්‍රිස්තු වර්ෂ |
|---|---|---|---|---|
| නයිදප්පු | පල්ලෙවෙල විහාරය | 1653 | 78 | 1731 |
| වන්නිය හේනයා | දළදා මාළිගය | 1687 | 78 | 1765 |
| සොයිදහාමි | දළදා මාළිගය | 1687 | 78 | 1765 |
| සුද්ධනාදයා, සෙම්බර දවුල්කාරයා | දළදා මාළිගය | 1688 | 78 | 1766 |
| එතනා | දළදා මාළිගය | 1691 | 78 | 1769 |
| සිල්ප නැකැත්තා | කිරා | 1721 | 78 | 1799 |
| පල්ලෙගේ අප්පුරාල | මැණික්රාල | 1729 | 78 | 1807 |
| නිකලියද්දේ පුංචිරාල | කලිඟුරාල ආරච්චි | 1735 | 78 | 1813 |

( Lawrie 1896 ඇසුරෙනි)

සීමිත වශයෙන් වුවත් අප සතුව ඇති මේ ඓතිහාසික ලේඛනවල කාල අවකාශය ක්‍රි. ව. දහ අටවන සියවසේ තෙවැනි දශකයේ සිට දහනව වන සියවසේ දෙවැනි දශකය මැද දක්වා

පරාසයකට අයත්වන බව පෙනී යා යුතු ය. මේ කාලය මෙරට රාජාවලිය සහ සම්බන්ධ කළ විට ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහගේ සිට ශ්‍රී වික්‍රම රාජසිංහගේ අවසාන කාලය දක්වා ඊට අයත් වෙයි. ඉන් විශේෂයෙන් අදහස් වන්නේ නායක්කර් වංශික රජවරුන්ගේ පාලන කාලසීමාවයි. මෙසේ සිය වගා භූමිවල පෞරාණිකත්වයට අදාළව ගංගොඩ, මැදිවක හා ඒ තදාශ්‍රිතව පැතිර පවතින ජනශ්‍රැති මගින් ඉඟි කරන කාල අවකාශය ලිඛිත සාධකවල කාල අවකාශය සමග මනා ගැළපීමක් ඇති කරවයි. එබැවින් අපගේ අධ්‍යයන අවකාශයට අයත් වගාභූමිවල පෞරාණිකත්වය වඩා ඈතකාලීනව දොළොස්වන සියවස පමණ දක්වා ද, වඩා මෑතකාලීනව යටත්පිරිසෙයින් දහසයවන හෝ දහහත්වන සියවස පමණ දක්වා ද කාලයකට අන්තර්ග්‍රහණය කිරීම වඩාත් යෝග්‍ය වනු ඇත.

ජෝන් ඩේවි සිය සුප්‍රකට **ඩේවි දුටු ලංකාව** ග්‍රන්ථයේ දී උඩරට වී ගොවිතැන පිළිබඳ තබා ඇති සටහනක් කෙරෙහි අවධානය යොමු කිරීම ප්‍රයෝජනවත් ය. ඔහු මෙසේ කියයි.

> '...උඩරට වී ගොවිතැන ක්‍රියාකාරීත්වයෙන් ද, සුන්දරත්වයෙන් ද, භූමි පිහිටීමෙන් ද විවිධ ය. විචිත්‍ර ය. සිත්ගන්නා සුළු ය. උඩරට ප්‍රදේශවල වී ගොවිතැන සඳහා ජලයෙන් හිඟයක් නැත. ඇතැම් විට ඔවුහු තම කුඹුරු සඳහා කුඩා ඇල මාර්ග හෝ පිහිලි මගින් ජලය ගෙන එනු ලැබේ. මෙම ජල අවශ්‍යතාව සැපිරෙන බැවින් උඩරට වර්ෂයක් තුළ කන්න දෙකක් වගා කෙරේ. කලාතුරකින් කන්න තුනක් වැඩ කරන බව මට අසන්නට ලැබිණි. බොහෝවිට වැඩ කරනු ලබන කන්න ප්‍රමාණය තීරණ වනුයේ වගා කරනු ලබන වීවල වයස අනුව ය. සත්මසක් පමණ ගතවන වඩා උසස් වර්ගයේ වී වර්ෂයකට එක් වරක් ද, තෙමසක් පමණ ගතවන බාල වී වර්ෂයකට දෙකන්නයක් ද වගා කරන බ වමට දැන ගැනීමට ලැබිණි.....(සෝමරත්න 1896:149).

මෙම ප්‍රදේශයට වැඩි වර්ෂාපතනයක් ලැබෙන නොවැම්බර් හා දෙසැම්බර් මාස මහ හෙවත් මාස් කන්නය ලෙස සැලකේ. ඔක්තෝබර් මාසයේ මැද භාගයේ දී මාස් කන්නය ඇතිවීමේ මූලික ලක්ෂණ පෙන්නුම් කරන අතර ඊසාන දිග මෝසම් සක්‍රීය වීමෙන් ජලය ප්‍රමාණවත් පරිදි ලැබෙන බැවින් මාස් කන්නයේ දී සෑම කුඹුරක් ම පාහේ අස්වැද්දීම සිදු කෙරේ. වෙනත් භෝග වගා කිරීමක් දක්නට නොලැබෙන බැවින් වැඩිම වී අස්වැන්නක් ලැබෙන කන්නය ලෙස සැලකෙන්නේ මාස් කන්නයයි. ජුනි-ජූලි මාස එළඹෙන විට වර්ෂාපතනය අඩු වී ගොස් වියළි කාලගුණ තත්ත්වයක් ප්‍රදේශය පුරා පැතිර යනු දක්නා ලැබේ. එය යල කන්නයේ ආරම්භය සනිටුහන් කරවයි. සාමාන්‍යයෙන් ජුනි හෝ ජූලි මාසයේ සිට ඔක්තෝබර් හෝ නොවැම්බර් දක්වා කාලය යල කන්නයට අයත් ය. මෙකල වරින්වර සුළු වැසි ඇකිවන්නේ නිරිත දිග මෝසම් සුළං සක්‍රීයවීම මගිනි. වියළි කාලගුණය මෙන් ම දැඩි හුළං ප්‍රවාහය ද මෙකල විශේෂ ලක්ෂණයකි. මේ වෙනස වගාව කෙරෙහි දෙයාකාරයක බලපෑම් ඇති කරවයි. එකක් නම් මහ කන්නයේදී මෙන් සෑම කුඹුරක්ම වගා කිරීමට නොහැකිවීමයි. ජලය සපයාගත හැකි කුඹුරු පමණක් වී වගාවට තෝරා ගැනෙන අතර ජලය සැපයීම දුෂ්කර කුඹුරු අතහැර දැමීමට නියමිත වනු ඇත. ඒවා 'මලං කුඹුරු' ලෙස ව්‍යවහාර කරනු ලැබේ. දෙවැන්න නම් හය මාසයක් පමණ බලපවත්වන සුළඟ හේතුකොටගෙන ගොයම යම් තරමකට බාල වීමට ලක් වීමයි. මේ සුළඟේ බලවත්කම මගින් වී කරල් බොල් කර දමනු පමණක් නොව අස්වනු නෙළීමට ආසන්න කාලයේදී ගොයම් කරල් පොළොව මත අතුරවනු ලැබේ. ගස් කොළං සශ්‍රීකත්වයෙන් තොර දඬු බවට පත් වෙයි. පොල් වැනි තාලවර්ගයේ ගස් පවා සුළං දිශාවට නැමී යාමෙන් සිය පැවැත්ම තහවුරු කර ගනියි. අස්වාභාවික ලෙස නැමී ගිය පොල් ගස් මෙම ප්‍රදේශයේ සුලබව දක්නට ඇත්තේ යල කන්නයේ දී සිදුවන මේ දේශගුණික විපර්යාසයේ

දිගුකාලීනබවේ ප්‍රතිඵලයක් ලෙසිනි. මාස් කන්නය සරු කාලසීමාවක් වන නමුත් යල කන්නය අස්වනු හීන වන එමෙන් ම ණයබරින් මිදීමට අපහසු වන කාල පරිච්ඡේදයකි. අතීතයේ දී යල කන්නයේ ද වී වගාව ම සිදු කළ මුත් දශක කිහිපයක සිට විකල්පයක් ලෙස එළවළු වගාවට හුරු වී තිබීම ද මේ කාලගුණ හා ආර්ථික දුෂ්කරතාවල ප්‍රතිඵලයකැ යි කිය හැකි ය. එබැවින් අද වන විට යල කන්නය වඩා ප්‍රකටව ඇත්තේ එළවළු වගා කරන කාලසීමාව ලෙසිනි.

වගා කටයුතු සඳහා අවශ්‍ය ජලය ප්‍රධාන වශයෙන්ම ලබා ගැනෙන්නේ ස්වභාවික දියසීරා හා දොළපහරවල් මගිනි. උඩදුම්බර විස්තෘත කලාපය සලකන විට එහි වී වගාවේ 65% පමණ සුළු වාරිමාර්ග පද්ධති මගින් ජලය සැපයෙයි. ස්වභාවික ජලමාර්ග උපයෝග කර ගනිමින් ඉදි කෙරුණු අමුණු 156ක් පමණ විස්තෘත කලාපයෙහි දක්නට ලැබෙන අතර, කුඩා ප්‍රමාණයේ වැව් පහක් ද ඊට අන්තර්ගත ය. ස්වභාවික දොළ පහරවල් උස් කඳුමුදුන්වලින් ඇරඹී පහත් බිම් ප්‍රදේශ හරහා ගලා ගොස් මහවැලියට එක් වෙයි. දොළ පහරවල් හරස් කොට අමුණු බැඳීම මගින් ජලය හරවා ගැනීමේ ක්‍රමවේදය ආරම්භක අවස්ථාවේ සිදු වූයේ තාවකාලික ඉදිකිරීමක් වශයෙනි. ඔයේ වතුර හැරවීමට අවශ්‍ය ස්ථානයේ වළවල් හාරා ඒවායේ ඉනි සිටවනු ලැබේ. අනතුරුව එම ඉනි හරස් කොට ලී බැඳ මැටි, කොළ අතු, පිදුරු ආදියෙන් ඇහිරීම මගින් තාවකාලික අමුණක් නිර්මාණය වෙයි. පූර්ව බ්‍රාහ්මී ලිපිවල 'අවරණ' යන යෙදුම භාවිතව ඇත්තේ ද මෙවැනි ඇහිරීම් හෙවත් ජල පහරට බාධා කිරීම් අඟවනු පිණිස ය. අතීතයේ දී ගල්බැමි ආදිය යොදා ගත් නමුත් වර්තමානය වන විට මේ අමුණු ක්‍රමය කොන්ක්‍රීට් භාවිතයෙන් ස්ථිර ඉදිකිරීම් බවට පරිවර්තනය කරගෙන තිබෙනු දැකගැනීමට පුළුවන. අමුණු ඉදිකිරීමට අදාළව විශේෂ අවධානයට ලක්විය යුතු ස්ථාන දෙකක් අපගේ නිරීක්ෂණයට ලක්ව තිබේ. ඉන් වඩා පැරණි යැ යි සිතිය හැකි අමුණ පිහිටා ඇත්තේ පල්ලෙවෙල ප්‍රදේශයේ මකර නමින් හඳුන්වන ස්ථානයට තරමක් ඉහළිනි. මුහුදු මට්ටමේ සිට මීටර 594ක උසින් යුතු මෙම ස්ථානය නැ.දේ. 21,25,97 හා උ. අ. 23,31,54 අතර ස්ථානගත වේ. ඔයේ පතුළ හරහා විහිද ඇති පාෂාණ උද්ගත භාවිත කරමින් ඒවායේ මතුපිට දැවකණු සිටුවීම පිණිස වලවල් සකසාගෙන ඇත. බලි අමුණ යනුවෙන් හැඳින්වෙන අමුණු විශේෂයක් ද භාවිතයේ පැවතිණි. ඔයෙහි සකසන කණු වළවල් උපකාරයෙන් සිරස් කණු සිටුවා ඒ හරහට මැටි ආදියෙන් වසා නිමකරන ලද මැසි සිටුවීමෙන් සකසා ගත් වේල්ල සහිත අමුණු බලි අමුණු නම් වෙයි (ඡායාරූපය 2).



**ඡායාරූපය 2 : පල්ලෙවෙල පැරණි අමුණක නටඹුන්**

මෙවැනි බලි අමුණක් කෙවුල්ගම පිහිටා තිබිණි. ඉන් ජලය ලබා ගත් කුඹුරු යාය හැඳින්වූයේ ද 'බලිතියන්නා වෙල' යනුවෙනි. රඹුක්වැල්ල සමීපයේ තවත් බලි අමුණක් විය. ගංගොඩ ආශ්‍රිතව කුඩා ප්‍රමාණයේ අමුණු තුනක් ද, පල්ලේවෙල විහාරය සමීපයේ අමුණෙවල යනුවෙන් හැඳින්වෙන ස්ථානයේ කණු වලවල් අටකින් යුතු අමුණක් ද පිහිටා තිබිණි. තාවකාලික මැසි යොදා නිර්මාණය කරන ලද අමුණු අධික වැසි ලැබීමත් සමග ගසාගෙන යාමට ලක් විය. පල්ලෙ පිටවල වයස්ගත ගැමියන්ගේ අත්දැකීම්වලට අනුව, එකම අමුණ නැවත නැවතත් ඉදි කිරීමට සිදු විය.

ජලය රැස්කර ගැනීම පිණිස කුඩා ප්‍රමාණයේ වැව් ඉදි කිරීමේ සිරිත මෙම ප්‍රදේශය ආශ්‍රිතව ද හඳුනා ගැනීමට පුළුවන. කිරිපට්ටිය නමින් හැඳින්වෙන ප්‍රදේශයේ එවැනි එක් වැවක් පිහිටා තිබේ. ඊට වැව් ලියද්ද යන නම ද ව්‍යවහාර කෙරිණි. අක්කර 20ක පමණ ජල ධාරිතාවක් රඳා පවතින්නට ඇතැ යි සිතිය හැකි මෙම වැව හුරී වැද්දා විසින් කරවන ලද්දක් බව ජනශ්‍රැතියේ කියැවේ. වැවේ ජලය සම්බන්ධයෙන් රඹුක්වැල්ලවාසීන් සමග ඇති වූ අරගලයක් නිසා වැව බිඳ දැමුණු බව ද, වැද්දා එම ශෝකයෙන් මිය ගිය බව ද එම කථා ප්‍රවෘත්තිවල සඳහන් ය.

දැනට වගා කෙරෙන හෙල්මළු කුඹුරු සියල්ලම පාහේ පාරම්පරික ඒවා වන බැවින් වාර්ෂිකව ඒවා වගා කිරීමට අදාළ ක්‍රියාවලිය කෙරෙහි යොමු වීමට සිදු වෙයි. එහි දී කුඹුරු සීමා පිළිබඳ දැනීම හෙවත් වගාබිම්වල අනන්‍යතාව පවත්වාගන්නා ආකාරය අවධානයට ලක් කිරීම වැදගත් ය. ආගන්තුකයෙකුට එක ගොන්නට විහිද පවතින්නා වූ කුඩා ලියදි සමූහයකින් යුතු කුඹුරු වෙන් වෙන්ව වටහා ගැනීම මහත් වෙහෙසකර වන්නක් බවට සැක නැත. එහෙත් ගැමියෝ ඒවායේ අනන්‍යතාව ක්‍රම කිහිපයකින් ස්මරණයේ තබා ගනිති. එක් ක්‍රමයක් වන්නේ ඉම හෙවත් සීමාව සලකුණු කරන ගල් සවි කිරීමයි. මේ කුඹුරු වසර සිය ගණනක් මුළුල්ලේ පාරම්පරිකව පැවතෙන ඒවා වන බැවින් එකල පිහිටුවන ලද සීමා ගල් තවමත් භාවිත කෙරේ. කුඹුරේ සිවු කොනෙහි විශාල ගල් සතරක් සිටුවීම මගින් සීමාව සංකේතවත් වෙයි. මෙය වර්තමානයේ භාවිත කෙරෙන මායිම් ගල් සිටුවීමට මුළුමනින්ම සමාන ය. 'ඉම කෙටීම' හෙවත් 'සීමාව වෙනස් කිරීම' සපුරා තහනම් ක්‍රියාවකි. දෙවැනි ක්‍රමය ඒ ඒ කුඹුරු නම් කිරීමයි. මෙහි පසුවට දීර්ඝව දක්වා ඇති පරිදි භූගෝලීය පිහිටීමේ ස්වභාවය, විශේෂ ලක්ෂණ, නිශ්චිත ගසක් හෝ ඉදිකිරීමක්, හිමිකරුවාගේ සම්බන්ධය ආදී යම් කරුණක් පදනම් කර ගනිමින් සෑම කුඹුරක් ම පාහේ නම් කොට තිබේ. පීල්ල ළඟ කුඹුර, ඇලෙන් පල්ල, නිකලියද්ද ආදි වශයෙනි. ඇතැම් අවස්ථාවල නියරේ විශාලත්වය මගින් ද කුඹුරු වෙන් කිරීම සිදු වෙයි. ඒවා 'මහ නියර' ලෙස හැඳින්වෙන අතර එළි කිරීමක් සිදු නොවේ. ඒ වෙනුවට ඒවායේ වැවෙන වල් අතින් කපා දැමීම සිදු වෙයි.



**ඡායාරූපය 3 : කුඹුර පෙගවීම**

නියර ආදිය ශුද්ධ කොට නගුල් භාවියෙන් ලියදි සීසෑම වී වගාව සඳහා භූමිය සකස් කර ගැනීමේ මූලික ක්‍රමවේදයයි. මෙම කාලයේ දී කුඹුරවලට ජලය ගෙන එන ඇළ වේළි ආදිය දෙපස වැවී ඇති වල් කපා දමා පවිත්‍ර කිරීම ද අවශ්‍ය කෙරේ. ඇළ සියල්ලන්ගේ පොදු වස්තුවක් බැවින් එය පවිත්‍ර කිරීම පිණිස ද සාමූහික දායකත්වයක් ලැබීම සාමාන්‍ය තත්ත්වයකි. තම තමන්ගේ කුඹුරු ආශ්‍රිත ඇළ කොටස ශුද්ධ කිරීම මගින් එම කාර්යය සාර්ථක කරගනු ලැබේ. නියර හා වක්කඩ බැඳීම මූලික අවශ්‍යතාවකි. වක්කඩ තැබීමේ දී පළමුවෙන් 'නියර කපා බැඳීම' සිදු කළ යුතු ය. ඉන් අදහස් කෙරෙන්නේ නියරේ කැඩී බිඳී ඇති තැන් පිළිසකර කොට යථා තත්ත්වයට පත් කර ගැනීමයි. එහි සාර්ථක බව පරීක්ෂා කිරීම පිණිස මුල්වරට කුඹුරේ වතුර බැඳ ජලය තැන්පත් වීමේ ස්වභාවය නිරීක්ෂණය කෙරේ. 'කුඹුර පෙඟවීම' යනුවෙන් අදහස් කෙරෙන්නේ එලෙස ජලය බැඳීමේ ක්‍රියාවලියයි (ඡායාරූපය 3).

සීසෑම සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිත නොවූ අතර හරකුන් බැඳි නගුල් ඊට භාවිත කෙරිණි. මේ නගුල් ද දෙවර්ගයක් දක්නා ලැබේ. ආරම්භයේ දී භාවිත කරන ලද්දේ කෙකි නගුලයි. කෙක්කකින් ඇද්දාක් මෙන් පස හැරෙන බැවින් ඊට **'කෙකි නගුල'** යන නම ව්‍යවහාර කෙරේ. මේ මගින් පස හැරෙන නමුත් පිඩැල්ල පෙරළීමක් සිදු නොවන බැවින් පිඩලි පෙරලා වල් යට කිරීම පිණිස කුඹුර උදලු භාවිතයෙන් නැවත කෙටීමට සිදු විය. පසුකාලීනව **'යකඩ නගුල'** භාවිතයට පැමිණි අතර එය සකසා ඇත්තේ හැරෙන පස් කුට්ටිය පෙරළී ගොස් වල් යටපත් වන පරිදි යකඩ තැටියක් ද සවි කිරීමෙනි. දෙබානක්, තුන් බානක් හෝ හතර බානක් සී සෑමට යොදා ගන්නා අතර ඒ ප්‍රමාණය කුඹුරේ විශාලත්වය මත තීරණය වෙයි. සී සෑම හා වැපිරීම අතර අවම වශයෙන් මාසයකවත් පරතරයක් තබා ගැනීමට ගොවියන් උත්සුක වූහ. වර්තමානයේ බෙහෙවින් නෙසලකනු ලබන මුත් පස පදම් වීම පිණිස එවැනි ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වීම ඊට හේතුවයි. මේ පළමු හීය හඳුන්වනු ලබන්නේ ද බිම් නැගුම් හීය යනුවෙනි. බිම් නැගුම යනු බිම හෙවත් භූමිය හෙවත් පස වර්ධනය කිරීමයි. වැඩීමයි. නැතහොත් ගුණාත්මක තත්ත්වයට පත් කරලීමයි. පළමු හීයෙන් පසුව වක්කඩ බැඳ ලියදිවලට වතුර පුරවා ශාඛ කොටස් ආදිය දිරා ගොස් මඩ පදම් වන තෙක් තබනු ලැබේ. නියර කෙටීමෙන් එකතු වූ ශාඛ කොටස් ආදිය ද කුඹුර තුළට එක් කෙරෙන බැවින් ඒවාද දිරා යාමට ලක් වෙයි. කුඹුරු වටා කරඳ, ගංසූරිය ගස් සිටුවා ඒවායේ කොළ අතු කුඹුරට දැමීමෙන් ද අපේක්ෂා කළේ පසෙහි සරු බව වර්ධනය කිරීමයි. ඇතැම් විට තිත්තවැල් ද ඊට එක් කෙරිණි. මී ඇටවල මදය ගෙන කොළපතක් පැසක් ලෙස භාවිත කර තද කිරීමට ලක් කිරීමෙන් මී තෙල් වෙන් කර ගැනෙයි. එවිට කොළපත තුළ ඉතිරිවන රොටියක් වැනි කුඩු (මුරු ඇට) වැලි හෝ අලු සමග එක් කොට කුඹුරට ඉසීමට ගොවියෝ පුරුදුව සිටියහ. මේ මගින් පස සරුවීම පරණක් නොව ගැඩවිලුන් වැනි සතුන් වර්ධනය වීම ද වූ බව කියනු ලැබේ. ඊට හේතුවිය හැක්කේ පසෙහි යම් බුරුල් වීමක් සිදුවීම මගින් පාංශු වාතය හොඳින් ලැබීම විය හැකි ය. දින පහළොවක් හෝ විස්සකට පමණ පසුව පදම් වූ කුඹුර දෙවන වරට කෙටීම අවශ්‍ය ය. ජන ව්‍යවහාරයේ මේ කාල පරතරය විස්තර කෙරෙනුයේ 'හී විටේ වල් පැලවෙන කාලය' යනුවෙනි. නගුලින් සීසෑමේ දී හීවිටෙන් දෙපැත්තට පෙරළෙන පස් කැටි වතුර බැඳීමත් සමග යටවන නමුත් ඇතැම් පස් කැටි (ගොඩැලි) වතුරට යට නොවී පවතින අවස්ථා ද වෙයි. එවැනි ගොඩැලිවල වල් පැළවෙන්නේ දින පහළොවක් පමණ ගත වූ පසුව ය. 'හී විටේ වල් පැළවෙන කාලය' යනුවෙන් අදහස් කෙරෙනුයේ එයයි. මේ දෙවනවර කෙටීමත් සමග එතෙක්

මර්ධනය නොවූ වල් නැවතත් යටපත් වන බැවින් වල් මර්ධනය කෙරේ අමතර අවධානයක් යොමු කිරීමට අවශ්‍යතාවක් ඇති නොවේ.

වැපිරීම සඳහා බිත්තර වී සකසා ගත්තේ ද එක් කන්නයකින් ලැබෙන අස්වැන්නෙන් කොටසක් වැස්සෙන් හානි නොවන පරිදි වියළා ආරක්ෂා කර ගැනීමෙනි. සාමාන්‍යයෙන් අලුත ලබා ගත් බිත්තර වී වැපිරීමට සුදුසු තත්ත්වයට පත් වීමට අවම වශයෙන් දින 45ක් පමණ ගත විය යුතු ය. හොඳින් වියළා වසරක් ඇතුළත ඒවා භාවිත කිරීම අවශ්‍ය ය. වසරක් ඉකුත් වූ බිත්තර වී වැපිරීමට සුදුසු නොවේ. ගොයම් කපන කාලයේ දී වර්ෂා කාලය එළඹිය හොත් එය පහව යනතුරු ගොයම් කැපීම සිදු නොකෙරෙන්නේ ද බිත්තර වී සකසා ගැනීමේ දී එහි ගුණාත්මකභාවය හීන වීමට වර්ෂාවෙන් බාධා ඇතිවිය හැකි බැවිනි. යම් හේතුවක් නිසා යමෙකුගේ බිත්තර වී විනාශව ගියහොත් ඔහුට ලබා දීමට තරම් ප්‍රමාණවත් බිත්තර වී අතිරික්තයක් ඇතැම් ගොවීන් සතු විය.

ගොයමට හානි කළ වල්පැල ලෙස ඇටෝරා, බඩතැල්, දියගෝවා හා බැලතණ හඳුනාගෙන තිබූ අතර ඒවා මර්ධනය කරන ලද්දේ ඉගිල්ලීම වැනි සරල ක්‍රම මගිනි. මුල් අවස්ථාවේ දී ම හඳුනා ගැනීමෙන් වල් මර්දනය පහසු විය. දිගුකලක් වතුර බැඳීමෙන් ඇටෝරා හැරුණු විට අනෙක් වල්පැල බොහොමයක් මර්දනය කළ හැකි වුවත් එසේ දිගුකාලීන ජල රැඳවුම යොයම් ගසේ කඳ කුණු වීමට හේතුවිය හැකි බැවින් සාර්ථක ක්‍රමයක් නොවී ය.



**ඡායාරූපය 4 : කුඹුරු කෙටීම, නියර මඩතැබීම, තවන් ගැලවීම හා ගෙයම් සිටුවීම -ගංගොඩ**

භූමිතෙල් භාවිතයක් නොවූ කාලයේ දී මේ ගම්වැසියන් ආලෝකය සපයා ගැනීම සඳහා කැකුණ තෙල් භාවිත කළහ. කැකුණ ඇට වේලා මදය ඉවත් කොට තලා හැළියක බහා උණු කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස තෙල් ඉවත් වීම සිදු වෙයි. තෙල් ඉවත් කර ගත් පසු ඉතිරි වන කැකුණ මණ්ඩි ද අධික  ලෙස තෙල් ගතිය අන්තර්ගත වූවකි. ඒවා රැස්කොට ලියදිවලට ඉසීමෙන් වල්පැල වර්ධනය ඉතා අවම කර ගැනීමේ හැකියාව පැවතිණි. සම්ප්‍රදායික වී වගාව සිදු කෙරුනු කාලසීමාවේ කෘමීන්ගෙන් උවදුරු සිදු වූයේ ඉතා අවම වශයෙනි. මැස්සන්ගෙන් වන හානි බොහෝ විට ස්වභාවිකවම ජෛවීය ක්‍රමවේද ඔස්සේ පාලනය විය. අවට පිහිටා ඇති වනාන්තර ප්‍රදේශ නොයෙක් කුරුලු වර්ගවල ද, සමනලුන් හා බත්කූරන් වැනි කෘමි සතුන්ගේ ද වාසස්ථාන කලාපය වෙයි. වගා කාලවල දී භෝගවලට හානිකරන කෘමීන් මේ සතුන්ගේ ආහාර ලෙස වැදගත් වූ බැවින් පළිබෝධ මර්ධනය පිණිස ගොවීන්ට මැදහත්විය යුතු වූයේ සුලු පරිමාණයෙනි. කුඹුරු අතර පිහිටා ඇති ගොම්මන් ප්‍රදේශ ආශ්‍රිතව ද මෙවැනි මැළපොළවල් නිර්මාණය කෙරිණි. තවාන් කාලයේ දී ගොයම් ගසෙහි පත්‍ර කපා දමන පණු විශේෂයක් ‘කොළ කන පණුවා’ ලෙස හැඳින්වේ. මෙම හානිකර

තත්ත්වය මර්දනය කිරීම පිණිස තවාන නිර්මාණය කෙරෙන අවස්ථාවේදී ම කටයුතු කෙරිණි. තවාන කෙටුවාට පසුව ඊට තිත්තමල්, ඉද්ද, කැකුණ අතු, කරඳ, ගිනිසීරිය වැනි කොළ වර්ග දමා පෑගීමට ලක් කළ විට මෙම රෝගී තත්ත්වයේ ඇතිවීමක් සිදු නොවෙයි.

හේන් කෙටීම සිදු කෙරුණු කාලයේ දී කුරුල්ලන් වැනි සතුන්ගෙන් ගොයමට සිදු වූ හානි ඉතා අවම විය. හේන් ප්‍රදේශවලින් උන්ගේ ආහාර සපයා ගත හැකි වූ බැවිනි. එබැවින් වියළි කලාපයේ දක්නට ලැබෙන 'කුරුලු පාලුව' හෙවත් කුරුල්ලන්ගේ ආහාරය පිණිස වෙන් කරන කොටස් මෙම වගාබිම්වල දක්නට නොලැබේ. දවල් කාලයේ දී හෝගවලට සුලු වශයෙන් වුවත් හානි කරන කුරුල්ලන් මර්දනය පිණිස 'ලැටිය තැබීම' නම් ක්‍රමය අනුගමනය කර ඇත. කොහොල්ලෑවලින් වැරටි සාදා ඒවා ලීයක අතුරවන අතර එවැනි ලී කිහිපයක් තැබීමෙන් ඒ මත වසන කුඩා කුරුල්ලන් එහි ඇලී හසුවීම මෙයින් අදහස් කෙරෙන ක්‍රමවේදයයි.

වගාවේ ආරක්ෂාව පිණිස අතීතයේ දී විවිධ කෙම් ක්‍රම භාවිත කළ බව දනිතත් ඒවා විස්තර වශයෙන් සඳහන් කිරීමට වයස්ගත ගැමියන් පවා අසමත් ය. කුඹුරු කිරිවදින කාලයේ දී කෘමි සතුන්ගෙන් හා ඌරන් වැනි සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම පිණිස වැලි මතුරා ඉසීම එක් කෙම් ක්‍රමයකි. එවැන්නක් කළ බව මතකයේ තිබුණ ද මැතිරිය යුතු ගාථාව කුමක් ද යි ඇතැමුන්ට කීමට හැකියාවක් නොවී ය. මීමුරේ ප්‍රදේශයේ මෙවැනි කෙම් ක්‍රමයක් කුඹුරු තහනම නමින් හැඳින්වෙන බව වාර්තා කර ඇත. ඒ අනුව, කිසිවෙකු හමු නොවන වේලාවක දී පාන්දරින් ඉර මුදුන් වන්නට පෙර කුඹුරට යන ගොවියන් මන්ත්‍රයක් ජප කොට මැතිරූ වැලි කුඹුරට ඉසිනු ලැබේ. එම මන්ත්‍රය නම්, 'අඹන් මැස්සෝ, වෙර මැස්සෝ, පාලි මංගර, දෝලි මංගර, කහ මංගර, කිරි මංගර, තෙද මංගර, උණ මංගර දෙවියන්ගේ අණින් වරුවට, දෙවරුවට, තුන්වරුවට මේ කෙතෙන් ඉවත් වන්නට යහපති' යනුයි(රාජපක්ෂ 2007: 162). මීමුරේ හා මැදිවක ගංගොඩ අතර අතීතයේ සිට අන්තර් සම්බන්ධතා පැවැති බැවින් ද, මෙම ප්‍රදේශ උඩුදුම්බර විස්තෘත කලාපයට අයත් වන බැවින් ද ඉහත කී නොදන්නා මන්ත්‍රය එය වීමට ඉඩ තිබේ. පිටවල ප්‍රදේශයේ අවුරුදු අසූ හයක් පමණ වයසැති ගැමියෙකු මැස්සන් පලවා හැරීමේ මන්ත්‍ර තිබූ බව පිළිගත් නමුත් ඒවා දූන් අනවශ්‍ය බවත්, මැස්සන්ගේ ආහාරය නැති කිරීම පාපයක් බවත් ප්‍රකාශ කළේ ය. ඔහු එය විස්තර කළේ 'අනුන්ට හිංසා කොට කෑමක්' යනුවෙනි. කොහොඹ ඇට හා පොතු තලා ඒවායේ යුෂ සකස් කොට 'සබබ පාපසස අකරණං' යන ගාථාවෙන් මතුරා කුඹුරට ඉසීමෙන් ද මැස්සන්ගෙන් වන උවදුරු දුරු වූ බව වැඩිහිටි ගොවියෝ ප්‍රකාශ කළහ. කලවැල් කපා තලා භාජනයකට දමා පල් වීමට හැර පෙරා කුඹුරුවලට ඉසීම තවත් ක්‍රමවේදයකි. කොහොඹ ඇට සොයා ගැනීමට ඇති නොහැකියාව මත මෙම ක්‍රමය ද අභාවයට ගොසිනි.

කෙම් ක්‍රමයක්ම යැ යි කිව නොහැකි වුව ද සතුන්ගේ උවදුරුවලින් හෝග ආරක්ෂා කර ගැනීමට බන්ධන ක්‍රමවේද ද උපකාර විය. වරක් ඉරිඟු හේනකට ඌරන්ගෙන් ඇතිවූ හානි වැළැක්වීමටත්, මන්ත්‍ර ක්‍රමය අත්හදා බැලීමටත් ගම්වැසියෙකු විසින් ඌරු මුඛ බන්ධනය නමින් හැඳින්වෙන බන්ධනය සිදු කරන ලදි. අවශ්‍ය කළමනා සොයා ගැනීමෙන් පසුව ඊට අදාළ මන්ත්‍රය 108 වරක් ජප කොට රාත්‍රී 12න් පසු හේනේ හතර කොන ආරක්ෂා කෙරිණි. පාන්දර යාමයේ කඩා වැදුණු ඌරකු ඉරිඟු ගස් කිහිපයක් කඩා දැමීමෙන් පසු එක්වනම දිවීමට පටන් ගත් බවත්, උදෑසන වන විට දොළ පහරක් අසළ ඌරෙකු මැරී සිටින බව දැන ගැනීමට ලැබුණු බවත් එම ක්‍රමය අත්හදා

බැලූ ගැමියාගෙන් දැන ගැන්මට ලැබිණි. මෙයින් කම්පාවට පත් ගැමියා ඉන් පසු එවැනි ක්‍රම අනුගමනය කිරීමෙන් වැළකුණේ ය.

ගංගොඩ හා මැදිවක ප්‍රදේශයේ කෙම් ක්‍රම බොහෝවිට භාවිතව ඇත්තේ මැස්සන් හා සිවුපා සතුන් පලවා හැරීම පිණිස ය. එහෙත් පහතරට ප්‍රදේශයේ පණුවන් සඳහා ද කෙම් ක්‍රම භාවිතව තිබේ. බෙල් විසින් වාර්තා කරනු ලැබ ඇති එක් කෙමක් පහත පරිදි ය.

> '...පසේ බුදුරජානන් වහන්සේ රත්ඇල්රුසියා ලඟට වැඩියා. එතනදී දානයක් දෙණ්ඩ දෙයක් නෑ. මහා බ්‍රහ්මරාජයා ලඟට ගොහින් ඉල්එවා. ඉල්ලාපු තැනදී රත්ඇල් දුන්නා. ඒ වී වැපුරුවා. එතනදී පලමුවෙනි කොලෙට ගැටපනුවෝ වැහුවා. සත් වර්ගයක් වැහුවා. බුදුරජානන්වහන්සේගේ ආනුභාවෙන් ඒ පනුවෝ අහක්වෙණ්ඩ ඉල්එවා. එවිට ඒ පනුවෝ අහක් උනා. සත්වෙනි පෙත්තේදී රන්වන් කරලක් වැටුනා. ඒ කරලට සත්වර්ගයක් මැස්සෝ වැහුවා. එවිට බුදුරජානන්වහන්සේගේ ආනුභාවෙණ්ඩ ඉල්එවා. එවිට අහක් උනා. ඉතින් ඒ විය කොටලා, බත් පිස දවල් දානය කොට දුන්නා. ඒ බුදුරජානන්වහන්සේගේ ආනුභාවෙන් අදත් අහක් වෙණ්ඩ ඕනෑ...... (රාජපක්ෂ 2007: 75).

දෙමුහුන් බීජ හඳුන්වා දීමට පෙරාතුව සාම්ප්‍රදායික වී වර්ග වගා කිරීම සිදු වූ අතර ඒවායින් ලැබුණු අස්වැන්න දෙමුහුන් වීවලට සාපේක්ෂව යම් අවම බවක් පෙන්නුම් කළේ ය. එහෙත් ගුණාත්මක බවින් ඒවා ඉතා උසස් මට්ටමක පැවැති බව වයස්ගත ගැමියෝ පවසති. ගංගොඩ හා මැදිවක ප්‍රදේශයේ පච්චපෙරුමාල්, කාබොකුරු, කලු වී ( කලු හීනටි), සුදු වී (සුදු හීනටි), දේවරාජ, මුරුංගා වී, හුරුළු වී, සුවඳුල් ආදී වී වර්ග වඩාත් ජනප්‍රිය වී තිබිණි. පල්ලෙවෙල ප්‍රදේශයේ දී අසන්නට ලැබුණු පරිදි දශක හයකට පමණ පෙර 'මරි වී' නමින් හඳුන්වන ලද වී වර්ගයක් බහුලව වගා කෙරිණි. එහි හාල් ඇටයේ පිටපොත්ත කහට පැයෙන් යුතු තිවුඩ්ඩ අධික වූවක් විය. මරි වී ඇටය ඉතා විශාල වූ අතර වී ඇටය අග කෙන්ද වැඩි දිගකින් යුතු විය. එවැනි වී ඇට සියයක් පෙළට තැබූ විට ඒ දුර ප්‍රමාණය පැනීමට සමතෙක් නොවූ බව මේ ගැමියෝ පවසති. පිටවල ප්‍රදේශයේ වගා කළ විශාල ඇට සහිත, සුදු පැහැති වී වර්ගයක් 'නරුහාල් වී' යනුවෙන් හඳුන්වන ලදි. සුදු වී හෙවත් සුදු හීනටි වගා කරන ලද්දේ යල කන්නය උදෙසා ය. ඒවා මාස තුනකින් පමණ අස්වනු නෙලන කාලය උදා වෙයි. මුරුංගා වී වගා කෙරෙන්නේ වතුර පහසුව අඩු කුඹුරු සඳහා ය. දේවරාජ වීවල අස්වනු නෙලීමට මාස පහක් පමණ ගත වන නමුත් බුසලට බුසල් 30ක පමණ ඉහළ අස්වැන්නක් ලැබිණි. මුප්පංගන් වීවලින් ද බුසලකට බුසල් 35ක් 40ක් පමණ ලබා ගත හැකි විය. සුදු වී වලින් බුසලකට බුසල් 30-35 අතර ප්‍රමාණයක් ලබා ගැන්ම අපහසු නොවී

අස්වනු නෙලන කාල සීමාව තීරණය වූයේ වපුරන ලද වී වර්ගයේ ස්වරූපය මත ය. බාල වී වර්ග නම් මාස තුනමාරෙන් පමණ අස්වනු නෙලිය හැකි වූ අතර දේවරාජ, මුප්පන්ගන්, සුදු වී, ඇල් වී, හීනටි වී ආදී මූකල වී වලට මාස 4, 1/2ක් හෝ 5ක් ගත විය. 'මූකළ වී' යනු 'වැඩි කාලයක් ගත වන වී' යන අදහසයි. අස්වනු නෙලීම සිදු වූයේ අත්තම් ක්‍රමය පදනම් කර ගනිමිනි. අත්තම් ක්‍රමය කෘෂිකාර්මික ජනසමාජයේ සාමූහිකත්වය හා විශ්වාසය ගොඩ නගන ප්‍රායෝගික ක්‍රමවේදයක් විය. යම් පුද්ගලයෙකුගේ නෙලීමකට සහභාගි වන පිරිස අස්වනු නෙලීම අවසන් කොට එය පෑගීමේ කටයුතුවලට ද සහභාගි වූ අතර ඔවුන්ට ආහාර පානයෙන් සංග්‍රහ කිරීම ගොයමේ හිමිකරුගේ කාර්යභාරයක් සේ සැලකුණි. අත්තමට පැමිණියවුන්ගේ කුඹුරු වැඩවලට ඒ ආකාරයෙන්ම සහාය

වීම අත්තම් සහාය ලබා ගත්තවුන්ගේ යුතුකම විය. යායම කැපීමට සුදු තත්ත්වයට පත්ව ඇති නම් ගමෙහි සියල්ලන් විසින් ම කතිකා කොටගෙන දින දෙක තුනක් තුළ යාය කැපීම ද දක්නා ලදි. ඊට සහභාගි වූවන් සඳහා සංග්‍රහ කිරීමට කිරිරොටි, කොට්ට කිරිබත් ආදී කැවිලි පෙවිලි සකස් කිරීමට ස්ත්‍රීහු මුල්තැන් ගෙන ක්‍රියා කළහ.

ගොයම පැසී අස්වනු නෙලීමට ආසන්නවත්ම කමත සැකසීම කෙරෙහි අවධානය යොමු වෙයි. සාමාන්‍යයෙන් සෑම කුඹුරකටම පාහේ කමතක් පවතින අතර ඇතැම් කුඹුරු සඳහා කමත වෙනුවෙන් ම වෙන් කළ අවකාශයක් පවතී. එහි වී වගා කිරීමක් සිදු නොවන අතර වට්ටක්කා වැනි භෝගයක් සඳහා එම අවකාශය වෙන් වෙයි. එසේ නොමැති අවස්ථාවල දී පැගීමට තරම් ප්‍රමාණවත් ඉඩක් සහිත ලියද්දක අස්වනු පළමුව නෙලා එම ලියද්ද එළි පෙහෙළි කොට, බිම පිරියම් කිරීමෙන් හා වට බිත්ති බැඳීමෙන් කමතකට සුදුසු පරිදි සකස් කර ගනු ලැබීම සිරිතයි. ගංගොඩ අස්වැද්දුම කුඹුර මීට එක් උදාහරණයකි. එසේ නොවන අවස්ථාවක හෙවත් කමත සඳහා ම වෙන් කළ අවකාශයක් පවතින විට එහි ආකෘතිය නිරම පාහේ වෘත්තාකාර හැඩයක් ගනී. කමතෙහි ප්‍රමාණය වපුරන බිමෙහි ප්‍රමාණය නැතහොත් පැගීමට සිදුවන කොළයේ ප්‍රමාණය මත තීරණය වී තිබේ. කුඹුරේ උස් ස්ථානයක් කමත් අවකාශයට වෙන් කර ගැනීම ගෞරවයටත් වඩා ජලය රඳා නොපැවතීම පදනම් කොට ගත්තකි. වසර 16කට පමණ පෙර දුම්බර කුඹුර නමින් හැඳින්වෙන කුඹුරු යායෙහි ගලින් ම බැඳි කමතක් දක්නට ලැබිණි. මේ පාරම්පරික කමතෙහි වේල්ල අඩි අටක පමණ උසකින් යුක්ත වූ අතර කමත් දොරකඩ නිර්මාණය කර තිබුණේ ද උස් ගල් පුවරු දෙකක් දෙපසින් යෙදීමෙනි. මේ අසාමාන්‍ය ස්වරූපය නිසා එහි පැගීමට සම්බන්ධ වූයේ ගමෙහි විසූ ශක්තිමත් හා පළපුරුදු ගොවීන් පමණක් වන අතර නවකයන් ඊට එක් වීමට අකමැති වූහ. අඩි අටක උසින් යුතු කමත් වේල්ලකින් එපිටට පිදුරු විසි කිරීම දුෂ්කර කාර්යයක් බැවිනි. එහි ප්‍රතිඵලයක් වූයේ 2000 වසරේ දී එම කමත බිඳ දැමීම ය. කමතකට ඇතුල්වීම සඳහා සකසන ප්‍රවේශ ස්ථානය කමත් දොරකඩ යනුවෙන් හැඳින්වෙයි. එය ගවයෙකුට ඇතුල්විය හැකි ප්‍රමාණයේ ඉඩක් සහිත වූවකි. මීට අමතරව හදිසි වැසි කාලගුණයක් ඇති වුවහොත් කමත තුළ රැස්වන ජලය පිට කිරීම පිණිස දිය බැස්සවුම් දොරටුවක් ද කමත් බැම්මෙහි නිර්මාණය කෙරෙයි.

ගොයම් කොළය ගොඩගසනු ලබන්නේ කමතෙහි මැද නිර්මාණය කෙරෙන කමත් යන්ත්‍රය මත ය. කමත් යන්ත්‍රය නිර්මාණය කිරීමට පළමුවෙන් බිම පිරියම් කිරීම කළ යුතු වේ. එනම් පැගීමට සුදුසු පරිදි නැවුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමයි. මෙය සිදු කෙරෙනුයේ කමතෙහි ගොම පිරියම් කිරීමෙනි. කමත් බිම හොඳින් පවිි කොට මැටි ආලේප කරන අතර කමත් බැම්ම හෙවත් කමත් වේල්ලෙහි ද මැටි ආලේප කෙරේ. කමත තුළට වතු හරවා බිම සෝදා හැරීමෙන් පසුව කමත් බිම වේලීමට හැරීම අවශ්‍ය ය. අනතුරුව බෝලත්තක් භාවිත කරමින් මැටි බිම මත හොඳින් දිය කළ ගොම ආලේප කළ යුතු ය. කමතෙහි ප්‍රමාණය අනුව ආලේප කළ යුතු ගොම ප්‍රමාණය ද අඩු වැඩි විය හැකි ය. අවශ්‍ය ගොම ප්‍රමාණය සාමාන්‍යයෙන් ප්‍රමාණ කෙරෙනුයේ 'පුද්ගලයකුට වරකට ගෙන යා හැකි ගොම ප්‍රමාණය මෙන් තුන් ගුණයක්' යනුවෙනි. වරකට ගෙන යා හැකි ගොම ප්‍රමාණය කිලෝ හතළිහකැයි සලකන විට කමතේ ගොම පිරියමට වැය වන ගොම ප්‍රමාණය කිලෝ 120ක් පමණ වෙයි. මෙසේ ගොම මැටි ආලේපනයේ ප්‍රතිඵලයක් ලෙස කමත් බිම ගල් වැලිවලින් තොර ස්ථානයක් බවට පරිවර්තනය වේ(ඡායාරූපය5, 6).



ඡායාරූපය5 : තාවකාලිකව සැකසුණු කමත - ගංගොඩ



ඡායාරූපය6 : ගොයම් මැඩීමෙන් පසු කමත - ගංගොඩ

ගොයම් ගොඩ ගැසීමට පෙරාතුව කමතෙහි කමත් යන්ත්‍රය ඇඳීම හෙවත් අලුවම් වඩනු ලැබේ. කමතේ මධ්‍යයේ සිට පිටතට විහිදෙන පරිදි වෘත්ත හතක් නිර්මාණය කෙරෙන අතර ඒවා කේන්ද්‍රයේ සිට දිශා හතරකට හෝ අටකට බෙදීම ද සිදු කෙරෙයි. දිශා දැක්වෙන රේඛාවන්ගේ කෙළවර ත්‍රිශූල ලකුණේ හැඩය නැතහොත් නාග 'ප'යන්න ඇඳ දැක්වීම සිරිතකි. කවයේ මධ්‍යය අරක්පොළ නමින් ව්‍යවහාරිත ය. අරක්පොළ මැද අරක්ගල තබා ඒ වටා තොලබෝ වළල්ල ද, වළල්ද මැද අරක් බෙල්ලා නමින් හැඳින්වෙන කටු බෙල්ලෙක් හා ඊට අමතරව කොහොඹා කොටය, යකඩ කැබැල්ලක්, පුවක් ගෙඩියක්, දුවයෙන් කළ සිරිපතුල් සංකේතයක් ආදී වස්තු ද තැන්පත් කෙරේ. තොළබෝ වළල්ල සකස් කරගන්නා ලද්දේ බෝ කොළ, කරල් හැබ කොළ, හීරැස්ස කොළ, හීරැස්ස දළු ආදිය තොලබෝ කොළයක ඔතා කිරිමදුවැල්වලින් වෙලීමෙනි. ඉහත සඳහන් කව හත අඳිනු ලබන්නේ තොලබෝ වළල්ලට පිටතිනි. මීමුරේ ප්‍රදේශයේ දී කමත් යන්ත්‍රය මැද එනම් අරක්පොළෙහි වලක් කපා ඒවා එහි තැන්පත් කිරීමේ සිරිතක් පවතී (රාජපක්ෂ 2007: 165). අනතුරුව අට දිශාවන්හි කෘෂිකටයුතු සඳහා උපකාර කර ගන්නා ලද උදැල්ල, බැතපෝරුව, කුල්ල, උකුණු ගහ, නගුල, දැකැත්ත, කෙවිට, බෝලත්ත ආදී වස්තූන් ඇඳ දැක්වීම සිදු කෙරේ. ගංගොඩ මැදිවක ප්‍රදේශයේ භාවිත කෙරෙන කමත් යන්ත්‍රය රත්නපුර, කෑගල්ල වැනි ප්‍රදේශවල භාවිත වූ කමත් යන්ත්‍රවලට අඩු වැඩි වශයෙන් සමාන වූවකි. කමත මැද අරක් වළක් හෑරීමක් මේ ප්‍රදේශයේ දක්නා නොලැබෙතත් අනෙනකුත් ප්‍රදේශවල එවැනි වලක් හාරා ඒ තුළ තැන්පත් කිරීම් සිදු කිරීම සිරිත වෙයි. රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් හා කුරුවිටි කෝරළේ ආශ්‍රිතව වාර්තා කර ඇති අන්දමට අරක් වළ මැද ගොන් කණුවක් සිටුවා ඒ අග පුවක් මලක් ගැට ගසනු ලැබේ. කමත් චාරිත්‍ර සඳහා දවට, දෙහි, නුග, බුලත්, දොඩම්, ඉළුක්, ගොයම් ආදී පිළිල ද, අරක් බෙල්ලා, රබ්බඩ ගෙඩි, කදුරු කොළ, වරකා ගැටය, මීගෝර, නයි ගෝර, එළු ගෝර, අස් ගෝර, ඇත් ගෝර, ගොන් ගෝර, මුව ගෝර ආදිය ද, රිදී, රත්‍රං, තඹ, පිත්තල, ලෝකඩ හා වානේ යන ලෝහ වර්ග ද, යකඩ දැකැත්ත, රත්න ජාති, මුතු ඇටයක් හා පබළු ද යන මේවා සපයා ගත යුතු වෙයි (Coomaraswamy 1906:417-419). රයිගම් කෝරළයේ භාවිත කමත් යන්ත්‍රයෙහි අඳිනු ලබන්නේ ලාහ, කුල්ල, පෝරුව හා දෑතිගොයියා යන මේ උපකරණ සතර පමණි. එහෙත් සියනෑ කෝරළයේ කමත් යන්ත්‍රය අංග දොළොසකින්

සමන්විත වෙයි. දිවිකඳුරු කොටය, කොහොඹ ලෑල්ල, කොරස ගැටේ, කටු හක්ගෙඩිය, දෑකැත්ත, ගල, පෝරුගොයියා, දතිගොයියා, බෝලත්ත, බුදුන්ගේ ශ්‍රී පතුළ, යලගොයියා හා අඬුව යන මේවා ය (Bell 1886). අයිවර්ස් විසින් වාර්තා කරනු ලැබ ඇති පරිදි කමත් යන්ත්‍රය සඳහා සිරිපතුල, චන්ද්‍ර මණ්ඩලේ, සූරිය මණ්ඩලේ, හග්ගෙඩිය, බැතපාහින කුල්ල, බැත මනින ලාහ, කොලවැඩ කරන උකුනු දැත්ත, බැත එකතු කරන ගොයිපෝරුව, බැතවල කටුව අහක් කරන කටුමාන අත්ත හා බැත අතුගාන බෝලත්ත යන මේවායේ රූප අඳිනු ලැබේ (Ievers 1880:46-52).

අලුවම් වැඩීම සඳහා භාවිත කරන අලු පිරිත් කොට ආරක්ෂාවක් බවට පත් කර ගැනීම ගැමියන්ගේ සිරිත වී තිබිණි. ඒ සඳහා යොදා ගනුනේ ද සබ්බ පාපස්ස අකරණං යන ගාථාවයි. එය හත්වරක්, දාහතරවරක් හෝ විසි එක් වරක් මතුරන ලදි. පල්ලෙවෙල ප්‍රදේශයේදී අසන්නට ලැබුණු පරිදි අලුවම් වැඩීමේ දී යොදා ගන්නා කමත් යන්ත්‍ර කිහිපයක් පැවතිණි. වංකගිරිය එක් ආකෘතියකි. වංකගිරිය යනුවෙන් අදහස් කරන ලද්දේ එකකට එකක් පිටතට විහිද යන ආකාරයෙන් නිර්මාණය කෙරෙන වෘත්ත හත බවට සැකයක් නැත. එහෙත් සාමාන්‍යයෙන් වංකගිරිය අඳිනු ලබන්නේ එකිනෙකින් වියුක්ත වෘත්ත ලෙස නොවේ. මැදිවියෙහි පසුවන ගොවීන් මේ කව හැඳින්වූයේ ධර්මචක්‍රය හා ඉර හඳ ආදී වශයෙනි. පරම්පරා දෙකක් අතර සිය සංස්කෘතික උරුමය සම්බන්ධයෙන් සිදුව ඇති දුරස්වීම මේ අර්ථකථනයන්හි විෂමතාව මගින් පෙන්නුම් කෙරෙයි. ජලනන්දන, සීවලී ආදී පිරිත් වලින් හෝ සබබ පාපසස අකරණං යන ගාථාවේ මුල් අකුරු කිහිපයක් යන්ත්‍රයක් පරිදි යොදා ගත් අවස්ථා ද තිබිණි. බොහෝ විට මේ අකුරු සහිත යන්ත්‍රය කොළයක ලියා අරක්පොළෙහි තැන්පත් කරන කොහොඹ පෝරුවේ සවි කෙරිණි. නැතහොත් එක් කවයක් වටා මේ අකුරු කිහිපයක් අලුවලින් ඇඳ දක්වන ලදි. කමත් යන්ත්‍රය ඇඳ අවසන් වීමෙන් පසුව කපන ලද ගොයම් තැන්පත් කිරීම සිදු වෙයි. මුල් කාලයේ දී කමතට ඇතුල්වීමට කාන්තාවන්ට අවසරයක් නොවී ය. ඔවුන් ගොයම් මිටි හිසින් ගෙනවුත් කමත් දොරකඩ අසළ සිටි අතර පිරිමින් ඒවා භාරගෙන කමත තුළ තැන්පත් කිරීම සිදු කළහ.

ගොයම් පෑගීම මුළුමනින්ම ගවයන් මගින් සිදු කෙරුණකි. අස්වැන්නේ ප්‍රමාණය අනුව කමතේ ප්‍රමාණය තීරණය වෙයි. කමතේ විශාලත්වය අනුව ගවයන්ගේ සංඛ්‍යාව තීරණය වෙයි. කමත් දොරින් ඇතුල් කෙරෙන ගවයන් දක්ෂිණාවෘත්තව කොළ පෑගීමේ යෙදවිණි. ප්‍රමාණවත් තරම් වේලාවක් පෑගුණ විට ඒවා නැවත නැවත ඇතිරීම සිදු කෙරෙයි. සිවුවතාවක් පමණ ඇතිරීමෙන් අනතුරුව කොළය කැඩීම හෙවත් මැඩුවන් ඉවත් කිරීම සිදු කරන ලදි. වී ඇට ගැලවී වෙන් වූ පිදුරු මැඩුවන් නම් වේ. මේවා කමත් වේල්ලට එපිටින් ගොඩ ගසනු ලැබී ය. අනතුරුව බෝල් තැබීම හෙවත් අතුගෑම මගින් පිරිසුදු කළ යුතු ය. මේ සඳහා බෝලතු උපකාර කර ගැනුණි. කමතෙහි පිරී තිබෙන බැතට යටවී ඇති මැඩුවන් ඇතොත් උකුණුගහ භාවිතයෙන් ඒවා ද ඉවත් කෙරෙයි. හත්වරක් පමණ බෝල් තැබීමෙන් අනතුරුව වී ඇට හොඳින් වෙන් වී ඇත් දැයි පරීක්ෂා කරන අතර සම්ප්‍රදායික ගොවීන් කොළය පෑගෙන ශබ්දයෙන් ඒ බව දැනගැනීමට තරම් හැකියාවකින් යුතු වූහ. මෙසේ කිහිපවරක් බෝල් තැබීමෙන් ද, මැඩුවන් ඉවත් කිරීමෙන් ද, පිරිසුදු කිරීමෙන් ද පසුව කමතෙහි රැස්ව තිබෙන බැත ගොඩ ගසා ගැනීමට අවස්ථාව එළඹුණේ ය.

පාගා ගොඩ ගසාගත් බැත නිවාස කරා රැගෙන යාමට තවලම් ක්‍රමය යොදා ගැනුණි. ඒ සඳහා පළපුරුද්දක් සහිත තවලම් ගොනුන් මේ ප්‍රදේශයේ වූ බැවින් ප්‍රවාහනය එතරම් වෙහෙසකර

නොවී ය. මේ සඳහා යොදා ගැනුණේ ද එළ හරකුන්ගේ පිරිමි සතා පමණකි. තවලම් ගොනුන් නඩත්තු කිරීම කළ හැකි වූයේ ද ශක්තිමත් ගැමි තරුණයන්ට ය. යම් හේතුවක් නිසා බඳින ලද ගෝනි කඩා වැටීමකට ලක් වුවහොත් ඒවා ඔසවා නැවත සකස් කර ගැනීමේ හැකියාවක් එවැන්නවුන් සතුව පැවතිණි. අස්වනු හෝ වෙනත් භාණ්ඩ ප්‍රවාහනය පිණිස අවශ්‍ය ගෝනි ද, ගොනා හැසිරවීමට අවශ්‍ය පටි ආදිය ද විශේෂයෙන් සකස් කර ගැනේ. දෙපසට සමබරව වැටෙන පරිදි එල්ලනු ලබන ගෝනි 'කලවා ගෝනි' නමින් හඳුන්වන ලදි. පිට මත අතුරවන ඇතිරුම් හැඳින්වූයේ 'හැඳ' යනුවෙනි. මීට අමතරව කන්දක් නගින අවස්ථාවේ ගොනා පල්ලමට යාම වළකනු පිණිස 'කර ලණුව' ප්‍රයෝජනවත් වූ අතර පල්ලමක යන විට ඉදිරියට ලිස්සා යාම වැළැක්වීමට යොදා ගැනුණේ 'පස්සා පටිය'යි. දෙපස එල්වන ගෝනි පැත්තකට නොයා සමබරව පවත්වා ගන්නා ලද්දේ 'බඩ ලණුවේ' ආධාරයෙනි. අණට කීකරු වීම තවලම් ගොනුන් සතු විය යුතු සුවිශේෂී ගුණාංගයක් විය. මෙසේ තවලම් මගින් ප්‍රවාහනය කිරීම මඩුගල්ල වැනි ප්‍රදේශවල ද දක්නට ලැබිණි. නිවාස වෙත ප්‍රවාහනය කෙරෙන බැත වේලීමට නියමිත වෙයි.

වගා කටයුතු පිණිස ශ්‍රම දායකත්වය බෙදී යාමේ සංකීර්ණ රටාවක් හඳුනා ගැනීම අපහසු ය. පැවැති ක්‍රමවේදය වූයේ සාමූහිකව සිය දායකත්වය ලබා දීමයි. අත්තම් ක්‍රමය මගින් වැඩි වියදමකින් තොරව සිය කටයුතු ඉටු කර ගැනීමේ අවස්ථාව පැවතිණි.හේන් මෙන්ම කුඹුරු වගාව සඳහා ද වයස් භේදයකින් තොරව කටයුතු කළ අතර කමත් චාරිත්‍ර සම්බන්ධයෙන් කාන්තාවන් යම් සීමා කිරීමකට ලක් කොට තිබිණි. ඒ අනුව කමත තුළට ප්‍රවේශවීම කාන්තාවන්ට අකැප වූ අතර ගොයම් මිටි කමත් දොරකඩ අසළට පමණක් ගෙන ඒම පමණක් ඔවුන්ගෙන් සිදු විය. එහෙත් ක්‍රමයෙන් මෙම සුලුපරිමාණ තහංචි පවා වෙනස් වී ඇති ආකාරය විසිවන සියවසේ දෙවැනි භාගය සම්බන්ධ අත්දැකීම්වලින් කියැවෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන් හේන් කෙටීම, කුඹුරු කෙටීම ආදී ගොවිතැනෙහි පිරිමින් නිරතවන  සැම කාර්යයකම පාහේ නිරතවීමට හුරු වූහ. වර්තමානය වන විට කමත් කටයුතුවලටට පවා කාන්තාවන් මැදිහත් වන අවස්ථා දක්නා ලැබේ.

අඳ ක්‍රමය සාමාන්‍යයෙන් දැකිය හැකි පරිදිම කරුණු දෙකක් පදනම් කර ගනිමින් ක්‍රියාත්මක විය. එකක් නම් ඉඩම් හිමි එහෙත් වගා කටයුතුවල යෙදීමට නොහැකි පිරිස් විසින් සිය වගාබිම් අඳයට පවරා දීමයි. ඉඩම් අහිමි සුලුතර කොටසක් ද ප්‍රදේශයේ වූ බැවින් ඉඩම් හිමියන් වෙත ගොස් වගා කිරීම පිණිස ඉඩම් කැබැල්ලක් ඉල්ලා සිටීමෙන් අඳ ක්‍රමය ක්‍රියාත්මක වීම දෙවැනි ක්‍රමවේදයයි. වර්තමානයේ පිංකුඹුරු හෙවත් විහාර කුඹුරු අඳයට දී ඇති නමුත් ඒවා මුල් කාලයේ සිට මෑතක් වනතුරු රාජකාරි ක්‍රමයට ලබා දුන් ඒවා ය. අතීතයේ දී අඳකරුවාට බිත්තර වී හෝ වෙනත් වියදමක් ලබා දීමේ සම්ප්‍රදායක් නොතිබිණි. එහෙත් පසුකාලීන පරිවර්තනවලට අනුව අඳ ක්‍රමයේ දී අස්වැන්නෙන් 50%ක් බැගින් ඉඩම් හිමියා හා අඳකරුවා අතර බෙදී යයි. බොහෝ විට පොහොර වියදම ද දෙදෙනා විසින් බෙදා ගනු ලැබේ. අයිතිකරු විසින් සැපයෙනුයේ බිත්තර වී පමණකි. එහෙත් අතීතයේ දී රසායනික පොහොර භාවිතයක් නොතිබූ බැවින් කුඹුර සරු කර ගැනීමේ වගකීම අඳකරුවාට පැවරෙන්නට ඇත. මෙය සාමාන්‍ය තත්ත්වය නමුත් සැම විටම එලෙසම ක්‍රියාත්මක වී යැ යි කීම අපහසු ය. නිදසුන් ලෙස පල්ලෙවෙල විහාරයට අයත් කුඹුරු අඳයට දීමේ දී පොහොර වියදම ද, සැමට වැයවන මුදල ද සපයන බව දැන ගැනීමට ලැබිණි. එය තීරණය වන්නේ අඳකරුවාගේ ජීවන මට්ටම අනුව ය. මෙම විහාරයටම අයත් තවත් පිං කුඹුරක් එක්කස්සේ කුඹුරු

යායට අන්තර්ගතව පවතී. එහි ප්‍රමාණය බුසල් තුනක් පමණ වෙයි. මහ කන්නයේ අස්වැන්නෙන් 50%ක් විහාරයට ලබා දෙන අතර යල කන්නයේ දී එළවළු වගා කරනු ලැබේ. එළවළු අස්වැන්නෙන් කොටසක් විහාරයට ලබා ගැනීමක් සිදු නොකෙරෙයි.

කුඹුරුවල අනන්‍යතාව හඳුනා ගැනීම පිණිස ඒවා විවිධ නම්වලින් හැඳින්වීමේ සිරිත මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක වේ. එම නම්වලට ද වසර සියගණනක් පුරා දිවෙන අඛණ්ඩතාවක් පවතින බව කීම අතිශයෝක්තියක් නොවෙයි. නිදසුනක් ලෙස, පල්ලෙවෙල විහාරයට අයත් පිංකුඹුරු පිහිටා ඇති කුඹුරු යාය ඇතුළත් ප්‍රදේශය වර්තමානයේ හැඳින්වෙන්නේ 'එක්කස්ස' යනුවෙනි. මෙම නාමය ක්‍රි. ව. 1731 වර්ෂයට අයත් සන්නසක ද සඳහන්ව ඇත. ඒ අනුව එක්කස්සේ කුඹුරෙන් ලාස් 15ක් නයිදප්පු නම් අයෙකු විසින් පල්ලෙවෙල විහාරයට පූජා කරන ලදි. එක්කස්ස යන්නෙහි අදහස 'තණබිම' යනුයි (Codrington 1996:15). මේ කුඹුරු නාම දෙස බැලීමේ දී පැහැදිලි වන කරුණක් නම් ස්ථානීය පිහිටීම, ප්‍රමාණය, සමීප විශේෂ ගසක් හෝ වෙනත් ඉදිකිරීමක්, භූගෝලීය ලක්ෂණ, හිමිකාරීත්වය ආදිය පදනම් කර ගනිමින් එම නාමකරණ සිදු කර ඇති බවයි. මැදිවක ගංගොඩ ආශ්‍රිත කුඹුරු කිහිපයක නම් පහත පරිදි ය. 'මහකුඹුර' යන නාමය එම කුඹුරේ ප්‍රමාණය සලකා බලා යොදන ලද්දකි. සාමාන්‍යයෙන් 'කුඹුර' යනුවෙන් හැඳින්වෙන වගා බිම් ඒකකයක් සඳහා අවම වශයෙන් අක්කර කාලක් අයත් වෙයි. සාමාන්‍ය ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයේ කුඹුරක් මහකුඹුරක් වන්නේ අනෙක් කුඹුරුවල ප්‍රමාණය ඉක්මවා යන බැවිනි. නිශ්චිත ස්ථානයක් පදනම් කර ගනිමින් ද නාමකරණ සිදු වී තිබේ. 'පට්ටියගාව කුඹුර' එවැන්නකට නිදසුනකි. කුඹුර සමීපයේ හෝ සීමාවේ යම් විශේෂ ගසක් දක්නා ලැබෙන අවස්ථාවක එම ගසෙහි නමින් කුඹුර හැඳින්වීමේ සම්ප්‍රදායයක් ද පවතී. 'කහටගහ කුඹුර', නාරංගහ කුඹුර', 'බුලුගහයට කුඹුර', 'උණපඳුර ළඟ කුඹුර', සියඹලා ගහයට කුඹුර', 'මල්ගහයට කුඹුර' ආදී කුඹුරු නාම ඇති වූයේ ඒ අනුව ය. එකී ගස්වල පැවැත්ම දිගුකාලීන නම් අදාළ කුඹුරු නාමය ද හොඳින් මුල්බැස ගනු ඇත. 'බෝගහයට කුඹුර'ට නම ලැබුණේ ඒ සමීපයේ පිහිටි බෝගස හේතුවෙනි. බෝගස් කැපීම පාපයක් ලෙස සලකන බැවින් එහි ජීව කාලය දක්වා මේ නාමය ඒ හා බද්ධව පවතිනු ඇත. ස්ථානීය පිහිටීම සලකා බලා සිදු කළ නාමකරණ ද පවතී. 'එගොඩ කුඹුර' යනුවෙන් අදහස් කෙරෙනුයේ එවැන්නකි. යම් ජල මාර්ගයකින් එපිට පිහිටන කුඹුරක් එලෙස හැඳින්වීමට යෝග්‍ය ය. ඉන් වක්‍රව වටහා ගත යුත්තේ 'මෙගොඩ කුඹුරු' ද පවතින බව ය. ඒ අනුව එවැනි නම් ඇති වීමේ තීරකයා වන්නේ දෙගොඩ බෙදා දක්වන ස්වභාවික මායිමයි. 'දේවහරියෙන් පල්ල' එවැනි තවත් නාමයකි. දේවහරිය ප්‍රකට ස්ථාන නාමයක් වන විට එයින් පහළ කොටසේ පිහිටා ඇති කුඹුරු පිළිබඳ ගැමියෝ දනිති. ඇළ මාර්ගයක් හේතුවෙන් ද භූමිය ඉහළ හා පහළ යනුවෙන් බෙදීමකට ලක් වෙයි. වගාව පිණිස සකස් කර ගත හැකි භූමියක් නම් ඉහළ හා පහළ කොටස්වල කුඹුරු නිර්මාණය කෙරෙනු ඇත. 'ඇලෙන් පල්ල', 'ඇලෙන් උඩ' ලෙස නම් කර ඇත්තේ එවැනි කුඹුරු ය. මෙහිදී 'ඇළ' නිශ්චිත බෙදීම් නිර්නායකය වන අතර, 'පල්ල' හා 'උඩ' යන වචන මගින් ඇළට සාපේක්ෂව භූමියේ පිහිටීම නියෝජනය කර තිබේ (Codrington 1996:18). විශාල කුඹුරු යායවල් එකම නමකින් හැඳින් වූ අවස්ථා ද වෙයි. 'මුත්තෙට්ටුව' එවැන්නකි. විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වූ කුඹුරු යායක් ඉන් ඇඟවෙයි. මහනුවර රාජධානි සමයේ දී මුත්තෙට්ටු යනුවෙන් හඳුන්වන ලද්දේ සේවා හෝ බදු ගෙවීමට බැඳී සිටි ගැමියන් විසින් අස්වද්දන ලද රජුගේ හෝ වෙනත් ප්‍රභුවරයෙකුට හෝ තාවකාලික ප්‍රදානලාභියෙකුට හෝ ගම් ප්‍රධානියෙකුට අයත් කුඹුරු යායකි. එය නින්ද මුත්තෙට්ටු හා අඳ මුත්තෙට්ටු යනුවෙන්

දෙයාකාර විය. නින්ද මුත්තෙට්ටුව ඉඩම් හිමියාගේ වරප්‍රසාදයක් ලෙස අනෙකුත් ගැමියන් විසින් මුළුමනින් ම නොමිලේ අස්වද්දා දෙන ලද්දකි. අඳ මුත්තෙට්ටුව අස්වද්දන්නාට අස්වැන්නෙන් අඩක් ලැබෙන පරිදි ක්‍රියාත්මක වූ වගා ක්‍රමයකි (Codrington 1996:38).

**වර්තමාන අර්බුදය**

වී වගාව සම්බන්ධයෙන් මෑත කාලයේ සිදුව ඇති සැළකිය යුතු විපර්යාසය කක්කුට්ටා හඳුන්වාදීමයි. පටු ලියදි සෑමට හැකි පරිදි නිර්මාණය කරන ලද කුඩා ප්‍රමාණයේ යන්ත්‍රයක් කක්කුට්ටා යන නමින් හඳුන්වනු ලැබේ. මෙම යන්ත්‍රය හඳුන්වා දී තවමත් ගතව ඇත්තේ වසර හයක පමණ කාලයක් වුව ද මේ ගැමි ජීවිතයේ හා පරිසරයේ වෙනස්කම් ගණනාවක්ම සිදු කිරීමට ඊට හැකියාව ලැබී ඇත(ඡායාරූපය 7 ). මෙතෙක් කලක් සීසෑම සඳහා අනුගමනය කළ සම්ප්‍රදායික ක්‍රමවේදය වන ගොනුන් බැඳි නගුල භාවිතය මුළුමනින්ම පාහේ අතුරුදන්ව යාමත්, ගව පාලනය ආශ්‍රිත ජීවන සම්ප්‍රදාය තුරන් වී යාමත් ඒ අතුරින් ප්‍රමුඛ වෙයි. මුල් වරට කක්කුට්ටෙක් මෙම ප්‍රදේශයට ගෙන එන ලද්දේ 2010 වර්ෂයේ දී පමණ ය. නගුල හා කක්කුට්ටාගේ ක්‍රියාකාරීත්වය අතර යම් සමාන අසමානකම් දක්නා ලැබේ. දිනකට සෑමට හැකි බිම් ප්‍රමාණය සලකන විට විශේෂ වෙනසක් පෙන්වා දීම අපහසු ය. හරක් බානක් බැඳි නගුලකින් දිනකට බුසල් දෙකක් හෝ දෙකහමාරක් සෑම මෙතෙක් ලබා ඇති අත්දැකීමයි. කක්කුට්ටෙකුගෙන් සෑමට හැකි බිම් ප්‍රමාණය ද බුසල් දෙකකි.

නව යන්ත්‍රයෙන් මතුපිට පස් කැට කුඩු කර දැමීම නිසා වතුර රඳා පැවැත්මක් සිදු නොවේ. ජලය මතුපිටින් ගසා ගෙන යාමත්, වැලි පෑදීම හා පස තදවීමත් යන අහිතකර තත්ත්වයන් නිර්මාණය වීමට මේ ක්‍රියාකාරීත්වය හේතු වේ. මේ නිසා කක්කුටුටා එළවළු වගාව සඳහා පමණක් ආදේශ කිරීමට ඔවුන් කල්පනා කරන බවක් පෙනේ. හඳුන්වා දුන් මුල් අවස්ථාවේදී පසෙහි මෙවැනි වෙසක් ඇති වන බව මේ ගැමියෝ දැන නොසිටියහ.



**ඡායාරූපය 7 : කක්කුට්ටා නම් යන්ත්‍රයෙන් සී සෑම - ගංගොඩ**

කක්කුට්ටාගේ හඳුන්වාදීම සමාජයේ අන්තර් සබඳතාවට සිදු කළ බලපෑම කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. මෙය එක් අතෙකින් වගා ශ්‍රමය පිළිබඳ කරුණක් පමණක් නොවෙයි. කෘෂි සමාජයක පැවැත්ම බෙහෙවින් තීරණය වනුයේ ඔවුන් අතර පවත්නා අන්තර් සහයෝගය හා බැඳුණු සබඳතා මත ය. මේ සහයෝගිතාව නිරූපණය වූයේ 'අත්තම් ක්‍රමය' මුල් කර ගනිමිනි. වර්තමානයේ ද අත්තම් ක්‍රමය යම් දුරකට ක්‍රියාත්මක වන නමුත් අඩු ශ්‍රමයක් අවශ්‍ය වන යන්ත්‍ර සූත්‍ර මගින් සාමූහික ක්‍රියාකාරකම් සඳහා වන ජන ඒකරාශීත්ව අඩපණ කරනු ලැබේ.

දෙවැනි අහිතකර ප්‍රතිඵලය නම් භෝග වගාව සඳහා විවිධ ලෙඩ රෝග ඇතිවීමත් ඒවායින් ගැලවීම පිණිස කෘෂි රසායන කෙරෙහි වැඩි විශ්වාසයක් තබමින් කටයුතු කිරීමට සිදු වීමත් ය. විශේෂයෙන් ජෛව පළිබෝධවල වැඩිවීමක් පෙන්නුම් කරන ලද්දේ ඉකුත් වසර දහයක පමණ කාලයක් තුළ දී බව වැඩිහිටි ගැමියන් විසින් නිරීක්ෂණය කරනු ලැබ තිබේ. විවිධත්වයෙන් යුතු භෝග වගා කිරීම පිණිස ජලය ලබා ගැනීමේ අපහසුව වැනි කරුණු බලපා නැත. ගංගොඩ, මැදිවක, පල්ලෙවෙල වැනි ප්‍රදේශ වගා කිරීමට නොහැකි තරමේ ජල හිඟයකට මුහුණ නොදෙයි.

සාම්ප්‍රදායික වී වර්ග වෙනුවට ජානමය වශයෙන් වැඩි දියුණු කළ නැතහොත් දෙමුහුන් වී වර්ග වගා කිරීමට අධ්‍යයන ප්‍රදේශයේ ගොවියෝ පෙළඹී සිටිති. බහුතරයක් දෙනා දන සිටින සාම්ප්‍රදායික වී වර්ගය ලෙස ප්‍රකාශ කළේ BG 11 නමින් හැඳින්වෙන වී වර්ගයයි. එහෙත් වයස්ගත ගොවීන් තම කුඩා කාලයේ දී හා යටත් පිරිසෙයින් වසර පනහකට පමණ පෙර වවන ලද පැරණි වී වර්ග පිළිබඳ දන සිටියහ. සම්ප්‍රදායික වී වර්ග වලින් ලැබෙන අස්වනු ප්‍රමාණය දෙමුහුන් වීවලින් ලැබෙන අස්වැන්නට වඩා අඩු අගයක් ගැනීම මෙම විතැන්වීමට බලපා ඇති ප්‍රධාන හේතුවකි. එහෙත් මේ දෙවර්ගයේ ගුණාත්මක වෙනස සම්බන්ධයෙන් පැරණි වීවල අගය පිළිබඳ ගොවියන් අතර ගෞරවයක් පවතී. වසර විස්සක පමණ කාලයක සිට යකඩමරං නමින් හඳුන්වන වී වර්ගයක් වගා කෙරෙයි. එහි විශේෂ ලක්ෂණයක් නම් සාපේක්ෂව වැඩි අස්වනු ප්‍රමාණයක් බලා ගැනීමට ඇති හැකියාව ය. එහි අස්වනු කාලය මාස 4, 1/2කි. සරු කුඹුරක් නම් බුසලකින් බුසල් තිහක අස්වැන්නක් අපේක්ෂා කිරීමට ඉඩ තිබේ. වගා ශ්‍රමය හිඟවීම හේතුවෙන් කුඹුරු පුරන් වීම මැදිවක, ගංගොඩ, ගොඩකුඹුර හා පල්ලෙවෙල යන ගම්මාන සියල්ලම පාහේ මුහුණ දී ඇති ගැටලුවකි. මේ සඳහා ආර්ථික හා සමාජයීය ගැටලු අඩු වැඩි වශයෙන් බලපා තිබේ. වර්තමාන පරම්පරාවගේ ආකල්ප පැරණි පරම්පරාවන්ට වඩා බෙහෙවින් වෙනස් ස්වරූපයක් ගැනීම ඉන් එකකි. ගොවිතැන ලාභ ලැබිය නොහැකි අඩු මට්ටමේ රැකියාවක් ලෙස සිතීම මගින් ඊට යම් උත්තේජනයක් ලබා දී ඇත. යුද හමුදා, පොලිස් හා ආරක්ෂක, ගුරු, ඇඟළුම් වැනි විවිධ වෘත්තීන් මෙම ප්‍රදේශයේ තරුණ ශ්‍රමය ආකර්ෂණීය කර ගැනීමට සමත්ව ඇත. සෑම පවුලකම පාහේ ආරක්ෂක අංශයට සම්බන්ධ සාමාජිකයෙකු පිළිබඳ අසන්නට ලැබෙයි. දනට ගොවිතැනෙහි නියැලෙන වයස 25-30 අතර පසුවන ප්‍රමාණය ගංගොඩ ගම සම්බන්ධයෙන් අටදෙනෙකුට පමණ සීමා වීම මේ තත්ත්වය පැහැදිලි කරන එක් නිදසුනකි.

එළවළු වගාව හා නූතන ආර්ථික සමාජ ප්‍රවණතා මේ ගම්මානවලට පැමිණීමට පෙර කුඹුරු වගාව සඳහා පැවැතියේ ඉහළ ඉල්ලුමකි. ඉඩම් අහිමි පුද්ගලයන් තැගිභෝග ද රැගෙන ඉඩම් හිමි පුද්ගලයන් හමුවීමට ගොස් මේ කන්නයේ දී තමන්ට අඳයට වගා කිරීම පිණිස ඉඩම් කැබැල්ලක් ඉල්ලා සිටියහ. සෑම කුඹුරක්ම පාහේ අස්වද්දන ලද බැවින් ඔවුන්ගේ ඉල්ලීම් ඉටු කිරීම ඉතා අපහසු

විය. එහෙත් වර්තමානයේ ඉඩම් හිමියන්ට අඳකරුවන් සොයා ගොස් සිය කුඹුර අඳයට අස්වද්දන්නැයි ඉල්ලා සිටීමට සිදු වී තිබීම මෙම ප්‍රදේශයේ සාමාන්‍ය ජීවන ක්‍රමවේදයේ ප්‍රතිවිරුද්ධ පැවැත්මක් නිරූපණය කරවයි. වසර විස්සකට පමණ පෙර මෙම ප්‍රදේශයේ කිසිදු කුඹුරක් පුරන්වීමක් පිළිබඳ අසන්නට නොලැබුණි. එහෙත් 2015 මහ කන්නයේදී පමණක් මැදිවක කුඹුරුවලින් බුසල් 10ක් අත්හැර දමන ලදි. වගා කිරීමට මිනිසුන් නොමැතිවීම ඊට හේතුවයි. ඇතැම් කුඹුරු මුළුමනින්ම පාහේ එළවළු වගාව සඳහා යොදාගෙන තිබීම මෙහි තවත් පැතිකඩකි.

කමත් චාරිත්‍ර අභාවයට යාම ඉකුත් දශක තුනක පමණ කාලයේ දී ඇතිව තිබෙන අයහපත් පරිවර්තනයකි. කමත් යන්ත්‍රයක අන්තර්ගතය නිවැරදිව විස්තර කිරීමට හැකි තරුණයකු මේ ප්‍රදේශයේ හමු නොවී ය. ගොයම් පෑගීම පිණිස ට්‍රැක්ටරය ආදේශ කර ගැනීමත් සමග එතෙක් හෝරා ගණනාවක් තුළ කය වෙහෙසීමෙන් කළ යුතු වූ ක්‍රියාවලිය අපහසු වූවක් ලෙස පෙනී ගොස් තිබේ.

අතීතයේ මෙන් දෙවියන් උදෙසා අඩුක්කු පිදීමක් දැන් සිදු කෙරෙනුයේ නැත. තාක්ෂණය විසින් දෙවියන්ගේ කාර්යභාරය තමන් වෙත ආදේශ කර ගැනීමත් සමග ගැමියන්ගේ විශ්වාස පද්ධතිය පුරන්වීමට පටන්ගෙන තිබේ. වැඩිහිටි හා වයස්ගත ගැමියන් කිහිප දෙනෙකු පමණක් ඒවායේ වටිනාකම සිහිපත් කරමින් පසුතැවිලි වෙමින් සිටිති. අඩුක්කු පිදීමෙන් තමන්ගේ වගාවට ලැබෙන සෙත පිළිබඳ විශ්වාසය තවමත් ඒ සුළුතරයෙන් ඉවත්ව ගොස් නැත. 2015 වර්ෂයේ යල කන්නයේ දී වර්ෂා රහිත දැඩි වියළි කාලගුණයකට මුහුණ දීමට මේ ගම්වැසියන්ට සිදු විය. ගොවි සංවිධානයේ සභාපතිවරයා අඩුක්කු පූජාවක් සිදු කිරීමට සිය සාමාජිකයන් පොළඹවා නිවෙස්වලින් සම්මාදම් කොට අගෝස්තු මස නව වන දින අඩුක්කු පූජාව පැවැත්වූයේ පිට ප්‍රදේශවලින් ගෙන්වාගත් කපු මහතුන්ගේ සහායෙනි. සම්ප්‍රදායික වගා කටයුතු වෙනස්වීමේ බලපෑම හුදෙක් ඒ ආශ්‍රිත භෝගවලට හෝ පරිසරයට පමණක් බලපාන්නක් නොවේ. ගැමි ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත්, විශ්වාස, මෙන් ම වාග්මාලාව ද නිර්මාණය වී ඇත්තේ කෘෂිකර්මාන්තය සමග බද්ධව බැවින් නව පරිවර්තන සමග ඒවායේ පිරිහීම ද අපේක්ෂා කළ යුතු ය. වගාකටයුතුවලට අදාළ විශේෂ වචන පිළිබඳ දැනුම වර්තමාන පරපුරෙන් ගිලිහී ගොසිනි. කලුන්තැන්න ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රදර්ශන පුවරුවක එවැනි වචන සමූහයක් ප්‍රදර්ශනය කර තිබීම මගින් වුව ද මේ පිරිහීමේ ස්වභාවය වටහා ගත හැකි ය.

කාලයක් පුරා යම් පවුලක් සතුව පැවැති කුඹුරක් එම පවුලේ දරුවන් අතර බෙදී යාම නිසා කුඹුරේ මුල් ප්‍රමාණ වෙනස්ව කුඩා කැබැලිවලට බිඳී ගොස් තිබේ. නිදසුනක් ලෙස ගංගොඩ ප්‍රදේශයේ වගළ නම් කුඹුර මුලින් එක් කුඹුරක් ලෙස තනි පුද්ගල හිමිකම යටතේ පැවැති නමුත් මේ වන විට එය තිදෙනෙකු අතරේ බෙදී ගොස් තිබේ. එනම්, වගළ අද කොටස් තුනකින් යුක්ත ය. මේ ආකාරයට ම ගෙදර කුඹුර ද කොටස් තුනකට බෙදී තිබේ. ගම අතහැර යාම, වගා කටයුතුවල තවදුරටත් නිරත වීමේ අකමැත්ත හෝ නොහැකියාව වැනි හේතු නිසා කුඹුරු විකුණා දැමූ අවස්ථා ද පවතී. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ කුඹුරුවල පාරම්පරික අයිතිය වෙනත් පිරිස් කරා විතැන් වීම ය. එසේ නමුත් ඒවායේ පැරණි නාමවල වෙනසක් සිදු කිරීමට මේ ගැමියන්ට මෙතෙක් අවශ්‍යව නැත. නිදසුනක් ලෙස බෙරකාර කුඹුර දැක්විය හැකි ය. එය විහාරයේ බෙර වාදනය කළ පවුලට අයත්

වූවකි. අද වන විට එය කොටස් දෙකකින් යුතු වන අතර එහි හිමිකරුවන් බෙර වාදන පවුලේ සාමාජිකයන් නොවේ. නමුත් කුඹුර තවදුරටත් බෙරකාර කුඹුර ලෙස භාවිත වෙමින් පවතී.

කෘෂි රසායන ජනප්‍රිය වීම ජෛවීය සමතුලිතතාව බිඳ වැටීමට බලපාන ප්‍රමුඛ හේතුවකි. ගොයම් හා එළවළු වගාවට අහිතකර ලෙස බලපාන කෘමි උවදුරු හා වෙනත් රෝග මර්දනයට සාම්ප්‍රදායිකව අනුගමනය කළ ක්‍රමවේද මුලුමනින්ම පාහේ අභාවයට ලක්ව පවතී. මුල් අවස්ථාවේ කෘමි උවදුරකට ආදේශ කරන කෘමි රසායන පසු කාලීනව සාර්ථක ප්‍රතිඵල ලබා නොදීම හේතුවෙන් ආදේශක හඳුන්වා දීමත්, ගොවියන් එවැනි ආදේශක භාවිතයට යොමු වීමත් සාමාන්‍ය තත්ත්වයක් බවට පත්ව තිබේ. තවාන සකසන අවස්ථාවේදී පොහොර එක් කිරීම නිසා ද ඇතැම් කෘමි උවදුරු වර්ධනය වෙතැ යි ගැමියෝ විශ්වාස කරති. උදාහරණ ලෙස කොළ කපන පණු රෝගය පෙන්වා දිය හැකි ය. පෝර ඉසීමත් සමග පණු රෝගය පැමිණීම ස්ථිර යැ යි යනු ඔවුන්ගේ අදහසයි.

කෘමිනාශක භාවිතයට වර්තමාන ගොවීන් පෙළඹී ඇති නමුත් ඒවා භාවිතයේ දී අනුගමනය කළ යුතු ප්‍රමිතීන් හෝ ආරක්ෂක ක්‍රමවේද හෝ අනුගමනය කිරීමට ඔවුහු උත්සුක නොවෙති. කෘමිනාශක ජලය සමග මිශ්‍ර කර ගැනීමේ දී හිතේ ප්‍රමාණයට ඒවා එකතු කිරීම නිසා කෘමිනාෂක සාන්ද්‍රණය අඩු වීම හෝ වැඩි වීම සිදු වෙයි. භාවිත කර අවසන් වූ කෘමිනාශක බෝතල් ජල කදුරුවලට මුදා හරින අවස්ථා ද දක ගත හැකි ය. මෙසේ කඳු මුදුන්වල සිට ගලා එන ජලය විෂ සමග එක්ව අපිරිසුදු වීම සිදු වේ. මෙය කෙතෙක් ගැටලුවක් වී ද යත් එවැනි ක්‍රියාවන් වැළැක්වීම පිණිස නඩු පැවරීමට කටයුතු කරමින් පවතී.

සාම්ප්‍රදායික ක්‍රමවේද භාවිත කොට කෘමි මර්දනය සිදු කිරීමේ දී සතුන් එම ක්‍රමවලට අනුගත වීමක් සිදු නොවී ය. එබැවින් වරින්වර එකම ෂත්ත්ව උවදුර දුරු කිරීම පිණිස විකල්ප ක්‍රමවේද නිර්මාණය කර ගැනීමට අවශ්‍යතාවක් පැරණි ගොවීන්ට නොවී ය. කෘමිනාශක සම්බන්ධයෙන් මේ තත්ත්වය වඩාත් සංකීර්ණ වේ. යම් සත්ත්ව වර්ගයක් ඉතා කෙටි කලකින් අදාළ කෘමිනාශක වර්ගයට ඔරොත්තු දෙන පරිදි හැඩ ගැසෙයි. නිදසුනක් ලෙස මැස්සන් මර්දනයට බහුලව භාවිත කෙරුණු ඩයිමෙතොඒට් නම් කෘමිනාශකය පෙන්වා දීමට පුළුවන. භාවිතය ඇරඹී කලකට පසුව මැස්සන් ඊට හුරු වූ බැවින් විකල්ප කෘමිනාශක කෙරෙහි යොමු වීමට සිදු විය. ඩයිමෙතොඒට් භාවිතය මේ වන විට තහනම් කරනු ලැබ තිබේ. එක් කෘමිනාශකයක් අසාර්ථක වන විට වෙනත් සමාගමක් විසින් විකල්ප කෘමිනාශක හඳුන්වා දීම සාමාන්‍ය අත්දැකීමයි.

ඉකුත් දශක දෙකක පමණ කාලයක සිට පස ආරක්ෂා කිරීම කෙරෙහි දක්වන අවධානය අඩු වෙමින් පවතී. විශේෂයෙන් වර්තමාන තරුණ පිරිස පාංශු සංරක්ෂණය කෙරෙහි සැලකිල්ලක් නොදක්වන තරම් ය. සාම්ප්‍රදායික ක්‍රමවේද භාවිත කරමින් වගා කටයුතු සිදු කළ කාලයේ දී ගොඩ නංවන ලද පස් සංරක්ෂණ වැටි ගංගොඩ, මැදිවක, පල්ලෙවෙල ආදී සැම ගමකම දක්නා ලැබේ. හේන් ක්‍රමය වුව ද එක් යායක් කෙරෙහි වසර හතකට පමණ පසු නැවත වගා කටයුතු කරන ලෙස හැඩගස්වාගෙන තිබුණේ පස වර්ධනය වීමට කාලයක් ලබා දිය යුතු බව ඔවුන් දැන සිටි බැවිනි. එහෙත් වර්තමානයේ ඒවා නොසලකා හැරීම නිසා පස සෝදාපාලුවට ලක්වීම වේගවත් වෙමින් පවතී. මෙහි අනිටු ඵලය වන්නේ පස නිසරුවීම හා අස්වනු බාල වීමයි. අනෙක් අතින් පාංශුජීවී ගහණය අවම වීමට ද, සරු අස්වනු ලබා ගැනීම පිණිස කෘෂි රසායන කෙරෙහි නැඹුරුවීම ද එහි වෙනත් අහිතකර පැති කිහිපයකි. සී. අයි. සී., හාක්‍රොස්, හේලීස් ආදී සමාගම් හයකට අධික

සංඛ්‍යාවක් මේ ප්‍රදේශයේ වගා කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වේ. එහෙත් පාංශු සංරක්ෂණ කටයුතු පිණිස එම සමාගම්වලින් මැදහත්වීමක් මෙතෙක් සිදුව නැත. පස නිසරු වීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන හේතුවක් වන්නේ පස සරු කිරිම සඳහා සම්ප්‍රදායික වගාව තුළ භාවිත කෙරුණු කාබනික පොහොර භාවිතයෙන් ගොවීන් ඈත් වීමයි. ඒ වෙනුවට රසායනික පොහොර කෙරෙහි වැඩි විශ්වාසයක් තබා තිබේ. කාබනික පොහොර මගින් පස සරු කිරීම පිණිස ඒ පිළිබඳ හැඟීමක් ද, කාලය හා ශ්‍රමය කැප කිරීමේ කැමැත්තක් හා මුදල් පසුපස හඹා යාමේ අතෘප්තිකර ආශාවෙන් මිදීමක් ද තිබිය යුතු ය. එහෙත් වැඩිහිටි කිහිප දෙනෙකු හැරුණු විට වර්තමාන ගොවියන් කෙරෙහි මේ ආකල්ප දැක ගත නොහැකි ය. පස නිසරු වීම හේතුකොට ගෙන ඇතැම් ගොවීන් ඩොලමයිට් පසට එක්කරන අවස්ථා දක්නට ලැබිණි. කෘෂි උපදේශකයින්ට අනුව එය උචිත ක්‍රමවේදයකි. රසායනික පොහොර භාවිතය නිසා පසෙහි ආම්ලිකතාව අධික ලෙස ඉහළ ගොස් ඇති බැවින් පස භාෂ්මික කිරිම පිණිස ඩොලමයිට් උපකාර වන බව කියනු ලැබේ. එබැවින් කන්නකට වරක් ඩොලමයිට් මිශ්‍ර කිරීමට කෘෂි නිලධාරීන් විසින් නිර්දේශ කර ඇත. අක්කරයකට මිශ්‍ර කිරීමට අවශ්‍ය ඩොලමයිට් ප්‍රමාණය කිලෝ 600කි. වසරකට වරක් ඩොලමයිට් දැමීම ප්‍රමාණවත් වීම වාසියක් වන නමුත් එය ද සිදු කරනුයේ ඉතා සීමිත පිරිසක් විසින් පමණි. මැදිවක හා ගංගොඩ දක්නට නොලැබුණත් පල්ලෙවෙල හා මඩුගල්ල වැනි ප්‍රදේශවල වී හා එළවළු වගාවට අමතරව දුම්කොළ වගාව ජනප්‍රිය වෙමින් පවතියි. නිසි ප්‍රමිතියෙන් යුතු දුම්කොළ සඳහා ඉහළ මිලක් ලැබීමත්, පැල, වගා ආධාර, උපදෙස් ආදිය දුම්කොළ සමාගම් මගින් ලබා දීමත් ඊට හේතු වී ඇත. ගංගොඩ ප්‍රදේශයේ අක්කරයක පමණ බිමක ගෝවා වගා කරමින් හුන් තරුණයෙකු තම ප්‍රදේශයේ දුම්කොළ වගාව සිදු කිරීමට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් අවසර ලබා නොදීම පිළිබඳව අප සමග පවසමින් කණගාටු විය. දුම්කොළ මිල දී ගැනීම සඳහා වූ ස්ථානයක් උඩුදුම්බර සමීපයේ පිහිටුවා තිබේ. වී හෝ එළවළු මෙන් නොව දුම්කොළ මිල පහත බැසීමක් සිදු නොවීමත්, වරින් වර මිල ඉහළ යාමත් ගොවීන්ව ඒ කෙරෙහි පෙළඹවීමට හේතු වී තිබේ. සුදුසු බීජ තවන් දමා පැළ කොට, ඒවා නියමිත ප්‍රමිතියට අනුව අඩි තුනෙන් තුනට සිටුවා වර්ධනය කොට සමාගමෙන් ඉල්ලන ප්‍රමිතියට අනුකූල වන සේ කොළ වේලා සකස් කොට භාර දීම සිදු කෙරේ. අවශ්‍ය බෙහෙත් හා පොහොර ණයට ලබා දීමට පියවර ගෙන ඇත.

ආකර්ෂණීය වැටුප් හා පිළිගැනීම් සහිත රැකියා කෙරෙහි ආකර්ෂණය වීම නිසා තරුණ පිරිස් විශාල වශයෙන් වගා කටයුතුවලින් ඉවත්ව යාම මෙම ප්‍රදේශයේ වගා කටයුතුවල අවසන් කාලසීමාව එළඹ ඇති බව සංකේතවත් කරවයි. ගංගොඩ ප්‍රදේශයේදී හමු වූ එක් තරුණ ගොවියෙක් පැවසුවේ තමන් සෞඛ්‍ය සෙවක පත්වීමක් උදෙසා ඉල්ලුම් කළ බවත්, එය ලැබුණු වහා ගොවිතැනෙන් ඉවත්ව යන බවත් ය. ගොවිතැනෙහි දක්ෂ තවත් තරුණයෙකුට ආරක්ෂක තනතුරක් ලැබී පූර්ණකාලීන ගොවිතැනෙන් ඉවත් වූයේ ඉතා මෑතකදී ය. අතීත පරම්පරාව හා වර්තමාන පරම්පරාව අතර පවත්නා ආකල්පමය වෙනස්කම් මගින් මේ තත්ත්වය වඩාත් සංකීර්ණ කරවනු ලැබේ. 'දියුණුව', 'සාර්ථකත්වය', 'ඉපයීම', 'සම්පත්' ආදිය පිළිබඳ වර්තමාන ආකල්ප චාම් බව හා සරලත්වය පදනම් කරගත් අතීත සමාජයට වඩා බෙහෙවින් දුරස්ත ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


Ananda, T. & Nallage, C. 2014. Traditional Agricultural Practices Unique to Meemure Villages, Kandy District Sri Lanka, In *International Journal of Multidisciplinary studies*, Vol.1 (1), p.19.

Bell, H. C. P. 1886. *Sinhalese Customs and Ceremonies Connected with Paddy Cultivation in the Low-Country*, Journal of the Ceylon Branch of the Royal Asiatic Society, Vol. Viii, Ceylon: Government Printer, pp. 44-91.

Bell, H. C. P. 1894. *Paddy Cultivation Ceremonies in the Four Korales, Kegalle District*, Journal of the Ceylon Branch of the Royal Asiatic Society, Vol. xi 1889-1890, Ceylon: Government Printer. Pp. 14-21.

Codrington, H. W. 1933. The Kevulgama Inscription, *Epigraphia Zeylanica, Vol. iii,* (eds.). D. M. D. Z. Wickramasinghe & H. W. Codrington, New Delhi: Asian Education Services. pp. 230-236.

Codrington, H. W. 1996. *Glossary of Native, Foreign and Anglicized Words; Commonly Used in Ceylon in Official Correspondence and Others,* New Delhi: Asian Educational Services.

Coomaraswamy, A. K. 1906. *Notes on the Cultivation Ceremonies in the Ratnapura District (Nawadun and Kuruwiti Korales),* Journal of the Ceylon Branch of the Royal Asiatic Society, Vol. xviii 1903-1905, Ceylon: Acting Government Printer. Pp. 413-431.

Epigraphia Zeylanica**,** ed.Don Martino De Silva Wickramasingha, Oxford University Press, London, Vol.III 1928-1933, pp. 71-78.

Ievers, R. W. 1880. *Customs and Ceremonies Connected with Paddi Cultivation*, Journal of the Ceylon Branch of the Royal Asiatic Society, Ceylon Times Press Company Limited. Pp. Coomaraswamy, A. K. 1906. *Notes on the Cultivation Ceremonies in the Ratnapura District (Nawadun and Kuruwiti Korales),* Journal of the Ceylon Branch of the Royal Asiatic Society, Vol. xviii 1903-1905, Ceylon: Acting Government Printer. Pp. 413-431. 46-51.

Lawrie, A.C. 1896. *A Gazetteer of the Central Province of Ceylon,* Colombo: Government Printer.

Meyer, E. 1996. *Paddy, Garden, Chena, Plantation: Was There a Peasent Strategy in the Kandyan Regions of Sri Lanka Before 1940?* (ed.) P. Robb, New Delhi, Oxford University Press. Sri Lanka Offprints, Phamplets etc, Vol. 51, pp. 182-227.

Mitchell, N., Rosler, M., & Tricaud, P., eds. 2009. World Heritage Cultural Landscapes-*A Handbook for Conservation and Management*. World Heritage Papers No.26. Paris: UNESCO World Heritage Centre.

Nicholas, C. W. 1963. *Historical Topography of Ancient and Medieval Ceylon*, In Journal of the Ceylon Branch of the Royal Asiatic Society, Colombo.

Paranavitana, S. 1970. *Inscription of Ceylon Vol.1,* Colombo, Department of Archaeology.

නිකලස්, සී. ඩබ්. 1979. පුරාතන හා මධ්‍යතන ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරයක්, පරි. එස්. ජයවර්ධන, දෙහිවල: තිසර ප්‍රකාශකයෝ

රාජපක්ෂ, එස්. 2007. **මීමුරේ: පුරාවිද්‍යාත්මක හා මානව විද්‍යාත්මක අධ්‍යයනයකි**, ජා ඇල: සමන්තී පොත් ප්‍රකාශකයෝ.

ආඛ්‍යානnarrations
**Volume 02 | Issue 01 | January – June 2017 | Article 04**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk



# ක්‍රි.ව. 8-10 සියවස් අතර කාලයේ අනුරාධපුරය සහ බැග්ඩෑඩය අතර වාණිජ සහ සංස්කෘතික සබඳතා

රෝහිත දසනායක[4]
B.A, M.S.Sc, PhD
kmrdasanayaka@yahoo.com

**සංක්ෂිප්තය**

ගෝලීය ආර්ථික හා දේශපාලනික සබඳතා වර්තමානයට සීමා වූවක් නොවේ. එහි අක් මුල් බෙහෙවින් ඇතට විහිදුනු ඒවාය. ශ්‍රී ලංකාව හා බැග්ඩෑඩය අතර පැවැති සබඳතා උදාහරණ වශයෙන් ගත හැකිය. ඒ සඳහා පසුබිම් වූ සාධක ද විවිධය, විචිත්‍ර ය. ඓතිහාසික මූලාශ්‍ර හා ඒවායෙහි වර්තමාන කියවීම් පදනම් කරගත් මෙම ආඛ්‍යානය ක්‍රි.ව. 8 - 10 සියවස් අතර කාලයේ අනුරාධපුරය සහ බැග්ඩෑඩය අතර වාණිජ සහ සංස්කෘතික සබඳතා පිළිබඳවය.

**ප්‍රමුඛ පදඃ** ඉතිහාසය, අනුරාධපුර, බැග්ඩෑඩය, වාණිජ හා සංස්කෘතික සබඳතා

## හැඳින්වීම

ක්‍රි.ව. 7 වන සියවසේ දී ඉස්ලාම් ධර්මය බිහිවන අවස්ථාව වන විට ඉන්දියන් සාගරයේ විශේෂයෙන් එහි බටහිර කොටස ආශ්‍රිතව නාවික කටයුතු හා වෙළෙදාම් සම්බන්ධයෙන් දීර්ඝ වූත් අඛණ්ඩ වූත් ඉතිහාසයක් ගෙවී ගොස් තිබුණි. එම කාලය තුළ සිදු කළ වෙළෙඳ සබඳතාවය, සාර්ථකත්වය, දේශපාලන බලය, උපායමාර්ගික වශයෙන් වැදගත් පිහිටීම, අමුද්‍රව්‍ය සහ හොඳ වරායවල් සොයා ගැනීමේ හැකියාව වැනි සාධක රැසක් මත රඳා පැවැති බව පෙනී යයි. මෙහිදී අවධාරණය කළ යුතු විශේෂ කරුණක් ඇත. එනම් ඉස්ලාම් ධර්මයේ පැන නැගීම සහ මුස්ලිම් පාලනය යටතේ අරාබි රාජ්‍යයේ ව්‍යාප්තියයි. එම සිදුවීම් ඉන්දියන් සාගරය තුළ මුස්ලිම් සහභාගිත්වය ඒකරාශි කළාවූ ප්‍රමුඛ සාධකයෝ වූහ. පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික මූලාශ්‍ර පෙන්වා දෙන අන්දමට ක්‍රි.ව. 7 වන සියවසේ දී ඉස්ලාම් ධර්මය බිහි වීම සමග අරාබිවරු දේශපාලන හා

[4] Senior Lecturer, Department of History, University of Peradeniya

ආගමික බලවේගයක් වශයෙන් පෙරට ආහ. එසේම කෙටි කාලයක් තුළ සමස්ත බටහිර ආසියා ම යටතට ගත් අතර අත්ලාන්තික් සාගරයට ළඟා වීම සඳහා උතුරු අප්‍රිකාව හරහා තම බලය පතුරුවා හැරීමටද සමත් විය. එපමණක් නොව නැගෙනහිර දිසාවෙන් අරාබි ව්‍යාප්තියේ මුල් වසර තුළ දී පර්සියාව යටත් කර ගැනීම වැදගත් සිදුවීමකි. ක්‍රි.ව. 8 වන සියවස ආරම්භයේ දීම ඔවුන් තම බලය ඉන්දියාවේ සින්ද් හා මුල්තාන් දක්වා දීර්ඝ කරගෙන තිබීම අමතක කළ නොහැකි සිදු වීමකි. මෙම දේශපාලන පසුබිම යටතේ ලංකාව සමග එතෙක් බටහිර ආසියානුවන් පැවැත් වූ සබඳතා ස්වරූපය කෙබඳු වීද යන් විමසීමට ලක් කළ යුත්තකි.

**මූලාශ්‍රය**

ශ්‍රී ලංකාව සෙරන්දීබ් (Serandib)[5] රතු කැට දිවයින හෙවත් Jaziratul Yakut[6] (Island of Rubies), සියලාන් (Siyalan)[7] සම්කාදිබ් (Samka-dib), සන්කාදිබ් (Sanka-dib), සරන්දිප් (Sarandip)[8], තප්‍රවාන් (Tapravan)[9] සලාභා (Salabha) , ලංගා, සහීලාන් (Sheelan)[10], සින්ගල්දිබ් (Singaldid) , තබ්රුබානි (Thabrubani)[11], ආදි විවිධ නම්වලින් බටහිර ආසියානු ලේඛකයන්, ඉතිහාසඥයන්, කවීන් සංචරකයන් හා වෙනත් රචකයන් බොහොමයක් ව්‍යවාර කිරීමට පුරුදු වී සිටි බව සිය ලේඛන විමසීමේදී පෙනි යයි. එහි දී ඔවුහු වඩා සැලකිල්ලට ගනු ලැබුයේ එහි ස්වභාවික පිහිටීම, සම්පත් සතුවීම, යන කාරණයන් ය. ඊට පරිභාහිරව ආදම් නම් සිය ආදි පිතෘවරයාගේ පා සටහන පිහිටා තිබිණැයි යන විශ්වාසය හේතු කොට ගෙන සිය කෘතින්ගේ ඒ බව සඳහන් කිරීමට අමතක නො කිරීම ශ්‍රී ලංකාවේ වැදගත් කම මතු වී ඒමට බලපෑ අතුරු සාධකයන් විය. මුල් කාලීන භූගෝල විද්‍යාඥයෙක් වූ අල්-බලසූරි, මසූදි අල් ඉද්‍රිසි සහ සුලෙයිමාන් යන වෙළෙන්දුන් ද ලංකාව

---

5 "***The Chāchnamāh*** **An Ancient History of Sind (giving the history of the Hindu period down to the Arab conquest**) Translated from the Persian manuscripts Mirza Kalichbeg Fredunbeg, Idarah-I Adabiyat-I , Delhi, 1900, pp. 69-70

6 ***Futu'hu-l Buldā'n of Ahmad Ibn Yahya Ibn Jabir Al-Biladuri,*****The History of India, as Told by Its Own Historians: The Muhammadan Period**, (eds.) H.M. Elliot and John Dowson, Vol. I, Trubner and Co., London, 1867, pp. 118-119***Baladhuri, Futuhul Buldān***, completeEnglish translation, Mustafal Babi Halabi, (Pub. not given), Cairo, 1935, p. 423; Ahmad Nafis, 'The Arab knowledge of Ceylon' **Islanic Culture**, Vol,19, 1940-p.221

7 ***Kitāb Al-Masālik Wa' l-Mamālik, Abu'l-Kāsim Obaidallah Ibn Abdallah Ibn Khoradhbeh,*****Bibliothéca Geographorum Arabicorum**, Vol. IV, (ed.), M.J. De Goeje, Lugduni-Batavorum, Apud E.J. Brill, Leiden, 1889, p. 42

8 ***Futu'hu-l Buldā'n of Ahmad Ibn Yahya Ibn Jabir Al-Biladuri,*****The History of India, as Told by Its Own Historians: The Muhammadan Period**, (eds.) H.M. Elliot and John Dowson, Vol. I, Trubner and Co., London, 1867, pp. 118-119***Baladhuri, Futuhul Buldān***, CompleteEnglish translation, Mustafal Babi Halabi, (Pub. not given), Cairo, 1935, p. 423

9 ***Buzurg Ibn Shahriyar, Kitāb 'Ajāyab-ul-Hind*** or ***The Book of the Marvels of India,*** (English trans.), L. Marcel Devic, The Golden Dragon Library, London, 1928, p. 154

10 ***Tahqiq ma li'l Hind*****: Alberuni's India**, (ed. and trans.), Edward C. Sachau, S. Chand and Co., Delhi, 1964, p. 309

11 M.A.M Shuki,. 'Muslims of Sri Lanka: A Cultural Perspective', **Muslims of Sri Lanka**, (ed.), Shukri M.A.M. Beruwela, Naleemia Institute, 1989, p.337

සෙරන්දිබ් ලෙස ව්‍යහාර කර ඇති අතර අල් බිරූණි සෙන්ගල් දිබ් හැරුණු විට ලංකා, සෙරන්දිබ්, ස්වර්ණ-භූමි, සහ සලාබ් ලෙසද ව්‍යවහාර ඇත.[12] ඉබන් ෂහිරියා සහ අබ්දුල් ෆීඩා තප්‍රොබේන්, සහිලාන්, සංගාදිබ් ලෙස සටහන් තබා ඇති අතර පර්සියානුන් ශ්‍රී ලංකාව දන ගෙන සිටියේ මුල් කාලීන අරාබි නාමයක් වන සින්ගල්දිබ් යනුවෙනි.[13] ඇතැම්හු පැරණි ග්‍රීක නාමය වූ තප්‍රොබේන් ලෙස ද ව්‍යහාර කිරීමට පුරුදු වී සිටියහ.

ක්‍රි.ව. 8 - 10 සියවස්වලදි අරාබි වංසකතාවල පර්සියානු කාව්‍ය සාහිත්‍යයේ මෙන් ම නොයෙක් දේශාටකයන්ගේ උගතුන්ගේ වාර්තාවල සෙරන්දිබ් දේශයේ ස්වභාවය වස්තූන් ආදි බොහොමයක් සඳහන් කරනුයේ අරාබි නාවික කටයුතුවල ආශ්‍රයෙන් ඔවුන් ලැබූ ජීවිතය ඇසුරිනි. මෙයින් බොහෝ දෙනෙක් ශ්‍රී පාදය වැඳීමට, මුතු මැණික් ලබා ගැනීමට හෝ අලුතෙන් යමක් සොයා ගැනීමට පැමිණියා වූ හෝ අය වෙති. සුලෙයිමාන් තාජි (Sulaiman Tajir)ක්‍රි.ව. 850 ද ශ්‍රී ලංකාවට පැමිණි අතර ඔහුගේ අදහස් *Salsilatatu-t Tawārikh*[14]නම් කෘතිය ඇසුරින් ක්‍රි.ව. 900 දී ශ්‍රී ලංකාවට පැමිණි Abu Zaid සඳහන් කොට තිබේ.[15] මෙම කාලයේ දීම අරාබි භූගෝල විද්‍යාඥයන් වූ අල් ඉස්ථාක්‍රි (Al-Isthakri ක්‍රි.ව. 950)[16] ඉබන් හක්වාල් (Ibn Hawqal ක්‍රි.ව. 977)[17] අල් මක්දිසි (Al-Maqdisi - ක්‍රි.ව. 985) ආදීන් ශ්‍රී ලංකාවට නොපැමිණිය ද ශ්‍රී ලංකාව පිළිබඳ බොහෝ වැදගත් තොරතුරු සම්භාරයක් ඉදිරිපත් කොට තිබීම ප්‍රශංසනීයය. ඔවුහු වෙනත් අරාබි සංචාරකයන් හා වෙළෙඳුන් මගින් තොරතුරු ලබා ගෙන සිය කෘති සම්පාදනය කළෝය. අරාබි සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණ ලියූ සංචාරක ලේඛන පදනම් කරගත් විස්තරාත්මක වාර්තා අනුව යමින් අරාබි භූගෝල විද්‍යාඥයින් විසින් අදාල කාලය තුළ සිදු වූ විස්මය ජනක වාණිජ කටයුතු පිළිබඳ කරුණු ඉදිරිපත් කොට තිබේ.[18]

---

12 Imam, S.A., "*Ceylon-Arab Relations*", in **Moors Islamic Cultural Home Souvenir**, Colombo, 1964-65, pp. 10-13.

13 ***Tahqiq ma li'l Hind*: Alberuni's India**, (ed. and trans.), Edward C. Sachau, S. Chand and Co., Delhi, 1964, pp. 209, 309

14***Salsilatatu-t Tawārikh" of the Merchant Sulayman with editions by Abu Zaidu-l Hasan of Siraf,* The History of India, as Told by Its Own Historians**, p. 5

15***El-Mas'ūdi's Historical Encyclopaedia entitled*** "***Meadows of Gold and Mines of Gems***", (trans.), Aloys Sprenger, p. 184, Wmqgd .ekSu S. Muhammad Husayn Nainar, **Southern India as Known to Arab Geographers**, University of Madras, Madras, 1942, pp. 149-151

16***Al-Istakhri, Al-Masālik wa'l-Mamālik***, **Bibliotheca Geographorum Arabicorum**, Vol. I, (ed.), M.J. De Goeje, Lugduni-Batavorum, Apud E.J. Brill, Leiden, 1927, pp. 170-173, 176-180 and ***Al-Istakhri, Al-Masālik wa'l-Mamālik*** (ed.), Mahammad Jabir, Abd al-'Al al-Hini, Cairo, 1961, pp. 169-178; ***Kitābu-L-Akalim of Abu ishak, Al Istakhri,* The History of India, as Told by Its Own Historians**, p. 26

17***Ashkalu-l Bilad or the Kitabu-I, Māslik Wa-L Mamālik of Ibn Haukal*, The History of India, as Told by Its Own Historians: The Muhammadan Period**, p. 31; ***Ibn Hauqal***, ***Surat al-Ard***, (ed.), J.H. Kramers, EJ. Brill,( Leiden, 1938), pp. 226-228 and 231-135

18 Ahmad Nafis, *'The Arab Knowledge of Ceylon '*, **Islamic Culture**, Vol.19, 1945, p.221

**ජනාවාස**

ශ්‍රී ලංකාවේඅරාබි ජනාවාසයන් ගේ ව්‍යාප්තිය ද මෙකල ආරම්භ වී තිබුණි. මෙකල වාණිජ කටයුතුවලදී අරාබි භාෂාව ද ව්‍යවහාර වී තිබේ. ඔවුන් පදිංචි වී සිටි ප්‍රදේශ අරාබි ජනාවාස ලෙස හැඳින් වුවත් සාමාන්‍යයෙන් පර්සියානු අරාබි ඇබිසීනියානු ජාතීන් සමග ද සම්ශ්‍රණය වි පොදුවේ ඉස්ලාමීයකරණයට ලක්ව අරාබියානු භාෂාව ව්‍යවහර කරන තත්ත්වයට පත්ව සිටියහ.[19] ඉස්ලාම් ආගම සහ අරාබි භාෂාව ඔවුන්ගේ කැපී පෙනන සංස්කෘතික ලක්ෂණ විය. මෙම සංස්කෘතික සබඳතාවලට මූලික පදනම් වූයේ වාණිජ කටයුතු ය. ක්‍රි.ව. 7 වන සියසේ සිට ඉන්දු නිම්නය දක්වා ව්‍යාප්ත වූ විශාල අධිරාජ්‍යයක් ගොඩ නැගීමත් සමග මෙම තත්ත්වය වඩාත් වර්ධනය වූ බව ඉහත පෙන්වා දී ඇත. සැලකිය යුතු මෙම ව්‍යාප්තිය සිදු වූයේ නැගෙනහිර සිට අත්ලාන්තික් සාගරයට ද බටහිර සහ දකුණේ අරාබියානු මුහුදේ සිට උතුරේ තුර්කි. කොකේසියස් දක්වා ය. ආරම්භයේ සිට ම අරාබි භාෂාව මුස්ලිම් ලෝකයේ සාහිත්‍යයීක භාෂාව විය, අරාබි භාෂාව විදේශ විද්‍යාවක් සමග වැඩි දියුණු වී ගියේය. ක්‍රි.ව. 9-10 සියවස්වල දී ප්‍රකට අද්විතිය සාහිත්‍යයික භාෂා ධාරාවක් ලෙස විශ්වීය මට්ටමකට පත් වී ගියේය.[20] පර්සියානු ගල්ෆ් ප්‍රදේශයේ සිට ශ්‍රී ලංකාවට පැමිණි අරාබි වෙළෙඳුන් මූලිකව ඔවුන්ගේ ඉස්ලාම් ආගම සහ අරාබි භාෂාව රැගෙන ආහ. ඔවුහු පර්සියන් ගල්ෆ්හි නිරන්තරයෙන් ව්‍යහාර කරනු ලැබුයේ අරාබි භාෂාව වීම එයට මූලික හේතුව විය. එසේ ම ආගමික වාග් විද්‍යාත්මක අතින් ඉස්ලාම් ආගම සහ අරාබි භාෂාව ශාස්ත්‍රීය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීමට ද උපකාරක ලෙස යොදා ගැණින.[21] ක්‍රි.ව. 9-10 සියවස්වල අරාබි සංචාරකයන්ගේ සහ රචකයන්ගේ වාර්තාවලට අනුව පෙනී යන්නේ සින්ද් ප්‍රදේශවල[22] සහ වෙනත් ශ්‍රී ලංකාවේ මුහුදු බඩ පලාත්වල මලයා අර්ධද්වීපයේ සහ චීනයේ කැන්ටන් ඇතුළු මුහුදුබඩ පලාත්වල භාවිත කළ බව ය. සිය භාෂාව ආගමික මෙන් ම වාණිජ කටයුතුවලට අනුබලයක් ලෙස වැදගත් විය. සමකාලීන ශ්‍රී ලංකාවේ අරාබි සම්භවක් ඇති මුස්ලිම්වරු අරාබි බස කථාකරන්නට ඇතැයි විශ්වාස කරන අතර එය ඔවුන්ට මුස්ලිම් ලෝකය සමග විශේෂයෙන් බැග්ඩෑඩ් නරගය සමග ගනු දෙනු පැවැත්වීමේ දී වඩාත් මහෝපකාරි විය. ඉහත දැක්වූ ලෙස මුස්ලිම් සමාජයේ ඉස්ලාම් ආගම සහ අරාබි බස ඉතා අවශ්‍යය එකිනෙකින් බැඳුණු කොටස් විය. මෙම පදනමින් මෙම යුගයේ ශ්‍රී ලංකාවේ පැවැති මුස්ලිම් සමාජ සංවිධානය පිළිබඳ යමක් සිතා ගත හැකිය.

මෙකල විශාල මුස්ලිම් පිරිසක් ජනාවාස කරගෙන සිටි අතර විවිධ මාධ්‍යයෙන් ඔවුහු දිනපතා ඔවුන්ගේ ආගමික පිළිවෙත් කරගෙන ගියහ. සෑම මුස්ලිම් සමාජ සංවිධානයක ම ඉතා වැදගත් අංගයක් ලෙස පල්ලිය (mosque) සැලකිය හැකිය. මුස්ලිම් ජනාවාසයන් පැවැති ස්ථානවල කුරානය ඉගැන්වීමට කුඩා ආගමික ගොඩනැගිල්ලක් ලබන්නට ඇත. නමුත් මෙම කාලයේ පැවැති පල්ලිවල

---

19 S.M.Yusuf, ‘*Ceylon and Arab Trade'*, **University of Ceylon History of Ceylon**, Colombo, 1960, p.709

20 M.A.M. Shukri, “*Muslims of Sri Lanka: A Cultural Perspective*”, M.A.M. Shukri, (ed.), **Muslims of Sri Lanka**, Naleemia Institute, Beruwela, 1986, p.340

21 **Ibid**, p.340

22 Majid Husain, **Evolution of Geographical Thought**, Rawat Publications, New Delhi, 1995, p. 118

සවභාවය පිළිබඳ යම් අදහසක් ලබා ගැනීමට ශේෂ වී ඇති ස්මාරකයක් දක්නට නොලැබේ. නූතනයේ පවතින ඇතැම් පැරණි පල්ලිවල ආරම්භක ඉතා පැරණි යුගයක් දක්වා ගෙන යාමට ඇතැමුන් උත්සහ කළ ද එයට ප්‍රමාණවත් සාක්ෂි නො මැත. මෙතෙක් කලක් එවැනි ගොඩනැගිලි ශේෂව තිබේ යැයි සිතිම උගහට ය. ශුක්‍රී මහතාගේ අදහස වන්නේ ඉස්ලාමීය සම්ප්‍රදායන්ට අනුව කුරානය ළමුන්ට ඉගැන් වූ Kuttab හෙවත් කුරාන් පාසැල් පල්ලිවලට අනුබද්ධිතව පවතින්නට ඇති බව ය.[23] නමුත් ඒ පිළිබඳ නිශ්චිත අදහසක් දීමට ප්‍රමාණව් සාක්ෂි මෙම කාලයේදී හමු නොවේ. ඉදිරියේ දී සාකච්ඡාවට බඳුන්වන අරාබි බසින් යුතු සෙල්ලිපි විශේෂයෙන් 9-10 සියවස්වලට අයත් යැයි සැලකිය හැකි සෙල්ලිපිවල අක්ෂර පවා බැග්ඩෑඩයේන් සකසා එවන ලද ඒවා බව සිතිය හැකි බැවින් එවැනි ලිපි සැකසිම ට තරම් භාෂාව හැසිර වූ පුද්ගලයන් නො සිටින්නට ඇතැයි අනුමාන කළ හැකිය. අරාබි භාෂාව සහ ඉස්ලාම් ආගම පිළිබඳ ඉහත සඳහන් කිරීම්වලින් මග පාදා ගැනීමට අවශ්‍යය වූයේ ශ්‍රී ලංකාවේ හමුවන අරාබි සෙල්ලිපිවල අර්ථය කුමක් දැයි විග්‍රහ කිරීමට පසුබිම හඳුනා ගැනීම සඳහා ය.

**සංස්කෘතික සබඳතා**

වෙළෙඳාම සඳහා ශ්‍රී ලංකාවට පැමිණි අරාබි වෙළෙඳුන් සිය අධිරාජ්‍යයාගේ අගනුවර වූ බැග්ඩෑඩ් සමග ඉතා වැදගත් සංස්කෘතික සබඳතා ඇති කර ගැනීමට උත්සහ කරනු ලැබුයේ සිය ආර්ථික කටයුතු තවදුරටත් සාර්ථකව පවත්වා ගෙනයාම සඳහාය. බැග්ඩෑඩයේ රජු අබ්බාසිද් රාජවංශයේ කාලිෆ් වූ හිජ්රා වර්ෂ 295 සිට 320 එනම් ක්‍රි.ව. 907 සිට 932 දක්වා රජ කළ අල් මුක්තා දීර් බිල්ලාහ් (Al-Muktadir bi' llah)[24] රජු විසින් Kahalid Bin Abu Bakaya ආගමික ගුරුවරයෙකු ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් ගේ ඉල්ලීමෙන් හිජ්ජා වර්ෂ 300 දී එනම් ක්‍රි.ව. 912[25] දී මෙහි එවන ලදී. ඔහු හිජ්ජා වර්ෂ 317[26] රජබ් (Rajab) මස 5 වන එනම් ක්‍රි.ව. 929[27] දී මිය ගිය අතර කාලිෆ් තමා විසින් මෙම ආගමික ගුරුවරයා පිළිබඳ සටහන් තබමින් සොහොන් ගලක් මෙහි එවා තිබේ. මොහු ආගමික ගුරුවරයෙකු ලෙස ශුක්‍රි මහාත හඳුනා ගෙන ඇත.[28] එම සොහොන් ගල (tombstone) කොළඹ

---

23 M.A.M. Shukri, "*Muslims of Sri Lanka: A Cultural Perspective*", in M.A.M. Shukri, (ed.), **Muslims of Sri Lanka**, Naleemia Institute, Beruwela, 1986, p. 340

24 Jalalu'ddin A'ssuyuti, **History of the Caliphs**, (trans.), H.S. Jarrett, Baptist Mission Press, Calcutta, 1881, p. 555

25 Y=lS% uy;df.a ,smsfha ysÊrd j¾I ls%'j' g fhdod .ekSfiÈ fodaIhla isÿ ù we;' tys ysÊcd j¾I 300 ls%'j 930 f,i fhdod we;' kuq;a th ls%'j' 912 úh hq;=h' M.A.M. Shukri, "*Muslims of Sri Lanka: A Cultural Perspective*", **op.cit**., p. 341

26 Mohamad Sameer Bin Hajie Ismail Effendi, "*Archaeological Evidence of Early Arabs in Ceylon*", **Moor's Islamic Cultural Home Souvenir**, Colombo, 1944-1965, p. 31

27 we;eï ;ekl yscrd j¾I 337 f,i i|yka ù we;'**Moor's Islamic Cultural Home Souvenir**, Colombo, 1970-76, p. 46

28 M.A.M. Shukri, **Islam in Independent Sri Lanka**, Department of Muslim Religious and Cultural Affairs, Colombo, 2000, p. 50.

ජාවන්ත මුස්ලිම් සුසාන භූමියේ තැන්පත් කර තබන ලදී. මෙය එක් ලන්දේසි නිලධාරියෙකු විසින් 1787 දී ගලවා ඉවත් කොට නිවසේ පඩියක් ලෙස භාවිත කොට තිබේ.[29]

ක්‍රි.ව. 1806-1819 දක්වා ශ්‍රී ලංකාවේ අග්‍රවිශ්වයකාරවරයා ලෙස කටයුතු කළ සර් ඇලේසෙන්ඩර් ජොන්ස්ටන් විසින් මෙහි ඉතිහාසය බැග්ඩැඩ් නුවරින් දැනගෙන ඒ පිළිබඳ වගකිව යුතු රාජ්‍ය නිලධාරින්ට දන්වන ලදී. පසුව මෙම අරාබි කුෆික් ලිපියේ තීන්ත පිටපතක් (Ink impression) එංගලන්තයට යැවූ අතර එහි පරිවර්තනය කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ අරාබි භාෂාව පිළිබඳ මහාචාර්ය සර් සැමුයෙල් ලී වෙත යවන ලදී.[30]

මෙම සෙල්ලිපිය ශ්‍රී ලංකාවෙන් හමුවන පළමු අරාබි ලිපිය වන අතර සැමුවෙල් ලී විසින් මෙම ලිපිය පරිවර්තනය කර තිබෙනුයේ මෙසේය. 'දයාවන්ත කාරුණාභරිත දෙවියන්ගේ නාමයෙන් මොහොමද් යනු දෙවියන්ගේ ද අනුශාසකවරයා ය. දෙවියන්ගේ ආශිර්වාදය සහ සාමය ඔහුට ලැබේවා. දෙවියනි ඔබේ සේවකයාගේ පුත්‍රයා කිතාබ් ඉබන් අබුබකයා ලෝකය හැර ගොසිනි'' සැමුවෙල් ලී ට අනුව අබු බකයා මිය ගොස් ඇත්තේ හිජ්ජා වර්ෂ 337 රිජිබ් මාසයේ 5 වැනිදා ය.[31]

---

29 **Ibid**., p.46

30 Alexander Jonston, "*A Kufic Inscription Found in Ceylon*", **Transactions of the Royal Asiatic Society of Great Britain and Ireland**, Vol. 1, Part III, London, 1827, pp. 537-548

31 Mohamad Sameer Bin Hajie Ismail Effendi, "*Archaeological Evidence of Early Arabs in Ceylon*", **Moor's Islamic Cultural Home Souvenir**, (Colombo, 1944-1965), p. 31; Somasiri Devendra, "*New Light on Some Arabic Lithic Records in Sri Lanka*", **Sri Lanka and the Silk Road of the Sea**, pp. 209-210



**කොළඹ ජාවත්තෙන් හමු වූ අබු බකයා නම් ගුරුවරයාගේ අරාබි සෙල්ලිපි දැනට කොළඹ කෞතුකාගාරයේ තැම්පත් කර තිබේ.**

මීට අමතරව මන්නාරම දකුණු ප්‍රදෙශයේ පුලියන්තිව් ස්ථනයෙන්ද[32] අනුරාධපුර පුත්තලම් මාර්ගයේද[33] මෙවැනිම ලිපි හමුවී තිබේ. එසේම මෙකල අබ්බාසිද් පාලන කාලයට අයත් කාසිද ලංකාවෙන් හමු වී තිබේ.[34] මෙම තොරතුරුවලින් පැහැදිලි වන්නේ බැග්ඩෑඩ් අධිරජු සමග සම්බන්ධතා පවත්වා ගැනීමට තරම් බලවත් මුස්ලිම් වෙළෙඳ ප්‍රජාවක් මෙහි සිටි බව ය. එම සබඳතා ඉතාමත් දෑඩි හා සුහදශීලී එකක් බව කාලිෆ් රජු සොහොන් ගල් එවීමෙන් පෙනේ. මෙම අන්තර් හුවමාරුවේ ස්වභාවය පිළිබඳව ඇලෙක්සෙන්ඩර් ජොන්ස්ටන් මෙසේ ලියයි. එක් පැත්තකින්

---

32 n,kakMahamed Samir, "*Recent Archaeological Finds*", **Moor's Islamic Cultural Home Souvenir**, 111, Colombo, 1970-76 , p. 46; Mohamad Sameer Bin Hajie Ismail Effendi, "*Archaeological Evidence of Early Arabs in Ceylon*", **op.cit**., p. 32; Somasiri Devendra, , "*New Light on Some Arabic Lithic Records in Sri Lanka*", **Sri Lanka and the Silk Road of the Sea**, pp. 209-219

33 Mohamad Sameer Bin Hajie Ismail Effendi, "*Archaeological Evidence of Early Arabs in Ceylon'*, **op.cit**., p. 34; Somasiri Devendra, "*New Light on Some Arabic Lithic Records in Sri Lanka*", **op.cit**., p. 211

34 Venetia Porter, "*Islamic Coins Found in Sri Lanka*", **op.cit**.,p. 225; Harun al-Rashid A.H. 170-193 (A.D.786-809) AV (gold) B.M.C. (Catalogue of Oriental Coins in the British Museum) I, No. 149, see. H.W. Codrington, **Ceylon Coins and Currency,** Memories of the Colombo Museum Series A, No. 3, Colombo, 1924, p. 157

බැග්ඩෑඩයේ කාලිෆ් යටතේ පර්සියන් ගල්ෆ්, බුසෝරාහ් (Bussorah) සහ අනෙක් රටවල් තබා ගනිද්දී අරාබිය, ගල්ෆ් හා ඊජිප්පතුව සමග මුස්ලිම් මහමද් බලය මධ්‍යධරණී මුහුද දිගේ ද පවත්වාගෙන යන ලදී. ඔවුන්ගේ අරාබි සහ ග්‍රීක රෝම සම්භාව්‍යය විද්‍යාවෙන් සාහිත්‍යය සියල්ල ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී.[35]

**චින්තකමය හුවමාරුව**

අලෙක්සෙන්ඩර් ජොන්ස්ටන්ගේ මෙම ප්‍රකාශය වඩා පුළුල් දැනීමකින් යුතුව කළ ප්‍රකාශයක් බව පිළිගැනීමට අසීරුය. විශේෂයෙන් අරාබීන් සහ ශ්‍රී ලංකාව අතර පැවැති සබඳතාවය නිසා එම ප්‍රදේශවල පැවැති සියලු ශාස්ත්‍රයන් ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදැයි සිති ම එතරම් ශාස්ත්‍රිය නොවේ. එසේ පැමිණි බවට ප්‍රමාණවත් සාක්ෂි ද නො ලැබේ. නමුත් චින්තකමය හුවමාරුවක් හෙවත් අන්තර් ක්‍රියාවක් සිදු වී ඇති බවට ඇතැම් සාක්ෂි ලැබේ. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ඉල්ලීමෙන් බැග්ඩෑඩ්හි කාලිෆ් විසින් ශ්‍රී ලංකාවට එවූ ආගමික ගුරුවරයාගේ ප්‍රවෘත්තියෙන් මෙම දෙරට අතර තිබූ සබඳතාව වටහා ගත හැකිය. අබ්දුල් රහමන් බින් හතීම් මුසා අස්සයිලානි (Abdur Rahman Bin Hatim Musa as-Sailani) විසින් හිජ්රා වර්ෂ 264 හෙවත් ක්‍රි.ව. 877 දී බැග්ඩෑඩයේ දක්නා ලද උගතෙක් පිළිබඳ සඳහන් කරන අතර මෙම උගතා ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලයක් සිටි නිසා නිස්බා (nisba) නම් ගෞරවාන්විත නාමය අරාබි පිළිවෙත් අනුව දිනා සිටි අයෙක් බව ද සඳහන් කරයි.[36]

අබ්බාසිද් පාලකයින් යටතේ ඔවුන්ගේ අගනුවර වූ බැග්ඩෑඩ් නගරයේ අද්විතිය ආර්ථික දියුණුවක් සහ ශාස්ත්‍රීය උන්නතියක් දක්නට ලැබුණි. අරාබි නිසොල්ලාසයේ බොහෝ කථාවලට ප්‍රස්තුත වූ බැග්ඩෑඩ් හා බැලසෝරා නගර පිළිබඳ ව දක්වන විස්තර කථනයක් තුළින් ඒවා අතිශයින් සමෘද්ධි මත් නගර වූ බවට සාක්ෂි බහුලව ලැබේ.[37] අබ්බාසිද් කාලීෆ් මාමුන් (ක්‍රි.ව.813-833 හිජ්රා වර්ෂ 198-218[38]) බැග්ඩෑඩ් නගර සංවර්ධනය කිරීමෙන් අනතුරුව සිට සියවස් තුනක් පමණ අතුළත අරාබි ශාස්ත්‍රීය ක්ෂේත්‍රයේ (Arabic reading world ) ප්‍රධාන දාර්ශනික චින්තන ධාරාවක් වූ ඇරිස්ටෝටල්ගේ චින්තතනය ගැලන්ගේ වෛද්‍ය විද්‍යාත්මක චින්තනය මෙන් ම පර්සියානු ඉන්දියානු විද්‍යාත්මක චින්තනය කැටිව පෝෂණය වූ නව සොයා ගැනීම් පිළිබඳ පර්යේෂණවලින් ද ප්‍රභාවත් වූ පරිසරයක් සකස් වී තිබුණි. යම් නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල ඉතා වැදගත් පරිවර්තන

---

35 Alexander Jonston, "*A Kufic Inscription Found in Ceylon*", **Transactions of the Royal Asiatic Society of Great Britain and Ireland**, Vol. 1, Part III, London, 1827, pp. 537-548

36 S.A. Imam,"*Ceylon Arab Relations*", **op.cit.**, p. 13;M.A.M. Shukri, "*Muslims of Sri Lanka: A Cultural Perspective*", **op.cit**., p. 341

37úia;r i|yd n,kak' Andre,Clot, **Harun al-Rashid and the World of the Thousand and One Nights**, Translated from the French by John Howe, Saqi Books, London, 1986

38Jalalu'ddin A'ssuyuti, **History of the Caliphs**, (trans.), H.S. Jarrett, Baptist Mission Press, Calcutta, 1881, p. 553

වෛද්‍ය විද්‍යාව, දර්ශනය තර්ක ශාස්ත්‍රය, තාරකා ශාස්ත්‍රය සහ වෙනත් ස්වතන්ත්‍ර නිර්මාණ කාර්යන් රැසක් මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වී පැවැතිණි.

අබ්බාසිද් කාලිෆ්වරු සියවස් 5 ක් පමණ පාලනය කළ අතර (ක්‍රි.ව. 750-1258) බොහෝ රජවරු විද්‍යාත්මක අධ්‍යයන කටයුතුවලට සහාය දුන්හ. අබු ජෆාර් අල් මන්සූර් (Abu Ja'far al-Mansur ක්‍රි.ව.745-775) හරවුන් - අල් - රෂීඩ් (ක්‍රි.ව.786-809) අල් මාමුන් රජු (ක්‍රි.ව. 813 -- 833) එසේ අනුග්‍රහ දැක්වූ පාලකයන් අතර ඉතා ප්‍රසිද්ධ අල් මාමුන් රජු *Bay al- Hikma* (house of wisdom) නම් අයතනය පිහිටුවා විද්‍යාත්මක චින්තනය වැඩි දියුණු කළේය.[39] මාමුන් කාලිෆ්වරයාගේ කාලයේ මෙම චින්තන ධාරාවක් වඩා වර්ධනය විය. තර්කයට මුල් තැන දෙමින් චින්තනයන් හැදෑරීමට පෙළඹුන යුගයක් විය. කාලීෆ්වරයාගේ අනුග්‍රහයේ එක් කොටසක් වූ ස්වභාවික ආගම සහ සංකල්ප ඔස්සේ බොහෝ දුර ගිය ඔවුහු චිරාගත ආගමික සම්ප්‍රදායට පටහැනි තත්ත්වයට ද එළඹුණහ. නායකයාගේ අනුග්‍රහයෙන් ස්වකීය බුද්ධි විෂය වූ ඉස්ලාම් ධර්මය කඩුවේ බලයෙන් සාමාන්‍ය ජනතාවට පිළිගැන්වීමට පවා පෙළඹුණ හ. මෙම වාදය නිසා ම ඔහු ස්වකීය පරමාර්ථය සමග විනාශ වී ගියහ. එහෙත් ලේ වැගිරීම් ඇතිවීමට පෙරාතුව ඉස්ලාම් චින්තන මාර්ගයේ නො මැකෙන සටහන් තබන ලද්දේ පමණක් නොව චිරන්තන ඉස්ලාම් ධර්මයේ පැවැති අනම්‍යතාවය ද සඳහට ම නැති කර දමන ලදී. කෙසේ නමුදු මෙකල අරාබි චින්තකයන්ගේ කාර්යභාරය ඉතා වැදගත් විය. මෙකල බටහිර ලෝකයේ hazes නමින් ප්‍රසිද්ධ සිටි අල් රයි (ක්‍රි.ව. 865-965) සහ ඉබන් සීනා හෙවත් ඇවිසින්නා (ක්‍රි.ව. 1037) වැනි විද්වතුන් අරාබි වෘත්තාන්ත ඉතිහාසයේ (annals history) කැපී පෙනෙන විද්වතුන් දෙදෙනෙකි.[40] මෙම චින්තනය ලෝක ව්‍යාප්ත කිරීමට ඔවුන්ගෙන් සුවිශාල සේවයක් සිදු විය.

එසේම මෙම කාලයේ ඉන්දු අරාබි විද්‍යාත්මක දැනීම හුවමාරුව වර්ධනය වූ කාලපරිච්ඡේදයක් ද විය. බොහෝ අරාබීහු වෛද්‍ය විද්‍යාත්මක දැනුම ලබා ගැනීම සඳහා ඉන්දියාවට පැමිණියහ. විද්‍යාව, ජ්‍යෝතිෂ ආදි ග්‍රන්ථ එමගින් අරාබියට ගෙන ගිය අතර ඒවා අරාබි බසට ද පරිවර්තනය කරන ලදී. ක්‍රි.ව. 711 දී ඉන්දියානු සංචාරකයෝ ආර්ය සිද්ධාන්තය බැග්ඩෑඩයට හඳුන්වා දෙන ලදී.[41] එසේම බටහිර ආසියානු තාක්ෂණික හා විද්‍යාත්මක චින්තක ධාරාවක් ද ගලා ඒම තුළින් අන්තර් හුවමාරුවක් සිදු විය. පසුකාලය වන විට මෙම තත්ත්වය තව දුරටත් වර්ධනය වූ බව වර්තමාන පර්යේෂණවලින් අනාවරණය වී තිබේ.[42] අල් බිරූනි මෙම පාර්ශවයෙන් සුවිශාල කොටසක් ආවරණය කළේය. හෙතෙම 11 වන සියවසේ මුල් භාගයේ ඉන්දියාවට පැමිණි අතර ජ්‍යෝතිෂ ග්‍රන්ථ බොහොමයක් අරාබි බසට පරිවර්තනය කරන ලදී. ග්‍රීක, රෝම මෙන් ම ඉන්දීය විද්‍යාව, දර්ශනය අරාබි ජනයාට සිය භාෂාවෙන් ලබා දීමට ඔහු ගත් ප්‍රයන්තය අරාබි ජනයා සදා අනුස්මරණීය

---

[39]P.K. Hitti, **History of the Arabs**, Macmillan, London, 1946, pp.363-407

[40] Tyq jvd m%isoaO jQfha tu kusks P.K. Hitti, **History of the Arabs**, Macmillan, London, 1946, pp.364

[41] Maqbul S Ahamed, **Indo-Arab Relations**, Indian Council for Cultural Relations, New Delhi, 1978, pp.20-27

[42] Refaqat Ali and Maloni Ruby Khan, *'Transmission of Science and Technology to India from Iran 1200-1526 A.D* in **Indo-Iran Relations**, Department of History, University of Mumbai, 2002, pp.173-210

සිද්ධියක් ලෙස සලකති.[43] ශ්‍රී ලංකාවේ සිටි මුස්ලිම්වරු ද මෙම ශාස්ත්‍රීය කාර්යයන් සමග සමීප සබඳතාවයකින් යුතුව සිටි බව සිතිය හැකිය. එසේ සිතිය හැකි වූයේ අබ්බාසිද් කාලිෆ්වරු සමග මෙන්ම අරාබි ලෝකය සමග ඔවුන් සබඳතා පවත්වමින් සිටි නිසාය. මෙම ශාස්ත්‍රිය කටයුතු කියවා බැලීමට තරම් ඔවුහු අරාබි බස හොඳින් දැන ගන්නට ඇත. ඉහත අරාබි ලිපිය පිහිටුවන්නට ඇත්තේද අරාබි බස කියවන්නට පිරිසක් සිටි නිසා යැයි ද කෙනෙකුට අදහස් කළ හැකිය. අලෙක්සෙන්ඩර් ජොන්ස්ටන් මෙරටින් පිටත් වීමට පෙර මුස්ලිම් වෛද්‍යවරයන්ගේ පෘථුල දැනුම පිළිබඳ දක්වනුයේ මෙවැනි අදහසකි. ඔවුන් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් වෛද්‍ය විද්‍යාත්මක ක්ෂේත්‍රය වූයේ Arcenna පිළිබඳ දැනුමයි. ඇරිස්ටෝටල්, ප්ලේටෝ, යුසිලිඩ් (Euclid) ගැලන්, සහ ටොලමි වැනි අයගේ ඉගැන්වීම්වල අරාබි පරිවර්තනය ද හඳුන්වා දුන්හ. මම ශ්‍රී ලංකාවේ සිටින කාලයේදී මොහොමද් පූජකයන් සහ වෙළෙඳුන් විසින් මෙම ලේඛන මා වෙත රැගෙන ආ අතර ඒවායේ මුල් පිටපත් බැග්ඩෑඩ්වල අවුරුදු සිය ගණනක් තිස්සේ ඔවුන්ගේ පවුල්වල මුතුන් මිත්තන් විසින් සුරක්ෂිතව ආරක්ෂා කරන ලද ඒවාය.[44]

**රාජ්‍ය තාන්ත්‍රික සබඳතා**

බුරාසන්හි අබු මෂාර් අල් බල්ඛි (ක්‍රි.ව.885) හෙවත් මධ්‍යකාලින යුරෝපයේ අලු බුනාසාර් නමින් ප්‍රසිද්ධ පුද්ගලයා විශ්ව කෝෂ දැනුමින් යුකත් විය. හෙතෙම ජ්‍යෝතිෂ විද්‍යාවට කර තිබෙන දායකත්වය ඉතා ඉහළ ය. සමකාලීන ලෝකයේ දක්ෂත ම ජ්‍යෝතිෂඥයා ලෙස ඔහු සැලකිය හැකිය. සරන්දිබ් රජුගේ කැමැත්ත පරිදි ලක්දිව ද ඔහුගේ නම ප්‍රසිද්ධ විය. සෙරන්දිබ් රජු අලුත උපන් කුමාරයාගේ කේන්දරය ඔහු ලවා පරීක්ෂා කරවා ගත් බව සඳහන් වේ. මෙම ප්‍රධාන ලේකම් ජ්‍යොතිෂඥයාගේ උපදේශකත්වය ලබා ගන්නට ඇත්තේ පළමුවන සේන රජු යැයි දක්වන එස්.ඒ. ඉමාම් මහතා එම රජු සඳහා වර්ෂය යොදා ඇත්තේ දෙවන සේන රජුගේ වර්ෂයයි. එය මුද්‍රණ දෝෂයේ හෝ ඉමාම් මහතාගේ අතපසු වීමක් ද යන්න නිශ්චිත නැත.[45] පළමුවන සේන (ක්‍රි.ව. 833-853) රජු යැයි අනුමාන කළත් මෙම අදහස සඳහන් කරන ජ්‍යොතිෂඥයාගේ කාලය හා වඩාත් සමකාලීන විය හැක්කේ දෙවන සේන රජු (ක්‍රි.ව. 853-887) යැයි අදහස් කිරීමට ඉඩ කඩ පවති. ශ්‍රී ලංකාවේ මූලාශ්‍රවලින් හෙළිදරව් නොවන ඇතැම් පාර්ශවයන් පිළිබඳ අරාබි මූලාශ්‍රවලින් එළිදැක්වෙන බවක් මෙම තොරතුරුවලින් පෙනී යයි. ක්‍රි.ව. 1291 දී පමණ රචිත ගුලිස්ථාන් (Gulistan) හෙවත් *Rose Garden of Sadi of Shiraz* ග්‍රන්ථයේ කථාවක ශ්‍රී ලංකාවේ දක්ෂ අක්ෂි වෛද්‍ය ක්‍රමයක් (knowledge of opthalomology prossesse) පිළිබඳ කතාවක් ඇත. එක්තරා නීති විශාරදයෙකුට

---

[43] úia;r i|yd n,kak' H. M., Said Karachchi (ed.), **Al-Biruni Commemorative Volume, Proceedings of the International Congress held in Pakistan on the Occasion of Millenary of Abu Raihan Muhammad Ibn Ahmad al Biruni (973-1051 A.D.)**, Hamdard National Foundaton, Hamdard, 1979.

[44] wef,lafikav¾ fcdkaiagka úiska 1827 § fmnrjdß 3 od hg;a úð; Ndr f,alï;=ud g hjk ,o ,smshl ^Despatch& mßj¾;khAlexander Jonston, "*A Kufic Inscription Found in Ceylon*", **Transactions of the Royal Asiatic Society of Great Britain and Ireland**, Vol. 1, Part III, London, 1827, pp. 537-548

[45] S.A. Imam,,"*Cultural Relation between Sri Lanka and Iran*", in Senake Bandaranayaka *et, al.*, (eds.), **Sri Lanka and the Silk Road of the Sea**, The Sri Lanka National Commission for UNESCO and the Central Cultural Fund, Colombo, 1990, p.176

විරූපි දියණියක් සිටි අතර විරූපි බව නිසා විවාහ කර දීම පියාට ප්‍රශ්නයක් විය. පසුව එක්තරා අන්ධ මිනිසෙකුට කැමති වී ඇය හා විවාහ විය. ඒ සමග සෙරන්දිබ් දිවයිනේ සිට ඉතා දක්ෂ අක්ෂි වෛද්‍යවරයෙකු පැමිණියේය. ඔහු අන්ධභාවය නැති කළ හැකි වෛද්‍යවරයෙක් නිසා තම බෑනනුවන් ඔහුට පෙන්වා ප්‍රතිකාර නො ගන්නේ ඇයි දැයි නීති විශාරදයාගෙන් බොහෝ දෙනෙක් විමසා සිටිය හ. එවිට ඔහුගේ පිළිතුර වූයේ එසේ වූවා නම් ඔහුට දෑස් පෙනීම ලැබී මගේ දියණියන් විරූපි බව දුන ඇය හැර දමා යා හැකි බව ය.[46]

මෙම කථා පුවතෙහි වැදගත් අදහසක් වනුයේ සෙරන්දිබ්හි අක්ෂි වෛද්‍යවරයෙක් පිළිබඳ සඳහන් වීමය. ශ්‍රී ලංකාව මෙකල බටහිර ආසියානු රටවල් සමග පැවැති සබඳතා මෙවැනි කථා නිර්මාණය වීමෙහි ලා පසුබිම වන්නට ඇත. ඇතැම් විට ඉහත සඳහන් කළ ආකාරයට ජ්‍යොතිශ්‍යයෙකු ශ්‍රී ලංකාවට පැමිණියා සේම ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරයා ද එම ප්‍රදේශවලට යන්නට ඇතැයි මෙම කථා ප්‍රවෘත්තියෙන් අනුමාන කළ හැකිය. මෙකල අරාබිය සමග සෘජු වෙළෙඳ සහ සංස්කෘතික සබඳතා පැවැති බවට පැහැදිලි සාක්ෂි පවතී. මීට සමාන සිද්ධියක් පිළිබඳ ව මීට ඉහත දී පෙන්වා දුන් ඉබන් ෂහිරියාගේ ඉන්දියාවේ පුදුම (Marvels of India ) කෘතියේ සර්පයන් දෂ්ට කිරීමෙන් පසු රෝග සුවපත් කිරීමේ පිළිවෙත් පිළිබඳ සටහන් තබා ඇත. එහිදි ඇල් බාර්ක්ෂාති (al- Barkshati) නම් සෙරන්දිබ්හි මේ සම්බන්ධයෙන් ප්‍රවීන වූ දක්ෂ විශේෂඥ වෛද්‍යවරයෙක් නාගයන් වර්ග 3120 ක් දැන සිටි බව සඳහන් කරයි.[47] මෙම පුද්ගලයා ශ්‍රී ලංකාවේ වෛද්‍යවරයෙක්ද නැතහොත් මුස්ලිම් වෛද්‍යවරයෙක් ද යන්න නිශ්චිත නැත. එහෙත් ශ්‍රී ලංකාවේ වෛද්‍යවරයෙකුගේ නාමයක් අරාබි බසින් ව්‍යවහාර කිරීමක් යැයි සිතිමට ඉඩ කඩ පවතී. නාවිකයෙකු වූ ඉබන් ෂහිරියාර් මෙම තොරතුරු දක්වනුයේ දෙරට අතර පැවැති වාණිජ සබඳතා පිළිබඳ සටහන් තබමින් ය. ඉහතින් සඳහන් කළ සින්බෑඩ්ගේ දූත ගමනේ දී ශ්‍රී ලංකාවේ රජු යවන ත්‍යාග අතර ද ඖෂධීය නාගයෙකුගේ සමක් ද අඩංගු වී තිබේ. අබු අලි අහමද් උමාර් (Abu-Ali-Ahamad b Umar) හෙවත් ඉබන් රුස්තා ඉස්ෆාහාන් (Ibn Rusta Isfahan) පර්සියානු ගත් කතුවරයෙකි. ඔහුගේ ඉතා ප්‍රසිද්ධ විශ්වකෝෂය වූ කිතාබ් අල් අ-ලක් අන්-නෆීසා කෘතිය ලියන ලද්දේ ක්‍රි.ව. 903 දීය. එහි භූගෝල විද්‍යාත්මක පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ ඖෂධ පැලෑටි පිළිබඳව තොරතුරු දැක්වීමට අමතක කොට නැත.[48]al-Istākhri (ක්‍රි.ව. 951) ලංකාවේ මුතු මැණික් පිළිබඳ දක්වා තිබේ.[49]ශ්‍රී ලංකාව පිළිබඳව පර්සියානු සම්භාව්‍ය සාහිත්‍යයේ පවා නිතර සඳහන් කරනුයේ එම ප්‍රදේශ අතර සබඳතා පැවැත්වීම හේතුවෙනි.

ඉමාම් පෙන්වා දෙන පරිදි ඉරානයේ හෆීස් (Hafiz of Shiraz ක්‍රි.ව. 1320-1389) කවියා හැර අනෙක් සියලු ම කවීන් තම කවිවල සෙරන්දිබ්හි ස්වභාවය සම්පත් පිළිබඳ ව සඳහන් කිරීමට අමතක

---

46 **Ibid**., p.175

47 **Ibid**., p.175

48 ***Kitāb al-a'lak an-nafisa-auctore Abu'Ali Ahmed ibn'Omar ibn Rosteh*,*(Book of the Rich and Costly Robes)***, **Bibliotheca Geographorum Arabicorum**, Vol. (Tome) VII, (ed. and trans.), M.J. De Goeje, Lugduni-Batavorum, Apud E.J. Brill, Leiden, 1892, p. 84

49 ***Al-Istākhri, Al-Masālik wa'l-Mamālik,*** (ed.), De Geoje, Brill, Leiden, 1854, p. 154

නො කළ බව ය. ඉරානයේ ජාතික මට්ටමේ කවියෙකු වූ Firduwsi (ක්‍රි.ව. 1020) ගේ පර්සියානු සම්භාව්‍ය සාහිත්‍යයේ වැදගත් රචනාවක් වූ ෂහ් නමග් (Shah Nameh ) හි ශ්‍රී ලංකාව පිළිබඳ සඳහන් කර ඇත.[50] ප්‍රසිද්ධ පර්සියන් කවියෙකු වූ උන්සුරි (Unsuri - ක්‍රි.ව. 1058) විසින් සස්නි හි සුල්තාන් මොහොමද්ගේ රාජ සභාවේදි ද ශ්‍රී ලංකාව පිළිබඳ සිහිපත් කර ඇති බව කියයි.[51] මෙසේ දීර්ඝ ලෙස සාකච්ඡා කළ තොරතුරු අනුව පෙනී යන්නේ ප්‍රදේශ අතර සිදු වූ වාණිජ සබඳතාවලට පරිභාහිරව හෝ එම සබඳතා ඔස්සේ සංස්කෘතික සබඳතා ද පැවැති බවය. වෛද්‍ය විද්‍යාව හා වෙනත් ශාස්ත්‍රීය විෂයන් පිළිබඳ දැනුම හුවමාරුවක් හෙවත් අන්තර් ක්‍රියාවක් (Interaction) දෙරට අතර සිදු වූ බවත් එම සම්බන්ධතා තුළින් වාණිජ සබඳතා තහවුරු කර ගැනීමට අවශ්‍ය සුහඳතාවයට අනියම් ආකාරයෙන් බලපා ඇති බවත් පෙනී යයි.

ඉබන් ඛුර්දාද්බේ සහ කැප්ටන් බුසාර්ග් දෙදෙනා (ක්‍රි.ව.10 වන සියවසේ දී පමණ) දක්වන පරිදි සිරාෆ් සහ බස්රා ඉතාමත් වැදගත් වෙළෙඳ වරායන් මෙන් ම ඕමාන් ප්‍රදේශයේ සොහාර් සහ මස්කට් ද වැදගත් වෙළෙඳ මධ්‍යස්ථාන ලෙස ප්‍රසිද්ධියට පත් වී තිබුණු බව ය.[52] හෝමියුස් වඩා ධනවත් මෙන්ම වඩා ලාභ ගෙනදෙන ස්ථාන ලෙස ද සඳහන් කරයි. ඉබන් ඛුර්දාද්බේ විස්තර කළ මුහුදු මාර්ග පිළිබඳ දීර්ඝ විස්තරවලින් පැහැදිලි වන්නේ මෝසම් වැසි භාවිතයට ගෙන ගිය නාවික ගමන් පිළිබඳ අදහසකි. මස්කට් සහ සෝහාර් වරායවල සිට බටහිර ඉන්දියාව දෙසට ඔවුහු යාත්‍රා කළ අතර එය මාර්ග දෙකකින් යුක්ත විය. සින්ද් ප්‍රදේශයේ වෙළෙඳාම් කිරීමේ දී දේබාල් ප්‍රදේශය ද දකුණු ඉන්දියාව සමග ගනුදෙනු කිරීමේදි කුලම් මාලි වැදගත් වූ අයුරුද සඳහන් කරන අතර ම එම ගමනේ ශ්‍රී ලංකාව හරහා යමේදි එහි වරායන් ද වැදගත් වූ අයුරු සඳහන් කර තිබේ. කැප්ටන් බුසාර්ග් දක්වන පරිදි ශ්‍රී ලංකාවේ වරායන් පසු රත්තරං භූමිය හෙවත් ජාවා සුමාත්‍රා පසු කොට දකුණු චීන මුහුදින් හනොයි සහ කැන්ටන් දක්වා යා හැකි බව ය.[53] මෙකල ඉස්ලාමීය වෙළෙඳාම් සාර්ථක වීමට ඇතැම් ප්‍රදේශවල හා වෙළෙඳාමට ප්‍රස්තුත වූ වාණිජ මධ්‍යස්ථානවල තිබූ සාමාකාමී වාතාවරණය ප්‍රධාන කරුණක් විය. එක් අතකින් උමයියාද් හා අබ්බාසිද් අධිරාජ්‍යය යටතේ මැදපෙරදිග වූ සාර්ථක පාලනය මෙන් ම අනෙක් පසින් ඈත පෙරදිග චීනයේ වූ ටාං අධිරාජ්‍යය සමයේ වෙළෙඳාම් දියුණු වීමත් ඉන්දියානු සාගරයේ වෙළෙඳාම කෙරෙහි අන්‍යෝන්‍ය වශයෙන් බලපාන ලදී.

---

50 S.A. Imam,,"*Cultural Relation between Sri Lanka and Iran*", in Senake Bandaranayaka *et, al.*, (eds.), **Sri Lanka and the Silk Road of the Sea**, The Sri Lanka National Commission for UNESCO and the Central Cultural Fund, Colombo, 1990, p.175

51 **Ibid**., p.175

52 G.F. Hourani, **Arab Seafaring in the Indian Ocean in Ancient and Medieval Times**, Princeton University, Princeton, 1951, and Khayats, Beirut, 1963; p. 71; Andre Wink, , **Al-Hind**: **The Making of the Indo-Islamic World-Early Medieval India and the Expansion of Islam 7th to 11th Centuries**, Vol. 1, Oxford University Press, Delhi, 1990, p. 81

53 ***Buzurg Ibn Shahriyar, Kitāb 'Ajāyab-ul-Hind or The Book of the Marvels of India,*** English Translation by L. Marcel Devic, The Golden Dragon Library, London, 1928, 4

ඉහත සඳහන් කළ අබුබකයාගේ සෙල්ලිපියට අමතරව මන්නාරම් දකුණු ප්‍රදේශයේ පුලියන්තිව් නම් ස්ථානයෙන් හමු වූ අරාබි සෙල්ලිපිය ද මෙකල ශ්‍රී ලංකාව සමග පැවැති සබඳතා පිළිබඳ යම් අදහසක් ලබා දීමට සමත් වෙයි. දැනට මෙම ලිපිය කොළඹ ජාතික කෞතුකාගාරයේ ලියාපදිංචි දරන 24.5 7 138 20 අංක යටතේ තබා තිබේ. යාපනේ දිසාපති සිටි ඊ. ආර්. අයර්ටන් මෙම ලිපිය ප්‍රථමයෙන් අධ්‍යයනයට බඳුන් කර තිබේ. ඔහු හඳුනා ගෙන ඇති පරිදි එහි පාඨය මෙසේ දක්වයි. මෙම ප්‍රශස්තිය දෙවියන්ට ය. දෙවියන්ගේ නාමයෙන් එය දයාවන්ත වූ කරුණාවන්ත වූ දෙවියන්ට ම දෙමි. දෙවියෙක් නැත. එහෙත් එහි දෙවියෙකි. ඔහු කිසිම සහායකයෙක් නොමැතිව වැඩ සිටි මහමද්තුමා දෙවියන්ගේ ශුද්ධවන්තයෙකි. දෙවියන්වහන්සේ ආශිර්වාද කරනවා පමණක් නොව ඔහුගේ පවුලට ද ආශිර්වාදය කර ඔවුන් නිරතුරුව ම රකී. [54] අහමඩ් සමීර් මහතා විසින් කයිරෝගි අල් අසාර් විශ්වවිද්‍යාලයේ ඒ සමක් මහතාගේ උදව් ඇතිව මෙම ලිපිය නැවත කියවීමට උත්සහ කළ අතර එහි කැඩී බිඳී ගිය වාක්‍ය සකසා මුළු සෙල්ලිපිය ම නැවත ඉදිරිපත් කළේය. එය මෙසේය. සියළු ප්‍රශස්තින් අල්ලා දේවියන්ටයි. අල්ලාගේ නාමයෙන් මම පටන් ගනිමි. අල්ලා අබියස ගැත්තෙක් නො මැත. ඔහු එකම පුද්ගලයාය. කිසි කෙනෙකුට ඔහු හා සම විය නොහැකිය. මහමද්තුමා යනු අල්ලාගේ පණිවිඩකාර දූතයෙකි. අල්ලා ඔහුට ආශිර්වාද කරනු ලැබේවා. ඔහුගේ කරුණාව සියල්ලන්ගේ සාමය පිණිස වේවා. සියළු සත්ත්වයෝ මරණයට පාත්‍ර වන්නා හූ ය.[55] මෙහි ඇති අක්ෂර බැග්ඩැඩ්වල කුෆික් අක්ෂර හා ඉතාමත් සාම්‍ය බවත් එම සෙල්ලිපිය හිජ්රා වර්ෂ 300-400 අතර කාලයට එනම් ක්‍රි.ව. 9-10 සියවසේ අතර කාලයට අයත් විය හැකි බවත් ඔහු වැඩි දුරටත් සඳහන් කරයි.[56] මෙම ලිපිය හා සමකාලීන තවත් ලිපියක් අනුරාධපුර පුත්තලම මාර්ගයෙන් හමු වී තිබේ. අචාර්ය සමීර් මහතාගේ අදහස අනුව මෙය කලීග්‍රෆික් මොරොක්කෝ භාෂාවෙන් ලියා ඇති අතර ක්‍රි.ව. 9-10 සියවසට අයත් විය හැකිය බව ය.[57]

මෙසේ අධ්‍යයනය කළ සෙල්ලිපි තුන සහිත සොහොන් ගල් අරාබි ජාතිකයන් මිය ගිය පසු ඒ මත සවිකරන ලද ස්මාරකයන්ය. ඇතැම් ඒවා අරාබියෙන් ම ගෙනෙන ලැදයි සැක කළ හැකිය. මෙයින් පැරණිම සෙල්ලිපිය හා සම්බන්ධ වන පුද්ගලයා පූජකයෙකු හෝ ඉස්ලාම් ගුරුවරයෙකු බව හඳුනා ගෙන ඇති අතර අනෙක් පුද්ගලයන් මෙහි පදිංචි වී සිටි වෙළෙඳුන් ගෙන් අයෙකු විය හැකිය. මෙම අරාබි සොහොන් ගල්වලට අමතරව මෙකල බටහිර ආසියානු ප්‍රදේශ සමග පැවැති සබඳතා තහවුරු කරන වෙනත් පුරාවිද්‍යාත්මක සාධක අතර මැටි බඳුන් සහ කාසි ද වැදගත් වේ. ඒ අනුව

---


54 fuu ,smsfha we;s wrdì NdIdfjysu igyk bx.S%is wl=rska fh¥ mßj¾;kh i|yd n,kak'Mahamed Samir, "*Recent Archaeological Finds*", **Moor's Islamic Cultural Home Souvenir**, 111, Colombo, 1970-76 , p. 46; Mohamad Sameer Bin Hajie Ismail Effendi, "*Archaeological Evidence of Early Arabs in Ceylon*", **op.cit.**, p. 32; Somasiri Devendra, , "*New Light on Some Arabic Lithic Records in Sri Lanka*", **Sri Lanka and the Silk Road of the Sea**, pp. 209-219

55 Somasiri Devendra, "*New Light on Some Arabic Lithic Records in Sri Lanka*", **Sri Lanka and the Silk Road of the Sea**, The Sri Lanka National Commission for UNESCO and the Central Cultural Fund, Colombo, 1990,pp. 209-219

56 Mohamad Sameer Bin Hajie Ismail Effendi, "*Archaeological Evidence of Early Arabs in Ceylon*", **Moor's Islamic Cultural Home Souvenir**, Colombo, 1944-1965, pp.31-38

57 Mahamed Samir, "*Recent Archaeological Finds*", **Moor's Islamic Cultural Home Souvenir**, 111, (Colombo, 1970-76) , p. 46

අබ්බාසිද් කාලිෆ් රාජ වංශයට අයත් කාසි වෙළගර වතුයායෙන් සහ තෙලින්ගිපත ස්ථානයෙන් කාසි කිහිපයක් සොයා ගෙන ඇත.[58] අනුරාධපුර කෞතුගාරයේ තබා ඇති රොබින් මහතාගේ එකතුවෙහි ඇති තිරුකේත්ෂ්වරම්වලින් හමු වූ අරාබි මැටි බඳුන් ද වැදගත්ය. මෙහි කැබලි 4 ක් දක්නට ලැබේ. එම හතරෙන් එකක් කොළපාට වන අතර එය බඳුනේ අඩිය පමණක් වේ. මෙ කාලපරිච්ඡේදයට ම අයත් යැයි සැලකිය හැකි හට්ටි මුට්ටි ලෙස වර්ග කරන ලද අරාබි මැටි බඳුන් ද වේ. මුට්ටි ගැටිති මෝස්තරවලින් යුක්ත ය. මාන්තේයිවලින් හමු වූ ලියාපදිංචි අංක. 10-6-9 මැටි බඳුන් කැබලි 9 ද මෙකල පර්සියන් ගල්ෆ් සම්බන්ධතා සඳහා උදාහරණයෝ ය. එසේ ම ලියාපදිංචි අංක. 11 -5 5 අතර මාන්තේසියවලින් හමු වූ දනට අනුරාධපුර කෞතුකාගාරයේ තබා ඇති මැටි බඳුන් කොටස් ද වැදගත් වේ.



**මාන්තේයිවලින් හමු වූ දනට කොළඹ කෞතුකාගාරයේ තබා ඇති ඉස්ලාමීය මැටි බඳුන් කැබලි**

මීට අමතරව අභයගිරියෙන් හමුවූ මැටි බඳුන් කිහිපයක් ද මැදපෙරදිග ප්‍රදේශයට අයත් බව සොයා ගෙන තිබේ. මෑත කාලයේ ගාලු වරායේ සිදු කළ කැණීම මගින් අරාබි ලංකා සබඳතා පිළිබඳ තොරතුරු අනාවරණය වී තිබේ. මෙම වරාය වැදගත් වුයේ පශ්චාද් මධ්‍යයතන යුගයේ සිට ය. යුරෝපීය සමයේ වඩාත් සාර්ථක ලෙස වාණිජ කටයුතු සඳහා භාවිතයට ගත් වරායකි. මෙහි කරන

58 Venetia Porter, "*Islamic Coins Found in Sri Lanka*", **op.cit**.,p. 225; Harun al-Rashid A.H. 170-193 (A.D.786-809) AV(gold) B.M.C. (Catalogue of Oriental Coins in the British Museum) I, No. 149, see. H.W. Codrington, **Ceylon Coins and Currency,** Memories of the Colombo Museum Series A, No. 3, Colombo, 1924, p. 157

ලද කැණීම බෙහෙවින් සාර්ථක විය. වරාය ආශ්‍රිතව කෙරුණු නව පර්යංක ඉදිකිරීම හෝ අලුත්වැඩියා මෙන් ම සංවර්ධන කටයුතු නිසා මුල් කාලීන ඓතිහාසික දත්තයන්ගේ විනාශය සිදු වී ඇත.

මෙයට සමුද්‍රිත පුරාවිද්‍යාඥයන් ගේ අවධානය යොමු වූයේ මෑතක දීය. 1992 දී ගාල්ල කොටුව ලෝක උරුම ස්මාරකයක් ලෙස නම් කර තිබීම ද එහි වැදගත්කමට හේතු විය. මෙහි කැණීම් කටයුතු පර්යේෂණවල දී පුරෝගාමීව කටයුතු කරනු ලැබුයේ Sri Lanka Sub-Aqua Club සහ Maritime Heritage Trust ආයතනවල නියෝජිතයන් ය. මෙහි කැණීම්වල දී මැදපෙරදිග සම්භවයක් ඇති මැටි බඳුන් කැබලි 5 ක් හමු වී තිබේ. ලා කහ පාටට හුරු මේවා ජෝගුවල කැබලි වේ. 8 වන සියවසින් පසුව පමණ කාලයට අයත් මේවා පර්සියන් හා රතු මුහුදු කලාපයට අයත් වේ. නමුත් ඉස්ලාමීය වීදුරු බඳුන් කැබලි හමු වී නැත. මීට අමතරව විවිධ මිශ්‍ර ස්වභාවයක් ඇති මැටි බඳුන් කැබලි ද හමු වී තිබේ. ප්‍රමාණය කැබලි 9 කි. දිගු බෙල්ලක් සහිත ජෝගුවල කැබලි ද වේ. (Trumpetnecked Jar) මේවා සමස්තයක් ලෙස කුඩා හා මධ්‍ය ප්‍රමාණයෙන් යුක්තය.[59] පර්සියන් ගල්ෆ් සබඳතා පිළිබඳ ඉතා වැදගත් සාක්ෂි අනාවරණය වූයේ සමුද්‍රික කැණීම්වලිනි. එහි දී ගල්වලින් නිර්මාණය කරන ලද නැව්ගරම් ගල් හමු වී තිබේ. මේවා ටොන් 1 ක් පමණ බර වන අතර ඕමානයේ නිෂ්පාදනය කරන ලදැයි බොහෝ දෙනාගේ විශ්වාසය වී ඇත. මේ සමග හමු වූ අවුරුදු 500 ක් පමණ පැරණි යැයි සැලකෙන ද්‍රව්‍යයෙන් නිර්මාණය කරන ලද නැම්ගුරම ද ඉතා වැදගත්ය. මෙම ද්‍රව නැම්ගුරම් සහ ගල් නැම්ගුරම්[60] බොහොමයක් භාවිත කරන ලද්දේ අරාබීන් විසින් යැයි විශ්වාස කරනු ලැබේ.

ශ්‍රී ලංකාව සමග මෙසේ සබඳතා පවත්වමින් සිය වාණිජ මෙන් ම සංස්කෘතික අවශ්‍යතාවයන් ද ඉටු කර ගනු ලැබූ අරාබීහු ඉන්දියන් සාගරයේ ප්‍රබල වාණිජ ආධිපත්‍යයක් ඇති කර ගෙන සිටියහ.

---

[59] Moira Tampoe, Moira,"*The Spice Island Route: Sri Lanka's Participations in Maritime Trade and the Archaeological Evidence from Mantai and Galle Harbour*", **Sesquicentennial Commemorative Volume of the Royal Asiatic Society of Sri Lanka**, 1845- 1995, Colombo, 1995, pp.176-177

[60] www.co.@mritimelanka

ආඛ්‍යාන narrations
**Volume 02 | Issue 01 | January – June 2017 | Article 05**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

---

# ජීව විද්‍යාත්මක ලිංගිකත්වයේ සමාජ නිර්මිතය

එම්.එන්. විනිෂියා[61]
B.A (sp)
vineeshiya@gmail.com

## සංක්ෂිප්තය

ජීව විද්‍යාත්මක මිනිසා ස්වභාව ධර්මයේ අංගයක් ලෙස සෙසු සත්වයන් කෙරෙන් වෙනස් වුව ද ඔවුන් හා සමීප ද වේ. සත්ව ලෝකය තුළ ජෛවීය අවශ්‍යතා පූර්ණය සඳහා වන ලිංගිකත්වය මිනිසාට ද පොදු සංසිද්ධියකි. එහෙත් සංස්කෘතික සත්වයෙක් වන මිනිසා ජීව විද්‍යාත්මක අවශ්‍යතා පූර්ණය යන සීමාවෙන් පරිභාහිරව ලිංගිකත්වය හා බැඳේ. සංස්කෘතික හා සමාජීය සාධක සමඟ මානව ලිංගිකත්වය මිනිසාට අනන්‍ය ප්‍රපංචයකි. මානව ලිංගිකත්වය කෙරේ පැනවුණු සමාජීය සුසමාදර්ශයන් අනන්‍ය වූ මානවීය සීමාවන් සංකලනයෙන් හා බද්ධ වූ ඇවතුම් පැවතුම් වලින් ඊට සුවිශේෂිකත්වයක් ආරෝපණය වී ඇත. මේ අනන්‍යතාව හුදෙක් සමාජ නිර්මිතයක් වන අතර සංවාදයෙහි අවකාශ අල්පය. මෙම පයීතයෙහි අභිප්‍රාය ද්විතීක මූලාශ්‍ර මත පදනම්ව ජීව විද්‍යාත්මක මානව ලිංගිකත්වය හා රාශිකෘත වූ සමාජීය සංකල්පයන් හා භාවිතාවන් සංවාදයට බඳුන් කිරීමයි. ශිෂ්ටාචාරගත මානවයා විෂයෙහි පෘථුල ලෙස අවධානය දිනූ මානව ලිංගිකත්වය හුදෙක් චර්යාවක් නොවී සාහිත්‍ය කලාදියෙහි පවා රස ජනනීය මාතෘකාවක් ද වෙනස් අරමුණු සඳහා යොමු වූවක් ද වේ. ප්‍රජනනය අරමුණු කොට ගත් සත්ව ලෝකයෙහි ලිංගිකත්වයෙන් පරිභාහිර සංසර්ගීය අවශ්‍යතාව කෙරෙහිම ලඝු නොවූ ස්වරූපයක් මානව ලිංගිකත්වය තුළ දිස්වේ. ඩෙස්මන්ඩ් මොරිස් (Desmond Morris) දක්වන අන්දමට මානව ලිංගිකත්වය සෙසු සත්වයන් කෙරෙන් වෙනස් වනුයේ වුව ජෛවීය පසුබිමක් පැවතිය ද (මොරිස් 1967:19) මානව සමාජගත ලක්ෂණ තුළ ඒවා සුවිශේෂී අනුකලනයක් දක්වයි. මේ කෙරෙහි බල පෑ සංස්කෘතික වර්ධනයන් වූ වග පෙන්වා දෙන මොරිස් ඒ පිළිබඳව

---

[61] Lecturer, Faculty of Social Science and Languages, Sabaragamuwa University of Sri Lanka

වන සමාජීය සම්බන්ධතා නිරාවරණය කරයි (Morris 1967: 57-59) ඓතිහාසික හා අද්‍යකාලීන භාවිතයන් තුළ මානව ලිංගිකත්වය හා සබැඳි බහුරූපී සංකල්පයන් සමාජගතව තිබුණ ද ඒවා බොහෝමයක් නිරාවරණය නොවූ සංවාදය එවැනි පසුබිමක එවන් භාවිතාවන් සංවාදයට යොමු කිරීම ද මෙම පර්යේෂණයෙහි අරමුණකි.

**ප්‍රමුඛ පද:** ලිංගිකත්වය, අනන්‍යතාව

**ලිංගිකත්වය යනු?**

ලිංගිකත්වය යනු වචනාර්ථයෙන් හුදෙක් ලිංගික ක්‍රියාවෙහි නියැලීම හා ආශ්‍රය සබැඳීම ලෙස රාමුගත කළ නොහැක්කෙකි. මන්ද යත් බහුවිධ නිර්වචන ඔස්සේ ලිංගිකත්වය පැහැදිලි කිරීමේ ප්‍රයත්නයක් මිස පොදු ඒකීය නිර්වචනයක් මේ කෙරෙහි නොවන බැවිනි. එසේම නිර්වචන ආශ්‍රිතව ජීව විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක විභේදනයන් පවතී. ජීව විද්‍යාත්මකව ලිංගික එක්වීමේ පරමාර්ථය වඩා ශක්තිමත් ජීවියෙක් ජනිත කිරීම සඳහා සහකරුවෙක් හෝ සහකාරියක් සමඟ ජන්මානු හුවමාරුවයි. මානව ලිංගිකත්වය ද ජෛවීය අවශ්‍යතාවයක් ලෙස මේ සමඟ සසැඳිය හැකිය ( චන්ද්‍රවංශ 2007:225 ). ප්‍රජනන යාන්ත්‍රනය තුළ මූලික ජෛවීය ප්‍රේරණයක් වන ලිංගිකත්වය සියලු විශේෂයන් අන්තර්වර්තී ලිංගික කෘත්‍යයක නියැලීමෙන් සපුරා ගැනෙති (Patricia & Jeffery 1997). මානව ලිංගිකත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක අර්ථ නිරූපණයක් ගොඩනැගෙනුයේ සංස්කෘතික, දේශපාලනික නෛතික දෘෂ්ටි කෝණයක් සහ දාර්ශනික මතවාදයන්ගේ සම්මිශ්‍රනයක් තුළිනි. ආචාරධාර්මික, දේවවාදී ආත්මීය හෝ ආගමික සබැදියාවන් ඒ ඇසුරෙහි තිබිය හැක (http://en.wikipedia.org/wiki/Human_sexuality). මානව ලිංගිකත්වය පිළිබඳ ක්‍රොගර් (Kroger) දක්වන නිර්වචනයට අනුව ඒ වනාහි පුද්ගලයකු ලිංගික කාර්යාවලියට සහභාගීවීම හා ඒකාබද්ධ වූ ලිංගික රුචිකත්වයන් වේ (Kroger :2000). මෙහිලා පැන නගින පෘථුල වූ කරුණු දක්වීමක් ලෙස සංසර්ගීය කාර්යට අතිරේක, ලිංගික රුචිකත්වය පිළිබඳ සඳහන විශේෂි වේ. එහෙත් Kroger ස්වකීය නිර්වචනය පුළුල් සන්දර්භයක ගොඩනැගීම දුබලතාවයකි. මන්දයත් මානව ලිංගිකත්වය හා බැඳුණු සංස්කෘතික හා සෙසු සාධක පිළිබඳ ගැබ්වීමක් ඔහුගේ නිර්වචය තුළ නොවන බැවිනි.

සමාජ සහ මානව විද්‍යා විශ්වකෝෂයීය නිර්වචනයට අනුව මානව ලිංගිකත්වය යනු ජීව විද්‍යාත්මක සංස්කෘතිකමය වශයෙන් අන්තර් ව්‍යවහාරික වූවකි. එසේම මානව ලිංගිකත්වය නම් සමීප මිනිසුන් අතර පවතින ලිංගික දැනීම් හි ප්‍රකාශනය හෝ ස්ත්‍රී පුරුෂ බව හරහා සහ ස්ත්‍රී පුරුෂ භාවය මතින් බලපෑම් ඇති කරන ලිංගික අනන්‍යතාවයේ ප්‍රකාශනයකි (http://www.bookrags.com/Sexuality). මානව ලිංගිකත්වය පුළුල් පරාසයක විහිදුනු චර්යාවන් ක්‍රියාවලීන්ගෙන් හා ඒවායේ කාය විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක, සමාජ සංස්කෘතික, දේශපාලනික හා දාර්ශනික විස්තීරණයන්ගෙන් සමන්විත වේ.

මොරිස් දක්වන අන්දමට ලිංගික හැසිරීම් රටාවන් හුදෙක් ජීව විද්‍යාත්මක විකරණයන් නොව ඉගෙනගත් දේ හා බුද්ධිය ද ඒ මත පදනම් වේ ( Morris 1967:29). චන්ද්‍රවංශ දක්වන පරිදි ( 2007:

225) ඇලන් සහ බාබරාට අනුව ලිංගිකත්වයේ ජීව විද්‍යාත්මක ස්වරූපය විමර්ශනයෙහි දී සඳහන් වන්නේ ප්‍රාරම්භක ඒක ශෛලික ජීවියා ස්වකීය ජාන හුවමාරු කර ගැනීම හා දුහිතෘසෛල වෙත පිරිනැමීම මතින් එහි මූලාරම්භය සිදු වූ බවයි. මොළයේ හයිපොතැලමස කේන්ද්‍රීය මධ්‍යස්ථානය වූ මානව ලිංගිකත්වය එහි ප්‍රමාණය මත හා හෝමෝන නිෂ්පාදනය මත රඳා පවතී. මානව ලිංගිකත්වය වටහා ගැනීම බහු වෛෂයික හා බහුවිධ දෘෂ්ටිකෝණ ඔස්සේ සිදු කළ යුතු වන්නේ මෙකී විස්තීරණ වූ ස්වභාවය හේතුවෙනි. විශේෂයෙන් සත්ව ලෝකය තුළ පොදු ලිංගිකත්වයෙන් බැහැර අනන්‍යතාවයක් මානව ලිංගිකත්වය තුළ පවතී. එසේම එය කේන්ද්‍රකොට ගනිමින් බිහි වූ නිර්මිතයන් ජීවන රටාවන් හා මෝස්තර හෝ සංකල්ප මානවයාට අවශ්‍ය වේ. එකී අනන්‍යතාව පදනම් වන්නේ සමාජීයීය මානවයා මතයි.

**ස්ත්‍රී පුරුෂ බව ලිංගික අනන්‍යතාව හා දිශානතිය**

ස්ත්‍රී පුරුෂ බව ලිංගිකත්වය ඇසුරෙහි සංවාදයට විවර වුව ද ලිංගිකත්වය හා එහි ඇති සබැඳියාව මිස ස්ත්‍රී පුරුෂ බව (Sex) යනු ලිංගිකත්වය නොවේ (Crooks 2005). ජීව විද්‍යාත්මක දෘෂ්ටිකෝනයෙන් ස්ත්‍රී පුරුෂ බව විමසීම ප්‍රායෝගික හා තාර්කික වේ. ජෛවීයම ලිංගේන්ද්‍රියන්ගේ සහ ද්විතීයික ලිංගික ලක්‍ෂණයන්ගේ විභේදනය මත දෘශ්‍ය ස්ත්‍රී පුරුෂ බව හඳුනා ගත හැකිය (Giddens 1997) . මූලිකව ස්ත්‍රියකගේ සහ පුරුෂයකුගේ ලිංගේන්ද්‍රීය ස්ත්‍රී පුරුෂ වෙනස දරන මුත් සමාජීය වශයෙන් ලිංගික ප්‍රදේශ අනාවරණය මානව සමාජගත ලක්‍ෂණයකි. නමුත් වෙනස් බාහිර ශාරීරික ලක්‍ෂණ එනම් ස්ත්‍රියකගේ පයෝධර, පුළුල් උකුල සේම පුරුෂයකුගේ පුළුල් දෙවුර හා ශක්තිමත් සිරුර ශරීරයේ රෝම ස්ත්‍රී පුරුෂ බව හෙළි කරයි. අතිරේකව ස්ත්‍රියකගේ සහ පුරුෂයාගේ කටහඬ චර්යාව ආදී හඳුනාගත හැකි ද්විතීයික ලිංගික ලක්‍ෂණ ද ස්ත්‍රී පුරුෂ බෙදුම් රේඛාවක් ලෙස ක්‍රියා කරයි. මේ බාහිර ලිංගික ලක්‍ෂණ අබිබවා යන අභ්‍යන්තරික වෙනස්කම් ස්ත්‍රී පුරුෂ විභේදනය කෙරෙහි බලපායි. ලිංගිකත්වය සඳහා මෙහෙයුම් මධ්‍යස්ථානය වන මොළයේ හයිපොතැලමස පුරුෂයාට වඩා ස්ත්‍රියකගේ කුඩාය. සංසර්ගික ආශාව ඇතිකරවන ටෙස්ටොස්ටෙරෝන් හෝමෝනය නිපදවීම ද සාපේක්‍ෂව ස්ත්‍රියකගේ අඩු ය. විශේෂයෙන් පුරුෂයන් සතු නොවන ඊස්ට්‍රජන් හා ප්‍රොජෙස්ටරෝන් හෝමෝනවල හිමිකාරිත්වය ස්ත්‍රියයි (චන්ද්‍රවංශ 2007). ස්ත්‍රියකගේ සහ පුරුෂයකුගේ මොළයෙහි කෘත්‍යය සහ ධාරිතාව තුළින් පැහැදිලි වෙනස්කම් ජනිත නොවූවද එහි ප්‍රමාණාත්මක වශයෙන් පිහිටීමෙහි විෂමතාවක් දක්නට ලැබේ. ස්ත්‍රිය බොහෝ සෙයින් භාෂා හැකියාව අතින් කාර්යක්ෂම වන අතර පුරුෂයන් බොහෝ විට තාර්කික හැකියාව අතින් ඉදිරියෙන් සිටී ( Garret 1992: 221).

මානව ලිංගිකත්වය තුළ ස්වීය ලිංගික අනන්‍යතාවයක් ස්ත්‍රිය සහ පුරුෂයා දරයි. මේ ලිංගික අනන්‍යතාවය යනු ඔහු හෝ ඇය දරන ස්ත්‍රී හෝ පුරුෂ භූමිකාව තුළ ස්වකීය පෞරුෂය හා චර්යාත්මක පසුබිම තුළින් ප්‍රකට කරන සහ මනෝමය වශයෙන් අභ්‍යන්තරිකව පවත්නා හැඟීම් ඇතුළත් සමස්ථයයි. ස්ත්‍රී පුරුෂ පුද්ගල භාවය තුළ තම ස්ත්‍රී හෝ පුරුෂ අනන්‍යතාව මනෝගමනය වී ඇතිවාක් සේම පෞර්ෂය හා චර්යාව ද ඊට අනුරූප වේ. එලෙසම මෙහි සහ සම්බන්ධිත පාර්ෂවයක් ලෙස පුද්ගල ලිංගිකත්වය පිළිබඳ අනෙකා සිතන්නේ කෙසේ ද යන අදහස ද පුද්ගලයා

තුළ පවතී. අනන්‍ය ලිංගික යථාර්ථයට අතිරේකව ඒ සමග ගොඩනැගෙන සමාජ සබඳතා සමාජ ප්‍රජාව සමග වන අන්තර් සබඳතාවල ස්වරූපය ද ලිංගික අනන්‍යතාවය නියමානුකූල කරයි.

ලිංගිකත්ව සංවර්ධනයේ දී අනුකරණය සහ හඳුනා ගැනීම වැදගත්වන බව සමාජ ඉගෙනුම් න්‍යාය පැහැදිලි කරයි. එය ලිංගික අනන්‍යතාව ගොඩනැංවීමෙහිලා වන සාධකයක් සේ ගත හැකිය. මන්ද දරුවා සිය සමාන ලිංගික දෙමාපියන් වෙතින් ස්ත්‍රී පුරුෂ සමාජ භාවයේ කාර්ය කොටස් මනෝගමය කරන බැවිනි (Carroll 2007). සම්ප්‍රදායික සමාජ ව්‍යුහය තුළ පුද්ගල ලිංගික අනන්‍යතාව ගොඩනැගෙනුයේ සාමූහික අභිප්‍රායන් මතය. නමුත් නූතන ලිබරල් ප්‍රජාතන්ත්‍රික සමාජයන්හිදී ලිංගික අනන්‍යතාව ගොඩනැගීමෙහිලා පුද්ගල අභිප්‍රාය මූල සාධකය වන අන්දම පැහැදිලි වේ (Carroll 2007). පුද්ගල ලිංගික අනන්‍යතාව ද සෙසු අනන්‍යතා සාධක සේම සවිඥානිකව හෝ අවිඥානිකව බහිර්දෘශ්‍ය වේ. ඇඳුම් පැළඳුම්, භාෂාව, ජීවන මෝස්තරය, පරිභෝගයන්, විශ්වාස පද්ධතීන් තුළින් ලිංගික අනන්‍යතාව විදාරනය වේ. කෙසේ වුවද මෑත කාලීන සමාජ විපර්යාස හමුවෙහි ඉස්මතු වූ නව්‍ය ජනප්‍රිය සංස්කෘතිකාංග සහ ගෝලීයකරණ ක්‍රියාදාමය තුළ සාම්ප්‍රදායික ලිංගික අනන්‍යතාව පිළිබඳ සංකල්පයෙහි වෙනස්කම් ඇති විනැයි තර්ක කළ හැක. ලිංගික අනන්‍යතාවට අදාල සම්මත ස්ත්‍රිය සහ පුරුෂයා පිළිබඳ සංකල්ප සහ රූපීය ලක්ෂණ භාවිතය තුළ සම්මිශ්‍රණය වී හෝ තව දුරටත් අනන්‍ය නොවී පවතී. සාම්ප්‍රදායිකව ස්ත්‍රියගේ අනන්‍යතා ලක්ෂණ පුරුෂයා ද පුරුෂයාගේ වූ ලක්ෂණ ස්ත්‍රිය ද අත් කර ගනිමින් සිටින අන්දම නිරීක්ෂණය කළ හැකිය (Tracy and Tim 1999).

ලිංගික අනන්‍යතාව තහවුරු කෙරෙන අංශික පැතිකඩකි ලිංගික දිශානතිය. ස්ත්‍රිය හෝ පුරුෂයා චිත්තාවේගීව කායිකව හා ලිංගිකව යම් ස්ත්‍රී පුරුෂ භාවයකට හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවයනට විචිත්‍රාභූතව ආශක්ත වීම ලිංගික දිශානතිය වේ. (Carroll 2007: 328). පුද්ගල ලිංගික අනන්‍යතාව නිරූපණය කෙරෙන ලිංගික දිශානතිය විශම ලිංගිකත්වය, (Hetrosexality) සමලිංගිකත්වය, (Homosexuality) ද්වි ලිංගිකත්වය, (Bisexuality) අලිංගිකත්වය, (Asexuality) හෝ ආදේශ ලිංගිකත්වය (Transexuality) ලෙස ප්‍රධාන වශයෙන් ස්ථාපිතව ඇත. පුද්ගලයාගේ ලිංගික දිශානතිය ඔහුගේ ජීවිත කාලය විෂයෙහි ස්ථායි නොවිය හැකිය. ජෛවීය හා සමාජ සංස්කෘතික සන්ධර්භය මත හා පුද්ගල මනෝභාවයන්ගේ විචලනයන් හේතුවෙන් වෙනස් විය හැකිය (Macammon 1998). කෙසේ වුව ද ලිංගික දිශානතිය මත ලිංගික චර්යාව රඳා නොපවතී. ඒ ඒ ලිංගික දිශානතීන්ට අනන්‍යව ප්‍රභේදනය වූ ලිංගික චර්යාවක් නොවේ. එක් ලිංගික දිශානතියක අනුගත චර්යාවක් තවත් ලිංගික දිශානතියක චර්යාමය ලෙස පැවතිය හැකිය. ඒ නමුත් පුද්ගල ලිංගික ආකර්ශනය රඳා පවත්නේ කවර ලිංගික ඉලක්කයක් වෙත ද යන්න සහ ඒවා මත බලපැවැත්වෙන චර්යාව ඇසුරෙන් දිශානතිය නිර්ණය කළ හැකිය (Kroger 2000).

ලිංගික චර්යාව ලිංගිකත්වයට අදාළය. මේ අදාලත්වය මතුවනුයේ එය ලිංගිකත්වයෙහි අනිවාර්ය උපාංගයක් වන හෙයිනි. ලිංගික චර්යාව යනුවෙන් මතුවනුයේ ලිංගිකත්වය උදෙසා නියැලෙන කාර්ය කුමක් ද හා කා සමඟ ද යන්නයි. (Steinberg 1993) මේ තුළ ලිංගික කෘත්‍ය සඳහා වන පුද්ගලාන්තර සබඳතා කායික හා මනෝමය බැඳීම සේම සංසර්ගය ඇතුළත්වේ (http://en.wikipedia.org/wiki/Human_sexual_activity). ලිංගික චර්යාව තුළ අන්තර්ගත වනුයේ

හුදෙක් ජතිතයන් බිහි කිරීමම අරමුණු කොට ගත් එනම් ප්‍රජනනය සඳහා වන සංසර්ගය පමණක් නොවේ. මානව ලිංගිකත්වය තුළ ලිංගික චර්යාවේ අභිප්‍රාය අතර තෘප්තිය ද වේ. මෙහිලා පුද්ගලයා අන්‍යෝන්‍ය සිරුර කෙරෙහි ඇලුම් කිරීම සිදුවන අතර ඒ මත ලිංගික චර්යාව තුළ සුරතාන්තයට (Climax) පෙර වන සංසර්ගය ද පූර්ව ලිංගික ක්‍රියාකාරකම් ද වේ. හුදෙක් සංසර්ගීය මුඛ්‍ය පරමාර්ථය ප්‍රජනනය නොවන්නේ ඊට බාධා පමුණුවමින් තෘප්තිය අවසන් අරමුණ ලෙස ඉලක්කගත ලිංගික චර්යාව මානව ලිංගිකත්වයෙහි පවතින හෙයිනි. ලිංගික චර්යාව සංසර්සය තුළ රාමු ගත කොට ලඝු කළ නොහැක්කේ පූර්ව ලිංගික ක්‍රියා ද ඇතුළත් ඇතුළත් සංකීර්ණ සමස්ථය එහි වන බැවිනි .ලිංගික චර්යාව තුළ යුගල බන්ධනය ප්‍රමුඛ වුව ද ස්වයං වින්දනය ආදී තනි පුද්ගල චර්යාවන් හෝ සාමූහික චර්යාවන් ද වේ. ඇතැම් අවස්ථාවක අපගාමී ලිංගික චර්යා ලෙස මානව සත්ව අන්තර් ලිංගික ක්‍රියාකාරකම් (Beastility), පරපීඩිත කාමුකත්වය (Sadisam), ස්වපීඩා කාමුකත්වය (Masochism) දැකිය හැකිය. මෙවැනි ලිංගික චර්යාවන් සමාජ සුභාවිත හෝ සම්මතක භාවිතාවන්ගෙන් දුරස්ථ වන අතර ඇතැම් සීමිත පිරිසක් ඇබ්බැහි වූ චර්යාවන් ද වේ (Atypical sexual behavour) (Crooke 2005).

**ලිංගිකත්වයේ ඉතිහාසය**

ප්‍රජනනය අභිප්‍රාය කොට ගත් ස්වභාවයේ කාර්යාවලිය ලිංගිකත්වය නම් එහි ඉතිහාසය මානව ඉතිහාසයම වේ. සිය රුක් වැසි වානර පූර්වයන්ගෙන් ලද ලිංගිකත්වය ආරම්භක දෙපාවත් මානවයා ස්වීය වූ අනන්‍යතා ලක්‍ෂණ සහිතව ගොඩනගාගත්තේ ය. ආරම්භක සමාජ තුළ වූ ලිහිල් ලිංගික සබඳතා හා රළ තුළින්ම සහකරු හෝ සහකාරිය තෝරා ගැනීම ආදී කෘත්‍යයන් පසුකාලීනව වඩාත් සංකීර්ණ ස්වරූපයක් ගත්තේ ය. ඒ තුළ තම සමාජයමය භාවිතයන් ද ලිංගිකත්වයේ ගොඩනැගීම කෙරෙහි භාවිතා විය.

> ''ආරම්භයේ දීම දඩයමේ ගිය විට ස්ත්‍රීන් තමන්ට විශ්වාස වන්තව සිටින බවට පිරිමින් සහතික වශයෙන් දැන සිටිය යුතු විය. මේ නිසා යුගල සැදීමේ කැමැත්තක් ගැහැණුන් තුළ වර්ධනය වීම අවශ්‍ය වූයේය. දඩයම් කටයුතුවලදී දුර්වල පිරිමින්ගේ සහයෝගය ලබා ගැනීමට නම් ඔවුන්ට ද සමාන ලිංගික අයිතිවාසිකම් ලබා දිය යුතු වේ. ස්ත්‍රීන් බෙදාගෙන ලිංගික සංවිධානය වඩා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පවත්වා ගැනීම මෙහි දී වැදගත් විය. මෙය සිදු කළ හැකි හොඳම ක්‍රමය වූයේ එක් පිරිමියෙකු එක් ගැහැණියකගෙන් තෘප්තිමත් වීමයි'' (මොරිස් 1967:40).

වඩාත් විධිමත් ලිංගික සබඳතා මානව සමාජගත වන්නට ප්‍රථම පැවති ලිහිල් ස්වරූපය නිසා ඒ සම්බන්ධ සම්මතයන් හා තහංචි ද පවතින්නට ඇත්තේ ද ප්‍රාථමික මට්ටමේ ය. 1861 බහෝපන්ගේ මව් අයිතිය කෘතියේ ඔහු සඳහන් කරන්නේ මිනිස් සංහතිය ආරම්භයේ දී හෙටේයරිසම් ලෙස ඔහු හැඳින් වූ අවිචාරවත් ලිංගික සබඳතා සහිත තත්වයක් තිබුණු බවයි.

රොද්‍රිගුට අනුව (1979) එල්. එච්. මෝගන් දක්වන අන්දමින් ලිංගිකත්වය කෙරෙහි ව්‍යභිචාරී තහංචි ආදි සීමා පැවතියේ මද වශයෙනි. මානව සමාජය තුළ පෙර නොවූ විරූ ලෙස පුද්ගලිකත්වය ඉස්මතුවන විට ලිංගිකත්වය පිළිබඳ ඓතිහාසික වෙනස්කම් පහළ විය. විශේෂයෙන් එක් සහකරුවෙක් ස්ථිර වශයෙන් ලිංගික කෘත්‍ය සඳහා සහභාගී කර ගැනීම පෞද්ගලික දේපල හිමිකම සහ කෘෂි සමාජ ඇති වීමත් සමග භාවිතයට ගැණුනු බව එංගල්ස් උපුටා දක්වමින් සඳහන් කළ හැක. කෙසේ වුව ද මානව ලිංගිකත්වයෙහි ඓතිහාසික පසුබිම තුළම ලිංගික කෘත්‍යයෙහි මූලික අරමුණ ප්‍රජනනයම නොවූ වග පෙනී යයි. ජීවන සුඛය සහ සන්තෘෂ්ටිය ද ලිංගික කෘත්‍යයෙහි අරමුණු අතර විය. ශිෂ්ටාචාර තුළ වඩාත් පහසු ජීවන තත්වයන් ඇත්වීමේ දී ලද විවේකය මානව ලිංගික ජීවිතයේ ප්‍රජනනයෙන් පරිබාහිර ඉලක්ක කෙරෙහි පුද්ගලයා යොමු කිරීම සිදු විය (Collins Coltrane 1991).

පසු කාලීනව ඒක සහකරුවෙකුට සීමා වූ විෂම ලිංගිකත්වය බොහෝ ශිෂ්ටත්වයන් තුළ සිදු විය යුතු දෙය ලෙස තහවුරු විය. නමුත් තම සහකරුවන්ට හෝ සහකාරියට සීමා නොවූ අනියම් ලිංගික සබඳතා ද ඇතැම් සමාජයන් හි පැවති බව ඓතිහාසික මූලාශ්‍ර මගින් පැහැදිලි වේ (Hawkes 1996). පුරාතන රෝම සහ ඉන්දීය ශිෂ්ටාචාරයන් තුළ ලිංගිකත්වය දිව්‍යමය ප්‍රකාශනයක් ලෙස ඉස්මතු වූ බව පෙනේ (Foucault 1979). ඉන්දීය සමාජය තුළ දේවදාසී සංකල්පය සහ ශිව ලිංග පූජාව ලිංගිකත්ව අරුත් මතු කරන වන්දනීය සම්ප්‍රදායන් විය. සුප්‍රකට කජුරාවෝ දෙවොලෙහි නිරූපන ලිංගිකත්වය හා සෘජු බැඳීමක් පවතින බවට තර්ක කළ හැකිය. කෙසේ වුව ද මේ ආරම්භක යුග වලදී පවා ගණිකා වෘත්තිය හා සමලිංගිකත්වය වැනි ලිංගිකත්වය හා සම්බන්ධිත ප්‍රභේදන පැවතිණි ( රොද්‍රිගු 1979:77 ).

ආරම්භක රෝම ශිෂ්ටාචාරයෙහි සමලිංගිකත්වය රාජ්‍ය බදු අයකිරීමට නතු වූ ගණිකා වෘත්තීමය තත්වයක ද පැවතුනු අතර ලිංගික සදාචාරය තුළ සමලිංගිකත්වය ස්වභාවික හා සාමාන්‍ය දෙයක් වූ බවට සාධක ඇත. නමුත් මධ්‍යධරණී කලාපය පුරා පැතිර ගිය ක්‍රිස්තියානි සභ්‍යත්වය මේ සම්බන්ධ වාරණයන් හා සීමාවන් පසුකාලීනව ගොඩනැංවීය. කෙසේ වුවත් කාන්තා සමලිංගිකත්වය (Lesbianism) කෙරෙහි සමකාලීන ශිෂ්ටාචාරයන් හි පැවතියේ විරෝධාකල්පයක් බව පැහැදිලිය (Carroll 2007) ආසියාතික චීන හා ඉන්දියානු සමාජයන් සැලකූ විට ලිංගිකත්වය සහ අදාල සම්භෝග සුඛය හා ශෘංගාරය කෙරෙහි ඉහළ අවධානයක් පැවති බව දැක්වේ. ලිංගික එක්වීම තුළYing & Yang නම් ප්‍රතිපක්ෂ ස්ත්‍රී සහ පුරුෂ ශක්තීන් එක්වන බව විශ්වාසය විය. වාත්ස්‍යායනගේ කාම සූත්‍රය ලිංගිකත්වය සම්බන්ධ ප්‍රකට ඉන්දීය ග්‍රන්ථයයි (Crooks 2005). මධ්‍යකාලීන යුරෝපය තුළ විශේෂයෙන් ක්‍රිස්තියානියෙහි බලපෑමට ද පසුබිමෙහි පැවතියදී උද්ගත වන උග්‍ර වික්ටෝරියානු සදාචාරය ඓතිහාසිකව ලිංගිකත්වයට අදාල දැඩි සීමා කිරීම් හා වාරණයන් පැනවීය. පල්ලියෙහි ඉගැන්වීම් මුල් කරගනිමින් අපගාමී ලිංගික චර්යා සහ සම්මත සදාචාරයෙන් බැහැර ලිංගික සබඳතා සමාජ උදහසට පාත්‍ර විය (Crooks 2005).

නමුත් කාර්මික විප්ලවය සහ සමාජ දේශපාලනික පෙරලීන්ගෙන් පශ්චාත්කාලීන ලිංගිකත්වය සම්බන්ධ අර්ථ නිරූපන හා භාවිතය බොහෝ සෙයින් වෙනස් වේ. ඒ වනාහී ස්වභාවධර්මයේ අංගයක් ලෙස මිස එරෙහි විය යුතු හෝ සඟවාගත යුතු දෙයක් නොවන බව සමාජ මතය විය.

කින්සි වාර්තාව නිදර්ශනාත්මක පැහැදිලි කිරීමක් ලෙස දැක්විය හැකි ය. එක්සත් ජනපදය තුළ ද පියුරිටන්වාදී ලිංගිකත්ව මර්ධනයන් අහෝසි විය. (Crooks 2005). අද්‍යයතනයෙහි ලිංගිකත්වය සම්බන්ධ බොහෝ වාරණයන් පහව ගොස් වඩාත් ලිබරල්වාදී දෘෂ්ටියකින් ඒ දෙස බැලීමටත් පරිභෝජනවාදී ආර්ථික රටාව තුළ ලිංගිකත්වය ද පරිභෝජනය කළ යුත්තක් සේ සැකීමටත් පෙළඹී ඇත. ස්ත්‍රී පුරුෂ සමලිංගිකත්වය වැනි පූර්වයෙහි අසම්මත භාවිතාවන් ඒවායෙහි නියැලෙන්නන්ගේ හිමිකමක් ලෙස තහවුරු කෙරෙන තරමටම ලිබරල් චින්තාවෙහි අනුබල සැපයී ඇත (Crooks 2005).

**ලිංගිකත්වයේ ජීව විද්‍යාව**

මානව ලිංගිකත්වයෙහි ජීව විද්‍යාත්මක සුවිශේෂත්වය විශේෂයෙන් ඔහුට සමීප අනෙකුත් ප්‍රිමාටාවන් සමඟ සසඳා බැලීම සිත්ගන්නා සුළුය. මානව ස්ත්‍රී ලිංගික ග්‍රාහකත්වය දක්වන කාලය පිළිබඳ ආර්ථව චක්‍රය සමඟ සීමාවන් නොවේ. අනෙකුත් ප්‍රිමාටාවන්ගේ ස්ත්‍රී සතුන් ලිංගික සක්‍රීය බව දක්වන්නේ ආර්ථව චක්‍රය තුළ සතියක පමණ කාලයක් වන අතර පැටවුන් ප්‍රසූත කරන කාලයේ සේම කිරි දෙන සමයේ ලිංගිකව අක්‍රීය බව ඩෙස්මන්ඩ් මොරිස් දක්වයි. ( මොරිස් 1967:39). එහෙත් මානව ස්ත්‍රිය වසර මුළුල්ලේ මත් බොහෝ විට අර්ථවහරණයෙන් පසුව වුවත් ලිංගික ග්‍රාහකත්වය දක්වයි. (Mastor & Jonsan 1970).

ජීව විද්‍යාත්මක අවශ්‍යතා පූරණය කරනු වස් මානවයා බෙහෙවින් ලිංගිකත්වය හා බැඳුණු සත්වයකු ලෙස පරිණාමය වූ වග තහවුරු වේ. මානව ලිංගිකත්වය කෙරෙහි අවධානයේ දී ස්ථිර වනුයේ සංසර්ගය සඳහා පුරුෂ සහභාගීත්වය ද කවර අවස්ථාවක වුව තහවුරුව ඇති බවයි. කුඩා කාලාන්තරයේ දී සංසර්ගය තුළ උච්චතම ලිංගික අවස්ථාවට එළඹුණද අන්සතුන් වෙතින් විද්‍යාමාන නොවන සාපේක්ෂව දිගු පූර්ව සංසර්ග අවස්ථාව මානව ලිංගිකත්වය තුළ වේ. ස්ත්‍රීය ලිංගික උච්ච අවස්ථාවට හෙවත් සුරතාන්තයට එළඹීමක් අනෙකුත් ප්‍රිමාටාවන්ගේ නොවුවත් මානව ස්ත්‍රිය සුරතාන්තය හෝ නැතිනම් බහු සුරතාන්තයන් අත්විඳීමේ හැකියාවෙන් යුක්ත වේ (Crooks 2005). මානව සංසර්ගීය ඉරියව් ද අන්‍ය ප්‍රිමාටාවන්ට හා සෙසු සත්වයින්ට වඩා වෙනස් මුහුණට මුහුණලා එකිනෙකා මත සිටින ඉරියව්වකි. මෙයද ජීව විද්‍යාත්මක විකරණයක් බව මොරිස් පෙන්වා දෙයි. මේ තුළින් ලිංගික ආශ්‍රයන් තීව්‍ර කරන පෙරමෝන (ගන්ධයන්) ආස්‍රාහන හැකියාව දියුණු කිරීමද සිදු වේ( Morris 1967).

මානව ලිංගික ක්‍රියාව අභිප්‍රේරණය වනුයේ මොලයේ හයිපොතැලමස මෙහෙයවීමෙන් නිපැයෙන හෝර්මෝන ක්‍රියාකාරීත්වයෙන් වේ. ලිංගිකත්වය ඒකෙරෙහි සංවේදීත්වය හා අන්තර්පුද්ගල ආකර්ශනය කෙරෙහි හෝර්මෝන බලපාන බව තවත් පිළිගැනීමකි. ලිංගික හෝර්මෝන ලෙස ඇන්ඩ්‍රොජන් සහ ඊස්ට්‍රජන් විශේෂයෙන් වැදගත් වේ. හෝර්මෝනීය කෘත්‍යයන් තුළින් ජෛව රසායනික පදනමක් විද්‍යාමාන වන මානව ලිංගිකත්වය පරිනාම ක්‍රියාවලිය තුළ සුවිශේෂී වෙනස්වීම් අත්පත්කොට ගෙන ඇත. ඒ කෙරෙහි ජානමය විස්තරකථනයන් ඉදිරිපත් කළ හැකිවාක් සේම ඒ වූ කලී ප්‍රවේණිකය. මෙහි ජෛවීය අරමුණ අනාගත දුහිතෘන්ට ජාන උරුම කිරීමයි. මානව ලිංගිකත්වයෙහි ජීව විද්‍යාත්මක පදනම විග්‍රහ කරන සෛධාන්තිකයන්ට අනුව ඒ හා බැඳුනු ඒක

පුරුෂ ඒක ස්ත්‍රී ව්‍රතය සහකරුවා තෝරා ගැනීම හා සමාජ ලිංගික වාරනයෙහි පදනම පවා ස්ථාපිත වනුයේ ජෛවීය මූලධර්ම මතයි (Carroll 2007: 35).

**ලිංගිකත්වය සමාජ නිර්මිතයක් ලෙස**

මානව ලිංගිකත්වය ජීව විද්‍යාත්මක පසුබිමකින් හෙබියේ වූ ව ද ඒ කෙරෙහි වන ලඝු නොවූ සමාජ සංස්කෘතික සබඳතාවන් විමසීම ද මේ පර්‍යෙෂණයෙහි අරමුණෙකි. හුදෙක් ප්‍රජනනයට සීමා නොවූ ඇතැම් විට සම්මුතික ස්වභාවයෙන් බැහැර වූ මානව ලිංගිකත්වයෙහි භාවිතාවන් සමාජීය නිර්මිතයකි. සන්තෘෂ්ටිය සෙනෙහස ප්‍රචණ්ඩකාරී චර්යාව ආර්ථික අත්පත් කර ගැනීම් ආදී අනු ආංගිකයන් ගණනාවක් මානව ලිංගිකත්වය හා සැබැඳෙන අතර ඒවා ජෛව විද්‍යාත්මක නොවූ සමාජ නිර්මිතයන් වනුයේ මානව ලිංගිකත්වයටම අනන්‍ය බැවිනි. Berger & Luckman (1966) පෙන්වා දෙනුයේ ලිංගිකත්වය යනු සමාජ නිර්මිත යථාර්ථයක් වන අතර අපගේ ක්‍රියාවන්, ප්‍රතික්‍රියාවන්, අන්තර් ක්‍රියාවන් ඇසුරෙහි නිර්මාණය කරමින් සහ ප්‍රතිනිර්මාණය කරමින් පවතින බවයි. ඔවුන්ගේ තර්කයට අනුව ලිංගික යථාර්ථය අස්ථාවරය. හේතුව සංස්කෘතිය තුළ සියල්ල ප්‍රතිනිර්මාණය වීමේ ස්වභාවය මත ස්ථාවරයන් නොවන හෙයිනි. හුදෙක් ලිංගික යථාර්ථයන් අර්ථ ගැන්වෙනුයේ තත්කාලීනව සමාජය එය අර්ථ නිරූපණය කරන ආකාරයන් මගිනි (Steel 2005: 14,15).

මිචෙල් ෆූකෝට අනුව ලිංගිකත්වය වනාහි දෘඪතර හෝ ස්වභාවික සැකැස්මක් නොවේ (Foucault 1979). එය ඓතිහාසික සමාජ සන්දර්භයන් මත නිර්මාණය වූ අතර ඊට යථාර්ථයන් ආරෝපණය කිරීමෙහි ලා සමාජ ධූරාවලියක බලපෑමක් ද වේ. එනම් සමාජ සම්මුතික අර්ථකථන ජනනය වනුයේ ධූරාවලියේ උපරි පාර්ශවයන් වෙතිනි. ෆූකෝ ගේ මෙකී විග්‍රහය තුළ විද්‍යාමාන තවත් තර්කයක් වනුයේ ලිංගිකත්වය ස්වභාවික නිර්මිතයක් නම් සමාජ ධූරාවලියේ උපරි ව්‍යුහය සමාජගත කරන අර්ථකථනයන්ට ප්‍රතිරෝධයන් තිබිය නොහැකිය යන්නයි. අර්ථකථන සමාජගත කිරීමෙහිලා හෙජොමනික ස්වභාවය තුළ පවා පොදු සම්මුතීන්ට එකඟ නොවන අර්ථකථන ලෝකය තුළ භාවිත වන්නේ ලිංගිකත්වය හුදෙක් සමාජ සංස්කෘතික නිර්මිතයක් ද වන බැවිනි. මධ්‍යකාලීන චීනයෙහි කෘතීම ලෙස දෙපා කුඩා කල ස්ත්‍රීන් ලිංගික ආශයන් වඩාත් කුළු ගැන් වූ බව පිළිගැණුන ද අද්‍යතන චීන සමාජයෙහි එවැනි අදහසක් දක්නට නොවීම නිදසුනකි. ලිංගිකත්වයට අදාල සමාජ සම්මුතීන් අතර වන ලිංගික චර්යාවට අනුගත වයස, සහකරු තීරණය කිරීම ආදී සමාජ නිර්මිත වනුයේ මානවයා ලිංගිකව සක්‍රිය වන අවධියේ සිටම ලිංගික චර්යාවෙහි නියැලීමට හැකි වුවත් එය වාරණය කෙරී වයස් සීමාවන් යනාදිය තීරණයව ඇති හෙයිනි.Gagmon & Simon (1973) ගේ අදහස අනුව මානවයාගේ මැඩිය නොහැකි ජෛවීය ලිංගික ආශයන් පාලනය කිරීමට සමාජය උත්සාහ ගැනීම තුළින් ද ලිංගිකත්වය සමාජ නිර්මිතයක් බව පෙනේ. මේ අනුව ලිංගිකත්වය පාලනය කිරීම සඳහා සදාචාරවත් සම්මුතීන් නිර්මාණය කෙරේ. නොඑසේනම් යම්කිසි වාරණ පැනවේ. ඒ අතර ලිංගික සහකරුවෙකු තෝරා ගැනීමේ වයස නිර්ණය, සංස්කෘතිය අනුව වෙනස්වන සම්මුතික ලිංගික චර්යාවන් ඒක පුද්ගල, ඒක ස්ත්‍රී විවාහයන් හා නෛතික විවාහ ක්‍රම සමාජ ගත කිරීම ආදිය වේ. මෙවැනි සම්මුතීන් හා වාරණයන්ගෙන් පාලනය කළ නොහැකි ලිංගිකත්වය සමාජ අපගමනයන් ලෙස අර්ථකථනය කෙරේ.

ජීව විද්‍යාත්මක ලිංගික ආශයන් පාලනය කරනු වස් පුද්ගලයා ලිංගික උත්තේජනය ලබන්නේ කවරෙකුගෙන් ද එහි ස්වභාවය කෙබඳුද යනන් පිළිබඳව සමාජමය අර්ථකථන ගොඩනැගී පවතී.ගැග්මන් සහ සිමොන් 1973 ට අනුව ලිංගික හමුවීම සහ ලිංගික චර්යාවේ ස්වභාවය නිර්නය කෙරෙන මාර්ගෝපදේශයන් සංස්කෘතිය විසින් සැපයේ. මෙබඳු මාර්ගෝපදේශ සංස්කෘතීන් තුළ ඒ ඒ සංස්කෘතියට අනන්‍ය විභේදන දක්වයි. ආසියාතික සමාජයෙහි ලිංගිකත්වය තුළ වන පුරුෂ මූලික ස්වභාවය බටහිර සමාජ සන්දර්භයේ දී වෙනස් විය හැකිය. විවිධ සමාජ සන්දර්භයන් තුළ ලිංගික චර්යාව බහුවිධ අර්ථකථන මතුකරයි. සෙනෙහස, සමීප බව, ස්වයං තෘප්තිය සඳහා වන අනියම් සබඳතා ප්‍රචණ්ඩකාරී ලිංගික චර්යාවන් හා ගණුදෙනු අපේක්ෂිත ලිංගික චර්යාවන් (ලිංගිකත්වයේ වාණිජ්‍ය ස්වරූපය) ඒ අතර වේ. ලිංගිකත්වය කෙරෙහි ජෛවීය පදනමක් මත ශාරීරික පෙළඹුමක් පැවතිය ද උක්ත අර්ථකතනයන් ස්ථාපනය සඳහා සමාජමය බලපෑමක් වෙතැයි සමාජ නිර්මාණවාදීන්ගේ මතයයි. කැරොල් (2007:18)පවසන පරිදි Elias පෙන්වා දෙන අන්දමට නිදන කාමරය පිළිබඳ අතිශය පෞද්ගලික යන සංකල්පය මධ්‍යකාලීන යුරෝපයේ නොවූවත් නග්න ශරීරය පිළිබඳ අද්‍යකාලීන මතයන්ට සාපේක්ෂ ලිහිල් මතයක් එකල පැවතුණි. එස්කිමෝ සමාජය තුළ තම ලිංගික සහකාරිය පවා පරිත්‍යාග කිරීම ද උග්‍ර වික්ටෝරියානු සදාචාරය තුළ පවා තම බිරිඳගේ පහස ඉතාම ඉහළ ගෞරවයක් ලෙස කෙනෙකුට පිළිගැන්වීම පිළිබඳ වාර්තා වේ. එහෙත් වික්ටෝරියානු සදාචාරය තුළ ම ලිංගිකත්වය හා බැඳුණු අන්‍ය සාධක වාරණයට ලක් වීම දැකිය හැකිය. නිදසුනක් ලෙස එච්. ඩී. ලෝරන්ස් ගේ කෘතීන් වන චැටර්ලි ආර්යාවගේ පෙම්වත්තු හා කන්‍යාවී සහ අභිකුණ්ටිකයා ප්‍රකාශන තහනම පෙන්වා දිය හැකිය. ෆ්‍රොයිඩියානු විශ්ලේෂණයට අනුව ලිංගික ආශයන් ද ඇතුළත් මූලික මානව ආශයන් ශිෂ්ටාචාරගත වීම තුළ පාලනයට නතු වේ. සමාජ සංස්කෘතික සාධක මේ ආශයන් පාලනය කිරීම සඳහා දායක වන බව තහවුරුවේ.

මේ තුළ සාධනය වන කරුණ නම් ජෛවීය මානව ලිංගිකත්වය කෙරෙහි සමාජ සංස්කෘතිකමය පදනමක් ද පවතින බවයි. හුදෙක් මේ මානවයාට අනන්‍ය වූ ස්වභාවයකි. ඒ තුළ මානව ලිංගිකත්වය වනාහි ජීව විද්‍යාත්මක එහෙත් සමාජමය අර්ථකතනයන් මත නිර්ණය වන මානවයා විෂයෙහි අනන්‍ය වූ ප්‍රපංචයක් වන බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


චන්ද්‍රවංශ, ආරියරත්න.
2007: *පිරිමි හා ගැහැණු මෙතරම් වෙනස් ඇයි.* බොරැල්ල.විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

දැදිගම.වි. රොද්‍රිගු
1979. *පවුල පෞද්ගලික දේපොළ හා රජය ඇති වූ සැටි : එන්ගල්ස්.* මොස්කව්: ප්‍රගති ප්‍රකාශක මන්දිරය.

බන්දුසීල. එස්.එම්
2000.නිරුවත් වානරයා:ඩෙස්මන්ඩ් මොරිස්.නුගෙ'ගොඩ:නව විද්‍යා ප්‍රකාශන.

Carroll, Janell.L
2007. *Sexuality Now*, Belmont: Thomson Higher Learning.

Collins, R & Coltrane, S
1991. *Sociology of marriage and Family*. Chocago: Nelson Hall Inc.

Crooks, Robberts & Bavr, Karla
2005. *Our Sexuality*, Belmont: Thomson Wadsworth.

Foucault, M
1979. *The History of Sexuality, Vol 1: An Introduction.* Harmondasworth: Penguin.

Garret, Stephanie
1992. *Gender*, London: Routledge.

Giddens, Anthony
1997. *Sociology*, London: Blackwell Publishers Ltd.

Hawkes, Gail
1996. *A Sociology of Sex & Sexuality*. Maidenhead: Open University Press.

Kroger, Jane
2000. *Identity Development*, Thousand Oaks, Sage Publications, Inc.

Macammon, S.
1998. *Making Choices in Sexuality,* Pacificgrove: Brooks Cole Publishing Company.

Morris, Desmond
1967. *The Naked Ape*, London: Jonathan Cape Ltd.

Tracey, Skelton & Allen, Tim
1999. *Culture and Global Change*, London: Routledge.

Masters, H & Johanson, V.E
1970. *The Pleasure Bond*. Little Brown and Company: Boston.

P atricia, M.W and Jeffrey H G.
1997. *Introduction to Psychology*. New York. MC Graw Hill.

Steele, Tracey.L.
2005. *Sex Self & Society*. Belmont: Thomson Wadsworth.

Steinberg Laurence.
1993. *Adolescence*. New York: Mc Graw Hill Inc.

http://en.wikipedia.org/wiki/Sexuality Accssed on 2010.11.18

http://www.bookrags.com/Sexuality Accssed on 2010.11.15

http://en.wikipedia.org/wiki/Human_sexual_activity Accssed on 2010.11.15

ආඛ්‍යාන narrations
**Volume 02 | Issue 01 | January – June 2017 | Article 06**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# දෘෂ්‍ය පරිසරය තුළ ස්ථාපිත කුල මහේශාක්‍යත්වයේ ආඛ්‍යාන[62]

ප්‍රභාත් ගලගමගේ[63]
B.A(sp), M.A, M. Phil
gprabath@gmail.com

උතුම් ලකුණු අටකින් සපිරුණ කදිමා
වැලිතොට කොඩිය තෙදබල පෙන්වූ නියමා
රන්දෙනි වෙලේ සතුරන් වැනසූ සැවොමා
කොස්මෝ ජේවිසේකර සෙන්පති උතුමා

ඌවේ ජනකවියක්[64]

## සංක්ෂේපය

ශ්‍රී ලාංකේය ඉතිහාසය යනු විවිධ වකවානුවල අනවරථව සිදුවූ සංක්‍රමණ වල ඉතිහාසයකි. මේ අනුව ප්‍රාදේශීය තලවලදී ජාතික තලයේ කියවෙන පොදු ඇරඹුම් ආඛයානයන්ට වෙනස් ආඛ්‍යානද කියවෙනු දැකගත හැකිය. මෙහිදී සාකච්ඡා කිරීම සිදුවනුයේ දකුණු වෙරළ බඩ තීරුවේ දිවි ගෙවන කුල කණ්ඩායම් ද්විත්වයක, එනම් කරාව හා සලාගම් කුල කණ්ඩායම් හි පොදු ඇරඹුම් ආඛයාන හා එකී ආඛයාන දෘෂ්‍ය පරිසරයට සේන්දුවීම පිළිබඳ කතාන්දරයයි. එම කතාන්දරය ශ්‍රීනිවාස්ගේ ප්‍රමුඛ කුලය පිළිබඳ සංකල්පය සමඟ සේම කුලය හා දේශපාලනය අතර සබඳතාවද නිරූපනය කරයි. ඒ අනුව මෙම වියමන කුල කණ්ඩායම් ද්විත්වයක පොදු සම්භව ආඛ්‍යානයන් පිළිබඳ ආඛයානයකි.

**ප්‍රමුඛ පදඃ** කුල සංකේත, ප්‍රාදේශීය සභා, සලාගම කොඩිය, මකර කොඩිය

අධිරාජ්‍යවාදීන් ධනවාදී සමාජ සබඳතා (කෘත්‍රිමව) ලංකාව තුළ ස්ථාපිත කිරීම නිසා පැරණි වැඩවසම් ක්‍රමයේ භෞතික පදනම් මකා දැමුණු නමුත්, වැඩවසම් සබඳතා තුළ පැවති ප්‍රධාන අංගයක් වන කුල ක්‍රමය පිළිබඳ හැඟීම ලාංකීය මනසින් ඉවත් වීම සිදුවූයේ නැත. ධනවාදී සමාජ

[62] මෙම ලිපිය සැකසී ඇත්තේ රාජකීය ආසියාතික සමිතියේ පස්වන පර්යේෂණ සම්භාෂණය වෙත ඉදිරිපත් කල පර්යේෂණ පත්‍රිකාවක් ඇසුරිනි

[63] Visiting Lecturer, National Institute of Cooperative Development, Polgolla, Kandy

[64] උපුටා ගැනීම: (කරුණාමුණි 2001:55)

ආකෘතිය ලංකාව තුළ ස්ථාපිත කර බොහෝ කල් ගතව ඇති නමුත්, පංතිමය ස්තරායනයට අමතරව යම් විකරණයන් හා වියැකීයාම් සහිතව වුවද, සිය අධ්‍යාත්මික ජීවිතය ආශ්‍රිතව කුල අනන්‍යතාවන් පිළිබඳව මිනිසුන් සවිඥාණික වනු දැකගත හැක.

කෙසේ නමුත් කුලය, ලාංකීය සමාජය තුළදී (ඓතිහාසිකවම) උඩු තලයේදී කතා බහ නොකෙරෙන, නමුත් යටි තලයේදී ප්‍රබල ලෙස එකී අනන්‍යතාව පිළිබඳ හැඟීම පවතින ප්‍රපංචයකි. (hidden reality) මේ හේතුවෙන් ම, ලාංකීය ලිඛිත සාහිත්‍යයෙහි පවා කුලය පිළිබඳ බහුලව සටහන්ව නැති අතර, පවතින සාහිත්‍යයන්ද දකුණු ඉන්දියානු බලපෑම දැඩිලෙස පැවති මෑත සියවස්වලදී ලියවුණු ඒවා වේ. එසේ වුවත්, කුල කණ්ඩායම් සිය අනන්‍යතාව ද, බලය හා ආධිපත්‍යය ද විවිධ සංකේතාත්මක භාවිතාවන් ඔස්සේ ඉදිරිපත් කරනු නිරීක්ෂණය කළ හැක. මෙම රචනාවට පදනම් වන්නේ දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කය තුළ ස්ථාපිත වෙරළබඩ කුල කණ්ඩායම් ද්විත්වයක් වන කරාව හා සළාගම ප්‍රජාවන් සිය කුල අනන්‍යතාව හා සිය ප්‍රාදේශීය පාලන ඒකකයන්ගේ බලය හා ආධිපත්‍යය පිළිබඳ තමනට ඇති හිමිකාරිත්වය කුල සංකේත ඔස්සේ ප්‍රකාශයට පත්කරන ආකාරය පිළිබඳ ක්ෂුද්‍ර තලයේ අධ්‍යයනයකි.

සිය ප්‍රජාව කුලමය "අනෙකා" ගෙන් වෙන් කරලීමෙහි ද, කුල හැඟීම තිරසර කිරීමේහි ද මෙවලමක් ලෙසත්, මේවායේ ඒකාබද්ධ ප්‍රතිඵලය ලෙස ප්‍රාදේශීය පාලන ඒකකයන්ගේ පාලන බලය නියෝජනයට "අනෙකාගේ" ආගමනය සීමා කිරීමෙහි මෙවලමක් ලෙසත්, මෙකී කුල අනන්‍යතාව හැඟීම් දනවන දෘෂ්‍ය සංකේතයක් ලෙස භාවිත වෙයි. එම තත්වය මෙම ප්‍රාදේශීය පාලන ඒකකයන්ගේ පාලක රෙජීමයන්ගේ කුල පසුබිම අධ්‍යයනය කළවිට තහවුරු වේ. පසුගිය සියවස තුළ පැවති කුල මහේෂාක්‍යත්වය පිළිබඳ විවාදයන් දෙසට ද මෙහිදී සමාන්තර අවධානයක් යොමුකර ඇත්තේ මෙම කුල සංකේතයන් වෙත කුල කථකයන් ලබාදෙන කුල ප්‍රෞඪත්වය හා බැඳි අර්ථකතන ඔස්සේ සිය කුල ප්‍රජාව සෙසු කුල කණ්ඩායම් වලට වඩා ඉහළට ඔසවා තැබීමට ඔවුන් උත්සාහ දරා ඇති බැවිණි.

දෘෂ්‍ය පරිසරය තුළ ස්ථාපිත කුල සංකේත ඔස්සේ සිදුකර ඇති මෙම අධ්‍යයනයේදී සමාජ විද්‍යාවේ වර්ධනය වෙමින් පවතින උප විෂයය ක්ෂේත්‍රයක් වන දෘෂ්‍ය සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයන් ද (visual sociological Method) උපයෝගීකරගෙන ඇත.

**ප්‍රවේශය**

කුලය හා දේශපාලන ආධිපත්‍යයද, සමාජ ජීවිතයද අතර නිහඬ නමුත් ප්‍රබල සබඳතාවක් අද දිනද ලාංකීය සමාජය තුල ඇත. ඉංග්‍රීසීන් රාජකාරි ක්‍රමය අහෝසි කරමින් කුලයේ ආර්ථික පදනම් බිඳ දැමුවද, අධ්‍යාත්මික තලය තුලින් එය පළවා හැරීම දුෂ්කර විය. එහි ප්‍රතිඵලය ලෙස ලාංකීය සමාජයේ විවිධ කුල කණ්ඩායම් අතර උස් පහත් භේදය පිළිබඳ කථිකාවක්ද, ජාතික දේශපාලනයේදී කුලය මත පදනම් මැතිවරණ චර්යාවක්ද, වඩා ප්‍රාදේශීය තලයේ දේශපාලනයේදී එය සම්පූර්ණ ලෙසම පාහේ කුලය මත පදනම් වීමද අපට අත්දැකිය හැක. මෙම පත්‍රිකාවට පාදක වන්නේ එම කුල ආධිපත්‍යයේ හා මහේෂාඛ්‍යත්වයේ ආඛ්‍යානයන් දෘෂ්‍ය පරිසරයට සංක්‍රමණිත අවස්ථාවක් වන අතර, ඒ මත ප්‍රාදේශීය පාලක රෙජීමයන්ගේ කුලවාදී හැසිරීමද නිරීක්ෂණය කර ඇත.

## අධ්‍යයන ක්ෂේත්‍රය හා ක්‍රම වේදය

මෙම පර්යේෂණය සඳහා යොදා ගෙන ඇත්තේ දේශපාලනික භූගෝලීය මායිම් ද්විත්වයක් නියෝජනය කරන අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා බලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යන ප්‍රාදේශීය පාලන ඒකක ද්විත්වයයි. මෙම පාලන ඒකක ද්විත්වය එකිනෙකට තදාසන්න, වඩාත් පැහැදිලිව සඳහන් කරන්නේ නම් පොදු බල ප්‍රදේශ මායිමක් භුක්ති විඳින ඒකකයන් ද්විත්වයකි. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරනු ලබන මෙම ප්‍රදේශ ද්විත්වයම සමුද්‍රාසන්න ප්‍රදේශයන් වේ. එසේම ප්‍රදේශ ද්විත්වයේ බළ ප්‍රදේශ සීමා යනු තදාසන්න ලෙසම කුලයේ සීමාවන්ද වේ. එනම් මෙම ප්‍රදේශ සලකුණු වී ඇත්තේ හැකි පමණ සමාජාතීය කුල කණ්ඩායම් අවශෝෂණය වන පරිදි වේ.

අධ්‍යයනයට අදාල දත්ත රාශිකරණය සඳහා සහභාගිත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡාවන් හා ලිඛිත මූලාශ්‍ර යන ආකෘති ත්‍රිත්වයම සමෝධානිකව යොදාගෙන ඇත. විශේෂයෙන්ම දෘෂ්‍ය සංකේත අධ්‍යයනය තුලදී දෘෂ්‍ය සමාජ විද්‍යා ක්‍රමවේදයේ ආලෝකය ලබා ඇත. අධ්‍යයන ක්ෂේත්‍රයට අදාල පදනම් දැණුම උදෙසා ක්ෂේත්‍රය ඔස්සේ ලියවී ඇති සාස්ත්‍රීය සාහිත්‍යය කියවීමට ලක්කර ඇත. එසේම කුල කථකයින් විසින් රචිත සාහිත්‍යයන් ද අප විසින් අවධානයට ලක්කර ඇති අතර එකී මූලාශ්‍ර ශාස්ත්‍රීය නොවන මූලාශ්‍ර ලෙස වර්ගීකරණයට ලක් කරමින් අධ්‍යයනය සඳහා සහය කරගෙන ඇත. එසේම කුල කථකයන්ගේ රචනාවන් අධ්‍යයනයේ මධ්‍ය ලක්ෂයක්ද දරා සිටී.

## ලාංකීය කුල ක්‍රමය

ක්‍රි.පූ හයවන සියවසේදී උතුරු ඉන්දීය ආර්යය සංක්‍රමණ ඔස්සේ ඇරඹෙන ලාංකීය ලිඛිත ඉතිහාසය[65] නොකඩවා කෙරුණු උතුරු හා දකුණු ඉන්දීය සංක්‍රමණ ඔස්සේ වරනැගී ඇත. ඒ තුලට සාමාකාමී මෙන්ම මිලිටරිමය ආකෘතීන්ගෙන් සිදුවූ දකුණු ඉන්දීය ද්‍රවිඩ සංක්‍රමණයන්ද ඇතුලත් විය යුතු වේ. සිංහළ අනන්‍යතාව හැඩ ගැන්වීමේදී මෙකී ඉන්දියානු මහ සංස්කෘතියේ ආභාෂය ද ඉන්දීය ප්‍රධාන භූමි ස්කන්ධයෙන් සාපේක්ෂව වෙන්ව පිහිටීම මත එකී මහ සංස්කෘතියෙන් පැහැදිලි පරාසයකින් වෙනස්වූ අනන්‍යතාවක්ද ලංකාව අත්කරගෙන ඇත. දෙමළ අනන්‍යතාව පිළිබඳ කාරණයේදීද මෙකී කාරණයම සාපේක්ෂ ලෙස වලංගු බව පැහැදිලිය. ලාංකීය සමාජ නිර්මිතය පාදක වූ ප්‍රධාන සමාජ සැකැස්ම වන කුල ක්‍රමයද මෙකී ජනවාර්ගික පදනම් මත වර්ධනය විය.

සිංහලයන්ගේ ආරම්භක ලක්ෂයන්ට අදාල පුරෝගාමී ජනාවාස ගෝත්‍රික මට්ටමක් නියෝජනය කල අතර ඒ තුල අපට දැකගැන්මට හැකිවූයේ සරළ මට්ටමේ ස්ථරායන ක්‍රමයක් පමණි (පරණවිතාන 1994). පසු කාලීනව වර්ධනය වූ කුලවාදී හැඟීම් සඳහා ඉන්දියානු මූලයන් ගේ බලපෑම සැක රහිතය. කුල ක්‍රමය සඳහා අදාල ආර්ථික අධෝ ව්‍යුහයක් මේ හා සමාන්තරව වර්ධිතව හා වර්ධනය වෙමින් පවතින්නට ඇත. එසේ නොමැතිව කුල ක්‍රමය හෝ වෙනයම් සමාජ ව්‍යුහයක් යම් සමාජයක් තුල ස්ථාපිත කල නොහැක. එහෙත් කුල ක්‍රමයේ ආරම්භක වකවානු නිශ්චිත නැත. මෙයට ප්‍රධාන හේතුව කුල ක්‍රමය පිළිබඳ පවතින වාර්තාගතවීම් ලංකීය ඉතිහාසය තුල දුර්ලභ වීමයි.

[65] ලාංකීය ඉතිහාසය විජයාවතරණ පුරා වෘත්තයෙන් ඉතා ඔබ්බට විහිදෙන බව නූතන පුරා විද්‍යාත්මක අනාවරණයන් සාක්ෂි දරයි.

ජනවංශය, නීති නිඝණ්ඩුව වැනි කුල ක්‍රමය පිළිබඳව පවතින ප්‍රධාන ලිඛිත මූලාශ්‍ර කිහිපයද අයත්වන්නේ මෑත ඉතිහාසය තුලට වේ.

> The Janavamsa, to be dated not earlier the fifteenth century, and Probably later, is apparently the compilation of a Buddhist *Bhikku* (Priest). It is valuable mainly for its listing of the castes and for certaininsights that it offers regarding Buddhist attitude toward the caste system. Quite a dissimilar account is the *Niti- Nighantuva*, which reflects traditional legends regarding the origins of the cast system among the Sinhalese from the standpoint of the high caste Kandyan
>
> (Ryan 1953: 5)
>
> නීති නිඝණ්ඩුව සම්පාදනය කරන ලද්දේ සිංහල රාජ්‍යය බ්‍රිතාන්‍ය කිරීටයට නතුවූ 1815 මාර්තු 02 දාට පෙර දිනයක සිංහල රජුන් යටතේ වූ ස්වාධීන සිංහලයේදී බව නිගමනය කල හැකිය. මෙහි අදහස නම් නීති නිඝණ්ඩුව සම්පාදනය කෙරුනේ 1769 සහ 1815 අතර අතර වූ 46 අවුරුද්ද තුලදී බවයි. මෙය සම්පාදනය කෙරුනේ සෙංකඩගලපුර අගනුවරදී බවත් බොහෝ දුරට විශ්වාසය.
>
> (විජයතුංග 1996: ඕබසඩ- නීති නිඝණ්ඩුව සංස්කරනයට ලියූ හැඳින්වීම)

කෙසේ වෙතත් මෙම මූලාශ්‍ර තුල අන්තර්ගත කුල ක්‍රමයේ සම්භවය පිළිබඳ අධිතාත්වික කාරණා ද විශ්වාස කටයුතු නැත. එහෙත් මෙම ලියවීම් මෑත ඉතිහාසයට අයත්වීම මත එක් කාරණයක් පැහැදිලි වේ. එනම් වඩා මෑත කාලීනව කුල ක්‍රමය යම් දෘඩතර අවධියකට ගමන් කර තිබූ බවයි. ඒ සඳහා දකුණු ඉන්දීය බලපෑම් වඩා සමීපස්ථ වන්නට ඇත. කෙසේ වෙතත් ලංකාවේ පැවති කුල ක්‍රමය ඉන්දියානු ආකෘතියෙන් විශ්ෂ්ට ලෙස වෙනස් වූ අතර ඒ සඳහා ඉහත සඳහන් කල ඉන්දියානු ප්‍රධාන භූමි ස්කන්ධයට පැවති සාපේක්ෂ වෙන්වීම, ලංකාවේ ස්ථාපිත බුද්ධාගම කුල ක්‍රමය සමඟ "සංකල්පීයව" බද්ධ නොවීමද මේ සඳහා බලපාන්නට ඇත. මේ අනුව ලංකීය කුල හැඟීම ඉන්දියානු මට්ටමට දැඩි නොවූ බව පෙනේ. එහෙත් එය සාපේක්ෂ අර්ථයෙනි. ලාංකීය සංඝ සංස්ථාවද කුල ක්‍රමය සමඟ අධ්‍යාත්මක මෙන්ම ආර්ථිකමය පාර්ෂවයෙන්ද සම්මුතිගතව සිටි බව (ගුණවර්ධන 1993) (හා සිටින බව) පැහැදිලිය. කුල ක්‍රමය ඔස්සේ යම් වර්ධිත වැඩ වසම් ස්වාභාවයේ සබඳතා දෙසට නුවර යුගය වන විට රාජ්‍යය ගමන් කර තිබූ බවට සේයාවන් දැකගත හැක. එම්. යූ ද සිල්වා (1998) මෙය හඳුන්වන්නේ කුල වැඩවසම් ක්‍රමය ලෙසිනි. එයට හේතු වන්නේ එය යුරෝපීය වැඩවසම් සම්ප්‍රදායෙන් වෙනස්වූ ලක්ෂණ දරා සිටි බැවිණි. ලාංකීය කුල වැඩවසම් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයක් වූයේ එක් එක් කුල සඳහා අදාල වෘත්තීය සේවා මත පදනම් වූ බද්ද සංවිධාන නම් ආයතනික ව්‍යුහයන් තුලට කුල කණ්ඩායම් සංවිධාන ගත කර පැවතීමයි. බද්ද සේවාවන් සමඟ බාඳී පැවතියේ ඉඩම් භුක්තියයි. බටහිර කොලණිකරණයට පූර්වයෙන් පැවති කුල සබඳතා වෙත කොළණිකරණ ආක්‍රමණිකයන් මැදිහත්වීම මත විකෘතිකරණයකට බඳුන් වූ බව සිල්වා (1998) පෙන්වා දෙයි. ඔවුන් කුල ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යමින් රාජකාරි ක්‍රමය යටතේ නොමිලයේ ලැබෙන කුල සේවා සිය වෙළඳ හා පරිපාලන කාර්යයන් ලාභදායීත්වයට ගමන් කරවීම සඳහා භාවිතා කළේය (සිල්වා

1997, සිල්වා 1998). කුල ක්‍රමය වියැකෙමින් ධනේශ්වර සබඳතා දෙසට ලාංකීය භූමි භාගය ගමන් කලේ ඉංග්‍රීසීන් යටතේ රාජකාරි ක්‍රමය අහෝසි වීම ප්‍රධාන සාධකය කර ගනිමිණි. මෙහිදී නැවතත් කුල ක්‍රමය වියැකීම භෞතික තලයේ දී සිදුවන විට අධ්‍යාත්මක තලය තුල කථිකාවක් ලෙස කුල හැඟීම ඉදිරියට ගමන් කළේය. එම තත්වය මෙම පත්‍රිකාව ඉදිරිපත් කරන සියවසටද අදාල වීම විරෝධාභාසයක් ලෙස දැකිය හැකි නමුත් සත්‍ය තත්වය වන්නේ එයයි. එය තවමත් මිනිස් අනන්‍යතාවයේ, සබඳතාවල එක් පාර්ෂවයක් තුල ස්ථාපිතව කටයුතු කරයි.

**වැඩවසම් ක්‍රමය හා කුල වැඩසම් ක්‍රමය සංසන්දනාත්මකව**

| යුරෝපීය වැඩවසම් ක්‍රමය | කුල වැඩවසම් ක්‍රමය |
|---|---|
| ඉඩම් භුක්තිය හා අනිවාර්ය යුධ සේවාව එකිනෙකට බැඳී තිබේ. රදලයෝ ඔවුන් භුක්ති විඳි ඉඩම් ප්‍රමාණය මත රජුට යුධ භටයන් සැපයුහ. එසේ සැපයු යුධ භටයන්ගේ පක්ෂපාතීත්වය රදලයා කෙරෙහි විය. ඔවුන් ක්‍රියා කලේ රදලයාගේ නියෝග මතය | ඉඩම් භුක්තිය මත රට වැසියන් අතරින් කලින් කලට යුධ භටයන් කැඳවිණි. මෙම සේනාංක ග්‍රාමීය මට්ටමේදී මුලාදෑනිවරුන් හා ආරච්චිවරුන්ද ප්‍රාදේශීය මට්ටමේදී මුදලිවරුන් හා දිසාව විසින්ද සංවිධානය කර ඔවුන්ගේ නායකත්වය යටතේ සටන් පෙරමුණට යැවිණි. සෙබලුන් හා මුලාදැනින් සේවය කලේ රජුට යි. පක්ෂපාතීත්වය රජු කෙරෙහි විය |
| ඉඩම් අයිතිය නින්දගම හිමි රදලයාට ය | ඉඩම් වල පරම අයිතිය රජුට ය |
| ඉඩමෙන් පිටවී ක්‍රියා කිරීමට අයිතියක් ප්‍රවේණිදාසයාට නැත | පැවරී ඇති සේවාව වෙනුවෙන් තමන් භුක්ති විඳින ඉඩම අතහැර සේවාවෙන් නිදහස් වීමේ අයිතිය පැවැතිනි |

මූලාශ්‍ර : ගුණවර්ධන (1997), සිල්වා (1998)

**කුල වැඩවසම් ක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ බද්ද සංවිධාන කිහිපයක්**

| බද්ද | කුලය | කාර්යයන් |
|---|---|---|
| කොට්ටල් බද්ද | නවන්දන්නා | ලෝහ දැව හා ගල් ආශ්‍රිත කාර්මික කටයුතු |
| මඩිගෙ බද්ද/ගොන් බද්ද | කරාව/ මුස්ලිම්වරු | වෙළඳ හා ප්‍රවාහන කටයුතු |
| බඩහැල බද්ද | කුඹල් | උළු, ගඩොල් හා මැටි බඳුන් තැනීම |
| රදා බද්ද | රදා | පිරිසිදු රෙදි, පන්දම් හා පහන්වැටි සැපයීම, වියන් බැඳීම (සහ යාතුකර්ම) |
| කුරුවෙ බද්ද | පන්නා | ඇතුන් ඇල්ලීම, හීලෑ කිරීම, රජුගේ ඇත්ගාල රැකබලා ගැනීම |
| හුනු බද්ද | හුනු | හුනු සැකසීම හා ආලේප කිරීම |
| බෙරවා බද්ද/උඩරට මහබද්ද | බෙරවා | රෙදි වියීම, රාජකීය ගබඩාවට එළවළු හා පලතුරු සැපයීම, කිතුල්ගස් වලින් පීලි සාදා සැපයීම |
| කින්නර බද්ද | කින්නර | රාජකීය ගබඩාවට කඹ හා පැදුරු සැපයීම |
| හැඳ බද්ද | හැඳි | රාජකීය ගබඩාවට කුළු හා මළු සැපයීම |

මූලාශ්‍ර : අමරතුංග (2003), ඔබේසේකර (2004), පීරිස් (2005), සිල්වා (1998), සුභාෂිනි (2002)

ලාංකීය ශිෂ්ටාචාර යේ හිමිදිරියේ දී ඉන්දීය චතුර් වර්ණයන්ට සමාන කුල සැකැස්මක ඡායාවක් දිස්වන නමුත් එම සතර වර්ණයන් "වර්ණ" ද්විත්වයක් තුලට ඌනනය වූ බව පෙනේ. රජ (ක්ෂත්‍රිය), බමුණු (බ්‍රාහ්මණ), වෙළඳ (වෛශ්‍ය), යන වංශත්‍රයෙහි පුද්ගලයින් කලින් කල ලංකාවට පැමිණ විසූ නමුත් ඔවුන් සියලු දෙනා ගොවි වංශයට (කුලයට) ඒකාබද්ධ වූ බවට නීති නිගණ්ඩුව (විජයතුංග සංස්කරණය 1998:13) කරනු ලබන සඳහන මේ සඳහා සාක්ෂි දරයි. මේ අනුව තත්ත්ව අනුපිළිවළෙහි පළමු මට්ටම ගොවි කුලය දරණ අතර අනෙක් කුල ක්ෂුද්‍ර මට්ටම තුල උප ස්ථරායනයක් අත්කර ගනිමින් ස්ථාපිත කර ඇත. කෙසේ නමුත් මෙම ස්ථරායන මට්ටම් පිළිබඳ මෙම කුල කණ්ඩායම් අතර එකග තාවක් නැතත් මෙම පත්‍රිකාව තුල ඉදිරිපත් කර ඇත්තේ වඩා පොදු තත්තව අනුපිළිවලයි (වගු අංක 03).

**සිංහල කුල නිර්මිතය - තත්ත්ව අනුපිලිවලින්**

| | |
|---|---|
| 1. ගොවිගම | 2. කරාව |
| 3. සලාගම | 4. දුරාව |
| 5. හුනු | 6. නවන්දන්නා/ ආචාරී |
| 7. රදා/ හේන | 8. වහම්පුර/ හකුරු |
| 9. කුඹල්/ බඩහැල | 10. දුර |
| 11. නැකති/ බෙරවා | 12. බත්ගම/ පදු |
| 13. ගහල | 14. කින්නර |
| 15. රොඩී/ හුලවාලි | |

මූලාශ්‍ර ඃ අමරසේකර (1996), අයිවන් (1999), Jiggins (1979), නීති නිඝණ්ඩුව (1999), පීරිස් (2005), Roberts (1982), සිල්වා (2005), සුභාෂිණී (2002)

කුල ක්‍රමය සමස්ත දිවයින පුරාම ඒකමිතිකව ගලාගිය ප්‍රපංචයක් නොවේ. කුල නිර්මිතය ප්‍රාදේශීයවද වෙනස් වේ. මෙම බෙදීම් අතරින් ප්‍රධාන වන්නේ උඩරට, පහතරට හා නුවරකලාවියේ ලෙස සිඳවන බෙදීම් ය. කරාව, සලාගම හා දුරාව පහතරටට ආවේනික කුල වන අතර පහතරටදී කුල ස්ථරායනයේ දෘඩතර බව අනෙක් පළාත් වලට වඩා අඩුතර වේ. ගොවි කුලයේ උප බෙදීමක් වන වන්නියාර්වරු නුවර කලාවියේ ස්ථරායනයේ ඉහළම ස්ථානය දරයි. එසේම පුද්ගලයෙකු යම් කුලයකට සේම වරිගයකටද අයත්වීම නුවර කලාවියේ තවත් විශේෂත්වයකි. තනි කුල හා මිශ්‍ර කුල ගම්මාන උඩරටදී හමුවන විට නුවර කලාවියේ දී හමුවන්නේ තනි කුල ගම්මාන පමණි.

කුල ක්‍රමය හා සබැඳි පැරණි අංගයන් නූතනයේදී බොහෝ දුරට වියැකී ගොස් ඇත. විශේෂයෙන් එහි භෞතික (ආර්ථික) පාදම වියැකී ගොස් ඇත. මේ හරහා කුලය අතුරුදහන් වූ හෝ ප්‍රතික්ෂේපිත වූ අංගයක් ය යන හැඟීම නිර්මාණය විය හැක. නමුත් සත්‍යය තත්වය වන්නේ කුල සවිඥානිකත්වය නූතන "ලිබරල් ධනවාදී" විඥානයන් තුලද සැරිසරන බවයි. එනම් භෞතික පදනම් බිඳවැටී ඇති නමුත් අධ්‍යාත්මකය තලයේදී කුල හැඟීම් නඩත්තු කරනු ලබයි. එය ධනවාදයේ සාමාන්‍ය සංකීර්ණත්වයට අමතර සංකීර්ණත්වයක් ලාංකීය පරිසරයට එක්කර ඇත.

පහත කාරණා ත්‍රිත්වය විමසා බලන්න.

1. ප්‍රේම සබඳතා මත අන්තර් කුල විවාහයන් (බහිර්ජන්‍ය විවාහයන්) සිදුවුවත් තවමත් අති බහුතර ලෙස දක්නට ඇත්තේ සමකුල විවාහයන්ය.

2. සංඝ සමාජය තුල පවතින නිකාය භේදයේ පදනම කුලයයි.

3. දේශපාලන ක්ෂේත්‍රයේදී කුලය ඉතා සමීපව උපයෝගී කරගනු දක්නට ලැබෙයි. මැතිවරණ චර්යාව තුල කුල විඥානය ඉතා පැහැදිලිව ක්‍රියාකාරී වේ.

## කුල මහේෂාඛ්‍යත්වයේ ආඛ්‍යානයන්

සංකේතයක් යනු යම් "තේරුමක් ඇඟිණු" යමක් ලෙස හැඳිනගත හැක. සංකේත යනු පුළුල් ප්‍රපංච පද්ධතියකි. මේ අනුව භාෂාව ගත් විට එයද සංකේත පද්ධතියකි. එහි ශ්‍රව්‍ය සංකේත මෙන්ම දෘෂ්‍ය සංකේතද අන්තර්ගතය. සංකේතයන් තවත් සංකේතයන් හා සබඳ වීම තුල සංකීර්ණත්ව අදහස් හා තේරුම් ගොඩ නැගෙණු දැකගත හැක.

කුල මහේෂාඛ්‍යත්වයේ කථිකාව කුල ධූරාවලිය තුල මධ්‍යම මට්ටමේ පසුවූ කුල කණ්ඩායම් ධනවාදී නූතනය වෙත සිරස්ව චලනය වීමත් සමග බැඳී පවතී. කරාව සහ සලාගම කුල කණ්ඩායම් වල සැලකිය යුතු කොටසක් ධනවාදයේ හිමිදිරිය තුල ඇතිවූ අවස්ථාවන් උපයෝගී කර ගනිමින් පංතිමය ස්ථරායනයේ ඉහළ මට්ටමකට පිවිසී ගත් අතර ලාංකීය සන්දර්භය තුල පංතිමය රේඛාව තුල ඉහළ යාම පමණක් සමාජ ගරුත්වය සඳහා අවකාශ නොලැබි අතර ඒ සඳහා කුල පසුබිමද දෘඩතරව අවශ්‍ය විය. මේ සංධර්භය තුල කුල ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ කථිකාවන් කරලියට පැමිණෙනු දැකගත හැක. මෙම විවාදය තුල ඒ ඒ කුල කණ්ඩායම් වල සම්ප්‍රදායික සංකේතයන්ද මහේෂාක්‍යත්වය පිළිබඳ කථිකාව වෙත ඇදාගනු ලැබූ අතර ඒවා සඳහා විවිධ අර්ථකතන ඇතුලත් කරනු ලැබිණි.

කරාව කුලය සම්ප්‍රදායික සංකේත රැසකට හිමිකම් කියන අතර ඒවා බොහොමයක් හමුවන්නේ ධජ හා පතාක ලෙසයි. ඉර හඳ කොඩිය, මකර කොඩිය, හලාවත කොඩිය, ඊ.ඩබ්ලිව් පෙරේරා ගේ*Sinhalese Banners and Standards* (1916), එම්. ඩී රඝවාන් ගේ *The Karava of Ceylon* (1961) හා ටී.ඇස් ධර්මබන්දු ගේ කෞරව වංශ කතාව (1962) යන කෘතීන් කරාව කුලයේ සංකේත අන්තර්ගත ප්‍රධානතම මූලාශ්‍ර ලෙස හැඳිනගත හැක. මේ අතරින් ධර්මබන්දුගේ කෘතිය භාවිතා කල හැක්කේ ශාස්ත්‍රීය මූලාශයකට වඩා කුල කථකයෙකුගේ ආඛ්‍යානයක් ලෙසිණි.

ධර්මබන්දු "කෞරව වංශිකයන්ගේ රාජ ලක්ෂණ" ලෙස හඳුන්වමින් දෘෂ්‍ය සංකේතාවලියක ලැයිස්තුවක් ඉදිරිපත් කරයි.

| | | | |
|---|---|---|---|
| 01. | මුතු කුඩය | 02. | ඉර ලකුණ දරන ආලවට්ටම |
| 03. | හඳ ලකුණ දරන ආලවට්ටම | 04. | ඉර හඳ කොඩිය |
| 05. | මකරයා කොඩිය | 06. | ත්‍රී සූලය |
| 07. | කඩුව | 08. | දවල් පන්දම් යුවල |

(ධර්මබන්දු 1962:xxi)

මෙම සංකේතාවලිය අද දිනද කරාව කුලයේ අවමංගල්‍ය පෙරහැරේ භාවිතා වන ප්‍රධාන අංගයකි. අම්බලන්ගොඩ හා වතුගෙදර ප්‍රදේශවල මල් ශාලා හිමිකරුවන් සඳහන් කරන්නේ කරාව කුල ප්‍රජාව මෙම සංකේතාවලිය රහිතව අවමගුල් පෙරහැර පැවැත්වීමට මැලිවන බවයි.

> කෞරව වංශිකයන්ගේ අවමගුල් වලදී බෙර, දවුල්, තම්මැට්ටම් කාරයෝ ඒවා වාදනය කරති, නළා පිඹිති. ඊලඟට ඉර හඳ කොඩිය හා මකරයා කොඩියද ගෙන යති. අවමඟුල් පෙරහැරේ ඉදිරියෙන්ම වාදකයෝ යති. මෘත ශරීරය සහිත දෙන දෙපස ආලවට්ටම් කඩු ත්‍රිසූල ආදී ආයුධ හා (දවල් පන්දම්) දල්වන ලද ලාම්පු ද ගෙන යති. මළ අයගේ පෙලෙහි වුවකු විසින් මුතු කුඩය (සේසත) ඉසිලීම කරනු ලැබේ. රජකයෝ පාවඩ අතුරති.
>
> (ධර්මබන්දු 1962:xxi)

**සිංහල කුල ක්‍රමයේ නූතන හා පැරණි තත්වය - සංසන්දනාත්මකව**

| පැරණි තත්වය | නූතන තත්වය |
|---|---|
| නෛතික සංස්ථාවකි | නෛතික පදනම අහෝසිව ඇත |
| (සාපේක්ෂව) ප්‍රසිද්ධියේ කතාබහට ලක්විය | කතාබහට ලක්වන්නේ යටි තලයේ ය |
| වෘත්තීන් තීරණය වුයේ කුල පදනම මත ආරෝපිත තත්වය ඔස්සේය | වෘත්තීන් සාධිත තත්වයන් ය |
| පුද්ගල නාම කුල වලට ආවේණිකය | පුද්ගල නාම කුල පදනමකින් තොරයි |
| වාසගම අනුව කුල පදනම හඳුනාගත හැක | නෛතික පටිපාටි මගින් පහල කුල සාමාජිකයන් වාසගම් වෙනස්කරගනු දක්නට ලැබේ. මේ නිසා වාසගම ඔස්සේ කුල පදනම හඳුනාගැනිම අසීරුය |
| කුලය හා බද්ධ වන ඥාති සබඳතා ප්‍රමුඛකත්වය ගනී | ප්‍රමුඛ වන්නේ හිතමිතුරු සබඳතාය |
| අන්තර්ජන්‍ය විවාහ පමණි | බහිර්ජන්‍ය විවාහයන්ද යම් තරමකින් දැකිය හැක |
| නැටුම් බෙරවාදන යාතුකර්ම ආදිය සේවා කුල වල කාර්යන් විය | ඇකඩමික් ආයතන/කලායතන එම කාර්යයන් පවත්වාගෙන යයි |
| කුලය පදනම් වූ ආසන පැනවිමක් හා ඇමතුම් පද දක්නට ඇත | ආසන පැනවීමේදී හා ඇමතුමේදී කුලය පදනම් නොවේ |
| ඉහල කුලයේ පුද්ගලයන් පහල කුල නිවසකින් | මගුල් උත්සව, අවමගුල් උත්සව ආදී කටයුතු වලට කුල භේදයකින් තොරව පුද්ගලයන් |

| | |
|---|---|
| ආහාර අනුභව නොකරයි | සහභාගි වේ |
| කුලය පදනම් කරගත් ඇදුම් පැලදුම්, ආභරණ හා චාරිත්‍ර වාරිත්‍රද පැවතිනි | එවැනි තත්වයක් දක්නට නැත |

මූලාශ්‍ර : අමරසේකර (1996), අයිවන් (1999), ගුණවර්ධන (1997), පීරිස් (2005), රාජපක්ෂ (1998), සුභාෂිනි (2002)

අවමංගල උත්සවයන් හැරුණු විට කරාව කුලයේ ආගමික හා අර්ධ ආගමික උත්සවයන් තුලදීද මෙම සංකේතාවලියේ සමහර සංකේතයන් භාවිතා වන අතර අතීතයේදී කරාව කුලයේ මංගල්‍ය අවස්ථාවන් තුලදීද මෙම සංකේත අතරින් සමහර අංග භාවිතා වී ඇති බව පෙනේ. මේ තුල පැහැදිලි වන්නේ මෙම සංකේත ජන විඥාණය සමඟ දිගු කලක් සක්‍රියව දිවි ගෙවා ඇති බවයි.අවමගුල් පෙරහැරේදී මෙම සංකේතාවලිය සමඟ

> ශ්‍රී බුද්ධ වර්ෂ 1859 වු වෙසඟ පුර දෙපෝ ලත් කුජ දින කෝට්ටේ ජයවර්ධන පුරයේදී හවෙනි ශ්‍රී පරාක්‍රමබාහු මහ රජතුමා විසින් කුරුකුල නාථ රිද්දි යුවරජතුමා ඇතුළු කෞරව රාජවංශිකයන්ට ගෞරව පිණිස මෙම භාණ්ඩ සකස් කර දෙවා වදාල සේක"
>
> මූලාශ්‍රඃ නන්දන මල් ශාලාව - අම්බලන්ගොඩ, ප්‍රේමා මල් ශාලාව - වතුගෙදර

යන පාඨය ඇතුලත් ධජයක්ද රැගෙන යනු නිරීක්ෂණය කල හැක. මෙම පාඨයන් තුලින් දෘෂ්‍ය වන්නේ රාජ්‍යයත්වය සමඟ යම් සමීප සබඳතාවක් සිය කුලයට පැවතීම පිළිබඳ ආඛ්‍යානයන් ය. එය සිය කුලයේ උසස් බව පිළිබඳ සංඥාවන්ය.

සලාගම කුලයේ ප්‍රකටම සංකේතය ලෙස වැලිතොට කොඩිය, නම් එදිරි කොඩිය, සලාගම කොඩිය යන නම් වලින්ද හඳුන්වනු ලබන බළපිටි කොඩිය දැක්විය හැක. ඊ.ඩබ්ලිව් පෙරේරා සිය *Sinhalese Banners and Standards* (1916) කෘතිය තුල දක්වන්නේ මෙම කොඩිය මඟින් නිරූපනය වන්නේ පේෂකාර්මිකයන් බවයි. රැල්ප් පීරිස් (2005), බ්‍රයස් රයන් (1953), ආනන්ද කුමාරස්වාමි (1962), කාලිංග ටියුඩර් සිල්වා (1998) ආදීන් දක්වන්නේ සලාගම කුලය ලංකාවට සංක්‍රමණය වූයේ දහතුන්වන සියවසේදී පමණ දකුණු ඉන්දියාවෙන් බවත්, මුල් කාලයේදී පේෂකාර්මිකයන් ලෙස පෙනී සිටි ඔවුන් පසු කාලීනව කුරුඳු කර්මාන්තය හා බද්ධ වී ඇති බවයි.

එහෙත් සලාගම කුල කථකයන් තමන් පේෂකාර්මිකයන් වූ බවට (අයිවන් 1990,උයන්ගොඩ 2000) හා තමන් ලංකාවට සංක්‍රමණිත වකවානුව සම්බන්ධයෙන් එකඟ නොවන බව පෙනේ. උදාහරණ ලෙස සලාගම කුල කථකයන් දෙදෙනෙකු වන සච්ලියස් කරුණාමුණි හා ජී.එම් ද සොයිසා, පෙරේරා ගේ කෘතියේ (1914) දැක්වෙන සලාගම කොඩිය පිළිබඳ විග්‍රහය සාවද්‍ය බවට තර්ක කරයි. සලාගම කුලයේ කථකයන් වන ඩබ්.එස් ද සොයිසා සහ එඩ්මන්ඩ් අක්කරවත්ත විසින් 1951.05.21 දාතමින් පිටපත් කර බෙදා හරින ලද සලාගම කොඩියේද මෙම පුරාවෘත්තයට ඔවුන් ලබා දෙන අර්ථ නිරූපනය සටහන් කොට ඇත. සළාගම කුලය පැවතෙන්නේ ක්‍රි.ව 13 වන සියවසේදී පැමිණි දකුණු ඉන්දියානු රෙදි වියන්නන්ගෙන් නොව ක්‍රි.ව 11 වන සියවසේදී විජයබාහු රජුගේ පුරෝහිතයන් ලෙස පැමිණි උතුරු ඉන්දීය බ්‍රාහ්මණ පිරිසකගෙන් බව කුල කථකයන්ගේ පැහැදිලි කිරීමයි. මෙම අදහස කරුණාමුනිගේ අමුණ දොලහ නවකතාව තුල මෙන්ම (උයන්ගොඩ 2000),

සොයිසාගේ නව මහා වංශය හෙවත් සිංහල ආර්යයෝ කෘතිය තුලද (1991), කරුණාමුණි මිරන්ඩෝ ඔබේසේකර අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහයට සලාගම බ්‍රාහ්මණ වංශය නමින් සැපයූ ලිපිය තුලද (2001) අන්තර්ගත වේ.

ඉතිහාසගත වත්මන් බමුණු කුලය ආරම්භ වන්නේ මහා විජයබාහු රජු (1055-1110) එතුමානන් ඔටුනු පලඳවා ගැනීම සඳහා උතුරු ඉන්දියාවේ සාලෙයියා ගම (ශාලි ග්‍රාම) වාසී උසස් බ්‍රාහ්මණ පිරිස ගෙන්වා ගැනිමෙන් පසුවය. එසේම සාලෙයියා ගම දෙවරක් වස් විසූ බුදුන් වහන්සේ මෙගම් වැසියන්ට දහම් දෙසමින් බුදු දහම ගැන මනා අවබෝධයක් ලබා දුන් සේක. අනතුරුව උගත් බුද්ධිමත් බුදුනුවන් වූ එම බ්‍රාහ්මණ පරපුර බෞද්ධ දේශවල රජුන් වෙත පුරෝහිතයන් ලෙස ගොස් ඇත. අභඹුවකින් මෙන් ලංකාවට පාවී ආ හද්ද කච්චානා කුමරියගේ ආ-ගමනයට ඇය විසින් ගෙන්වාගත් සහෝදර හයදෙනාද සමඟ පැමිණි පිරිස අප මේ කතා කරන බ්‍රාහ්මණයන් ලෙස සැලකේ. සාලිය පබ්බත බ්‍රාහ්මණයා දේවානම් පියතිස්ස රජතුමාගේ පුරෝහිත බ්‍රාහ්මණයා වේ. ඔහු සාලෙයියා ගම බෞද්ධ පරපුරේ බුදුන් වස්විසූ සාලිය පබ්බත වංශයෙන් පැවතෙන්නෙකු බව පැහැදිලිව පෙනේ.

මහා විජයබාහු දෙමළ ආක්‍රමණිකයන් මැඩ පවත්වා රට සන්සුන් කිරීමෙන් අනතුරුව ඔහුගේ මෞලි මංගල්ලය සඳහා සුදුසු කල්යල් බලා සුදානම් වූයේ එම උදාර සම්භාවනීය මංගල කටයුත්ත කරවා ගැනීමට සුදුස්සෙකු රට පුරා සෙවූ නමුත් ප්‍රයත්නය සාර්ථක නොවුයෙන් උතුරු භාරතය උදව් කර ගත්තේය.

උත්තර දඹදිව් තලයේ කෝසල මහා රාජ්‍යයෙහි ශාලිග්‍රාම බ්‍රාහ්මණ ගම් දනව්වෙන් පිළිගත් උගත් ප්‍රභූ බ්‍රාහ්මණ පිරිසක් ගෙන්වා ගැනීම පිණිස අරාබි වෙළඳ නායකයෙක් වු පෙරිය මරික්කාර් නැමති අයගේ නැව උපයෝගී කරගෙන දූත පිරිසක් පිටත්කොට යැවීය. එවකට දෙමල ආක්‍රමණිකයන් හා මුහුදු කොල්ලකරුවන් මුහුදු ගමන්මග නිතර කරක්ගහන බැවින් ඔවුන්ගෙන් ආරක්ෂා වී තම ඉලක්කය කරා නිරුපද්‍රිතව යාමට පහසු වීම සඳහා එම අරාබි නැව පිහිටට ගනු ලැබුනේ රජුගේ තීක්ෂණ බුද්ධි මහිමය නිසාය.

දූත පිරිස තම මෙහෙය අවශ්‍ය පරිදි ඉටුකරගනු ලැබුවේ එරට රජුගේ පූර්ණ අනුග්‍රහය ලබා ගනිමිනි. එරට රජු තෝරා බේරා දුන් බ්‍රාහ්මණ පිරිසද සමග ගිය නැවෙන්ම ආපසු දූත පිරිස බේරුවල වරායට සේන්දු වූයේ කිසිදු අතවරයකට ලක් නොවීමෙනි.

ඉන්පසු රජතුමාගේ පූර්ණ අධීක්ෂණය මධ්‍යයයේ රජුගේ ඇරයුමින් මෙහි පැමිණි දූත පිරිස පිලිගෙන අනුරාධපුරය බලා ගෙනගොස් සුදුසු පරිදි විවේක ගන්වා රාජකීය පිලිගැනිමෙන් අනතුරුව බලපැවැත්වූ සිරිත - විරිත අනුව විජයබාහු රජතුමාගේ ඔටුනු පැළඳවිම මෙම සලාගම බ්‍රාහ්මණ පිරිස අතින් සිදුකරන ලදී. මෙම රාජකීය උලෙල පවත්වනු ලැබුවේ අනුරාධපුර රත්නමාලී සෑ මළුවේදී ක්‍රි.ව 1088 වෙසක් පුන් පොහෝ දිනයේදීය

(කරුණාමුණි 2001:53)

මෙම බ්‍රාහ්මණ පිරිස රැගෙන ආ බව කියන කොඩියක් හා එහි සංරචකයන් පිලිබඳව විශ්වයේ ඔබත් මමත් නම් පොතකින්ද, හෙලදිව බමුණුවත නම් පුස්තකයෙන්ද, ඌවේ ජනකවියක්ද උපුටා දක්වමින් සච්ලියස් කරුණාමුනි විස්තර කරයි (2001).

විජයබාහු මහ නිරිඳුගෙ සිරස මත ඔටුනු තබන්නට සැරසෙන්නේ
දඹදිව සාලිය පුරයෙන් සාලිය කුල බමුණන් මෙහි ගෙන්වන්නේ
ඔටුනු පළඳවා මේ වර ලැබගෙන රාජ පුරෝහිතයන් වන්නේ
අසනුය විස්තර කොඩියේ පැවසෙන සාලි පුරෙන් ආ බමුණන්ගේ

ඉරහඳ මුදුනේ මුළුවල බැබලෙයි සතස්වස්තික දෙක යට දෙකොනේ
ත්‍රිශූලය හා රන්කග කතිරය ලෙස පූන නූලෙනි ගැට ගැසුනේ
මැද රන් කෙන්ඩිය වටේ නෙළුම් පෙති ලේ රත් පැහැයෙනි බැබලෙන්නේ
උතුම් සලාගම බමුණන් සතු එම කොඩියේ විස්තර දැනගන්නේ
හෙලදිව බමුණුවත - කරුණාමුණි (2001:54)

පලමුවන විජයබාහු මහරජතුමාගේ අභිෂේකය සඳහා බේරුවල සිට අනුරාධපුරය බලා තමන් කැඳවාගෙන යනු ලැබූ දර්ශනීය පෙරහැරේ ඉර-හඳ -ස්වස්ථිකය - හක්ගෙඩිය - පූන නූලය - කෙන්ඩිය - කඩුව - ත්‍රිශූලය යන උතුම් ලකුණු අටකින් යුක්ත වූ වර්ණවත් ධජය සලාගම බ්‍රාහ්මණ වරුන් විසින් ගෙන එන ලද බැව් කියවේ.

විශ්වයෙහි ඔබත් මමත් - පිටුව 284(කරුණාමුණි 2001:54)

බලපිටිය ජාතික වීර සමරු සංවිධානය මඟින් 1992 වසරේ පෙබරවාරි 15 දින පැවැත්වූ බලපිටිය ජාතක වීර සමරු උළෙල වෙනුවෙන් නිකුත්කල කුඩා මුද්‍රිත ප්‍රකාශනයක ඉහත උපුටා දැක්වීම් වලට අමතරව බලපිටි වරුණ නම් පද්‍ය පංතියක්ද "ඓතිහාසික බලපිටි ධජය" නම් මාතෘකාව යටතේ දක්වා ඇත.

උතුම් බමුණු සත්දෙන ගෙන ආ කොඩිය
උතුම් ලකුණු අටකින් සුසැදුන කොඩිය
උතුම් හැගුම් දී එඩි ගන්වන කොඩිය
උතුම් කොඩිය සුදිලේ බළපිටි කොඩිය
බළපිටි වරුණ (බලපිටිය ජාතික වීර සමරු උළෙල 1992:02:15)


මේ අනුව "උතුම් ලකුණු අට" පහත පරිදි හදුනා ගත හැක.

1. ඉර 2. හඳ

3. ස්වස්ථිකය 4. හක්ගෙඩිය

5. පූන නූල 6. කෙන්ඩිය

7. කඩුව 8. ත්‍රිශූලය




මෙම සංකේත සංරචකයන් ලෙස භාවිතාකොට සලාගම බ්‍රාහ්මණයන් රැගෙන පැමිණි කොඩිය නමින් තවත් කොඩියක් සලාගම කුලය විසින් නිර්මාණය කරගෙන ඇති බව පෙනේ. බලපිටිය ජාතික වීර සමරු උලෙල වෙනුවෙන් නිකුත් කල මුද්‍රිත ප්‍රකාශනයේ (1992) පිටකවරය නිර්මාණය කර ඇත්තේ මෙසේ නිර්මාණය වූ කොඩියෙනි. ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ කොළඹ දෙසින් හා ගාල්ල දෙසින් බලපිටිය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය ඇරඹෙන ස්ථානයන්හි මෙම කොඩිය සහිත පුවරුවක "බලපිටිය - වීරවරයන්ගේ පුරවරය" ලෙස සටහන් කොට පවතිනු දැකගත හැක.

හෙලදිව බමුණු වත කෘතියේ "ඉරහඳ මුදුනේ බැබලෙයි....." කවිය තුලින් විස්තර කෙරෙන උතුම් ලකුණු අතර හක්ගෙඩිය නොපවතින අතර ඒ වෙනුවට ස්වස්ථික ලකුණු දෙකක් අන්තර්ගතව ඇත. මෙම කාව්‍ය පසුබිමින් සටන් කරමින් සලාගම බ්‍රාහ්මණ වංශික කොඩිය ලෙස නම් කෙරුනු කොඩියක් මිරැන්ඩෝ ඔබේසේකර සිය කන්ද උඩරට සමාජ සංවිධානය හා ප්‍රභූවරු කෘතියේ (2005:83) දක්වා ඇති අතර එහි සංරචකයන් ඉහත කාව්‍යයේ විස්තරයන්ට අනුරූපව ගොඩ නැගී ඇති බව පෙනේ. කෙසේ නමුත් බලපිටිය ප්‍රදේශයේ සලාගම ප්‍රජාව තම කුල සංකේතයන් ලෙස හඳුනාගන්නේ පලමුව සඳන්ව ඇති හක්ගෙඩියද සංරචකයක් වන කොඩිය බව ඉදිරි විශ්ලේෂණයන් තුලදී පැහැදිලි වනු ඇත.

## ප්‍රමුඛ කුලය පිලිබඳ සංකල්පය සහ කරාව හා සලාගම කුල

ප්‍රමුඛ කුලය පිලිබඳ සංකල්පය මූලික ලෙස ඉන්දියානු සමාජ විද්‍යාඥ ශ්‍රී නිවාස් ගේ ඉදිරිපත් කිරීමකි. සාර්ව මට්ටමේ කුල ස්ථරායනයන් ක්ෂුද්‍ර මට්ටමට ගමන් කරන විට විකරණයන්ට භාජනය වන බව ප්‍රමුඛ කුලය පිලිබඳ සංකල්පය ඔස්සේ පැහැදිලි වේ. විශේෂයෙන්ම ප්‍රාදේශීය පාලන ඒකකයන්ගේ බලය හා ආධිපත්‍ය පිළිබඳ විෂයය ක්ෂේත්‍රයේදී, එම සංසිද්ධිය පැහැදීම සඳහා ශක්තිමත් න්‍යායික මෙවලමක් ප්‍රමුඛ කුලය පිලිබඳ සංකල්පය සම්පාදනය කරයි. කුල සංවිධානයේ ප්‍රාථමිකම ඒකකය වන ගමක නායකත්වයට පත්වන්නේ ගම්මානයේ වෙසෙන ධූරාවලියේ ඉහලම මට්ටම දරන කුලය නොව ගම්මානයේ බහුතරය වන එසේම ධූරාවලියේ පහලින්ම නොපිහිටන කුලයක්ය යන්න සිංහල කුල ක්‍රමය තුල නිරීක්ෂනය කල හැකි සංසිද්ධියකි. මෙසේ නායකත්වයට පත්වන කුලය ප්‍රමුඛ කුලය ලෙස හැදිනගත හැක.

**අම්බලන්ගොඩ ප්‍රාදේශීය පාලන ඒකකයේ කුල ව්‍යුහය**

| | | |
|---|---|---|
| 1. කරාව | 2. සලාගම | 3. වහම්පුර/හකුරු |
| 4. නවන්දන්න | 5. හින්න | 6. රජක/රදා |

මූලාශ්‍ර : Jiggins (1979), සිල්වා (2000), මැතිවරණ දෙපාර්තමේන්තුවේ ඡන්ද හිමි නාමලේඛන සහ සහභාගිත්ව නිරීක්ෂණය

**බලපිටිය ප්‍රාදේශීය පාලන ඒකකයේ කුල ව්‍යුහය**

| | |
|---|---|
| 1. සලාගම | 2. කරාව |
| 3. නවන්දන්න | 4. රජක/රදා |
| 5. බෙරව | 6. හින්න |
| 7. වහම්පුර/හකුරු | 8. ගොවිගම |

මූලාශ්‍ර : Jiggins (1979), මැතිවරණ දෙපාර්තමේන්තුවේ ඡන්ද හිමි නාමලේඛන සහ සහභාගිත්ව නිරීක්ෂණය

මේ අනුව අම්බලන්ගොඩ හා බලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන් තුල කුල ව්‍යුහය නිරීක්ෂණය කල විට අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ 98% ක් පමණ වන (සිල්වා 2000 :139) අති බහුතර කරාව කුල නියෝජනයද, ඔවුන් කුල ස්ථරායනයේ මධ්‍යම මට්ටම නියෝජනය කිරීම ද මගින් පෙන්නුම් කෙරෙන්නේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය පාලන ඒකකයේ ප්‍රමුඛ කුලය කරාව කුලය බවයි. ප්‍රදේශයේ මැතිවරණ චර්යාව මෙම තත්වය හොඳින් පැහැදිලි කරයි. ජීගින්ස් ගේ (1979) අධ්‍යයනයන්ට අනුව 1947 - 1956 අම්බලන්ගොඩ - බලපිටිය බහු මන්ත්‍රී ආසන කොට්ඨාශ සමයේදී අම්බලන්ගොඩ ප්‍රදේශයේ කරාව කුල ඡන්ද ඔස්සේ කරාව කුලයේ අපේක්ෂකයෙක් අනිවාර්යයෙන්ම ජයගනු ලැබිනි. 1960 - 1970 අතර මැතිවරන සඳහා අම්බලන්ගොඩ ආසනයෙන් ඉදිරිපත්ව ඇත්තේත්, ජයග්‍රහනය කර ඇත්තේත් කරාව කුල අපේක්ෂකයන් වන අතර වෙනත් කුලයක (වහම්පුර) අපේක්ෂකයෙක් ඉදිරිපත්ව ඇති එකම අවස්ථාව වන 1970 මැතිවරණයේදී එම අපේක්ෂකයා ලබා ඇත්තේ සමස්ත ඡන්ද ප්‍රමාණයෙන් 3 % ක් පමණි (Jiggins 1979) . 1979 - 1997 අතර අම්බලන්ගොඩ නගර සභාවට තේරී පත්වූ නගර සභිකයන් සියලු දෙනාම පාහේ කරාව කුල පසුබිමක් සහිත වීම මෙම තත්වය තව දුරටත් තහවුරු කරයි. බලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කුල ව්‍යුහයේ බහුතරය අත්කර ගන්නේ සලාගම කුලයයි. නමුත් සෙසු කුලයන්ද සැලකිය යුතු ප්‍රතිශතයකින් ප්‍රදේශය තුල දිවි ගෙවන නිසා එකී නියෝජනය අතිබහුතරයක් බවට පත්වන්නේ නැත (අංක 6 වගුව). බල ප්‍රදේශය තුල පිහිටි වතුගෙදර උප නගරය ආශ්‍රිතව දෙවන විශාලතම කුලය වන කරාව කුලය සංකේන්ද්‍රිතව ඇත. නවන්දන්න, බෙරව, රජක (රදා) ආදී කුලයන්ද තනි කුල ගම්මාන ලෙස සංවිධානය වී ඇත. සිංහල ජනවාර්ගික කණ්ඩායමට අමතරව සැලකිය යුතු මුස්ලිම් වරුන් පිරිසක්ද බලපිටිය නගරය ආශ්‍රිතව ජීවත් වේ. මේ නිසා බලපිටිය ප්‍රාදේශීය පාලන ඒකකය තුල ප්‍රමුඛ කුලය හඳුනා ගැනීම අම්බලන්ගොඩ ප්‍රාදේශීය පාලන ඒකකයට සාපේක්ෂව යම්

සංකීර්නත්වයක් ගන්නා බව පෙනී යන නමුත් මෙහිදීද මිනිසුන්ගේ මැතිවරණ චර්යාව අධ්‍යයනය ඒ සඳහා සැහෙන ආලෝකයක් ලබා දෙනු ඇත. මේ සඳහා නැවතත් ජිගින්ස් ගේ අධ්‍යයනය දෙසට යොමුවූ විට පෙනී යන්නේ 1947 - 1956 අම්බලන්ගොඩ - බලපිටිය ද්වි මන්ත්‍රී ආසන සමයේ මහ මැතිවරන තුලදී බලපිටිය සලාගම කුල ඡන්ද ඔස්සේ සළාගම කුල අපේක්ෂකයෙක් අනිවාර්යයෙන්ම තේරී පත්වී ඇති බවයි. 1960 - 1970 තනි මන්ත්‍රී ආසන සමයේදී එක් අවස්ථාවකදී පමණක් (1965 මහ මැතිවරණය) කරාව කුල සම්භවයක් සහිත ලංකා සමසමාජ පක්ෂයේ අපේක්ෂකයා ඉතා කුඩා වැඩි ඡන්ද ප්‍රමාණයකින් ජයගෙන ඇත. මෙහිදීද කුල පදනම ක්‍රියාකාරී විම හොඳින් තහවුරු කරමින් එම පක්ෂයෙන්ම 1970 මැතිවරණයට ඉදිරිපත් වූ සලාගම කුල සම්භවයක් සහිත අපේක්ෂකයා පැහැදිලි බහුතර ඡන්ද ප්‍රමාණයක් හිමිකරගෙන ඇත (Jiggins 1979). වඩා ක්ෂුද්‍ර තලයට හෙවත් ප්‍රාදේශීය පාලන ඒකකයේ (ප්‍රාදේශීය සභාවේ) සභිකයන්ගේ කුල පදනම වෙත යොමු වුවහොත් එහිද බහුතරය සලාගම කුලය නියෝජනය කරයි. දෙවන තැන කරාව නියෝජනයට ලැබේ. සමහර අවස්ථාවන් වලදී මුස්ලිම් නියෝජනයක්ද දැකගත හැක. කැපී පෙනෙන කාරණය වන්නේ අනෙකුත් සුළුතර කුලවල නියෝජනයක් දක්නට නොමැති බවයි (අංක 4.3 වගුව). එක් අවස්ථාවකදී පමනක් එක් නවන්දන්නා කුල නියෝජනයක් දක්නට ලැබුණු නමුත් එකී නියෝජනය දිගින් දිගටම පැවතුනේ නැත. මෙයට හේතු ලෙස පහත කාරණා නිරීක්ෂණය කල හැක.

1. සුළුතර කුල කණ්ඩායම් වල ඡන්ද බොහෝ ප්‍රමාණයක් ප්‍රමුඛ කුලය වන සලාගම අපේක්ෂකයන් වෙත යොමු වීම.

2. ප්‍රධන පක්ෂ සුළුතර කුල වල පුද්ගලයන් වෙත අපේක්ෂකත්වය ලබා දීම ඉතා සීමිත වීම.

3. සුළුතර කුල අතරින් බෙහොමයක් පහත් කුල ලෙස සැලකීම හා ඒ තුල ප්‍රධාන කුල වල ඡන්ද ඔවුන් වෙත යොමු නොවීම.

ප්‍රදේශීය සභාවේ ප්‍රධාන දේශපාලන තනතුර වන සභාපති තනතුර හිමිවනුයේ සලාගම කුල සම්භවයක් සහිත පුද්ගලයකුටය යන්න ප්‍රදේශය තුල ප්‍රකට කාරණයකි. මේ නිසා ප්‍රාදේශීය පාලන ඒකකයේ බලය හා ආධිපත්‍ය සලාගම කුලය වෙත ඒකරාශීවීම සිදුවේ. මෙම කාරණා සැලකිල්ලට ගත් විට බලපිටිය ප්‍රාදේශීය පාලන ඒකකයේ ප්‍රමුඛ කුලය වන්නේ සලාගම කුලය බව පැහැදිලිය.

බලපිටිය හා අම්බලන්ගොඩ ප්‍රාදේශීය පාලන ඒකක වලට අදාල ඉහත සාකච්ඡාව තුලින් පෙනී යන්නේ පක්ෂය, පුද්ගලයා, ප්‍රතිපත්තීන් කුමක් වුවද ආධිපත්‍ය දරණුයේ ප්‍රමුඛ කුලය බවයි.

## කුල සංකේත ප්‍රාදේශීය පාලන ඒකකයන්ගේ නිල සංකේත බවට පරිවර්තනය වීම

බලපිටිය ප්‍රාදේශීය සභාවේ නිල ලාංඡනයේ හා ධජයේ සංරචකයන් වන්නේ කඩුව ත්‍රිශූලය හා හක්ගෙඩියයි. මේ අනුව ලංකාවට පැමිණි සලාගම බ්‍රාහ්මණයින් ගෙන එන ලදැයි කුල කථකයන් සඳහන් කරනු ලබන කොඩියේ අන්තර්ගත "උතුම් ලකුණු අට" අතරින් තෝරා ගැනුනු සංකේත ත්‍රිත්වයකින් බලපිටිය ප්‍රාදේශීය සභාවේ නිල සන්නම් නිර්මාණය වී ඇති බව පැහැදිලිය.




කුල කථකයන් විසින් ඉදිරිපත් කරන මූලාශ්‍ර වල සත්‍යාසත්‍යතාව මෙතෙක් පර්යේෂකයන් තහවුරු කොට නැතත් මෙම අධ්‍යයනයට වැදගත් වන්නේ මූලාශ්‍රවල ආරම්භක සත්‍යාසත්‍යතාව නොව මෙම සංකේත තම කුලය සමඟ අනන්‍යකර ගනිමින් කුල ප්‍රජාව විසින් නිරතවන ගනුදෙණුවේ ස්වභාවයත්, දිගු කලක් භාවිතය හා, මුඛ පරම්පරාගතව හා ලිඛිතව පැවතිම ඔස්සේ මෙකී සංකේත සම්ප්‍රදායක් බවට පත්වීමත් වේ. මෙම ලක්ෂණ සමුදාය ඉහත කුල කොඩි හා ඒවායේ අඩංගු අභ්‍යන්තර සංකේත තුල පවතින බව පැහැදිලිය. මෙම සංකේතමය භාවිතය තුල කතිකාවේ තවත් පැතිකඩක් පැහැදිලි කරයි. ඒ කුල මහේෂාක්‍යයත්වය පිලිබඳ සංවාදයයි. මෙම සංකේත එම සංවාදය තුල මැදිහත් වන්නේ කුල මහේෂාක්‍යයත්වය පිලිබඳ දෘෂ්‍යමය සංනිවේදනයක් ඉදිරිපත් කරන ප්‍රධාන අංගයක් ලෙසිනි. "සලාගම කුලයේ පුරෝගාමීන් බ්‍රාහ්මණයන්ය. ඔවුන් ලාංකීය රජකුට ඔටුනු පැලඳවීම සඳහා ඉන්දියාවෙන් පැමිණි අතර එම බ්‍රාහ්මණයන් විසින් උතුම් ලකුණු අටකින් සැදුණු ධජයක්ද රැගෙන ආවේය" යන ඉදිරිපත් කිරීම් ඔස්සේ කුල සංකේත බවට පරිවර්තනය වූ මෙම සංකේත මාලාව සාර්ව සමාජය තුල, පෞඩත්වය, විශිෂ්ඨත්වය, සෞභාග්‍ය, උසස් බව ආදී මනෝ භාවයන් ජනිත කරන ඒවා වේ (උදාහරණ ලෙස පූන නූල ඉන්දීය බ්‍රාහ්මණයන්ගේ සංකේතයක් වන අතර ඒ තුල කුල නිර්මිතයේ ඉහලම තලය පිලිබඳ සංඥාවන් අන්තර්ගතව ඇත). ප්‍රාදේශීය පාලන ඒකකයේ නිල සන්නම් තුලට මෙම සංකේත සංකේන්ද්‍රණය වූ විට එයින් සංනිවේදනය කෙරෙන්නේ මෙම ප්‍රාදේශීය පාලන ඒකකයේ බලය හා ආධිපත්‍ය දරන කුලය සලාගම බවත්, ඔවුන් ශ්‍රේෂ්ඨ සම්භවයක් සහිත උසස් කුලයක්ය බවත් ය.

බලපිටිය ප්‍රාදේශීය පාලන ඒකකය මිශ්‍ර කුල නියෝජනයක් සහිත අධිකාරියක් බව පෙරදී පැහැදිලි කර ඇත. විශේෂයෙන් සැලකිය යුතු කරාව කුල නියෝජනයක් ප්‍රාදේශීය සභාව තුල දක්නට ඇත. සිංහල ජනවාර්ගිකත්වයට අමතරව මුස්ලිම් ජනවාර්ගික කණ්ඩායමද නොසලකා හල හැකි කුඩාතර සංඛ්‍යාවක් නොවේ. නමුත් සලාගම කුලයේ සංකේත පමණක් නිල ලාංඡන හා ධජ තුලට අන්තර්ගතවූයේ කෙසේද? මෙම තත්වය පැහැදිලි කල හැක්කේ ප්‍රමුඛ කුලය පිලිබඳ සංකල්පය ඔස්සේය. එනම් ප්‍රදේශයේ බහුතර කුලය වන්නා වූත්, කුල ධූරාවලියේ පහලින්ම ස්ථානගත නොවන්නා වූත් සලාගම කුලය බලපිටිය ප්‍රාදේශීය පාලන ඒකකයේ ප්‍රමුඛ කුලය ලෙස ක්‍රියාත්මක වන බවයි. ප්‍රමුඛ කුලය, ප්‍රදේශය පිලිබඳ බලය හා ආධිපත්‍ය කේන්ද්‍රගත වූ කුලයයි. මෙම බලයේ හා

ආධිපත්‍යයයේ නිල මුහුණුවර වන්නේ ප්‍රාදේශීය පාලන ඒකකයයි. එය නෛතික සංස්ථාවකි. එහි බලය හා ආධිපත්‍ය සුජාතකරනයට ලක්වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතිය හරහාය. මෙකී ආකෘතිය හමුවේ "බහුතර කැමැත්ත" ඉතා පැහැදිලිව ක්‍රියාත්මක වී ඇති අවස්ථාවක් ලෙස නිල සන්නම් පිලිබඳ කාරණය ඉදිරිපත් වේ. මෙහි වැඩි දුර කියවීම වන්නේ ප්‍රමුඛ කුලයේ බලය හා ආධිපත්‍ය හමුවේ අනිකුත් කුල යටපත් වී ඇති බවයි. මෙම තත්වය සෙසු කුල ප්‍රජාව විසින් ප්‍රශ්න කරන බවක්ද දක්නට නැත. එයට ප්‍රතිපක්ෂව සුළුතර කුල කණ්ඩායම් ප්‍රමුඛ කුලය වෙත දේශපාලමය සහයෝගය පලකරනු බොහෝ විට දක්නට ලැබේ.







අම්බලන්ගොඩ නගර සභාවේ නිල ලාංඡනය හා ධජය නිර්මාණය වී ඇත්තේ කරාව කුලයේ ප්‍රධාන සංකේතයක් වන මකර රුවක් ඇසුරිනි. ප්‍රාදේශීය පාලන ඒකකයේ ප්‍රමුඛ කුලයේ කුල සංකේතයක් අම්බලන්ගොඩ නගර සභාවේ නිල ලාංජනය හා ධජය බවට පත්වී ඇති බව මේ අනුව පැහැදිලිය. බලපිටිය ප්‍රාදේශීය පාලන ඒකකයේ නිල ලාංඡනයේ හා ධජයේ සංරචකයන්ට ඓතිහාසික අන්තර්ගතයක් ඉදිරිපත් වන්නාසේ ම මකරා සංකේතය කරාව කුලයට හිමිවීම පිලිබඳවද ඉතිහාසයක් නිර්මාණය වී ඇත. මේ පිලිබඳව මූලික සටහන ලෙස ඉදිරිපත් වන්නේ මුක්කර හටන නම් වූ ලියවිල්ලයි. මේ අනුව කෝට්ටේ ශ්‍රී පරාක්‍රමබාහු රජ සමයේ පුන්නාල දේශයේ මුක්කුර නම්

වූ ජන කොටසක් ලංකාව ආක්‍රමණය කල බවත්, මොවුන් හා සටන් කොට පැරදවීමට මූලිකත්වය ගත්තේ කෞරව වංශිකයන් බවත්, ඒ වෙනුවෙන් ශ්‍රී පරාක්‍රමබාහු රජු විසින් පිරිනමන ලද දෑ අතර මකර කොඩියද අන්තර්ගත බවත් පෙනේ.

> ඒ හැර රාවණා කොඩියද ඉරහඳ කොඩියද මකරයා කොඩියද මාල දෙරිසන්ද වට්ට පේරැස් මුදු ද රත්තරං කස්ථාන රිදී කස්ථාන රං හවඩි රිදී හවඩි ද රං බන්දි රිදී බන්දි ද රං බස්තං රිදී බස්තං ද කර්ණ කුණ්ඩලා ද වඩන තල අතු ද ඇලි ස්වරං දෙක දෙක ද රිදී තැටි රිදී සුලාං ද රිදී හැදි ද රිදී කොතලාද  රිදි වලං ද මෙකී තානාන්තර ලැබෙමින් දහඅට තොටමුනේට වෙලදාමට යනවාට එනවාට තීරුව සඟං මුද්දර මිල නැති සැටියට මහ වාසලින් පනිවුඩ උනායැ
>
> (ධර්මබන්දු 1962:99 - මුක්කර හටන, Raghawan 1961: 176)

කරාව කුලයේ අවමංගල්‍ය උත්සව තුල සම්ප්‍රදායිකව භාවිතා කෙරමින් පවතින සංකේතාවලිය අතරද මකර කොඩිය පවතින බවත්, එකී සංකේතාවලිය සමඟ රැගෙන යන තවත් ධජයක ශ්‍රී පරාක්‍රමබාහු රජු විසින් මෙම සංකේතාවලිය ප්‍රදානය කල බව සඳහන් බවත් පෙරදී දක්වා ඇත.මෙම කාරණා මත පැහැදිලි වන්නේ මකරා සිය කුලයේ සංකේත අතර ප්‍රමුඛත්වයකින් කරාව කුලය සලකන බවයි. මකරා ස්වභාවික සත්වයින් කිහිප දෙනෙකුගේ ලක්ෂණ කැටිකර ගත් මනඃකල්පිත සතකු වන අතර මෙවැනි සංයුක්ත සත්වයින් පැරණි සංස්කෘතියේ අංගයක් විය. එසේම එය බලය පිළිබඳ සංකේතයක්ද වේ. රඝවාන් (1961: 170) දක්වන්නේ මකරා - පෘතෘවිය, ජලය, අග්නි, වාතය යන මූලිකාංග පිළිබඳ සංකේතාත්මක ඉදිරිපත් කිරීමක් බවයි.

අම්බලන්ගොඩ නගර සභාවේ ලාංඡනය කලාශූරී දිවංගත ජුවන්වඩු ආරියපාලද සිල්වා විජේ සූරියගේ (ආරියපාල ගුරුන්නාන්සේගේ) අදහසකි (සිල්වා 2000:79). අම්බලන්ගොඩ නගර සභා ධජය නිර්මාණය කිරීමේ කමිටුව සී. ද ඇස්. කුලතිලක, බර්නාඩ් ලොකුගේ, බන්දුල ප්‍රනාන්දු යන මහතුන්ගෙන් සමන්විත විය ( සිල්වා 2000:80 ). මොවුන් ජාතික මට්ටමින් ප්‍රකට පුද්ගලයන් වේ. සී. ද ඇස්. කුලතිලක දේශීය සංගීතය පිළිබඳ අධ්‍යයනයන්හි නියැලී සුප්‍රකට පුද්ගලයෙකි. බර්නාඩ් ලොකුගේද ප්‍රකට චිත්‍ර ශිල්පියෙකි. ආරියපාල ගුරුන්නාන්සේ කෝලම්, නර්තනය, වෙස් මුහුනු කලාව පිළිබඳ කීර්තිමත් කලාකරුවෙකි. මෙම පුද්ගලයන් ඉතා සවිඥානික ලෙස තම කුලය නියෝජනය සඳහා නිල ලාංඡන තුල කුල සංකේත හසුරුවා ඇති බව පැහැදිලිය.

> ලාංඡනයේ මකරා යොදා ගැනීමට හේතුව එය කරාව කුලයේ කොඩියේ පැවති ලාංජනය වීම නිසා යයි ආරියපාල මහතා පවසයි.
>
> (සිල්වා 2000:79)

මෙම සවිඥානික බව ඉහත පුද්ගලයන්ට පමණක් හුදකලාවූ ප්‍රපංචයක් යයි සිතිය නොහැක. එය ප්‍රාදේශීය පාලන ඒකකයේ නියෝජිතයන් ඇතුළු කුලවාදී ප්‍රභූන් සමස්තයකගේ කුලවාදී මනෝ භාවයේ ප්‍රකාශනයක් ලෙස හැඳිනගැනීම වඩා සාධාරණ වේ. මන්ද නගර සභා අනන්‍යතාවට මෙම සන්නම් යෝග්‍ය නොවේ නම් ඒ පිළිබඳ විවේචන හා විරෝධතා එල්ලවිය යුතුව පැවති බැවිනි.

නමුත් එවැනි විරෝධතා හා විවේචන පිලිබඳව අසන්නට නොලැබෙන අතර මෙම නිල ලාංජනය හා ධජය නගර සභා සන්නම් ලෙස දීර්ඝ කාලයක් පැවතෙමින් තිබේ.

ජාතියක් විසින් ශාස්ත්‍රීය පසුතලයක් සහිත පුද්ගලයන් ලෙස හැඳිනගන්නා කමිටුවක් තම ප්‍රාදේශීය පාලන ඒකකයේ නිල සංකේත, කුල සංකේත ඔස්සේ සංරචනය කර තිබේ.

> නගරසභා ධජයේ මධ්‍යයේ ඇති මකරාගෙන් කෞරව වංශයද, නිල් පැහැයෙන් කරදිය වලල්ලද (මුහුද) ,ඒ වටා ඇති කහ පැහැති රේඛාවෙන් තේජසද සංකේතවත් කෙරේ. ධජයේ සුදු පැහැයෙන් දැහැමි බව (නිර්මල බව) අදහස් කෙරේ
>
> (සිල්වා 2000:80).

මේ අනුව බලපිටිය ප්‍රාදේශීය පාලන ඒකකයේ නිල සන්නම් තුලදී මෙන්, අම්බලන්ගොඩ ප්‍රාදේශීය පාලන ඒකකයේ නිල සන්නම් තුලින්ද කුල ශ්‍රේෂ්ඨත්වය පිලිබද අදහස සන්නිවේදනයට උත්සහ ගෙන ඇති බව පෙනේ. කෝලම් වෙස් මුහුණු නර්තන රූකඩ ආදී අම්බලන්ගොඩ ප්‍රාදේශීය පාලන ඒකකයේ අනන්‍යතාව ප්‍රකාශයට පත් කල හැකි දෙස් විදෙස් ප්‍රකට විශිෂ්ට අංග රැසක් එය සතුව පවතී. විවිධ පර්යේෂකයන්ගේ අධ්‍යයනයන් ඔස්සේ මේ පිලිබද සුවිසල් සාහිත්‍යයක් ගොඩ නැගී පැවතිම එම විශිෂ්ඨත්වයට සාක්ෂියකි. නමුත් මෙකී සියලු අංගයන් නිශේධනය කරමින් අම්බලන්ගොඩ නගර සභාවේ අනන්‍යතාව ඉදිරිපත් කිරිමට ප්‍රමුඛතම හා යෝග්‍යතම අංගය ලෙස කුල සංකේතයක් ඉදිරිපත්ව ඇත.

## නිගමන

පරිපාලන දේහයන් ඔවුන්ගේ ස්ව-අනන්‍යතාව ගොඩ නගණු ලබන්නේ ඔවුන්ගේ සංවිධාන ව්‍යුහය හා ඔවුන් නායකත්වය දෙන මිනිසුන්ගේ පෞර්ෂත්වය මත පදනම්වයි යනුවෙන් Allison (1971) උපුටා දක්වමින් Shuffield (2002) විසින් සිදුකරණ සඳහන ඔහු විසින් අධ්‍යනය කරනු ලබන අමරිකානු පසුතලයට පමණක් නොව ලාංකීය පරිසරය සම්බන්ධයෙන්ද සාධාරණ වන බව පෙනේ. අම්බලන්ගොඩ ප්‍රාදේශීය පාලන ඒකකයේ ප්‍රමුඛ කුලය ලෙස කරාව කුලයද, බලපිටිය ප්‍රාදේශීය පාලන ඒකකයේ ප්‍රමුඛ කුලය ලෙස සළාගම කුලයද ස්ව කුල කණ්ඩායම වෙත ප්‍රාදේශීය පාලන ඒකකය තුල ඇති බලය හා ආධිපත්‍ය ප්‍රකාශ කිරීමේ දෘෂ්‍යමය සකේතයක් ලෙස පාලන ඒකකයන්ගේ නිල සන්නම් තුලට කුල සංකේත ඇතුලත් කර ඇත. වඩාත් පැහැදිලිව කියනවා නම් මෙම නිල සන්නම් තුල ඇති ප්‍රධානතම සංරචකයන් වන්නේ කුල සංකේතයන්ය. මෙම කුල සංකේතවල සංකේතාත්මක භාවිතය කුලය නියෝජනය කරනවාත් සමඟම කුල මහේෂාඛ්‍යත්වයද නියෝජනය කරයි. ඒවා කුල කථකයින් විසින් කුල සංකේත මත තබන ලද ආඛ්‍යානයන් වන අතර එම ආඛ්‍යානයන් බිහිවන්නේ කුල කණ්ඩායම් අතර, විශේෂයෙන්ම ගොවිගම කුලය අභිබවා කරාව, සලාගම හා දුරාව කුල අධිරාජ්‍යවාදී සමය තුල ඉහළට එසවීගැනීමත් සමඟිණි. ප්‍රාදේශීය පාලන ඒකකයක නිල සන්නම යනු ප්‍රාදේශීය පාලන ඒකකයේ දෘෂ්‍ය පරිසරය සිසාරා ස්ථාපනය වන, නිරන්තර ඇස ගැටෙන, ඒ හේතුවෙන් මිනිස් මනස තුලට නිරායාසයෙන් කාවදින යමක් වේ. මෙම සන්නම් ඔස්සේ දෘෂ්‍ය පරිසරය තුල කුල මහේෂාඛ්‍යත්වයේ ආඛ්‍යානයන්ද, කුල ආධිපත්‍යයේ ආඛ්‍යානයන්ද ස්ථාපිත කර ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ - ඉංග්‍රීසි


Bottermore, T.B (1962). Sociology- A guide to Problems and Literature. London: George Allen and Unwin Ltd.

Dube, S.C (1955). India Village. London: Routlege and Kegan Paul Ltd.

Jayawardena, Kumari (2001). Nobodies to Somebodies- The Rise of the Colonial Bourgeoisie in Sri Lanka. New Delhi: Leftword Books.

Jiggins, Janice (1979). Caste and Family in the Politics of the Sinhala 1947-1976. Colombo: K.V.G De Silva and Sons Colombo Ltd.

Masani, R.P (1951). "Caste and the Structure of Society" in G.T Garratt (ed :) The Legacy of India. London: Oxford University Press.

Perera, E.W (1916). Sinhalese Banners and Standards, Memories of the Colombo Museum, Series A.No.2.Government Printer.

Persell, Caroline Hodges (1984). Understanding Society- An Introduction to Sociology. New York: Happer and Row Publishers.

Raghavan, M.D (1961). The Karava of Ceylon- Society and Culture. Colombo: K.V.G De Silva and Sons.

Robbens, G.F (1979). Patterns of Behaviour. London: Edward Arnold

Roberts, Michael (1979)."Elite Formation and Elites; 1832-1931" in Michael Roberts (ed :) Collective Identities Nationalism and Protest in Modern Sri Lanka. No Place: No Publisher

Roberts, Michael (1982). Caste Conflict and Elite Formation- The Rise of Karava Elite in Sri Lanka 1500-1931. Cambridge: Cambridge University Press.

Ryan, Brace (1953). Cast in Modern Ceylon: the Sinhala System in Transition. New Jersey. Rutgers University Press.

Vitharana, V (1993). Sun and Moon in Sinhala Culture. Colombo. Educational Publications Department.


## ආශ්‍රිත ග්‍රන්ථ - සිංහල


අමරසේකර, දයා (1984) . සමාජ විද්‍යාවේ මූලික සංකල්ප . බොරලැස්ගමුව : ආරිය ප්‍රකාශකයෝ

අමරසේකර, දයා(1992) . 1993 . ඉන්දියානු කුල ක්‍රමයේ වෙනස්වීම පිලිබඳ විමසුමක් . සමාජ විමසුම, අංක 08

අමරසේකර, දයා(1994) . සමාජ විද්‍යාවේ සිද්ධාන්ත හා විධික්‍රම . වරකපොළ : ආරිය ප්‍රකාශකයෝ

අමරසේකර, දයා (1996) . ශ්‍රී ලංකා සමාජය - සමාජ විද්‍යාත්මක විමසුමක් . වරකපොළ : ආරිය ප්‍රකාශකයෝ

අමරසිංහ, සරත් සහ තවත් අය (2001) . සමාජ විද්‍යාව පිලිබඳ ශබ්ද කෝෂය . මුල්ලේරියාව : විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

අමරතුංග, ගීතානි (2003) . ශ්‍රි ලංකාවේ සම්ප්‍රදායික ගැමි සමාජය වෙනස්විම. සමාජ සමීක්ෂා , තෙවැනි කලාපය

අතුකෝරාල, කරුණාතිස්ස(1992/93) . ශ්‍රී ලංකාවේ වෙනස් වන ගම සහ එහි යථාර්තය පිලිබඳ විවරණයක්. සමාජ විමසුම , අංක 08

ධර්මබන්දු, ටී. ඇස්(1962) . කෞරව වංශ කතාව . ප්‍රකාශිත ස්ථානයක් රහිතයි : ප්‍රකාශකයෙක් රහිතයි

ධීරානන්ද, හගුරන්කෙත(2002) . රාජ්‍යය හා රාජ්‍යත්වයේ වර්ධනයඃ පූර්ව රාජ්‍යය අවධියේ ශ්‍රී ලංකාවේ පැවති දේශපාලනික පසුබිම පිලිබඳ ඓතිහාසික විමසුමක්.දයා අමරසේකර හා රෝහිත දිසානායක විසින් සංස්කරණය කරන ලද ඉඳුවර - පර්යේක්ෂණාත්මක ලේඛන සංග්‍රහය - ඉතිහාසය . වරකපොල ඃ ආරිය ප්‍රකාශකයෝ

දිසානායක, උබේසේකර(2003). නුවර කලාවියේ පුරාණ ගම . සමාජ සමීක්ෂා , තෙවන කලාපය

ගුණසේකර, සුවිනීතා(1982).සමාජ විද්‍යාව . කොළඹ ඃ සී/ස ඇම් ඩි ගුණසේන සහ සමාගම

ගුණවර්ධන, කේ. ඩබ් (1997). 16 වන සියවසේ සිට 19 වන සියවසේ අවසානය දක්වා ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා සමාජය . ශ්‍රී ලංකාවේ ඉතිහාසය - තුන් වන කොටස . අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ගුණවර්ධන, රණවීර (1993). සිවුර හා නගුල . කොළඹ . සමාජ විද්‍යාඥයන්ගේ සංගමය

හේමන්ත කුමාර, එන් .වී. ජී. එ(1997). සමාජ විද්‍යාව හා මානව විද්‍යා ප්‍රවේශය . කොළඹඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

අයිවන්, වික්ටර් (1999) . ශ්‍රී ලංකාවේ නූතන කැරලිකරුවාගේ සමාජ පසුබිම . නුගේගොඩ ඃ දූර්ගා ප්‍රකාශකයෝ

ජයවර්ධන, කුමාරි(2002) . "පවත් නොදැන බමන මතින් - නටත් දූගියො සුරා මතින් ඃ අරක්කු වෙළඳාමෙන් ශ්‍රී ලංකාවේ ධනපති පංතිය ගොඩනැගුනු අන්දම" . ප්‍රවාද ,අංක 21

කරුණතිලක, කේ (1991) . සමාජ විද්‍යා න්‍යාය . කඩවත ඃ මාලිංග ප්‍රකාශකයෝ

කරුණාතිලක, පී. වී. බී (1990 – 91) . පැරණි ලංකාවේ කුල හා සමාජ ප්‍රභේද . සමාජ විමසුම , අංක 07

කරුණාමුණි, සව්ලියස්(2001) . සලාගම බ්‍රහ්මණ වංශය . ශ්‍රී ලංකාවේ කුල සංයුතිය - ආචාර්ය මිරන්ඩෝ ඔබේසේකර අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය . ප්‍රකාශිත ස්ථානයක් රහිතයි ඃ සිංහල සංස්කෘතික සංවිධානය

කරුණානන්ද, උක්කුබණ්ඩා(1995). නුවර කලාවියේ සමාජ සම්බන්ධතා 1815 - 1900. කැළණිය ඃ කර්තෘ ප්‍රකාශන

කුමාරස්වාමි, ආනන්ද (පරිවර්තනය එච් එම් සෝමරත්න)(1962) . මධ්‍ය කාලීන සිංහල කලා . කොළඹ ඃ ලංකා ආණ්ඩුවේ මුද්‍රණාලය

කුමාරතුංග ඩි. ජී(1997) . ශ්‍රී ලංකාවට ආර්යයන්ගේ පැමිණීම හා ජනාවාස ව්‍යාප්ති . ඩි ජී කුමාරතුංග විසින් සංස්කරණය කරන ලද ශ්‍රී ලංකාවේ ඉතිහාසය ස - ආරම්භයේ සිට කෝට්ටේ යුගය දක්වා . කඩවත ඃ අභය මුද්‍රන ශිල්පියෝ

කුමාරතුංග, ඩි. ජී (1997) . ශ්‍රී ලංකාවේ ඉතිහාසය සකස්වීම කෙරෙහි භූගෝලීය සාධකයන්ගේ බලපෑම . ඩි ජී කුමාරතුංග විසින් සංස්කරණය කරන ලද ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ආරම්භයේ සිට කෝට්ටේ යුගය දක්වා . කඩවත ඃ අභය මුද්‍රන ශිල්පියෝ

මෙන්ඩිස් . ජී. සී (අනුවාදක නීල් ශ්‍රී විජේසිංහ )(1966) . ලංකා ඉතිහාසයේ ගැටලු . කොළඹ ඃ ලංකා ඇපොතිකරීස් සමාගම

මෝර්, මික්(1998) . වර්ග (වාද) ය, කුල (භේද) ය සහ ධනේශ්වරයේ සුජාත භාවය . ශ්‍රී ලංකාවේ පනස් වසරක නිදහස . මහරගමඃ රාවය ප්‍රකාශන

නාහිත, මහ පුලියන්කුලමේ(1998) . සමාජ විද්‍යාවේ මූලිකාංග . කුලියාපිටිය ඃ කර්තෘ ප්‍රකාශන

නීති නිඝණ්ඩුව(1998) . හරිස්චන්ද්‍ර විජයතුංග සංස්කරණය කොළඹ ඃ එස් ගොඩගේ සහ සහෝදරයො

ඔබේසේකර, තිලක් ආර්. මිරන්ඩෝ (2004) . කන්ද උඩරට සමාජ සංවිධානය සහ ප්‍රභූවරු . ජා ඇලඃ සමන්ති ප්‍රකාශකයෝ

ඔෂාම්, ඒ. එල්(1965) . අසිරිමත් ඉන්දියාව . කොළඹඃ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශය

පරණවිතාන, සෙනරත් (1964) . ආර්යය ජනාවාසථ සිංහලයෝ . හේම් චන්ද්‍රරාය ප්‍රධාන සංස්කාරක වූ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසයජ් කැළණියඃ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ මුද්‍රණාලය

පරණවිතාන, ඇස් (2004) . ශ්‍රී ලංකාවේ ආර්යය ජනාවාස හා ආදී පාලකයෝ . ඇස් . බී හෙට්ටිආරච්චි පරිවර්තන සංස්කාරක ලෙස ක්‍රියා කල සී . ඩබ්ලිව් . නිකෙලස් හා ඇස් . පරණවිතාන රචනා කල සංක්ෂිත ලංකා ඉතිහාසයක් ග නුගේගොඩ ඃ සමන් ප්‍රකාශකයෝ

පෙරේරා, ජයන්ත(1986) . සමාජ විද්‍යා ප්‍රවේශය . කොළඹ ඃ ශ්‍රී ලංකා පදනම් ආයතනය

පෙරේරා, ටෙනිසන්(1986) . ඉන්දීය කුල ක්‍රමය පිලිබඳ විග්‍රහයක් ග සමාජ විමසුම, අංක 04

පෙරේරා, ටෙනිසන් බී. ඒ (1993) . මානව විද්‍යා හා සමාජ විද්‍යා ප්‍රවේශය ග කොළඹ 10ඃ එස් ගොඩගේ සහ සහෝදරයෝ

පීරිස්, රැල්ෆ් (2005) . සිංහල සමාජ සංවිධානය . බොරලැස්ගමුව ඃ සී/ස (පෞද්ගලික) විසිදුනු ප්‍රකාශකයෝ

ප්‍රනාන්දු, ශිරෝමාල් (2001) . කෞරව ක්ෂත්‍රීය වංශය. ශ්‍රී ලංකාවේ කුල සංයුතිය - ආචාර්ය මිරැන්ඩෝ ඔබේසේකර අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය. ප්‍රකාශිත ස්ථානයක් රහිතයි ඃ සිංහල සංස්කෘතික සංවිධානය

රාජපක්ෂ, චන්ද්‍රසිරි (1998). කුඩාකන්ඩායම් සන්නිවේදනය ( රොඩී කුලය ආශ්‍රිත පර්යේෂණයකි) . කොළඹ ඃකර්තෘ ප්‍රකාශන

රත්න සභාපති, ඇම් සහ B.A Hons(1963) . ලංකා හා ඉන්දියානු ඉතිහාසය - ආදි යුගයේ සිට ක්‍රි.ව 1505 දක්වා . කොළඹ ඃ ඇම්. ඩී ගුණසේන සහ සමාගම

රත්නායක, අබේ (1999) . සමාජ මානව විද්‍යා න්‍යාය . පේරාදෙනිය ඃ කර්තෘ ප්‍රකාශන

සරත්, ලයනල් (1989) . සිංහල ජාතික චින්තනයේ මූලාරම්භය . කොළඹ ඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

සේනානායක , පියතිස්ස (2002) . ශ්‍රී ලංකාවේ ප්‍රාග් පූර්ව ඓතිහාසික යුගයන්හි ඉතිහාසය. දයා අමරසේකර හා රෝහිත දිසානායක සංස්කරණය කරන ලද ඉඳුවර - පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහය - ඉතිහාසය . වරකපොල ඃ ආරිය ප්‍රකාශකයෝ

සිල්වා, කාලිංග ටියුඩර්(1990 - 1991) . කුල ක්‍රමය ගැන මූලික හැඳින්වීමක්. සමාජ විමසුම, අංක 07

සිල්වා, කාලිංග ටියුඩර්(1997). කුලය පංතිය හා වෙනස්වන ලංකා සමාජය . මහනුවරඃ ප්‍රජා අධ්‍යයන කවය

සිල්වා,කාලිංග ටියුඩර්(2005) . කුලය පංතිය හා ලංකාවේ සමාජ ගැටුම් . බොරලැස්ගමුව ඃ සී/ස විසිදුනු ප්‍රකාශකයෝ

සිල්වා, ජිනේන්ද්‍රවංශ ද (2000) . අම්බලන්ගොඩ පුරාණය . අම්බලන්ගොඩ ඃ අම්බලන්ගොඩ නගර සභාව

සිල්වා, එම්. යූ ද (1997) . පෘතුගීසීන් යටතේ ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ . ශ්‍රී ලංකාවේ ඉතිහාසය - තුන් වන කොටස . බත්තරමුල්ල ඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සිල්වා, ඇම්. යූ ද (1998) . ශ්‍රී ලංකාවේ කුල වැඩවසම් ක්‍රමය . නාවල ඃ කර්තෘ ප්‍රකාශන

සොයිසා, ජී . එම් ද (1990) . නව මහාවංශය හෙවත් සිංහල ආර්යයයෝ . ප්‍රකාශිත ස්ථානයක් රහිතයි. ප්‍රකාශකයෙක් රහිතයි

සුභාෂිණී , ටී. එම්. ධම්මිකා (2002) . රොඩී ජන සමාජය . කැලණිය ඃ කර්තෘ ප්‍රකාශන

ශ්‍රී ලංකාවේ ඉතිහාසය - පලවන කොටස(1994) . බත්තරමුල්ල ඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ ඉතිහාසය - දෙවන කොටස(1995) . බත්තරමුල්ල ඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ ඉතිහාසය - තුන් වන කොටස(1997) . බත්තරමුල්ල ඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ කුල සංයුතිය - ආචාර්යය මිරැන්ඩෝ ඔබේසේකර අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය(2001) . ප්‍රකාශිත ස්ථානයක් රහිතයි ග සිංහල සංස්කෘතික සංවිධානය

තම්බයියා, එස් . ජේ (1987). “ ප්‍රාග් ඓතිහාසිකයේ පූර්ව සත්‍යයන්. යාත්‍රා ග කලාප 01

උයන්ගොඩ, ජයදේව(2000). ගේ ඇතුලේ මැද මිදුලේ ඨ කුලය , සාධාරනත්වය සහ සමානත්වය පිලිබඳ ශ්‍රී ලංකාවේ දේශපාලන කතිකාව ග ප්‍රවාද ල අංක 16

වැලිතොට(1971). බළපිටිය ග බළපිටිය තරුණ බෞද්ධ සමිතියේ ප්‍රකාශනයකි

**වෙනත් මූලාශ්‍ර**

http://www.defonseka.com

බළපිටිය ජාතික වීර සමරු සංවිධානය මගින් 1992.02.15 දින පැවැත්වූ බළපිටිය ජාතික වීර සමරු උළෙල වෙනුවෙන් නිකුත් කල මුද්‍රිත ප්‍රකාශනය.

2005 ඡන්ද හිමි නාම ලේඛන - මැතිවරණ දෙපාර්තමේන්තුව.

මැතිවරණ දෙපාර්තමේන්තුවේ මැතිවරණ වාර්තා.

ඩබ්.එස් ද සොයිසා සහ එඩ්මන්ඩ් අක්කරවත්ත විසින් 1951.05.21 දාතමින් කැලණියේ දී පිටපත්කොට බෙදාහරින ලද සලාගම කොඩිය (බලපිටියේ පතිරත්න ද සිල්වා මහතා සතුව පවතින පිටපත).

ආඛ්‍යාන narrations
open access, refereed journal

ISSN 2478-0642
Volume 02 | Issue 01 | January – June 2017